# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT
# 2025




ශ්‍රී ලංකා රේගුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

இலங்கைச் சுங்கம்

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

**SRI LANKA CUSTOMS**

**MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPEMNT**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2025

ශ්‍රී ලංකා රේගුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය

ශ්‍රී ලංකා රේගුවේ 2025 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්යසාධන වාර්තාව සුවිශේෂී ජයග්‍රහණ හා ප්‍රගතිය පිරි වර්ෂයක් ලෙස සනිටුහන් කරමින් ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. 2024 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 1,533 ක ආදායම් වාර්තාව සැලකිය යුතු ලෙස ඉක්මවා යමින් ද, මෙම වර්ෂයේ ඉලක්කය වූ රු. බිලියන 2,231 අභිබවා යමින් ද, ඉතිහාසයේ ඉහළම ආදායම් එකතුව වන රු. බිලියන 2,562 ක් මෙම වර්ෂයේ දී රේගු දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලදි. මෙමගින් ජාතික ආර්ථිකය කෙරෙහි දක්වන ලද ශක්තිමත් දායකත්වය සහ ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිසංස්කරණවල ඵලදායිත්වය පිළිබිඹු කරයි.

උපාය මාර්ගික සැලසුම්කරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආයතනික සුපිළිපන්භාවය කෙරෙහි අප දක්වන අඛණ්ඩ කැපවීම මෙම සාර්ථකත්වය තුළින් නිරූපණය කෙරෙයි. නවීකරණ කටයුතු සඳහා සිදුකරන ලද මූලපිරීම් ආදායම් එකතු කිරීම ශක්තිමත් කිරීමට, අනුකූලතාව වැඩිදියුණු කිරීමට සහ නීත්‍යානුකූල වෙළඳාම පහසු කිරීමට දායක වී ඇත.

2025 වර්ෂය තුළ, කාර්යක්ෂමතාවය, විනිවිදභාවය සහ සේවා සැපයීමේ ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා රේගුව මගින් ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලපිරීම් ඔස්සේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය වැඩි දියුණු කරන ලදී. ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීම, "Track My CusDec" පද්ධතිය, කඩදාසි රහිත බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) නිෂ්කාශන ක්‍රියාවලිය සහ වාහන සත්‍යාපන ද්වාරය මෙයට ඇතුළත් විය. තවද, ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ පද්ධති ඒකාබද්ධ කිරීම, විද්‍යුත් ප්‍රේෂණ ක්‍රමවේදය, ඇපකර, වරණීයතාවන් සහ බන්ධිත ගුදම් ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර ඇත. මෙම සියලුම සමාරම්භයන් මඟින් වෙළඳ පහසුකරණය ශක්තිමත් කරමින්, රේගු ක්‍රියාවලීන් ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සමඟ ගැලපීම කිරීම සාර්ථකව සිදු කර ඇත.

දෙපාර්තමේන්තුව විසින් නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සිදුකරන අතරම ඉහළ අවදානම් සහිත භාණ්ඩ ඵලදායීව ඉලක්ක කිරීමට ඉඩ ලබා දෙමින් ASYCUDA පද්ධතිය හරහා තම ස්වයංක්‍රීය, අවදානම් පාදක භාණ්ඩ වරණීයතා යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කරන ලදී. දත්ත මත පදනම් වූ අවදානම් පැතිකඩ නිර්ණය වැඩි දියුණු කිරීම්, ස්වයංක්‍රීයකරණය සහ අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස බහාලුම් රඳවා තබා ගැනීමේ කාලය අඩු වූ අතර සම්පත් උපයෝජනය වැඩිදියුණු විය.

බලාත්මක කිරීම සහ අනුකූලතාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීම/ විනාශකාරී අවි සඳහා මූල්‍යකරණය වැළැක්වීම සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස 2025 ජූලි මාසයේදී මූල්‍ය අපරාධ පාලන ඒකකය (FCCU) ලෙස ස්ථාපිත කරන ලදී. වැඩි දියුණු කරනලද තොරතුරු හුවමාරුව සහ සම්බන්ධීකරණ ක්‍රියාවලීන් හරහා ශ්‍රී ලංකා පොලීසිය, මූල්‍ය බුද්ධි ඒකකය ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කර ඇත.

එසේම, අනවසර මත්ද්‍රව්‍ය ජාවාරම් වැළැක්වීම සඳහා දැඩි හා අඛණ්ඩ කැපවීමක් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය ජාතික ආරක්ෂාව හා බලාත්මක කිරීමේ කටයුතු ශක්තිමත් කිරීමට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

මෙම වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින්, ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව සහ ලෝක රේගු සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව 2025 භාණ්ඩ නිෂ්කාශන කාල අධ්‍යයනය (Time Release Study - TRS) සාර්ථකව අවසන් කිරීම ඇතුළු කාර්යසාධන ක්‍රියාමාර්ග සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් තවදුරත් ශක්තිමත් කරන ලදී. 2026 ජනවාරි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ නිෂ්කාශන කාල අධ්‍යයනය (Time Release Study - TRS), දේශසීමා හරහා භාණ්ඩ නිෂ්කාශණ කාර්යක්ෂමතාව පිළිබඳ වැදගත් අවබෝධයක් ලබා දේ.

ආයතනික ප්‍රතිසංස්කරණයන්හි ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ, සංශෝධිත අරුෂා ප්‍රකාශනයට අනුකූලව හා රජයේ දූෂණ විරෝධී න්‍යාය පත්‍රය තවදුරටත් ශක්තිමත් කරමින් සහ සුපිළිපන්භාවය, විනිවිදභාවය, වගවීම සහ වෘත්තීයභාවය පිළිබඳ දෙපාර්තමේන්තුවේ කැපවීම තහවුරු කරමින් නව ආචාරධර්ම හා චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වාදීමයි.

අවසාන වශයෙන්, භාණ්ඩාගාර ලේකම්තුමාට ද, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ද, වෙළඳ ප්‍රජාවට සහ සියලුම හවුල්කාර ආයතනවලට ද ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මාගේ හදපිරි කෘතඥතාව පළ කරමි. එසේම අභියෝගාත්මක තත්වයන් මධ්‍යයේ වුවද මෙම සුවිශේෂී ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු කාර්ය මණ්ඩලය දැක්වූ කැපවීම සහ වෘත්තීයභාවය වෙනුවෙන් ද මාගේ ප්‍රශංසාව පුද කර සිටිමි.

විමල් එස්. කේ. ලියනගම
රේගු අධ්‍යක්ෂ ජනරාල්

පටුන පිටු අංකය


**01** වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම ………………………………………………………………………………. 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ……………………………………………… 1
1.3 ප්‍රධාන කාර්යයන් ……………………………………………………………………. 2
1.4 සංවිධාන ව්‍යුහය ……………………………………………………………………….. 3
1.5 පර්ෂද හා අංශ ප්‍රධානීන්ගේ නාම ලේඛනය …………………………………………… 4

02 වන පරිච්ඡේදය - 2025 වසරේ ප්‍රගතිය
2.1 මූල්‍ය කාර්ය සාධනය ………………………………………………………………… 7
2.2 බදු ආදායම උපදවන ප්‍රමුඛ භාණ්ඩ වර්ග පනහ (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක අනුව) …. 9

03 වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්ය සාධනය
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ………………………………………………………… 10
3.2 මූල්‍ය තත්ව ප්‍රකාශය ………………………………………………………………… 11
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ……………………………………………………………… 12
3.4 ආදායම එකතු කිරීම පිළිබඳ කාර්ය සාධනය ……………………………………….. 13
3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය …………………………… 14
3.6 2025 වර්ෂයේ වැය ශීර්ෂයට හරවීම් විස්තර …………………………………………… 14
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ……………………………………… 14
3.8 විගණකාධිපති වාර්තාව ……………………………………………………………… 14

04 වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක
4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක ……………………………………………………... 15

05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ……………………………………... 15

06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය …………………………………………………………… 18
6.2 මානව සම්පත් සංවර්ධනය ……………………………………………………………… 18

07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව
7.1 අනුකූලතා වාර්තාව ………………………………………………………………….. 28

08 වන පරිච්ඡේදය – දෙපාර්තමේන්තුවේ අංශවල කාර්ය සාධනය
8.1 බලාත්මක කිරීමේ පර්ෂදය
8.1.1 නිවාරණ අංශය ………………………………………………………………………. 37
8.1.2 මධ්‍යම බුද්ධි අංශය …………………………………………………………………. 39
8.1.3 මධ්‍යම විමර්ශන අංශය ……………………………………………………………… 42
8.1.4 මධ්‍යම අපහරණ අංශය ……………………………………………………………… 44
8.1.5 සමාජ ආරක්ෂණ අංශය ……………………………………………………………… 49
මත්ද්‍රව්‍ය පාලන ඒකකය …………………………………………………………… 49
පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය …………………………………………….. 55
ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ………………………… 60
වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය ………………………………… 64

8.2 ආදායම් හා සේවා පර්ෂදය
8.2.1 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය ……………………………………………………… 79
8.2.2 ප්‍රකාශන අංශය ……………………………………………………………………… 82
දිගු කාමරය ……………………………………………………………………… 83
මෝටර් වාහන ඒකකය ……………………………………………………………… 84
“ඩී” ශාඛාව ……………………………………………………………………….. 84

8.2.3 මධ්‍යම මිල පිරික්සුම් අංශය ………………………………………………………… 90
8.2.4 ආදායම් හා සේවා (කටුනායක) අංශය ………………………………………………… 94
8.2.5 කර්මාන්ත හා සේවා අංශය ………………………………………………………… 97
8.2.6 ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය ………………………………………… 100

8.3 ආයතනික පර්ෂදය
8.3.1 ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ………………………………………………. 103
8.3.2 විශේෂිත සේවා අංශය ………………………………………………………………… 110
භාණ්ඩ වර්ගීකරණ ඒකකය ……………………………………………………….. 110
රේගු රසායනාගාර ඒකකය …………………………………………………….. 111
මැණික් ඒකකය ……………………………………………………………….. 111
බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක/ එකතු කළ අගය මත බදු ඒකකය (TIN/VAT Unit) …. 113
8.3.3 අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය ………………………………………………… 115
8.3.4 මගී සේවා (කොළඹ) අංශය ……………………………………………………. 122
8.3.5 මගී සේවා (කටුනායක) අංශය ……………………………………………………….. 127

8.4 ඩිජිටල්කරණ පර්ෂදය
8.4.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ………………………………………… 133
8.4.2 අවදානම් කළමනාකරණ අංශය ……………………………………………………….. 136
8.4.3 නීති කටයුතු අංශය ………………………………………………………………… 155
8.4.4 අපනයන අංශය ……………………………………………………………………. 157
8.4.5 ආදායම් සහ සේවා (පළාත්) අංශය ……………………………………………………….. 159

8.5 මානව සම්පත් පර්ෂදය
8.5.1 මානව සම්පත් කළමනාකරණ අංශය ………………………………………………….. 167
8.5.2 මානව සම්පත් සංවර්ධන අංශය ……………………………………………………….. 170
8.5.3 සේවා සැපයුම් අංශය ………………………………………………………………. 175
8.5.4 කාර්ය මණ්ඩල සේවා අංශය ……………………………………………………………….. 179

8.6 සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පවතින අංශ
8.6.1 ආදායම් අධීක්ෂණ අංශය ……………………………………………………….. 183
8.6.2 අභියාචනා අංශය ………………………………………………………………….. 187
8.6.3 මූල්‍ය අංශය ……………………………………………………………………….. 188
8.6.4 පද්ධති සහ ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය ………………………………………… 196
8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය ……………………………………………….. 198
8.6.6 අභ්‍යන්තර කටයුතු ඒකකය ……………………………………………………… 200

වගු


| | පිටු අංකය |
|---|---|
| **5.1** වගුව **:** තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ දායකත්වය | 15 |
| බලාත්මක කිරීමේ පර්ෂදය | |
| **8.1.1** නිවාරණ අංශය | |
| 8.1.1.1 වගුව : 2025 වර්ෂය තුළ දී ආදායම රැස්කිරීම | 37 |
| **8.1.2** මධ්‍යම බුද්ධි අංශය | |
| 8.1.2.1 වගුව: කාර්යසාධනය - 2025 | 40 |
| 8.1.2.2 වගුව **:** රඳවාගත් බහාළුම් සහ **BRAC/ FCCU** මෙහෙයුම් පිළිබඳ තොරතුරු | 41 |
| **8.1.3** මධ්‍යම විමර්ශන අංශය | |
| 8.1.3.1 වගුව : ආදායම රැස්කිරීමේ කාර්යසාධනය - 2025 | 42 |
| **8.1.4** මධ්‍යම අපහරණ අංශය | |
| 8.1.4.1 වගුව: සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව | 44 |
| 8.1.4.2 වගුව : ටෙන්ඩර අලෙවි මගින් සිදු කරන ලද අයකර ගැනීම් **- 2025** | 45 |
| 8.1.4.3 වගුව **:** ආපසු නොගෙවන තැන්පතු මගින් අයකර ගැනීම් | 47 |
| 8.1.4.4 වගුව **:** විනාශ කිරීම් සඳහා ඉල්ලීම් **- 2025** | 47 |
| **8.1.5** සමාජ ආරක්ෂණ අංශය | |
| 8.1.5.1 වගුව : මත්ද්‍රව්‍ය හසුකරගැනීම් - 2025 | 49 |
| 8.1.5.2 වගුව : ස්ථානය අනුව මත්ද්‍රව්‍ය හසුකර ගැනීම පිළිබඳ තොරතුරු | 50 |
| 8.1.5.3 වගුව **:** මාසික මත්ද්‍රව්‍ය හසුකර ගැනීම් **- 2025** | 52 |
| 8.1.5.4 වගුව **:** කාර්යසාධනය **- 2025** | 58 |
| 8.1.5.5 වගුව **: 2025** වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය **(SLSI)** විසින් ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ | 59 |
| 8.1.5.6 වගුව **:** සමස්ත සිද්ධි සංඛ්‍යාලේඛන සැසඳීම | 62 |
| 8.1.5.7 වගුව **: 2025** වර්ෂයේ ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශයේ ප්‍රධාන අත්අඩංගුවට ගැනීම් **- 2025** | 62 |
| 8.1.5.8 වගුව : රැස්වීම්, පුහුණු වැඩසටහන්, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අනෙකුත් සහයෝගීතාවයන් **- 2025** | 63 |
| 8.1.5.9 වගුව : **2024** සහ **2025** වර්ෂවලදී අයකරගත් ආදායම | 66 |
| 8.1.5.10 වගුව : විමර්ශන සිද්ධීන්හි තත්ත්වය හා අයකර ගැනීම් **- 2025** | 66 |
| 8.1.5.11 වගුව : යාත්‍රා අතිකාල අධීක්ෂණය **- 2025** | 67 |
| ආදායම් හා සේවා පර්ෂදය | |
| **8.2.1** මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය | |
| 8.2.1.1 වගුව **:** කාර්ය සාධනය **- 2025** | 80 |
| **8.2.2** ප්‍රකාශන අංශය | |
| 8.2.2.1 වගුව **:** කාර්ය සාධනය **- 2025** | 85 |
| 8.2.2.2 වගුව **: 2025** වර්ෂය සඳහා ආදායම රැස් කිරීම | 87 |
| 8.2.2.3 වගුව **:** කටයුතු කරන ලද රේගු සටහන්කර - 2025 | 88 |
| **8.2.3** මධ්‍යම මිල පිරික්සුම් අංශය | |
| 8.2.3.1 වගුව**:** කටයුතු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව **-2025** | 90 |
| 8.2.3.2 වගුව : ආදායම රැස්කිරීම සැසඳීම | 91 |
| 8.2.3.3 වගුව **:** මිල පිරික්සුම් කාර්යසාධනය (ගුවන් භාණ්ඩ) **- 2025** | 92 |
| 8.2.3.4 වගුව : කාර්යසාධනය | 93 |
| **8.2.4** ආදායම් හා සේවා (කටුනායක) අංශය | |
| 8.2.4.1 වගුව : කාර්යසාධනය (ආනයන) – 2025 | 95 |
| **8.2.5** කර්මාන්ත හා සේවා අංශය | |
| 8.2.5.1 වගුව**:** EFU- TIEP ඒකකයේ කාර්යසාධනය | 98 |
| 8.2.5.2 වගුව**:** බන්ධිත ගුදම් මෙහෙයුම් | 99 |
| **8.2.5.3** වගුව**:** තැපැල් තක්සේරු ඒකකයේ කාර්යසාධනය | 99 |
| **8.2.6** ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය | |
| 8.2.6.1 වගුව **:** කාර්යසාධනය **- 2025** | 100 |

| | |
|---|---|
| ආයතනික පර්ෂදය | |
| **8.3.1** ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය | |
| 8.3.1.1 වගුව: **2025** වර්ෂය තුළ පළකරන ලද දෙපාර්තමේන්තු නියෝග **(DOPL)** | 104 |
| 8.3.1.2 වගුව: රේගු අන්‍යෝන්‍ය පරිපාලන සහායක ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ ශ්‍රී ලංකා රේගුවට අදාල අනෙකුත් ගිවිසුම් | 107 |
| 8.3.1.3 වගුව: තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කාර්යසාධනය | 109 |
| **8.3.2** විශේෂිත සේවා අංශය | |
| 8.3.2.1 වගුව : භාණ්ඩ වර්ගීකරණ ඒකකයේ කාර්යසාධනය | 110 |
| 8.3.2.2 වගුව : රේගු රසායනාගාර ඒකකයේ කාර්යසාධනය | 111 |
| 8.3.2.3 වගුව : මැණික් ඒකකයේ කාර්යසාධනය | 111 |
| 8.3.2.4 වගුව : අපනයන (වටිනාකම) | 112 |
| 8.3.2.5 වගුව : ආනයන ( වටිනාකම) | 113 |
| 8.3.2.6 වගුව : ආයතන වර්ග අනුව ආනයනකරු/අපනයනකරු ලියාපදිංචි කිරීම / සක්‍රිය කිරීම | 114 |
| 8.3.2.7 වගුව : රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචි කිරීමේ ඒකකයේ (CHA Unit) කාර්යසාධනය | 114 |
| **8.3.3** අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය | |
| 8.3.3.1 වගුව : පශ්චාත් නිෂ්කාශන විගණන අංශයේ කාර්ය සාධනය - 2025 | 118 |
| 8.3.3.2 වගුව : කාර්යසාධනය සැසඳීම | 118 |
| 8.3.3.3 වගුව : පශ්චාත් විගණන සිද්ධි සැසඳීම | 119 |
| 8.3.3.4 වගුව : ආදායම රැස්කිරීම සැසඳීම | 119 |
| 8.3.3.5 වගුව : ලියාපදිංචි කරන ලද සහ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 120 |
| 8.3.3.6 වගුව : ආපසු ගෙවූ හිමිකම්වල තත්ත්වය | 120 |
| **8.3.4** මගී සේවා (කොළඹ) අංශය | |
| 8.3.4.1 වගුව : කාර්යසාධනය **- UPB** ගුදම් | 122 |
| 8.3.4.2 වගුව : **2025** වර්ෂයේ ආදායම රැස්කිරීමේ සාරාංශය | 125 |
| 8.3.4.3 වගුව : වෙළඳ පහසුකරණය යටතේ කාර්යසාධනය | 126 |
| **8.3.5** මගී සේවා (කටුනායක) අංශය | |
| 8.3.5.1 වගුව : ආදායම එකතු කිරීම - 2025 | 128 |
| 8.3.5.2 වගුව : **2025** වර්ෂයේ හසුකර ගැනීම් | 128 |
| 8.3.5.3 වගුව : 2025 වර්ෂයේ දී මගීන් සඳහා සපයන ලද සේවාවන් | 129 |
| 8.3.5.4 වගුව : ආදායම රැස්කිරීම සැසඳීම | 129 |
| ඩිජිටල්කරණ පර්ෂදය | |
| **8.4.1** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය | |
| 8.4.1.1 වගුව: කාර්යසාධන දත්ත - 2025 | 134 |
| **8.4.2** අවදානම් කළමනාකරණ අංශය | |
| 8.4.2.1 වගුව: විමර්ශනවල ජයග්‍රහණ **- 2025** | 139 |
| 8.4.2.2 වගුව: **2025** ක්‍රියාකාරී සැලැස්මට අනුව අවදානම් කළමනාකරණ අංශයේ කාර්ය සාධනය | 141 |
| **8.4.3** නීති කටයුතු අංශය | |
| 8.4.3.1 වගුව: වර්තමාන කාර්ය මණ්ඩලය | 155 |
| 8.4.3.2 වගුව: ප්‍රගති සමාලෝචනය **- 2025** | 156 |
| **8.4.4** අපනයන අංශය | |
| 8.4.4.1 වගුව: ආදායම රැස්කිරීම – 2025 | 157 |
| **8.4.5** ආදායම් හා සේවා (පළාත්) අංශය | |
| 8.4.5.1 වගුව: **2025** වර්ෂයේ ආදායම රැස්කිරීම | 160 |
| 8.4.5.2 වගුව: මගී පහසුකම් සැලසීම | 161 |
| 8.4.5.3 වගුව: පාරිසරික හා සමාජ ආරක්ෂණය | 162 |
| මානව සම්පත් පර්ෂදය | |
| **8.5.2** මානව සම්පත් සංවර්ධන අංශය | |
| 8.5.2.1 වගුව: වර්තමාන සේවක සංඛ්‍යාව | 171 |
| 8.5.2.2 වගුව: දේශීය පුහුණු වැඩසටහන් සඳහා රේගු කාර්යමණ්ඩලයේ සහභාගිත්වය (ආයතනය තුළ සහ බාහිරව) | 172 |
| 8.5.2.3 වගුව: **2025** වර්ෂය තුළ පවත්වනලද විදේශ පුහුණු වැඩසටහන් වර්ග | 172 |
| 8.5.2.4 වගුව: විදේශ සමුළු/සම්මන්ත්‍රණ/පුහුණු වැඩසටහන් සඳහා සහභාගිත්වය (ශ්‍රේණි අනුව) | 173 |

| | |
|---|---|
| 8.5.2.5 වගුව: **2025** CHA/WA සහතිකපත් පාඨමාලා විභාගයේ සාරාංශය - 01 වන සහ 02 වන කණ්ඩායම් | 173 |
| **8.5.3** සේවා සැපයුම් අංශය | |
| 8.5.3.1 වගුව: අයවැය යෝජනාවල ප්‍රගතිය - 2025 | 175 |
| 8.5.3.2 වගුව: 2025 වර්ෂයේදී වෙන්කළ ප්‍රතිපාදන තුළ සම්පූර්ණ කරන ලද ප්‍රධාන කාර්යයන් | 176 |
| **8.5.4** කාර්ය මණ්ඩල සේවා අංශය | |
| 8.5.4.1 වගුව: විනය කළමනාකරණය | 179 |
| 8.5.4.2 වගුව: විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 179 |
| 8.5.4.3 වගුව: පාර්ලිමේන්තු ප්‍රශ්ණ සහ ප්‍රශ්ණමාලා සඳහා පිළිතුරු සැපයීම | 180 |
| ඍජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පවතින අංශ | |
| **8.6.1** ආදායම් අධීක්ෂණ අංශය | |
| 8.6.1.1 වගුව: 2025 වර්ෂයේ අයකරගැනීම් | 184 |
| **8.6.2** අභියාචනා අංශය | |
| 8.6.2.1 වගුව: ලැබුණු අභියාචනා සංඛ්‍යාව | 187 |
| 8.6.2.2 වගුව : පවත්වන ලද අභියාචනා කමිටු රැස්වීම් සංඛ්‍යාව | 187 |
| 8.6.2.3 වගුව : අවසන් නොවූ අභියාචනා ගොනු | 187 |
| **8.6.3** මූල්‍ය අංශය | |
| 8.6.3.1 වගුව : තථ්‍ය ආදායම එකතු කිරීම සහ වාර්ෂික ඇස්තමේන්තුව සැසඳීම (රු.මි.) | 190 |
| 8.6.3.2 වගුව : වියදම් කළමනාකරණය | 191 |
| 8.6.3.3 වගුව : අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) | 192 |
| 8.6.3.4 වගුව : රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල | 193 |
| 8.6.3.5 වගුව : වැටුප් ගෙවීම | 193 |
| 8.6.3.6 වගුව : රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල /රේගු නිලධාරීන්ගේ වන්දි හා කලමනාකරණ අරමුදල | 194 |
| 8.6.3.7 වගුව : පසුගිය වර්ෂ දෙක සඳහා අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම | 195 |
| 8.6.3.8 වගුව : තැන්පතු ගිණුම් විස්තර | 195 |
| **8.6.4** පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය | |
| 8.6.4.1 වගුව : මෙම අංශයේ අනුකූලතා වාර්තාව | 196 |
| **8.6.5** නිෂ්පාදන බදු අංශය (විධිවිධාන විශේෂ) | |
| 8.6.5.1 වගුව: නිෂ්පාදන බදු අදාල වන අයිතම සහ **2024** වර්ෂය තුළ රැස්කරන ලද ආදායම (දේශීය) | 199 |
| 8.6.5.2 වගුව : නිෂ්පාදන බදු ආදාල වන අයිතම සහ **2025** වර්ෂය තුළ රැස්කරන ලද ආදායම (දේශීය) | 199 |
| **8.6.6** අභ්‍යන්තර කටයුතු ඒකකය | |
| 8.6.6.1 වගුව : පැමිණිලි සාරාංශය | 201 |

# රූපසටහන්


| බලාත්මක කිරීමේ පර්ෂදය | පිටු අංකය |
|---|---|
| **8.1.1** නිවාරණ අංශය | |
| 8.1.1.1 රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම | 38 |
| 8.1.1.2 රූපසටහන : ආරම්භ කරන ලද සහ අවසන් කරන ලද සිද්ධි සැසඳීම | 38 |
| **8.1.2** මධ්‍යම බුද්ධි අංශය | |
| 8.1.2.1 රූපසටහන : ලැබුණු සහ බෙදාහරින ලද තොරතුරු | 40 |
| 8.1.2.2 රූපසටහන : නීති බලාත්මක කිරීමේ කාර්යසාධනය | 41 |
| **8.1.4** මධ්‍යම අපහරණ අංශ | |
| 8.1.4.1 රූපසටහන: ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව | 45 |
| 8.1.4.2 රූපසටහන : ටෙන්ඩර අලෙවි මගින් සිදු කරන ලද අයකර ගැනීම් **- 2025** | 45 |
| 8.1.4.3 රූපසටහන : විකිණුම් ආදායම් ව්‍යාප්තිය | 46 |
| 8.1.4.4 රූපසටහන: ටෙන්ඩර් අලෙවියෙන් ලැබූ ආදායම (රු. මි.) | 46 |
| 8.1.4.5 රූපසටහන : විනාශකිරීම් අවසන් කිරීම් - 2024 සහ 2025 | 47 |
| **8.1.5** සමාජ ආරක්ෂණ අංශය | |
| 8.1.5.1 රූපසටහන : හසුකරගත් මත්ද්‍රව්‍ය බෙදී යාම **- 2025** | 49 |
| 8.1.5.2 රූපසටහන : ස්ථානය අනුව මත්ද්‍රව්‍ය හසු කරගැනීම් වටිනාකම | 50 |
| 8.1.5.3 රූපසටහන : මත්ද්‍රව්‍ය හසුකර ගැනීම **-** පැමිණි ප්‍රධාන රටවල් **10** | 51 |
| 8.1.5.4 රූපසටහන : මාසික හසුකරගැනීම් ප්‍රවණතා (ප්‍රමාණය ග්‍රෑම් වලින්) | 51 |
| 8.1.5.5 රූපසටහන සිද්ධි සංයුතිය - 2025 | 59 |
| 8.1.5.6 රූපසටහන: අත්අඩංගුවට ගත් භාණ්ඩ | 62 |
| 8.1.5.7 රූපසටහන: රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/ අලෙවියෙන් ලද මුදල (රු. මි.) | 66 |
| 8.1.5.8 රූපසටහන : යාත්‍රා අතිකාල අධීක්ෂණය | 67 |
| ආදායම් හා සේවා පර්ෂදය | |
| **8.2.2** ප්‍රකාශන අංශය | |
| **8.2.2.1** රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම (රු.මි.) | 88 |
| 8.2.2.2 රූපසටහන : කටයුතු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව සැසඳීම | 89 |
| **8.2.3** මධ්‍යම මිල පිරික්සුම් අංශය | |
| 8.2.3.3 රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම | 91 |
| 8.2.3.4 රූපසටහන : මිල පිරික්සුම් (ගුවන් භාණ්ඩ) **-** රැස්කළ A/E (රු.මි) | 92 |
| ආයතනික පර්ෂදය | |
| **8.3.2** විශේෂිත සේවා අංශය | |
| 8.3.2.1 රූපසටහන : අයකරගත් තීරුබදු සහ වෙනත් බදු - මැණික් ඒකකය | 112 |
| 8.3.2.2 රූපසටහන : අපනයන | 112 |
| 8.3.2.3 රූපසටහන: ආනයන | 113 |
| **8.3.3** අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය | |
| 8.3.3.1 රූපසටහන: ආදායම රැස්කිරීම සැසඳීම | 119 |
| 8.3.3.2 රූපසටහන : ලියාපදිංචි කරන ලද සහ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව සැසඳීම | 120 |
| 8.3.3.3 රූපසටහන : ආපසු ගෙවූ හිමිකම් සැසඳීම | 121 |
| **8.3.4** මගී සේවා (කොළඹ) අංශය | |
| 8.3.4.1 රූපසටහන: මුළු අයකරගැනීම් සැසඳීම (රු.මි.) | 125 |
| **8.3.5** මගී සේවා (කටුනායක) අංශය | |
| 8.3.5.1 රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම (රු. බි.) | 129 |
| ඩිජිටල්කරණ පර්ෂදය | |
| **8.4.5** ආදායම් හා සේවා (පළාත්) අංශය | |
| 8.4.5.1 රූපසටහන : ආදායම සැසඳීම | 162 |

# 01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

වර්ෂ 1806 දී ස්ථාපිත ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකාවේ පැරණිතම රජයේ දෙපාර්තමේන්තු වලින් එකක් මෙන්ම ලෝකයේ පැරණිතම රේගු පරිපාලන ව්‍යුහයක් ද වේ. එය ආදායම එකතු කිරීම සහ නීතිය බලාත්මක කිරීම සඳහා මූලිකවම වගකිව යුතු පූර්ණ බලයලත් රාජ්‍ය ආයතනයක් වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

"ශක්තිමත් දේශ සීමාවන් හරහා ආරක්ෂිත හා සමෘද්ධිමත් දේශයක් "

මෙහෙවර

"ආදායම සුරක්ෂිත කිරීමත්, පරිසරය හා සමාජය ආරක්ෂා කිරීමත්, බාධක රහිත වෙළඳ හා සංචාරක ප්‍රවාහයක් ප්‍රවර්ධනය කිරීමත් සඳහා සුපිළිපන්භාවය සහ වෘත්තීයභාවය සහිත ලොව පළමු පෙළ රේගු සේවාවක් සැපයීම "

ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන අරමුණු

**I.** ආදායම රැස්කිරීම

ශ්‍රී ලංකාවේ ආදායම් රැස්කිරීමේ කාර්යය ඉටු කරනු ලබන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා රේගුව, රාජ්‍ය බදු ආදායමෙන් 50% කට අධික ප්‍රමාණයක් රැස් කිරීමේ වගකීම දරයි.

**II**. සමාජ ආරක්ෂණය

නීති විරෝධී මත්ද්‍රව්‍ය හා අනෙකුත් හානිකර භාණ්ඩ වර්ග රට තුළට පැමිණීම සහ රටේ ජෛව සම්පත් සහ පුරාවස්තු ඇතුළු වටිනා සම්පත් රටින් පිටකිරීමේ ජාවාරම් කටයුතු වළකාලන පළිහක් ලෙස ක්‍රියාත්මක වෙමින්, ශ්‍රී ලංකා රේගුව ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරයි. ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් අනූන රටක් බැවින්, ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය, ශ්‍රී ලාංකේය ජාතිය වෙනුවෙන් මෙම උරුමයන් රැක දෙනු වස් අප්‍රතිහත කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතන අතර රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය විසින් ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

**III**. වෙළඳාම සඳහා පහසුකම් සැළසීම

1993 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුවේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමත් සමඟ රේගු ක්‍රියා පටිපාටි සරල කිරීම සඳහා පියවර කිහිපයක්ම හඳුන්වා දීමට මංපෙත් විවර වූ අතර, අවදානම් කළමනාකරණ පද්ධතිය ආරම්භ කිරීම, තනි කවුළු ක්‍රමය හඳුන්වා දීම සහ රේගු ක්‍රියා පටිපාටි යථාවත් කිරීම මගින් ආර්ථිකය තුළ වෙළඳ කටයුතු වලට ගතවන කාලය සහ පිරිවැය ඉතිරි කර ගැනීමට පැහැදිලිවම දායක විය. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුම අනුමත කිරීමෙන් පසුව ශ්‍රී ලංකා රේගුව එහි ක්‍රියා පටිපාටිවල හා නීතිමය රාමුවේ කැපී පෙනෙන වෙනස්කම් සිදු කරමින් තවදුරටත් වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ කටයුතු සිදු කරමින් ඉදිරියට යයි.

**IV**. නීති බලාත්මක කිරීම

අනුකූලතාවය සහතික කිරීම, ආනයන/අපනයන නීති බලාත්මක කිරීම, හොර බඩු ජාවාරම් වැළැක්වීම සහ දේශසීමා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කිරීම ඉතා වැදගත්ය. නීති 125කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමේ බලය ශ්‍රී ලංකා රේගුව සතුය.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීති වලට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ආනයන හා අපනයන රේගු බදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- අනෙකුත් පනත් සහ රාජ්‍ය ආයතන වෙනුවෙන් තීරු බදු/බදු සහ අනෙකුත් ගාස්තු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- තීරු බදු ඉවත් කිරීම්, බදු නිදහස් කිරීම්, බදු සහන ( ලබාදීම) ක්‍රියාත්මක කිරීම.
- තීරු බදු සහ අනෙකුත් ගාස්තු ආරක්ෂා කරගැනීම සහ ගිණුම්කරණය.
- රේගු බදු ආපසු ගෙවීම්, බදු සහන සහ වට්ටම් ලබාදීම.
- නීති විරෝධී භාණ්ඩ ජාවාරම, වාණිජ වංචා සහ මත්ද්‍රව්‍ය ජාවාරම් අනාවරණය හා නිවාරණය.
- තහනම් කරන ලද සහ සීමා කරන ලද භාණ්ඩ වලට අදාළ නීති බලාත්මක කිරීම.
- රේගු නීති සහ අනෙකුත් අදාළ නීති යටතේ වැරදි පිළිබඳ විමර්ශනය කිරීම හා පරීක්ෂණ පැවැත්වීම.
- වැරදිකරුවන්ට දණ්ඩන පැනවීම/ රාජසන්තක භාණ්ඩ භාරයට ගැනීම.
- රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම.
- ආනයන අපනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීම.
- මගීන් සහ මගී ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- භාණ්ඩ සහ මගී නිෂ්කාශන ක්‍රියාපටිපාටි පරිගණකගත කිරීම.
- දේශීය කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ගනු ලබන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- අපනයන සඳහා පහසුකම් සැලසීමේ ක්‍රමවේද කළමනාකරණය කිරීම.
- භාණ්ඩ ගුදම්ගත කිරීම කළමනාකරණය කිරීම (බන්ධිත ගුදම් ක්‍රමවේදය).
- අපනයන අරමුණු කරගත් කර්මාන්ත ක්‍රියාවලි අධීක්ෂණය කිරීම.
- වෙළඳ සංඛ්‍යාලේඛන රැස්කිරීම හා නිකුත් කිරීම.
- තොරතුරු හා වර්ගීකරණය කිරීමේ තීරණ යනාදිය සැපයීම.
- වාණිජ මණ්ඩල-නිෂ්කාශන නියෝජිතයින්-රේගු මූලස්ථාන අනු නියෝජිතයින් සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීම/සම්බන්ධීකරණය.
- පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- නාමකරණය, වර්ගීකරණය, මිළ පිරික්සුම් කිරීම සහ බලාත්මක කිරීමේ ශිල්පීය ක්‍රමවේදයන්ට අදාළ කරුණු පිළිබඳව ලෝක රේගු සංවිධානය සමඟ අඛණ්ඩව තොරතුරු හුවමාරු කරගැනීම.
- තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රේඛීය ආයතන, රජයේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම : (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය සහ සුරාබදු දෙපාර්තමේන්තුව යනාදිය.)

## 1.4 සංවිධාන ව්‍යුහය

- **රේගු අධ්‍යක්ෂ ජනරාල් (රේ.අ.ජ.)**
  - **අති.රේ.අ.ජ. (බලාත්මක කිරීමේ පර්ෂදය)**
    - රේගු අධ්‍යක්ෂ - සමාජ ආරක්ෂණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - නිවාරණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - මධ්‍යම විමර්ශන අංශය
    - රේගු අධ්‍යක්ෂ - මධ්‍යම බුද්ධි අංශය
    - රේගු අධ්‍යක්ෂ - මධ්‍යම අපහරණ අංශය
  - **අති.රේ.අ.ජ. (ආදායම් හා සේවා පර්ෂදය)**
    - රේගු අධ්‍යක්ෂ - ප්‍රකාශන අංශය
    - රේගු අධ්‍යක්ෂ - කර්මාන්ත හා සේවා අංශය
    - රේගු අධ්‍යක්ෂ - මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - ආදායම් හා සේවා (කටුනායක) අංශය
    - රේගු අධ්‍යක්ෂ - ආයෝජන මණ්ඩල (BOI) සම්බන්ධීකරණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - මධ්‍යම මිල පිරික්සුම් අංශය
  - **අති.රේ.අ.ජ. (ආයතනික පර්ෂදය)**
    - රේගු අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය
    - රේගු අධ්‍යක්ෂ - විශේෂිත සේවා අංශය
    - රේගු අධ්‍යක්ෂ - මගී සේවා (කටුනායක) අංශය
    - ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ - මගී සේවා (කොළඹ) අංශය
  - **අති.රේ.අ.ජ. (මානව සම්පත් පර්ෂදය)**
    - රේගු අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - මානව සම්පත් සංවර්ධන අංශය
    - රේගු අධ්‍යක්ෂ - සේවා සැපයුම් අංශය
    - රේගු අධ්‍යක්ෂ - කාර්ය මණ්ඩල සේවා අංශය
  - **අති.රේ.අ.ජ. (ඩිජිටල් පරිවර්තන පර්ෂදය)**
    - රේගු අධ්‍යක්ෂ - ආදායම් හා සේවා (පළාත්) අංශය
    - රේගු අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - අපනයන අංශය
    - රේගු අධ්‍යක්ෂ - අවදානම් කලමනාකරණ අංශය
    - රේගු අධ්‍යක්ෂ - නීති කටයුතු අංශය
  - **ප්‍රධාන මූල්‍ය නිලධාරී**
    - අධ්‍යක්ෂ - මූල්‍ය අංශය
  - රේගු අධ්‍යක්ෂ - ආදායම් අධීක්ෂණ අංශය (RTF)
  - රේගු අධ්‍යක්ෂ - අභියාචනා අංශය
  - අධ්‍යක්ෂ - පද්ධති සහ ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය
  - රේගු අධ්‍යක්ෂ - අභ්‍යන්තර කටයුතු අංශය
  - අධ්‍යක්ෂ - සංඛ්‍යාලේඛන අංශය
  - අධ්‍යක්ෂ - නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

**කෙටි යෙදුම් :**

**අති.රේ.අ.ජ. - අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්**

## 1.5 පර්ෂද හා අංශ ප්‍රධානීන්ගේ නාම ලේඛනය
**(**2025.12.31 දිනට**)**

**එස්.පී. අරුක්ගොඩ මහතා**
**රේගු අධ්‍යක්ෂ ජනරාල්**

**එච්.ඩබ්.එස්.පී. කරුණාරත්න මිය**
**අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)**

**සී.එස්.ඒ.චන්ද්‍රසේකර මහතා**
**අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික)**

**ඒ.ඩබ්.එස්.අයි. සිල්වා මහතා**
**අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ඩිජිටල් පරිවර්තන)**

**එල්.කේ.එච්.ඩී.කේ. ආරේවත්ත මහතා**
**අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (බලාත්මක)**

**ටී.ලෝගනාදන් මහතා**
**අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)**

**එම්.ආර්.ජී.ඒ.බී. මුතුකුඩේ මහතා**
**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

**එම්.ජී.එන්. ප්‍රේමතිලක මිය**
**ප්‍රධාන ගණකාධිකාරී**

**ජේ.එච්. ප්‍රනාන්දු මිය**
**අධ්‍යක්ෂ (ප්‍රධාන අභ්‍යන්තර විගණක)**

**එස්.ඒ.ටී.බී. සුරවීර මහතා**
**ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කොළඹ)**

**ඒ.එම්.එල්.කේ. අලහකෝන් මහතා**
**රේගු අධ්‍යක්ෂ (අභියාචනා)**

**පී.එන්.පී.පී. ප්‍රේමරත්න මහතා**
**රේගු අධ්‍යක්ෂ (ආදායම් අධීක්ෂණ අංශය - RTF)**

**එම්.ඒ.එම්. නාසීර් මහතා**
**රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)**

**ඒ.ඒ.ඩී.සී. ශාන්තප්‍රිය මහතා**
**රේගු අධ්‍යක්ෂ (අනුකූලතා සහ පහසුකම් සැපයීම්)**

**ආර්.එල්. වීරසේකර මහතා**
**රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කටුනායක)**

**ආර්.ඩී.ආර්.පෙරේරා මහතා**
**රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්)**

**පී.එම්.එස්. උදයකාන්ත මහතා**
**රේගු අධ්‍යක්ෂ (අපනයන)**

**කේ.කේ.ඩී.සී. රණවීර මිය**
**රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)**

**අයි.යූ.කේ.ටී. ජයවර්ධන මහතා**
**රේගු අධ්‍යක්ෂ (මධ්‍යම අපහරණ)**

**ජී.එච්.එන්. ජගත් මහතා**
**රේගු අධ්‍යක්ෂ (ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ)**

**බී.ඩී.ටී. පෙරේරා මිය**
**රේගු අධ්‍යක්ෂ (මිල පිරික්සුම්)**

**සී.පී.ජී. පුංචිහේවා මහතා**
**රේගු අධ්‍යක්ෂ (නිවාරණ අංශය)**

**ඊ. පටුවතවිතාන මිය**
**රේගු අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සේවා)**

**සී.ඩී. ලියනගේ මිය**
**රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)**

**එස්.ඩී. අබේසේකර මිය**
**රේගු අධ්‍යක්ෂ (පළාත්)**

**එම්.ඩබ්.ආර්. තිසේරා මහතා**
**රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)**

**එච්.එම්.සී.කේ. හේරත් මයා**
**රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - කටුනායක)**

**පී.වී.එම්. ප්‍රනාන්දු මහතා**
**රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)**

**ඩී.ඒ.ටී.ආර්. වර්ණකුලසූරිය මහතා**
**රේගු අධ්‍යක්ෂ (අවදානම් කළමනාකරණ)**

**කේ.යූ.ඩී. සේනාරත්න මහතා**
**රේගු අධ්‍යක්ෂ (මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ)**

**ඩබ්.ආර්.පී. වික්‍රමරත්න මහතා**
**රේගු අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන තාක්ෂණ)**

**ඩබ්.කේ.ඒ.පී.සී. අබේසිංහ මහතා**
**රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි)**

**එල්.අයි.එන්. පෙරේරා මහතා**
**රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)**

**පී. විජේනායක මිය**
**රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු) (රාජකාරී ආවරණ)**

**ජේ.ඒ.කේ.කේ. ප්‍රදීප් මහතා**
**රේගු අධ්‍යක්ෂ (මධ්‍යම විමර්ශන)**

**ඩබ්.ඒ.එස්. කුමාර මහතා**
**රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, සැලසුම් සහ පර්යේෂණ)**

**ඊ. පටුවතවිතාන මිය**
**රේගු අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු) (වැ.බ.)**

**කේ.ඒ.එස්. කොඩිකාර මිය**
**අධ්‍යක්ෂ (සංඛ්‍යාලේඛන)**

# 02 වන පරිච්ඡේදය : 2025 වර්ෂයේ ප්‍රගතිය

## 2.1 මූල්‍ය කාර්යසාධන

### 2.1.1 ආදායම් රැස්කිරීම

(රු.මි.)

| ආදායම් කේතය | විස්තරය | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | තත්‍ය | ඇස්තමේන්තුගත | තත්‍ය |
| 1001.01.00 | ආනයන තීරුබදු | 175,000 | 111,147 | 240,000 | 275,894 |
| 1001.02.00 | අපනයන තීරුබදු | 35 | 27 | 32 | 18 |
| 1001.03.00 | IECD බලපත්‍ර ගාස්තු | - | - | - | 42 |
| 1001.04.00 | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 175,000 | 170,014 | 177,000 | 180,853 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 58,000 | 79,133 | 87,700 | 88,728 |
| 1001.05.02 | අපනයන සෙස් බදු | 2,000 | 1,995 | 2,300 | 1,644 |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 95,000 | 115,199 | 145,000 | 164,599 |
| 1002.05.01 | නිෂ්පාදන බදු - සිගරට් | 143,000 | 117,145 | 100,000 | 101,173 |
| 1002.05.03 | පෙට්‍රල් සහ ඩීසල් | 135,000 | 200,200 | 180,000 | 240,575 |
| 1002.05.04 | මෝටර් වාහන | 30,000 | 58,562 | 396,000 | 471,751 |
| 1002.05.99 | වෙනත් | 5,000 | 8,039 | 12,000 | 12,120 |
| 2003.07.10 | වාහන හිමිකම් බදු | 165 | 240 | 1,400 | 2,260 |
| 2003.02.17 | ඇඟලුම් අලෙවිය මත බදු | - | 121 | - | 103 |
| 2003.03.01 | දඩ සහ රාජසන්තක කිරීම් | - | 8,024 | - | 5,415 |
| | **රේගු ආදායම් එකතුව** | **818,200** | **869,846** | **1,341,432** | **1,545,175** |
| 2004.04.02 | ආර්ථික සේවා ගාස්තු | - | 201 | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැඟීමේ බදු | - | 8 | - | 407 |
| 1002.01.04 | ආනයන මත එකතු කළ අගය මත බදු | 660,000 | 597,493 | 820,000 | 891,390 |
| 1002.16.00 | සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 55,000 | 64,392 | 70,000 | 72,614 |
| 1003.01.00 | සුඛෝපභෝගී වාහන බදු | - | 2,772 | - | 52,048 |
| 2003.02.99 | විවිධ | - | 297 | - | 383 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | - | 122 | - | 129 |
| | **අනෙකුත් ආදායම් එකතුව** | **715,000** | **665,285** | **890,000** | **1,016,971** |
| | | | | | |
| | **මුළු ආදායම් එකතුව** | **1,533,200** | **1,535,131** | **2,231,432** | **2,562,146** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 2.1.2 රේගු ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

(රු.මි.)

| ආදායම් කේතය | විස්තරය | 2025 | |
|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | සත්‍ය |
| 1001.01.00 | ආනයන තීරුබදු | 240,000 | 275,894 |
| 1001.02.00 | අපනයන තීරුබදු | 32 | 18 |
| 1001.03.00 | IECD බලපත්‍ර ගාස්තු | - | 42 |
| 1001.04.00 | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 177,000 | 180,853 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 87,700 | 88,728 |
| 1001.05.02 | අපනයන සෙස් බදු | 2,300 | 1,644 |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 145,000 | 164,599 |
| 1002.05.01 | නිෂ්පාදන බදු - සිගරට් | 100,000 | 101,173 |
| 1002.05.03 | පෙට්‍රල් සහ ඩීසල් | 180,000 | 240,575 |
| 1002.05.04 | මෝටර් වාහන | 396,000 | 471,751 |
| 1002.05.99 | වෙනත් | 12,000 | 12,120 |
| 2003.07.10 | වාහන හිමිකම් බදු | 1,400 | 2,260 |
| 2003.02.17 | ඇඟලුම් අලෙවිය මත බදු | - | 103 |
| 2003.03.01 | දඩ සහ රාජසන්තක කිරීම් | - | 5,415 |
| | **රේගු ආදායම් එකතුව** | **1,341,432** | **1,545,175** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 2.1.3 අනෙකුත් ආයතන සඳහා ආදායම් එකතු කිරීම

(රු.මි.)

| ආදායම් කේතය | විස්තරය | 2025 | |
|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | සත්‍ය |
| 2004.04.02 | ආර්ථික සේවා ගාස්තු | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බදු | - | 407 |
| 1002.01.04 | ආනයන මත එකතුකළ අගය මත බදු | 820,000 | 891,390 |
| 1002.16.00 | සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 70,000 | 72,614 |
| 1003.01.00 | සුඛෝපභෝගී වාහන බදු | - | 52,048 |
| 2003.02.99 | විවිධ | - | 383 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | - | 129 |
| | **අනෙකුත් ආදායම් මුළු එකතුව** | **890,000** | **1,016,971** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 2.2 බදු ආදායම උපදවන ප්‍රමුඛ භාණ්ඩ වර්ග පනහ (සංයෝජිත වර්ගීකරණ කේතාංක අනුව) -2025
**(දේශීය භාවිතය සඳහා ආනයන (CPC 4XXX))**

| අංකය | සංයෝජිත වර්ගීකරණ | සමස්ත බදු මුදල (රු.) |
|---|---|---|
| 1 | 87032169 | 215,950,209,819 |
| 2 | 27101221 | 200,486,629,845 |
| 3 | 27101942 | 124,589,069,797 |
| 4 | 87034035 | 119,231,782,966 |
| 5 | 87032370 | 62,866,351,091 |
| 6 | 87112010 | 60,836,635,674 |
| 7 | 87036035 | 59,200,521,430 |
| 8 | 87032250 | 54,223,263,294 |
| 9 | 04022100 | 53,594,120,120 |
| 10 | 87032450 | 48,447,368,166 |
| 11 | 87042191 | 42,442,920,036 |
| 12 | 87038073 | 26,662,977,321 |
| 13 | 87038032 | 26,140,447,383 |
| 14 | 87032154 | 22,547,465,375 |
| 15 | 85171390 | 18,186,923,194 |
| 16 | 27111910 | 18,181,686,164 |
| 17 | 87033350 | 17,640,215,177 |
| 18 | 87032359 | 17,588,388,675 |
| 19 | 17019910 | 15,075,839,955 |
| 20 | 87021039 | 14,673,513,627 |
| 21 | 72071110 | 13,885,339,782 |
| 22 | 87032192 | 13,709,325,448 |
| 23 | 87036071 | 13,688,480,565 |
| 24 | 17019920 | 13,109,290,000 |
| 25 | 15119030 | 12,658,668,945 |
| | | |

| අංකය | සංයෝජිත වර්ගීකරණ | සමස්ත බදු මුදල (රු.) |
|---|---|---|
| 26 | 10019910 | 12,611,551,749 |
| 27 | 07019000 | 12,399,043,959 |
| 28 | 27101970 | 12,136,591,077 |
| 29 | 27101980 | 12,037,098,322 |
| 30 | 25231000 | 12,026,337,416 |
| 31 | 27011900 | 11,961,002,757 |
| 32 | 23040000 | 11,716,900,121 |
| 33 | 15131910 | 10,927,226,181 |
| 34 | 72259200 | 10,454,008,306 |
| 35 | 72107000 | 10,147,409,681 |
| 36 | 69072190 | 10,034,614,202 |
| 37 | 31021000 | 9,985,432,257 |
| 38 | 27101222 | 9,699,486,071 |
| 39 | 10063029 | 8,496,451,690 |
| 40 | 15132900 | 8,033,638,407 |
| 41 | 15121900 | 7,623,769,192 |
| 42 | 87034051 | 7,573,157,946 |
| 43 | 27101941 | 7,387,504,400 |
| 44 | 87038031 | 7,210,867,250 |
| 45 | 40111090 | 7,105,554,652 |
| 46 | 84713090 | 7,074,837,738 |
| 47 | 87034053 | 7,017,947,168 |
| 48 | 87034071 | 6,543,770,084 |
| 49 | 27090010 | 6,476,900,934 |
| 50 | 10059000 | 6,429,813,338 |
| | | **1,518,728,348,747** |

*මූලාශ්‍රය : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

# 03 වන පරිච්ඡේදය : සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | සත්‍ය 2025 රු. | සත්‍ය 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| 689,400,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 827,879,417,517 | 384,185,605,203 | ඒසීඒ-1 |
| 652,032,000,000 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 711,736,495,968 | 477,515,177,039 | |
| 380,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 5,517,344,922 | 8,144,941,146 | |
| **1,341,812,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,545,133,258,408** | **869,845,723,388** | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 5,550,695,221 | 3,901,521,056 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 75,756,604,951 | 60,334,893,327 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් (අත්තිකාරම් බී) | | 71,708,726 | 71,347,314 | ඒසීඒ-5 |
| | අත්තිකාරම් ගිණුම් (අරාබ) | | 1,593,007 | 14,297,354 | |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 51,150,087 | 710,500 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **81,431,751,992** | **64,322,769,551** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,626,565,010,400** | **934,168,492,939** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **31,371,988,766** | **29,090,204,532** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,595,193,021,634** | **905,078,288,407** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 3,016,540,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,911,816,231 | 2,308,694,777 | |
| 1,679,900,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,207,382,247 | 1,358,126,846 | ඒසීඒ-2(ii) |
| 22,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 18,681,878 | 19,196,997 | |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 827,488 | |
| **4,719,040,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **4,137,880,356** | **3,686,846,108** | |
| | මූලධන වියදම් | | | | |
| 374,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 34,376,589 | 34,804,862 | |
| 1,455,288,755 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 307,241,063 | 428,809,345 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 360,000 | හැකියා වර්ධනය | 14 | 358,800 | 211,579 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| **1,830,548,755** | **මුළු මූලධන වියදම් (උ)** | | **341,976,452** | **463,825,786** | |
| | තැන්පතු ගෙවීම් | | 67,548,986,835 | 55,040,543,108 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් (අත්තිකාරම් බී ගිණුම) | | 81,214,151 | 57,472,759 | ඒසීඒ-5 |
| | අත්තිකාරම් ගෙවීම් (අරාබ) | | 7,370,501 | 10,751,834 | |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **67,637,571,487** | **55,108,767,701** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **72,117,428,296** | **59,259,439,595** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **1,523,075,593,338** | **845,818,848,812** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **1,523,075,593,338** | **845,818,848,812** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |

## 3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
**2025 දෙසැම්බර් 31 දිනට**

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 16,791,439,945 | 16,502,082,202 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 213,589,498 | 198,306,580 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **17,005,029,443** | **16,700,388,782** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (45,936,452,575) | (37,744,117,378) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 16,791,439,945 | 16,502,082,202 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 46,150,042,073 | 37,942,423,957 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **17,005,029,443** | **16,700,388,782** |

පිටු අංක 7 සිට 30 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 31 සිට 43 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
තනතුර : ලේකම්,
මුදල්,ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
දිනය :2026.02.24

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

..............................
ගණන්දීමේ නිලධාරී
නම : එස්.පී.අරුක්ගොඩ
තනතුර : රේගු අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2026.02.20

එස්.පී. අරුක්ගොඩ
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
කොළඹ 11

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එම්.ආර්.ජී.ඒ.බී.මුතුකුඩේ
දිනය :2026.02.20

එම්.ආර්.ජී.ඒ.බී. මුතුකුඩේ
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලංකා රේගුව
කොළඹ 11

2

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ඒසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | 1,514,708,833,852 | 830,478,634,566 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 5,517,344,922 | 8,144,941,146 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 1,017,187,626,967 | 665,375,197,155 |
| අග්‍රිම ලැබීම් | 5,550,695,221 | 3,901,521,056 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අත්තිකාරම් බී ගිණුම | 79,855,034 | 84,574,225 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අරාබ අත්තිකාරම් ගිණුම | 1,593,007 | 14,297,354 |
| තැන්පතු ලැබීම් | 75,756,604,951 | 60,334,893,327 |
| වර්ගු මුල්‍ය පාලන ගිණුම් | 52,464,186,973 | 7,772,069,824 |
| විවිධ ලැබීම් | 55,784,603 | 123,563,310 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,671,322,525,530** | **1,576,229,691,963** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 4,137,616,895 | 3,665,274,535 |
| සහනාධාර සහ මාරුකිරීම් | 18,681,878 | 19,196,997 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 8,253,398,438 | 8,015,337,534 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,549,240,224,033 | 1,489,736,824,047 |
| අත්තිකාරම් ගෙවීම - අත්තිකාරම් බී ගිණුම | 80,838,746 | 60,256,009 |
| අත්තිකාරම් ගෙවීම - අරාබ අත්තිකාරම් ගිණුම | 7,370,501 | 10,751,834 |
| තැන්පතු ගෙවීම් | 67,548,986,835 | 55,040,543,108 |
| වර්ගු මුල්‍ය පාලන ගිණුම | 41,525,697,490 | 18,785,730,933 |
| විවිද ගෙවීම් | 202,469,651 | 437,479,168 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,671,015,284,467** | **1,575,771,394,165** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **307,241,063** | **458,297,798** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| නිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 307,241,063 | 458,297,798 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **307,241,063** | **458,297,798** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(307,241,063)** | **(458,297,798)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 ආදායම එකතු කිරීම පිළිබඳ කාර්යසාධනය - 2025

### 3.4.1 රේගු ආදායම් කේත සඳහා එකතු කරන ලද ආදායම්

(රු.මි.)

| ආදායම් කේතය | විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | එකතු කරන ලද ආදායම |
|---|---|---|---|
| 1001.01.00 | ආනයන තීරු බදු | 240,000 | 275,894 |
| 1001.02.00 | අපනයන තීරු බදු | 32 | 18 |
| 1001.03.00 | IECD බලපත්‍ර ගාස්තු | - | 42 |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 177,000 | 180,853 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 87,700 | 88,728 |
| 1001.05.02 | අපනයන සෙස් බදු | 2,300 | 1,644 |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 145,000 | 164,599 |
| 1002.05.01 | නිෂ්පාදන බදු - සිගරට් | 100,000 | 101,173 |
| 1002.05.03 | පෙට්‍රල් සහ ඩීසල් | 180,000 | 240,575 |
| 1002.05.04 | මෝටර් වාහන | 396,000 | 471,751 |
| 1002.05.99 | අනෙකුත් | 12,000 | 12,120 |
| 2003.07.10 | වාහන හිමිකම් බදු | 1,400 | 2,260 |
| 2003.02.17 | ඇඟළුම් අලෙවිය මත බදු | - | 103 |
| 2003.03.01 | දඩ සහ රාජසන්තක කිරීම් | - | 5,415 |
| | මුළු රේගු ආදායම | **1,341,432** | **1,545,175** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 3.4.2 අනෙකුත් ආයතන සඳහා එකතු කරන ලද ආදායම්

(රු.මි.)

| ආදායම් කේතය | විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | එකතු කරන ලද ආදායම |
|---|---|---|---|
| 2004.04.02 | ආර්ථික සේවා ගාස්තු | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බදු | - | 407 |
| 1002.01.04 | ආනයන මත එකතුකල අගය මත බදු | 820,000 | 891,390 |
| 1002.16.00 | සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 70,000 | 72,614 |
| 1003.01.00 | සුඛෝපභෝගී වාහන බදු | - | 52,048 |
| 2003.02.99 | විවිධ | - | 383 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | - | 129 |
| | මුළු අනෙකුත් ආදායම් එකතුව | **890,000** | **1,016,971** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

(රු.මි)

| විස්තරය | වියදම් කළමනාකරණය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2025 | | |
| | ඇස්තමේන්තුගත | තත්‍ය | භාවිතා කළ % | ඇස්තමේන්තුගත | තත්‍ය | භාවිතා කළ % |
| පුනරාවර්තන | 3,878 | 3,684 | 95% | 4,719 | 4,138 | 88% |
| ප්‍රාග්ධන | 594 | 459 | 77% | 1,830 | 342 | 19% |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 55 | 32 | 58% | 55 | 55 | 100% |
| එකතුව | **4,527** | **4,175** | **92%** | **6,604** | **4,535** | **69%** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 3.6 2025 වර්ෂයේ වැය ශීර්ෂයට හරවීම් විස්තර

| ගිණුම් කේතය | ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රමාණය |
|---|---|---|---|
| 247-1-1-0-1003-4/11 | 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 2,034,510.00 |
| 247-1-1-0-1302-0/11 | 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 178,999.27 |
| 247-1-1-0-2001-0/11 | 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 1,667,264.71 |
| 247-1-1-0-2001-0/11 | 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 2,929,058.65 |
| 247-1-1-0-2001-0/11 | 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 1,571,233.27 |
| 247-1-1-0-2001-0/11 | 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය | 7,935,905.98 |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ('000)

| වත්කම් කේතය | කේතයේ විස්තරය | මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව 2024.12.31 දිනට ශේෂය | මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව 2025.12.31 දිනට ශේෂය | ඉදිරියේ දී ගිණුම් තැබීමට ඇති | ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 7,046,369.00 | 7,046,369.00 | - | 100% |
| 9152 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 5,048,748.00 | 5,205,849.00 | - | 100% |
| 9153 | ඉඩම් | 4,272,560.00 | 4,272,660.00 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 50,910.00 | 183,067.00 | - | 100% |
| 9155 | ජෛවීය වත්කම් | - | - | - | - |
| 9160 | සිදු කෙරෙමින් පවතින කාර්යයන් | 83,495.00 | 83,495.00 | - | 100% |
| 9180 | කල්බදු වත්කම් | - | - | - | 100% |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1- ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

## 04 වන පරිච්ඡේදය : කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක
(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| නියමිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% -74% |
| ආදායම එකතු කිරීම | X | | |
| සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග | X | | |
| වෙළඳ පහසුකරණ ක්‍රියාමාර්ග | X | | |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව*

## 05 වන පරිච්ඡේදය : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ශ්‍රී ලංකා රේගුව තම ආයතනික කාර්යයන් හරහා සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන තිරසර සංවර්ධන අරමුණු

**SDG 4** - සැමට එක හා සමාන සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

**SDG 8** - අඛණ්ඩ, සැමට ප්‍රතිලාභ හිමිවන සහ තිරසර ආර්ථික වර්ධනයක්, පූර්ණ සහ ඵලදායී සේවා නියුක්තිය සහ ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

**SDG 9** - සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, සැමට ප්‍රතිලාභ හිමිවන සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනය දිරිගැන්වීම.

**SDG 12** - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

**SDG 15** - භූගෝලීය පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම සහ තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණය වැළැක්වීම, භූමි හායනය නැවැත්වීම සහ නැවත යථා තත්ත්වයට පත් කිරීම සහ ජෛව විවිධත්වයට හානි වීම නැවැත්වීම.

**SDG 16** - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඒකරාශී වූ සමාජයන් ප්‍රවර්ධනය කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගවීම් සහිත සෑම දෙනා ඇතුළත් වූ ආයතන ගොඩනැගීම.

**SDG 17** - තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාවය නැවත පණ ගැන්වීම සහ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම.

**5.1 වගුව : තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ දායකත්වය**

| උපායමාර්ගික ඉලක්කය | අරමුණ | ළඟාකර ගැනීමට නියමිත තිරසර සංවර්ධන අරමුණ (SDG) | ළඟාකර ගැනීමට නියමිත තිරසර සංවර්ධන ඉලක්කය (SDG) | සාක්ෂාත්කර ගැනීම් දර්ශකය | මේ දක්වා ළඟාකරගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 1. ආදායම උපරිම කිරීම | 1.1 නියමිත ආදායම එකතු කිරීම | SDG 17 | 17.1 | ශක්තිමත් කරන ලද දේශීය සම්පත් උපයෝජනය | | | X |
| | | SDG 16 | 16.6 | වගවීමෙන් යුතු ඵලදායී ආයතනයක් බිහිවීම | | | X |

| උපායමාර්ගික ඉලක්කය | අරමුණ | ළඟාකර ගැනීමට නියමිත තිරසර සංවර්ධන අරමුණ (SDG) | ළඟාකර ගැනීමට නියමිත තිරසර සංවර්ධන ඉලක්කය (SDG) | සාක්ෂාත්කර ගැනීම් දර්ශකය | මේ දක්වා ළඟාකරගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| | 1.2 අපතේ යාම් වැළැක්වීම | SDG 16 | 16.4 | අවම කරන ලද දූෂණ හා නීති විරෝධී මූල්‍ය ප්‍රවාහ | | | X |
| | | | 16.6 | ඉහළ නංවන ලද විනිවිදභාවය සහ කාර්යක්ෂමතාවය | | | X |
| | | SDG 17 | 17.1 | වැඩි දියුණු කරන ලද ආදායම් පරිපාලනය | | | X |
තවද, මෙම ඒකකය නව මුදල් ප්‍රකාශ කිරීමේ (currency declaration) අවශ්‍යතා හඳුන්වා දීමේ අවසන් අදියරේ පවතින අතර ත්‍රස්තවාදය, ත්‍රස්තවාදය සඳහා අරමුදල් සැපයීම සහ විනාශකාරී ක්‍රියා සඳහා අරමුදල් සැපයීමට අදාළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල තීරණ දෙපාර්තමේන්තු නියෝග (Departmental Orders) මගින් ක්‍රියාත්මක කිරීමද සිදු කරමින් පවතී. එයට සමගාමීව, මූල්‍ය අපරාධ පාලන ඒකකය විසින් ඉදිරියට පැවැත්වීමට නියමිත APG අන්‍යෝන්‍ය ඇගයීම අපේක්ෂාවෙන් පූර්ව පියවර කිහිපයක්ද ගෙන ඇත. AML/CFT/CPF සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විමර්ශන සහ ධාරිතා සංවර්ධන කාර්යයන් සියල්ල මූල්‍ය අපරාධ පාලන ඒකකය යටතේ සිදු කෙරෙන අතර එය බුද්ධි තොරතුරු හා නීති ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණ භූමිකාව තුළ ඉටු කරන CI වලට වඩා වෙනස් වේ.

### 8.1.2.2 කාර්යසාධනය

| | |
|---|---|
| **PIRD** මගින් ලැබූ තොරතුරු සංඛ්‍යාව | 100 |
| අනෙකුත් ප්‍රභව මගින්  (ෆැක්ස්, ලිපි,පුවත්) - පුද්ගලික | 26 |
| එකතුව | **126** |
| ක්‍රියා කිරීම සඳහා අනෙකුත් අංශ සඳහා බෙදාහරින ලද බුද්ධි තොරතුරු සංඛ්‍යාව | 109 |

**8.1.2.1** රූපසටහන **:** ලැබුණු සහ බෙදාහරින ලද තොරතුරු




*මූලාශ්‍රය: මධ්‍යම බුද්ධි අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.2.1** වගුව **: කාර්යසාධනය - 2025**

**RILO/WCO** වෙතින් ලැබුණු බුද්ධි අනතුරු ඇඟවීම් සංඛ්‍යාව

| | |
|---|---|
| **RILO/ WCO CEN** අනතුරු ඇඟවීම් | 4 |

අනෙකුත් අංශ වලට බෙදාහරින ලද පෙර වැරදි විස්තර සංඛ්‍යාව

| | |
|---|---|
| **POD** වාර්තා සංඛ්‍යාව | 742 |

**CSI** මෙහෙයුම**3**

| | |
|---|---|
| පරිලෝකනය කරනලද බහාළුම් සංඛ්‍යාව | 504 |

**nCEN** දත්ත පද්ධතිය

| | |
|---|---|
| දත්ත පද්ධතියට වලංගු කරන ලද සිද්ධි සංඛ්‍යාව | 3,584 |

දේශීය සහ විදේශීය විමර්ශන සහ බුද්ධි නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම

| නියෝජිතායතනය | යවනු ලැබූ ඉල්ලීම් සංඛ්‍යාව | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව |
|---|---|---|
| DRI | 10 | 6 |
| RILO | 11 | 7 |
| අනෙකුත් නියෝජිතායතන | 10 | 9 |

නීතිය බලාත්මක කිරීමේ කාර්යසාධනය

| | |
|---|---|
| **eCCR** පද්ධතියේ ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | 85 |
| අයකර ගනු ලැබූ මුළු ආදායම රු. | 268,465,774 |

*මූලාශ්‍රය: මධ්‍යම බුද්ධි අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.2.2 රූපසටහන : නීති බලාත්මක කිරීමේ කාර්යසාධනය**




*මූලාශ්‍රය: මධ්‍යම බුද්ධි අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.2.2 වගුව : රඳවාගත් බහාළුම් සහ BRAC/ FCCU මෙහෙයුම් පිළිබඳ තොරතුරු**

| රඳවාගත් බහාළුම් | අ. ප්‍රවර්තන වර්ෂය **(2025)** | ආ. පෙර වර්ෂය **(2024)** | ඇ. පසුගිය වර්ෂ **(2023 සහ පෙර)** |
|---|---|---|---|
| කාල සීමාව ආරම්භයේ ශේෂය | - | 8 | 22 |
| කාල සිමාව තුළ රඳවාගනු ලැබූ බහාළුම් සංඛ්‍යාව | 39 | අදාළ නොවේ | අදාළ නොවේ |
| කාල සීමාව තුළනිදහස් කරන ලද බහාළුම් සංඛ්‍යාව | 28 | 1 | 2 |
| කාල සීමාව අවසානයේ ශේෂය | 11 | 7 | 20 |

| **BRAC මෙහෙයුම්** | **2025** |
|---|---|
| ක්‍රියාත්මක තත්වයේ ඇති හඳුනාගත් ඉලක්ක (Known Targets) සංඛ්‍යාව | 432 |
| ක්‍රියාත්මක තත්වයේ ඇති හඳුනානොගත් ඉලක්ක පැතිකඩ (Unknown Target Profiles) සංඛ්‍යාව | 1 |
| කාල සීමාව තුළ හසුකර ගන්නා ලද හඳුනාගත් ඉලක්ක සංඛ්‍යාව | 208 |
| කාල සීමාව තුළ හසුකර ගන්නා ලද හඳුනා නොගත් ඉලක්ක සංඛ්‍යාව | - |
| BIA වෙත දැනුම් දෙන ලද ඉලක්ක සංඛ්‍යාව | 3,620 |

| **FCCU මෙහෙයුම්** | **2025** |
|---|---|
| දේශීය නියෝජිතායතන සමග අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව | 7 |
| FIU වෙතින් ලැබුණු STR සංඛ්‍යාව | 3 |
| FIU වෙත බෙදාහරින ලද STR සංඛ්‍යාව | 3 |
| අනෙකුත් නීති බලාත්මක කිරීමේ නියෝජිතායතන වෙතින් ලැබුණු යොමු කිරීම් සංඛ්‍යාව | 0 |
| අනෙකුත් නීති බලාත්මක කිරීමේ නියෝජිතායතන වෙත බෙදාහරින ලද යොමු කිරීම් සංඛ්‍යාව | 2 |

*මූලාශ්‍රය: මධ්‍යම බුද්ධි අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.1.3 මධ්‍යම විමර්ශන අංශය

### 8.1.3.1 ප්‍රධාන අරමුණු

නීති විරෝධී වෙළඳාම වැළැක්වීම සඳහා බලාත්මක කටයුතු ශක්තිමත් කිරීම, පැහැරහරින ලද බදු ආපසු අයකර ගැනීම, සහ දඩ හා රාජසන්තක කිරීම් ආදායම් ලෙස එකතු කිරීම මධ්‍යම විමර්ශන අංශයේ මූලික අරමුණුවලට ඇතුළත් වේ. මෙයට අමතරව රඳවාගත් භාණ්ඩ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, නිලධාරින්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම, සහ අවි ගබඩාව, සුරක්ෂිතාගාරය, ලේඛනාගාර, සහ CIB සිර මැදිරිය වැනි වැදගත් පහසුකම් ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා පවත්වාගෙන යාම ද මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

### 8.1.3.2 ක්‍රියාත්මක කරන ලද උපායමාර්ග

මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවාගැනීම සඳහා මධ්‍යම විමර්ශන අංශය මගින් විවිධ උපායමාර්ග අනුගමනය කර ඇත.ඒවා නම්:

- අනාගත බදු පැහැර හැරීම් අවම කිරීම සඳහා බදු ගෙවීම් පැහැර හරින්නන් හඳුනාගැනීම සහ පාලනය කිරීම.
- අවභාවිතයට සහ වංචා සිදුකිරීම සඳහා අවකාශ ඇති රේගු ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම.
- අහිමි වී ඇති ආදායම විමර්ශන සහ දණ්ඩන හරහා අයකර ගැනීම.
- භාණ්ඩ නිෂ්කාශනය සහ ආදායම් උත්පාදනය කඩිනම් කිරීම සඳහා අංගන අවකාශය කළමනාකරණය විධිමත් කිරීම.
- වෘත්තීය සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ඉගෙනුම් සංස්කෘතියක් ඇති කිරීම
- රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා ආරක්ෂිත ගබඩා පරිසරයක් සහතික කිරීම.
- ගොනු නැවත ලබා ගැනීම සහ කළමනාකරණය සඳහා ලේඛනාගාරය සංවිධානය කිරීම.

### 8.1.3.3 ප්‍රධාන කාර්යයන්

විමර්ශන, පරිපාලනය, වාර්තා කිරීම, CCR පද්ධති කළමනාකරණය, බැංකු ඇපකර කළමනාකරණය කිරීම සහ සහායක කාර්යයන් ලෙස වර්ගීකරණය කර ඇති කාර්යයන් පරාසයක් මධ්‍යම විමර්ශන අංශය මගින් ඉටුකරනු ලැබේ.
රේගු නීති බලාත්මක කිරීම, ආදායම රැස් කිරීම උපරිම කිරීම, සහ එහි සියලුම මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවයේ සහ වගවීමේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම විමර්ශන අංශය කැපවී සිටී.

### 8.1.3.4 ආදායම රැස්කිරීමේ කාර්යසාධනය

**2025** වර්ෂයේදී මධ්‍යම විමර්ශන අංශය මගින් රු. **936,744,713.76** ක ආදායමක් අයකරගෙන ඇත. එම මුදල අයකරගෙන ඇත්තේ රේගු විමර්ශන **107** ක් අළුතින් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම මගිනි.

ඉලක්කය : ආදායම උපරිම කරගැනීම

අරමුණු : ආදායම අහිමිවීම් වැළැක්වීම

උපායමාර්ගය :

- රේගු පාලන යාන්ත්‍රණ ශක්තිමත් කිරිම
- පශ්චාත් නිෂ්කාශන විගණන පාලන ශක්තිමත් කිරීම
- නිරීක්ෂණ සහ පරීක්ෂා කිරීම් ක්‍රියාවලි වැඩි දියුණු කිරීම
- සිදුවිය හැකි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම
- අන්තර්- නියෝජිතායතන සහයෝගීතාවය ශක්තිමත් කිරීම

**8.1.3.1** වගුව : ආදායම රැස්කිරීමේ කාර්යසාධනය - **2025**

| | 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලද සිද්ධි මගින් සිදුකරන ලද අයකර ගැනීම් (රු.) | 2025 වර්ෂයට පෙර ආරම්භ කරන ලද සිද්ධි මගින් සිදුකරන ලද අයකර ගැනීම් (රු.) |
|---|---|---|
| දඩ | 47,537,500.00 | 4,100,000.00 |
| රාජසන්තක කිරීම් | 344,157,600.00 | 498,975,000.00 |
| විකිණුම් ආදායම | 7,991,915.00 | 41,182,698.24 |
| එකතුව | **399,687,015.00** | **544,257,698.24** |

*මූලාශ්‍රය: මධ්‍යම විමර්ශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

බහාළුම්/වාහන

| | |
|---|---|
| 2025 වර්ෂය තුළදී රේගු ක්‍රියාවලීන් සම්පූර්ණ කළ පසුව නිදහස් කරන ලද බහාළුම් සංඛ්‍යාව | 90 |
| 2025 වර්ෂය තුළදී රේගු ක්‍රියාවලීන් සම්පූර්ණ කළ පසුව නිදහස් කරන ලද වාහන සංඛ්‍යාව | 35 |

හසුකර ගැනීම්

| | |
|---|---|
| වසර තුළ ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව | 107 |
| වසර තුළ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 27 |
| අවසන් නොවූ සිද්ධි සංඛ්‍යාව | 80 |

### 8.1.3.5 විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ පරිවර්තනය

අරමුණු : මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරිම
උපාය මාර්ගය : පුහුණුව සහ උපදේශනය සඳහා සංවිධාන රාමුවක් සකස් කිරිම.

2025 වර්ෂයේ දී හසුකර ගැනීම්, විමර්ශන, නඩු පැවරීමේ ක්‍රම සහ රේගු විමර්ශන මත පදනම් වූ පශ්චාත් නිෂ්කාශන විගණන පරීක්ෂණ පිළිබඳව පුහුණුවීම් සැපයීමට මධ්‍යම විමර්ශන අංශයට හැකිවිය. ඇතැම් පුහුණු පවත්වන ලද්දේ මධ්‍යම විමර්ශන අංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසිනි.
මේ අතර මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරන ලද අනෙකුත් පුහුණු සඳහා සහභාගී වීමේ අවස්ථාව ද මධ්‍යම විමර්ශන අංශයේ කාර්ය මණ්ඩලයට ලබාදෙන ලදී.

අරමුණු : ගතික ආයතනික සංවර්ධනය සහ සම්පත් ප්‍රශස්ථකරණය සහතික කිරීම
උපායමාර්ගය : විද්‍යාත්මක සම්පත් කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරිම මගින් සම්පත් වෙන් කිරිම ප්‍රශස්තකරණය කිරිම

මෙම ඉලක්කයට සහාය වීම සඳහා ක්‍රියාකාරකම් කිහිපයක්ම හඳුනාගෙන ඇත. ප්‍රධාන සහායක කාර්යය වන්නේ ආයුධ ගබඩාව සහ මධ්‍යම විමර්ශන අංශයේ සුරක්ෂිතාගාරය (vault) පවත්වාගෙන යාමයි . ඒ යටතේ අවි, පතරොම්, රන්, රිදී සහ මුදල් වැනි වටිනා ද්‍රව්‍ය ගබඩා කිරීම සහ අවශ්‍ය වන විට නිදහස් කිරීම සිදු කරයි. එය වසර පුරා අඛණ්ඩව සිදු කරනු ලබන කාර්යයක් වේ. මධ්‍යම විමර්ශන අංශයට අයත් සිද්ධි වාර්තා සඳහා ප්‍රවේශ හැකියාව සහතික කිරීම සහ අවසන් කරන ලද සිද්ධි වාර්තා සුරක්ෂිත කිරීම සඳහා ලේඛනාගාරය සහ ලේඛන ක්‍රමවත්ව පවත්වා ගැනීමට කටයුතු සිදු කරන ලදී .

රේගු සිද්ධි ලියාපදිංචි කිරීම සහ අයකිරීම් ඇතුළු දැනුම් පාදක විමර්ශනයන් සිදුකිරීම සඳහා ශක්තිමත් පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් යුතුව e-CCR යෙදුම නවීකරණය කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය හරහා කමිටුවක් පත්කර කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය මෙතෙක් සම්පූර්ණ කර නොමැති වුවද මෙමගින් මධ්‍යම විමර්ශන අංශයේ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ඒකාබද්ධ කැපවීම මගින් සැළකිය යුතු ප්‍රගතියක් ද 2025 වර්ෂයේ දී අත්පත්කරගෙන ඇත.

## 8.1.4 මධ්‍යම අපහරණ අංශය

### 8.1.4.1 හැඳින්වීම

අදාල අභ්‍යන්තර සහ බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් රාජසන්තක කරන ලද/ අත්හැර දමන ලද භාණ්ඩ සම්බන්ධයෙන් සියලු අපහරණයන් මධ්‍යගතව සිදුකිරීම සඳහා නව අංශයක් ලෙස 2019 වසරේදී මධ්‍යම අපහරණ අංශය (CDD) ස්ථාපිත කරන ලදී.

### 8.1.4.2 ප්‍රධාන කාර්යයන්

- ටෙන්ඩර් අලෙවි පැවැත්වීම
- අලෙවි කළ නොහැකි භාණ්ඩ විනාශ කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරි පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පවත්වනු ලබන ටෙන්ඩර/වෙන්දේසි වල RMV e Facilitation හි මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා ඒවා සම්බන්ධ කිරීම

### 8.1.4.3 නීති හා රෙගුලාසි

1. රේගු ආඥාපනතේ 16 වන වගන්තිය - ආනයනය සහ අපනයනය සිදුවන නිශ්චිත වේලාව පිළිබඳ අර්ථ දැක්වීම
2. රේගු ආඥාපනතේ පනතේ 109 වන වගන්තිය - දින තිහක් තුළ නිෂ්කාශනය කර නොගත් භාණ්ඩ විකිණීමට ඇති බලය
3. රේගු ආඥාපනතේ පනතේ 154 වන වගන්තිය - අත්අඩංගුවට ගත් භාණ්ඩ පිලිබඳව මාසයක් තුළ දී හිමිකම් පෑමක් නොකළහොත්, නුසුදුසු බවට ප්‍රකාශ කොට ඒ අනුව ක්‍රියා කළ යුතු බව
4. රේගු ආඥාපනතේ පනතේ 162 වන වගන්තිය - අල්වා ගැනීමෙන් පසු නීති විරෝධී බව ප්‍රකාශ කල බඩු හා නැව් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා නියම කරන ආකාරයට සුදුස්සක් කළ යුතු බව
5. අංක 2016/06 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය
6. 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත
7. 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත
8. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරි පනත (39/39 6)/84/(84(2)/84(3) වගන්ති )
9. 1979 අංක 31 දරන මෝටර් රථ ප්‍රවාහන පනත
10. 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත
11. 1980 අංක 26 දරන ආහාර පනත
12. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
13. 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත
14. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත
15. 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත
16. 1942 අංක 31 දරන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත
17. 1947 අංක 08 දරන වනාන්තර පනත
18. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත
19. 2015 අංක 05 දරන ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත

### 8.1.4.4 කාර්යසාධනය

8.1.4.1 වගුව : සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව

| ටෙන්ඩර කාණ්ඩය | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| සාමාන්‍ය | 11 | 12 | 13 |
| වාහන | 11 | 12 | 13 |
| විශේෂ | 06 | 5 | 6 |
| **එකතුව** | **28** | **29** | **32** |

*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

2025 වර්ෂයේදී මධ්‍යම අපහරණ අංශය මගින් සාමාන්‍ය ටෙන්ඩර් 13ක්, වාහන ටෙන්ඩර් 13ක්, සහ විශේෂ ටෙන්ඩර් 6ක් අන්තර්ගතවන පරිදි සමස්ත ටෙන්ඩර් අලෙවි 32 ක් සිදුකර තිබේ. වාර්ෂික ටෙන්ඩර් විකිණුම් සමාලෝචනය කිරීමේදී මධ්‍යම අපහරණ අංශය විසින් 2023 වර්ෂයේදී 28ක්ද 2024 වර්ෂයේදී 29ක්ද

සිදුකර ඇති අතර තවද **2025** වර්ෂයේදී මධ්‍යම අපහරණ අංශය මගින් ටෙන්ඩර් අලෙවි **32** ක් සිදු කර ඇති අතර එම අගය වාර්ෂික සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව වන **24**ට වඩා ඉහළ අගයකි.

**8.1.4.1** රූපසටහන : ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව




*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.4.2** වගුව : ටෙන්ඩර අලෙවි මගින් සිදු කරන ලද අයකර ගැනීම් - **2025**

| කාණ්ඩය | උපයන ලද අයකර ගැනීම් (රු.) | ප්‍රතිශතය |
|---|---|---|
| සාමාන්‍ය | 2,106,195,851 | 87.49% |
| වාහන | 297,414,619 | 12.35% |
| විශේෂ | 3,825,232 | 0.16% |
| එකතුව | **2,407,435,702** | **100%** |

*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.4.2** රූපසටහන : ටෙන්ඩර අලෙවි මගින් සිදු කරන ලද අයකර ගැනීම් - **2025**




*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**2025** වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර අලෙවි මගින් අයකර ගන්නා ලද මුළු එකතුව රු. **2,407,435,702** කි. සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි මගින් සිදුකරන ලද මුළු අයකිරීම් රු. **2,106,195,851** ක් වූ අතර, එය **2025** වසරේ සමස්ත අයකර ගැනීම් වලින් **87.49** % කි. විශේෂ ටෙන්ඩර සහ වාහන ටෙන්ඩර මගින් අයකර ගැනීම් පිළිවෙලින් **0.16** % සහ **12.35** % කි.

**8.1.4.3 රූපසටහන : විකිණුම් ආදායම් ව්‍යාප්තිය**




*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**විශේෂ සහ සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි යන දෙයාකාරයෙන්ම සාමාන්‍ය භාණ්ඩ අලෙවි කෙරේ. සාමාන්‍ය භාණ්ඩ යටතට ගැනෙන භාණ්ඩවල ප්‍රතිශතාත්මක සංයුතිය ඉහත දැක්වේ.**

**ශුද්ධ අයකර ගැනීම් වලින් 82% ක් වන රත්‍රං සහ වටිනා ද්‍රව්‍ය මගින් සිදුකරන ලද අයකරගැනීම් ටෙන්ඩර් අලෙවියේ මූලික කොටස නියෝජනය කරන අතර අනෙක් සියලු සාමාන්‍ය අයිතම ඉතිරි 18% සඳහා දායකත්වය සපයයි.**

**8.1.4.4** රූපසටහන **:** ටෙන්ඩර් අලෙවියෙන් ලැබූ ආදායම (රු. මි.)




*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**වාහන ටෙන්ඩර් මගින් අයකර ගැනීම් 2024 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැඩිවී ඇති අතර, සාමාන්‍ය ටෙන්ඩර් මගින් අයකර ගැනීම් වසරින් වසර සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.**

### 8.1.4.5 ආපසු නොගෙවන තැන්පතු මගින් අයකර ගැනීම්

ලංසුකරුවන් විසින් ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා ඔවුන්ට නිකුත් කරන ලංසු ලේඛනයක් සඳහා ආපසු නොගෙවන තැන්පතුවක් ලබා ගනී. මධ්‍යම අපහරණ අංශයේ දෙපාර්තමේන්තු නියෝග 1450 (DOPL 1450) මගින් අංක 06/2016 චක්‍රලේඛයට අනුකූලව මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර අලෙවි සඳහා ආපසු නොගෙවන තැන්පතු ප්‍රතිපත්තිය 2020.05.26 දින සිට සංශෝධනය කර ඇත.

8.1.4.3 වගුව : ආපසු නොගෙවන තැන්පතු මගින් අයකර ගැනීම්

| වර්ෂය | අයකරගැනීම්(රු.) | ලංසු ලේඛන සංඛ්‍යාව |
|---|---|---|
| 2023 | 4,720,900 | 3,012 |
| 2024 | 3,291,700 | 2,161 |
| 2025 | 3,667,300 | 2,073 |

*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.1.4.6 විනාශ කිරීම්

කල් ඉකුත් වූ භාණ්ඩ හෝ නියාමන ප්‍රමිතීන්ට අනුකූල නොවන භාණ්ඩ ඇතුළු අලෙවි කළ නොහැකි භාණ්ඩ විනාශ කිරීමට යටත් වේ. අදාල අංශ හෝ බලධරයන්ගේ ඉල්ලීම් මත මධ්‍යම අපහරණ අංශය විසින් මෙම ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසනු ලැබේ.

8.1.4.4 වගුව : විනාශ කිරීම් සඳහා ඉල්ලීම් - 2025

| විනාශ කිරීම් සඳහා ඉල්ලීම් | ලැබුණු | සිදුකරන ලද | සිදුකළ යුතුව ඇති |
|---|---|---|---|
| විවිධ ඉල්ලීම් | 343 | 58 | 285 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉල්ලීම් | 85 | 29 | 56 |
| එකතුව | **428** | **87** | **341** |

*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

8.1.4.5 රූපසටහන : විනාශකිරීම් අවසන් කිරීම් - 2024 සහ 2025




*මූලාශ්‍රය : මධ්‍යම අපහරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

පසුගිය වර්ෂයට වඩා 164%ක කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කරමින් සාර්ථක විනාශ කිරීම් 87ක් සම්පූර්ණ කිරීම මගින් මධ්‍යම අපහරණ අංශය 2025 වර්ෂයේ දී සුවිශේෂී කඩඉමක් සාක්ෂාත් කරගන්නා ලදී.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉල්ලා සිටින ලද විනාශ කිරීම් වලින් 34 % ක් සිදුකරන ලද අතර විවිධ ඉල්ලීම් වලින් 16.90 % ක් නිමකරන ලදී. සිදුකළ යුතුව ඇති විනාශ කිරීම් සඳහා ඇති ප්‍රධාන බාධකය වන්නේ විනාශ කිරීම් සඳහා සුදුසු පාර්ශවයන් පත්කිරීමට ප්‍රමාද වීම සහ තෝරාගත් පාර්ශවයන්ට ඒ සඳහා සහයෝගය දැක්වීමට නොහැකි වීමයි. තෝරාගත්

විකිණුම්කරුවන් අවශ්‍ය නියාමන අනුමැතීන් සාධාරණ කාලසීමාවක් තුළ සපුරා ගැනීමට බොහෝවිට අසමත්වන අතර, එමගින් ව්‍යාපෘති අතහැර දැමීමට සිදුවේ. මෙම ගැටළුව නිරාකරණය කිරීමට මධ්‍යම අපහරණ අංශය විසින් විශේෂිත භාණ්ඩ වර්ග සඳහා පූර්ව අනුමැතිය ලත් විනාශ කිරීම් සිදුකරනු ලබන පාර්ශව සමග දීර්ඝ කාලීන සේවා ගිවිසුම් වලට එළඹීම සිදු කළ යුතුය.

### 8.1.4.7 Vehicle Linking

**2025.03.18** දින රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ලබාදුන් විශේෂ අනුමැතිය අනුව, **2024.11.12** දිනට පෙර භාරගත් වාහනවල තොරතුරු මධ්‍යම අපහරණ අංශය මගින් ඇතුළත් කර සම්බන්ධ කිරීම සිදු කරනු ලැබේ.

- තොරතුරු ඇතුළත් කර සම්බන්ධ කරන ලද මෝටර් වාහන + යතුරු පැදි = **25**

දෙපාර්තමේන්තු නියෝග **1669** අනුව, **2024.11.12** දිනට පසුව බෙදාහැරීම සඳහා බාරගත් වාහන සඳහා ASYCUDA පද්ධතියේ 'නිදහස් කිරීමේ නියෝග' (Release Order) සහ 'අවසර පත්‍රය' (Authorized Pass) පිළිබඳ කාර්යයන් පමණක් මධ්‍යම අපහරණ අංශය මගින් ඉටු කරනු ලැබේ.

- නිදහස් කිරීමේ නියෝග ලබාදුන් මෝටර් වාහන + යතුරු පැදි = **71**

### 8.1.4.8 ශ්‍රී ලංකා වරාය අධිකාරි ටෙන්ඩර් අලෙවි කිරීම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ටෙන්ඩර් අලෙවි කිරීම් පැවැත්වීම කළමනාකරණය කරනු ලබන අතර, මධ්‍යම අපහරණ අංශය මගින් සියලුම අදාළ බදු මුදල් එකතු කිරීම සිදු කරනු ලැබේ.

සහභාගීවන ලද

- ටෙන්ඩර් අලෙවි - 5
- වෙන්දේසි - 7

ලබාදුන් මිල පිරික්සුම්/වර්ගීකරණ සංඛ්‍යාව - 268
එකතු කරන ලද බදු සහ අයකිරීම් - රු. 48,447,515.00

## 8.1.5 සමාජ ආරක්ෂණ අංශය

### 8.1.5.1 මත්ද්‍රව්‍ය පාලන ඒකකය

#### 8.1.5.1.1 විධායක සාරාංශය

ශ්‍රී ලංකා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය (NCU) විසින් **2025** වර්ෂයේ දී වාර්තා කරන ලද මත්ද්‍රව්‍ය අනාවරණය කරගැනීම් දත්ත පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයක් මෙම වාර්තාව මගින් ලබා දෙයි. මෙම දත්ත මගින්, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වෙළඳාමට එරෙහිව සටන් කිරීම සඳහා මත්ද්‍රව්‍ය පාලන ඒකකය විසින් ගනු ලැබූ සුවිශේෂී ප්‍රයත්නයන් නිරූපණය වන අතර වාර්තා වූ සමස්ත සිද්ධි **147**ක දී ඇස්තමේන්තුගත වීදි වටිනාකම රු. 5,886,838,700.00 ක් වූ ග්‍රෑම් **435,215** ක මුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් හසු කරගැනීමට හැකි වී ඇත. මෙම විශ්ලේෂණය මගින් හසුකරගත් මත්ද්‍රව්‍ය වර්ගයන්හි ප්‍රධාන ප්‍රවණතාවන්, හසු කරගත් ප්‍රධාන ස්ථාන, සහ ප්‍රධාන ප්‍රභවස්ථාන රටවල් (countries of origin) හඳුනාගැනීම සිදු කරනු ලැබේ. එය ද්විපාර්ශවික සහයෝගීතාව සහ උපායමාර්ගික මැදිහත් වීම සඳහා වැදගත් වේ.

#### 8.1.5.1.2 සමස්ත හසු කරගැනීම් (Detections) සාරාංශය

**2025** වර්ෂයේ සිදු කරන ලද සමස්ත හසුකරගැනීම්හි ප්‍රතිඵල ලෙස විවිධ වර්ගයේ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සිදු කරන ලදී. සිද්ධි සංඛ්‍යාව සහ ප්‍රමාණයෙන් සළකා බැලූවිට බහුතරය ගංජා සම්බන්ධ සිදුවීම් වන අතර, වටිනාකම සැළකූවිට කොකේන් සහ MDMA හසුකරගැනීම් ද සැළකිය යුතු ප්‍රමාණයක් වේ.

**8.1.5.1 වගුව : මත්ද්‍රව්‍ය හසුකරගැනීම් - 2025**

| මත්ද්‍රව්‍ය වර්ග | සිද්ධි සංඛ්‍යාව | ප්‍රමාණය(ග්‍රෑම්) | වටිනාකම (රු. ) | මුළු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ගංජා (Cannabis) | 101 | 376,360 | 3,902,575,700.00 | 86.5% |
| කොකේන් | 15 | 31,993 | 1,457,870,000.00 | 7.4% |
| MDMA | 12 | 14,660 | 278,195,000.00 | 3.4% |
| මෙතැම්පෙටමින් | 14 | 8,521 | 129,875,000.00 | 2.0% |
| හෙරොයින් | 3 | 3,678 | 114,573,000.00 | 0.8% |
| වෙනත් | 2 | 2 | 3,750,000.00 | <0.1% |
| එකතුව | **147** | **435,215** | **5,886,838,700.00** | **100%** |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.1 රූපසටහන : හසුකරගත් මත්ද්‍රව්‍ය, ප්‍රමාණය අනුව බෙදී යාම - 2025**




*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

දත්ත මගින් පෙන්නුම් කරන පරිදි අත්අඩංගුවට ගත් ප්‍රමාණය අනුව මුළු බරින් 87%ක් කැනබීස් මගින් නියෝජනය වේ. කෙසේවෙතත්, වටිනාකම අනුව සැළකූ විට කොකේන් මගින් සැලකිය යුතු කොටසක් නිරූපණය වන අතර එහි ජාවාරමේ ඉහළ වටිනාකමක් සහිත ස්වභාවය කැපී පෙනේ.

**8.1.5.1.3 : හසුකරගත් ස්ථාන අනුව විශ්ලේෂණය**

හසුකරගත් ස්ථාන විශ්ලේෂණය කිරීම මගින් අනාවරණය වන්නේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) හසුකරගැනීම් සිදු කිරීමේ ඉතාමත් තීරණාත්මක ස්ථානය ලෙස පවතින බවත්, මුළු හසුකරගැනීම් ප්‍රමාණය හා වටිනාකම අනුව විශාලතම කොටස එමගින් නිරූපණය වන බවත්ය. වැඩිම සිද්ධි ප්‍රමාණයක් වාර්තා වන්නේ තැපැල් මාර්ගයෙන් බව පෙනී යන අතර තැපැල හරහා මත්ද්‍රව්‍ය කුඩා ප්‍රමාණවලින් ජාවාරම් කිරීමේ උත්සාහයන් විශාල ප්‍රමාණයක් පවතින බව පෙනී යයි.

**8.1.5.2 වගුව : ස්ථානය අනුව මත්ද්‍රව්‍ය හසුකර ගැනීම් පිළිබඳ තොරතුරු**

| ස්ථානය | සිද්ධි සංඛ්‍යාව | ප්‍රමාණය (ග්‍රෑම්) | වටිනාකම (රු.) | මුළු සිද්ධීන්හි ප්‍රතිශතයක් ලෙස | මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) | 38 | 282,951 | 3,948,193,700.00 | 25.9% | 65.0% |
| තැපැල් | 81 | 97,410 | 1,078,725,000.00 | 55.1% | 22.4% |
| CCE | 11 | 14,462 | 406,720,000.00 | 7.5% | 3.3% |
| UPS | 11 | 21,046 | 249,535,000.00 | 7.5% | 4.8% |
| කැටුව නොඑන මගී ගමන් මළු (UPB) | 6 | 19,346 | 203,665,000.00 | 4.1% | 4.4% |
| එකතුව | **147** | **435,215** | **5,886,838,700.00** | **100%** | **100%** |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.2 රූපසටහන : ස්ථානය අනුව මත්ද්‍රව්‍ය හසු කරගැනීම්හි වටිනාකම**




*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

තැපැල් මාර්ගය හරහා හඳුනාගන්නා ලද ඉහළ සිද්ධි ප්‍රතිශතය මගින් පෙනී යන්නේ කුඩා පාර්සල් භාණ්ඩ තොග පිළිබඳව වැඩි දියුණු කළ පරීක්ෂා කිරීම් සහ බුද්ධි තොරතුරු හුවමාරුවේ අවශ්‍යතාවයක් පවතින බවයි. ඉහත දත්ත සළකා බැලීමේ දී මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඔස්සේ සිදුවන බව පැහැදිලිය.

### 8.1.5.1.4 මත්ද්‍රව්‍යයන්හි භූගෝලීය සම්භවය

හසුකරගත් මත්ද්‍රව්‍ය සඳහා එය පැමිණි රට පිළිබඳව විශ්ලේෂණයක් කිරීම මගින් ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම සිදුවන මාර්ග පිළිබඳව වැදගත් බුද්ධි තොරතුරු ලබා දේ. මෙම දත්ත හසු කරගත් සිද්ධි සංඛ්‍යාව මත පදනම් වේ.

**8.1.5.3 රූපසටහන : මත්ද්‍රව්‍ය හසුකර ගැනීම - පැමිණි ප්‍රධාන රටවල් 10**




*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

මුළු සිද්ධි සංඛ්‍යාවෙන් බහුතරයක් එක්සත් රාජධානිය සහ අමෙරිකා එක්සත් ජනපදය යන රටවල් දෙක මගින් පැමිණීම හරහා සිදුවී ඇත. එම රටවල් දෙක අතර ද්විපාර්ශවික බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීමේ සහ මෙහෙයුම් සිදුකිරීමේ සහයෝගීතාවය මේ මගින් අවධාරණය කරනු ලැබේ.

### 8.1.5.1.5 හසු කරගැනීම්වල මාසික ප්‍රවණතා

මාසික හසුකරගැනීම් දත්ත මගින් වර්ෂය පුරා සිදුවන උච්ඡාවචනය වීම් පෙන්වා සිටින අතර, මේ මගින් ඍතුමය ප්‍රවණතාවන්, ජාවාරම් ක්‍රමයන්හි වෙනස්වීම්, හෝ නිශ්චිත බලාත්මක කිරීම් මෙහෙයුම්වල කාරයක්ෂමතාවය පිළිබඳව ඉඟි ලබා දීමක් සිදුවනු විය හැකිය.

**8.1.5.4 රූපසටහන : මාසික හසුකරගැනීම් ප්‍රවණතා (ප්‍රමාණය ග්‍රෑම් වලින්)**




*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.1.6 ප්‍රධාන නිරීක්ෂණ:**

- **ඉහළම අනාවරණය කරගැනීම්:** වැඩිම සමස්ත හසුකරගැනීම් ප්‍රමාණය මැයි මාසයේ වාර්තා වූ අතර, ගංජා විශාල ප්‍රමාණයක් සහ කොකේන් සැළකිය යුතු ප්‍රමාණයක් හසුකරගැනීම මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු විය.
- **කෘත්‍රිම මත්ද්‍රව්‍යයන්හි ඉහළ යාම:** සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසවලදී MDMA සහ හෙරොයින් හසුකර ගැනීම් පමණක් වාර්තා වූ අතර ඉලක්කගත ජාවාරම් සිදුකිරීමේ ප්‍රයත්නයන් හෝ සාර්ථක බුද්ධි මෙහෙයුම් මෙම කාල සීමාව තුළ පැවති බව පෙන්නුම් කෙරේ.

**8.1.5.3 වගුව : මාසික මත්ද්‍රව්‍ය හසුකර ගැනීම් - 2025**

| මාසය | ගංජා (ග්‍රෑ) | කොකේන් (ග්‍රෑ) | මෙතැම්පෙටමින් (ග්‍රෑ) | MDMA (ග්‍රෑ) | හෙරොයින් (ග්‍රෑ) | එකතුව (ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2,837 | 3,953 | ~1,000 | 0 | 0 | ~7,790 |
| පෙබරවාරි | 49,470 | 0 | 0 | 0 | 0 | 49,470 |
| මාර්තු | 31,901 | 0 | 0 | 0 | 0 | 31,901 |
| අප්‍රේල් | 52,224 | 4,855 | 0 | 0 | 0 | 57,079 |
| මැයි | 68,823 | 10,491 | 0 | 0 | 0 | 79,314 |
| ජූනි | 6,467 | 1,081 | 0 | 0 | 0 | 7,548 |
| ජූලි | 46,725 | 5,298 | 0 | 0 | 0 | 52,023 |
| අගෝස්තු | 5,500 | 0 | 0 | 0 | 0 | 5,500 |
| සැප්තැම්බර් | 36,118 | 1,445 | 0 | 14,000 | ~1,000 | ~52,563 |
| ඔක්තෝම්බර් | 21,214 | 0 | ~6,000 | 0 | ~4,000 | ~31,214 |
| නොවැම්බර් | 49,060 | 4,870 | 0 | 0 | 0 | 53,930 |
| දෙසැම්බර් | 6,021 | 0 | 0 | 0 | 0 | 6,021 |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.1.7** සාර්ථක හසුකර ගැනීම් සහ සාක්ෂි දක්වන ඡායාරූප

**2025 මැයි 30 වන දින කොකේන් ග්‍රෑම් 10,232ක් සමග තායි ජාතිකයෙකු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දී හසුකර ගන්නා ලදී.**



**2025** නොවැම්බර් **23** වන දින කොකේන් ග්‍රෑම් **4,870** ක් සමග මලයාසියානු ජාතිකයෙකු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දී හසුකර ගන්නා ලදී.



- **2025** පෙබරවාරි **15** දින හෂිස් ග්‍රෑම් 36,152 ක් සමග
- **2025** මාර්තු **09** වන දින හෂිස් ග්‍රෑම් 17,573 ක් සමග
- **2025** ජූලි **22** වන දින හෂිස් ග්‍රෑම් 18,123 ක් සමග
- **2025** ජූලි **25** වන දින හෂිස් ග්‍රෑම් 12,196 ක් සමග
  කැනඩා ජාතිකයින් හසුකර ගන්නා ලදී.



ප්‍රකට සිද්ධිය

**රු. මිලියන 460ක වටිනාකමකින් යුත් කුෂ් මත්ද්‍රව්‍ය සමග බ්‍රිතාන්‍ය ජාතික කාන්තාවක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දී හසුකරගන්නා ලදී.**



### 8.1.5.1.8 සාරාංශය

ඇස්තමේන්තුගත වීදි වටිනාකම රු.බිලියන **5.8** ක් ඉක්මවූ මත්ද්‍රව්‍ය ග්‍රෑම් **435,000** ක් අත්අඩංගුවට ගනිමින් සහ සිද්ධි **147**ක් වාර්තා කරමින් ශ්‍රී ලංකා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය (NCU) **2025** වර්ෂයේ දී කැපී පෙනෙන කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කර ඇත. වැඩිම ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇත්තේ ගංජා වන අතර සමස්ත වටිනාකමින් සැළකිය යුතු කොටසක් කොකේන් නියෝජනය කරමින් එමගින් විවිධ වූ මත්ද්‍රව්‍ය ජාවාරම් ක්‍රම නිරූපණය වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරන ප්‍රධානතම ස්ථානය ලෙස පවතින අතර වැඩිම සිද්ධි සංඛ්‍යාවක් දැකගත හැකි වූයේ තැපැල් මාර්ගයෙන් වන අතර, එමගින් කුඩා ප්‍රමාණයන්ගෙන් ජාවාරම් කෙරෙන නිරන්තර ප්‍රයත්නයන් දැකගත හැකි වේ. මත්ද්‍රව්‍ය ජාවාරම ප්‍රභවය ලබන ප්‍රධාන රටවල් ලෙස විශේෂයෙන්ම එක්සත් රාජධානිය සහ අමෙරිකා එක්සත් ජනපදය මත්ද්‍රව්‍ය වෙළඳාමේ ජාත්‍යන්තර ස්වභාවය සහ ගෝලීය සහයෝගීතාවයේ අවශ්‍යතාවය අවධාරණය කර සිටී. මාසික ප්‍රවණතාවන් සළකා බැලීමේ දී මැයි මාසය තුළ ඉහළම හසුකරගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ අතර කෘත්‍රිම මත්ද්‍රව්‍ය වල නිශ්චිත ඉහළ යාමක් සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසයන්හි දැකගත හැකි විය. එමගින් වෙනස්වන මත්ද්‍රව්‍ය ප්‍රවාහන රටාවන් මෙන්ම සාර්ථක බුද්ධි මූලික මෙහෙයුම් අදහස් වේ.

### 8.1.5.1.9 නිර්දේශ

**2025** වර්ෂය සඳහා වන මත්ද්‍රව්‍ය හසුකර ගැනීමේ දත්ත විශ්ලේෂණ මත පදනම්ව, ශ්‍රී ලංකා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ කාර්යක්ෂමතාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා පහත නිර්දේශ යෝජනා කරනු ලැබේ:

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි **(BIA)** පරීක්ෂා කිරීම් සඳහා වන තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම: ඉහළ වටිනාකමකින් යුත් මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA) කටයුතු කරන බැවින්, මත්ද්‍රව්‍ය හසුකර ගැනීමේ උසස් තාක්ෂණික ක්‍රමවේදයන් වල ආයෝජන කිරීමත් පුද්ගල පුහුණු කිරීම් වැඩි දියුණු කිරීමත් අවශ්‍ය වේ.
- තැපැල් මාර්ගයේ සිදුකරන ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම: තැපැල හරහා විශාල වශයෙන් සිදු කරනු ලබන කුඩා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් වැළැක්වීම සඳහා වඩාත් දැඩි පරීක්ෂණ ක්‍රම සහ බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම.

- ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම: සැපයුම් දාම එහි ආරම්භයේදීම අවහිර කිරීම සඳහා එක්සත් රාජධානිය සහ අමෙරිකා එක්සත් ජනපදය වැනි හඳුනාගත් ප්‍රධාන ප්‍රභවස්ථාන රටවල් සමග ද්විපාර්ශවික බුද්ධි තොරතුරු හුවමාරුව සහ මෙහෙයුම් සහයෝගීතාවය ඉහළ නැංවීම.
- ඉලක්කගත බලාත්මක කිරීමේ උපායමාර්ග වැඩි දියුණු කිරීම: මාසික හසුකර ගැනීමේ ප්‍රවණතා මගින් විශේෂිත කාල පරිච්ඡේද හා ඊට අදාළ මත්ද්‍රව්‍ය වර්ග හඳුනාගනිමින් (කෘත්‍රිම මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ඉහළ යාම දක්නට ලැබෙන සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වැනි) නම්‍යශීලී සහ ඉලක්කගත බලාත්මක කිරීමේ උපායමාර්ග සංවර්ධනය කිරීම.
- අඛණ්ඩ පුහුණුව සහ ධාරිතා වර්ධනය: නව මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීමේ ක්‍රම, නව මත්ද්‍රව්‍ය වර්ග සහ ඉහළ පරීක්ෂණ ක්‍රමවේද පිළිබඳව මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ නිලධාරීන් සඳහා නිරන්තර පුහුණුව ලබාදීම.

#### 8.1.5.1.10 නිගමනය

ශ්‍රී ලංකා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ 2025 වාර්ෂික වාර්තාව මගින් අනවසර මත්ද්‍රව්‍ය වෙළඳාමට එරෙහිව කැපවූ උත්සාහයන් සහ සුවිශේෂී සාර්ථකත්වයන් පිරුණු වසරක් නිරූපණය කරයි.

අත්අඩංගුවට ගැනීම් රටා, භූගෝලීය ප්‍රභවස්ථාන සහ මත්ද්‍රව්‍ය ජාවාරම් ක්‍රම පිළිබඳ දත්ත මත පදනම් වූ අවබෝධය මගින් උපායමාර්ගික සැලසුම්කරණය සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් සඳහා ශක්තිමත් පදනමක් සපයයි. මෙම සොයාගැනීම් මගින් සහ යෝජිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම මගින්, මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහි ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කිරීමට මත්ද්‍රව්‍ය පාලන ඒකකයට හැකිවන අතර, එමගින් වඩාත් ආරක්ෂිත හා සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට දායක විය හැක.

### 8.1.5.2 පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය

#### 8.1.5.2.1 හැඳින්වීම

රට තුළ දැනට පවතින රෙගුලාසි සහ ප්‍රමිතීන්ට අනුව ආනයන භාණ්ඩයන් හි තත්වය හා ප්‍රමිතිය පාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අරමුණ ඇතිව **2011** වසරේ දී පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය (CPU) ස්ථාපිත කරන ලදි. පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය, ආනයන හා අපනයන භාණ්ඩ වලට අදාළ බුද්ධිමය දේපළ හිමිකම් (IPR) සඳහා ශ්‍රී ලංකා රේගුවේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වේ. වෙනත් අදාළ ආයතන සමඟ සහයෝගීතාවය ඇතිව ජාත්‍යන්තර සම්මුතීන්ට අදාළ බැඳීම් බලාත්මක කිරීම හරහා පරිසරය සුරැකීමට ද මෙම අංශය දායක වේ.

#### 8.1.5.2.2 ප්‍රධාන කාර්යයන්

1. යම් නීති උල්ලංඝනය වීමක් හෝ වංචාවක් මැඩලීම පිණිස රේගුවට අදාළ නීති සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනත (IPR), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත(SLSI), ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත, පාරිභෝගික කටයුතු අධිකාරී පනත (CAA), මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් දක්වා ඇති පාලන අවශ්‍යතාවන් ක්‍රියාත්මක කිරීම. ඉහත ආයතන සහ අණ පනත් වලින් ආවරණය වන සියළු ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර, පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය (CPU) වෙත යොමුකළ යුතුය.
2. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය විසින් ඉහත අධිකාරීන් මගින් ලබාදෙන අනුමැතීන් සම්බන්ධයෙන් රෙජිස්ටර පවත්වාගෙන යනු ලැබේ.
3. අදාළ ආයතන සම්බන්ධ ඉහත විෂයන් පිළිබඳ රේගු ක්‍රියා පටිපාටීන් යාවත්කාලීන කිරීම.
4. අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂණ අංගන වෙත CPU කාර්ය මණ්ඩලය යෙදවීම.
5. රේගු ආඥා පනත සහ හඳුනාගනු ලැබ ඇති අනෙකුත් අදාළ නිති යටතේ සාදන ලද රෙගුලාසි සමාලෝචනය කිරීම.
6. ඉහත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අනෙකුත් අදාළ පනත් සහ අණ පනත් සමඟ කියවියයුතු රේගු ආඥා පනත ප්‍රකාරව නීතිය බලාත්මක කිරීම.
7. ප්‍රතික්ෂේපිත භාණ්ඩ සහ අවදානම් (hazardous) සහිත අනෙකුත් ආනයන, ප්‍රති-අපනයනය අධීක්ෂණය කිරීම.
8. ඉහත විෂය පිළිබඳව ජාතික සහ අන්තර් ජාතික සමුළු වලදී ශ්‍රී ලංකා රේගුව නියෝජනය කිරීම.
9. බුද්ධිමය දේපළ හිමිකම සහ පාරිසරික කරුණු සඳහා ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම.
10. ඉහත විෂය කරුණු පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
11. ජාතික සහ ජාත්‍යන්තර මෙහෙයුම් වල දී WCO, INTERPOL, EUROPOL, සහ පාරිසරික අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීම.

**8.1.5.2.3** ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන කාර්යය - **01:**<br>**බුද්ධිමය දේපළ හිමිකම් (IPR) යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) හිමිකම් දරන්නන්ගේ (right holders) නිල ලැයිස්තුව ලබාගැනීම-<br>•ලියාපදිංචි වෙළඳ ලකුණු ලබාගැනීම<br>(තහනම් කරන ලද භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම;)<br>සහ බුද්ධිමය දේපළ හිමිකම් (IPR) යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ බලාත්මක කිරීමේ නියෝගයන් හි සඵලතාවය වැඩිකිරීම සඳහා සියළුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන්ට හා බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% |
| (2) බුද්ධිමය දේපළ හිමිකම් හා අදාළ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් පිළිබඳව රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% |
| (3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූල වීමක් සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම. | 100% | 100% |
| (4) රේගු ක්‍රියා පටිපාටීන් පිළිබඳ, හිමිකම් දරන්නන්ගේ (right holders) දැනුම ඉහළ නැංවීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **02:**<br>**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) ආනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සහතිකයක් අවශ්‍ය වන නිල භාණ්ඩ ලැයිස්තුවක් ලබාගැනීම සහ රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් සහ බලාත්මක කරන සියළුම නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% |
| (2) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේපිත ආනයනයට අදාළ, රෙගුලාසි සහ අවශ්‍යතා සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදුකරන නිලධාරීන් සහ බලාත්මක කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% |
| (3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූල වීමක් සඳහා ඉහත අංක (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම. | 100% | 100% |
| (4) පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම හා වෙළඳාම පහසු කිරීම සඳහා නව රෙගුලාසි සැකසීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **03:**<br>**බුද්ධිමය දේපළ නීති (IP Law) බලාත්මක කිරීම** | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) බුද්ධිමය දේපළ අයිතියට අදාළ නීති බලාත්මක කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 100% | 100% |
| (2) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කරමින් ආනයනය කර ඇති බවට සැක කෙරෙන භාණ්ඩ හසුකර ගැනීම. | 100% | 100% |
| (3) රේගු ආඥා පනතේ **125** (අ) හා **125** (ආ) වගන්ති වලට අනුකූලව "ක්‍රියාකිරීම සඳහා යෙදවීම" (Application for Action) සම්බන්ධයෙන් කටයුතු කිරීම. | 100% | 100% |
| (4) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කිරීම් හසුකර ගැනීම් වාර්තා කිරීම . | 100% | 100% |
| (5) **WCO** හා **RILO** කාර්යාල වෙත කාලීනව ප්‍රතිඵල වාර්තා කිරීම | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **04:**<br>**මොන්ට්‍රියල් සම්මුතිය මගින් ආවරණය කරනු ලබන ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී ඵලදායී බව ඉහළ නැංවීම.** | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකයේ පූර්ව ලියාපදිංචිය අවශ්‍යවන සහ ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් (ICL) අවශ්‍ය වන භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% |
| (2) වඩා හොඳ අනුකූලතාවක්/ බලාත්මක කිරීමක් සඳහා ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍ය සහ ඉහත සඳහන් ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පිළිබඳව රේගු සටහන්කර සකස් කරන හා බලාත්මක කරන නිලධාරීන්ට දැනුම ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% |

| | | |
|---|---|---|
| (3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීමක් සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% |
| (4) ඉල්ලීම් වලට අනුව ඕසෝන් ස්ථරයට හානිවන ද්‍රව්‍ය ආනයන පිළිබඳ දත්ත, ජාතික ඕසෝන් ඒකකයට ලබාදීම | 100% | 100% |
| (5) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබා ගැනීම හා ඉලක්ක කිරීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **05:**<br>බාසල් ප්‍රඥප්තිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශ සීමා හරහා සංක්‍රමණය වීමට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) • බාසල් ප්‍රඥප්තියෙහි ඇමුණුම් I සහ ඇමුණුම් III යටතට ඇතුලත්;<br>• ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ;<br>• ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ භාණ්ඩවල නිල ලයිස්තුවක් ලබාගැනීම හා එම දත්ත රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරින් සහ බලාත්මක කරන නිලධාරීන්ට ලබාදීම. | 100% | 100% |
| **2)** රජයේ අනෙකුත් නියෝජිතායතනයන්ගේ ද තාක්ෂණික සහාය ඇතිව වඩාත් උචිත අනුගතවීමේ ක්‍රියාමාර්ග ගැනීම බලාත්මක කිරීම සඳහා,<br>• බාසල් ප්‍රඥප්තිය යටතේ සඳහන් වන හානිකර අපද්‍රව්‍ය;<br>• ශ්‍රී ලංකාව තුළට ආනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ;<br>• ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නා වූ පරිසරයට සංවේදී අනෙකුත් භාණ්ඩ;<br>•ආනයනය කරන ලද හානිකර භාණ්ඩ තොග හඳුනාගත් අවස්ථාවකදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම | 100% | 100% |
| (3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **06:**<br>ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය වන දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය ආනයන කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම. | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| **(1)**• ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තු ගත කර ඇති;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% |
| (2) දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% |
| (3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **07:**<br>රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය වන පූර්ව දැනුම්දීමේ අනුමැතිය **(Prior - Informed Consent)** ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) • රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>• පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා **(ROP)** යටතේ පූර්ව ලියාපදිංචිය අවශ්‍ය වන්නාවූ<br>• ආනයනය කිරීමට පෙර පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ;<br>අන්තරාදායක රසායන සහ කෘමිනාශක පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම | 100% | 100% |

| | | |
|---|---|---|
| **(2)** පළිබෝධනාශක ආනයනය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 100% | 100% |
| **(3)** වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූලවීම් සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුලත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය - **08:**<br><br>**රසායනික අවි සම්මුතිය (CWC) යටතේ ගැනෙන භාණ්ඩ වලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම (රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, තොග රැස්කිරීම සහ භාවිතය වැළැක්වීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය)** | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| **(1)**<br>• රසායනික අවි ප්‍රඥප්තිය;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය තහනම් කරන ලද;<br>• ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය කරන;<br>රසායනික පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% |
| (2) හානිකර රසායන ද්‍රව්‍ය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම. | 100% | 100% |
| (3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූලවීම සඳහා සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය – **09**<br>අනෙකුත් පාර්ශවකරුවන් සහ රජය සමඟ සම්බන්ධීකරණය ඉහළ නැංවීම | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO), සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය සමග රැස්වීම් සංවිධානය කිරීම. | 100% | 100% |
| (2) පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. | 100% | 100% |
| (3) පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම්හි නියුතු වෙනත් ආයතන සමග ඒකාබද්ධ මෙහෙයුම් සංවිධානය කිරීම. | 100% | 100% |
| (4) ජනමාධ්‍ය හරහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 100% | 100% |
| (5) WCO, WIPO, INTERPOL, EUROPOL, USPTO,UNODC හා UNEP වැනි අන්තර්ජාතික සංවිධාන සමග සහයෝගීතාවය පවත්වා ගැනීම. | 100% | 100% |

| ප්‍රධාන කාර්යය –**10**<br>ධාරිතා සංවර්ධන වැඩසටහන් | | |
|---|---|---|
| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය |
| (1) වැඩමුළු, පුහුණු සහ සම්මන්ත්‍රණ (දේශීය/ ජාත්‍යන්තර) සඳහා නිලධාරීන් නම් කිරීම. | 100% | 100% |
| (2) රේගු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම. | 100% | 100% |
| (3) පාරිභෝගික ආරක්ෂණ සහ පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් දිරිමත් කිරීම. | 100% | 100% |
| (4) රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ අනෙකුත් අදාල ආයතන වෙත විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීම. | 100% | 100% |

**8.1.5.4 වගුව : කාර්යසාධනය - 2025**

| අයකරගැනීම් | මුදල (රු.) |
|---|---:|
| ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් | 44,968,354.59 |
| දඩ | 300,000.00 |
| පාරිභෝගික ආරක්ෂණ ඒකකයේ මුළු අයකරගැනීම් | 45,268,354.59 |

ශ්‍රී ලංකා ප්‍රමිති (SLSI) හා සම්බන්ධ විමර්ශන

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු SLSI විමර්ශන සංඛ්‍යාව | 368 |
| **SLSI** විමර්ශන සඳහා පනවන ලද මුළු (දඩ + ළිහිල් කරන ලද රාජ සන්තක කිරීම්) ප්‍රමාණය (රු) | 14,711,854.00 |
| **SLSI** විසින් ප්‍රතික්ෂේප කරන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය | **8.1.5.5** වගුව බලන්න |

බුද්ධිමය දේපළ හිමිකම් (IPR) පිළිබඳ විමර්ශන

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු IPR විමර්ශන සංඛ්‍යාව | 12 |
| රාජසන්තක කරන ලද IPR කඩකළ භාණ්ඩ වල මුළු වටිනාකම (රු.) | 16,525,141.18 |

පාරිසරික ආරක්ෂණයට අදාල විමර්ශන

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු විමර්ශන සංඛ්‍යාව | 4 |
| සිද්ධි සඳහා පනවන ලද මුළු දඩ ප්‍රමාණය (රු.) | - |
| ප්‍රති අපනයනය කරන ලද මුළු ප්‍රමාණය | - |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.5 රූපසටහන : සිද්ධි සංයුතිය - 2025**




*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.5 වගුව : 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ**

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ඇම්පියර් 13 නැවත සකස්කළ නොහැකි (Non-Rewirable) ප්ලග් | 30,000 කෑලි |
| 2 | ඇම්පියර් 13 ස්විචය සහිත සොකට් | 20,000 කෑලි |
| 3 | බබල්ගම් | 3,000 කාටූන |
| 4 | දෝසි (candy) | 2,500.33 කිග්‍රෑ |
| 5 | ටින් මාළු | 5,700 කාටූන |
| 6 | සිවිලිම් විදුලි පංකා | 1,897 කෑලි |
| 7 | සෙරමික් මග් | 300 කාටූන |
| 8 | සෙරමික් පිඟන් | 900 කාටූන |
| 9 | සෙරමික් භාණ්ඩ | 6,008 කාටූන |
| 10 | මිරිස් කුඩු | 4,290 කිග්‍රෑ |
| 11 | මිරිස් සෝස් | 65 කිග්‍රෑ |
| 12 | පරිපථ කඩන (MCB/RCCB) | 400 කෑලි |
| 13 | ක්ලිප් විදුලි පංකා (Clip Fans) | 1,000 කෑලි |
| 14 | විදුලි වයර් (Electric Cables) | 1,500 කෑලි |
| 15 | විදුලි ස්ත්‍රික්ක | 25,000 කෑලි |
| 16 | විදුලි කේතල | 30,672 කෑලි |
| 17 | විදුලි රයිස් කුකර් | 3,000 කෑලි |
| 18 | Valve රහිත ගෑස් සිලින්ඩර | 3,586 කෑලි |

| | | | |
|---|---|---|---|
| 19 | හිස් LPG සිලින්ඩර | 9,478 | කෑලි |
| 20 | එක්සෝස්ට් විදුලි පංකා | 345 | කෑලි |
| 21 | Extension Cords | 92 | කෑලි |
| 22 | ගෑස් මිශ්‍රණ ටැංකි | 1,820 | මෙ.ටො. |
| 23 | ක්ෂණික නූඩ්ල්ස් | 4,700 | කිග්‍රෑ |
| 24 | අයඩීන් මිශ්‍ර කරන ලද ලුණු කැට | 5987.25 | මෙ.ටො. |
| 25 | Free Flow අයඩීන් මිශ්‍ර කරන ලද ලුණු | 2135 | මෙ.ටො. |
| 26 | Granular ලුණු | 618.96 | මෙ.ටො. |
| 27 | ජෙලි | 500 | කාටූන |
| 28 | ලෙඩ් ඇසිඩ් මෝටර් සයිකල් බැටරි | 1,500 | කෑලි |
| 29 | LED බල්බ් | 40,000 | කෑලි |
| 30 | අඩු පීඩන රෙගියුලේටර | 640 | කාටූන |
| 31 | LPG (ද්‍රව පෙට්‍රෝලියම් වායු) | 13,371 | මෙ.ටො. |
| 32 | LPG උඳුන් (දාහක එකක්/ දෙකක් සහිත) | 30,000 | කෑලි |
| 33 | මයිසූර් පරිප්පු | 1,600 | බෑග් |
| 34 | කැරකෙන විදුලි පංකා (Orbit Fans) | 400 | කෑලි |
| 35 | ප්ලාස්ටික් වතුර බෝතල් | 10,000 | කෑලි |
| 36 | පෝසිලේන් කෝප්ප සහ පීරිසි | 1,500 | කාටූන |
| 37 | පෝසිලේන් භාණ්ඩ (Assorted) | 1,000 | කාටූන |
| 38 | පවර් කෝඩ් | 300 | ඒකක |
| 39 | රාණි බීම | 150 | පෙට්ටි |
| 40 | රතු වියළි මිරිස් (නටු සහිත/රහිත) | 186.78 | මෙ.ටො. |
| 41 | නැවත භාවිතා කළ හැකි වතුර බෝතල් | 156,232 | කෑලි |
| 42 | සෝයා සෝස් | 150 | කිග්‍රෑ |
| 43 | සිටුවන විදුලි පංකා | 10,000 | කෑලි |
| 44 | නාන කාමර ද්‍රව්‍ය (සබන්, පවුඩර්, ක්‍රීම්) | 5,000 | කාටූන |
| 45 | තක්කාලි කෙචප් | 10,029 | කිග්‍රෑ |
| 46 | සෙල්ලම් බඩු / ක්‍රීඩා කට්ටල | 500 | කෑලි |
| 47 | කුඩ | 4,000 | කෑලි |
| 48 | බිත්ති විදුලි පංකා | 4,216 | කෑලි |
| 49 | සුදු උක් සීනි | 945 | මෙ.ටො. |
| 50 | සම්පූර්ණ කොත්තමල්ලි | 22,000 | කිග්‍රෑ |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.1.5.3. ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශය

### 8.1.5.3.1 පසුබිම

පාරිසරික අපරාධ යනු ස්වභාවික ලෝකයට පමණක් නොව ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂාව, සමාජ හා ආර්ථික සංවර්ධනය සහ ගෝලීය සෞඛ්‍ය කෙරෙහි ද දැඩි අහිතකර බලපෑම් ඇති කරන බරපතල ගෝලීය ගැටළුවක් බවට පත්ව ඇත. විද්‍යාඥයින් විශ්වාස කරන අන්දමට පෘථිවිය මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මේවන විට හයවන මහා නෂ්ටප්‍රාප්තියට මුහුණ දෙමින් සිටී. වර්තමානයේ 150,300 කට අධික වූ ජෛව විශේෂයන් සංඛ්‍යාවක් ස්වාභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ (IUCN) රතු දත්ත ලේඛනයෙහි ලැයිස්තු ගතකර ඇති අතර, ඉන් 41% ක් උභය ජීවීන් ද, 37% ක් මෝරුන් හා මඩුවන් ද, 36% ක් කොරල් ජීවීන් ද, 34%ක් කේතුධරයින් ද , 27% ක් ක්ෂීරපායීන් ද, 13% ක් කුරුළු විශේෂ වශයෙන් විශේෂ 42,100 කට අධික ප්‍රමාණයක් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇත. නීතිවිරෝධී වනජීවී ජීවී වෙළඳාම මෙම ජෛව විවිධත්ව විනාශයට ප්‍රධාන වශයෙන් දායක වේ. නීති විරෝධී වනජීවී වෙළඳාමේ වාර්ෂික ඇස්තමේන්තුගත වටිනාකම ඇ.ඩො. බිලියන 23 ක් පමණ වන අතර, එය මත්ද්‍රව්‍ය, ව්‍යාජානුකරණය සහ මිනිස් ජාවාරමට පසුව ලෝකයේ සිදුවන විශාලතම සංවිධානාත්මක අපරාධය ලෙස හඳුනාගෙන ඇත.

සර්ම කලාපයේ පිහිටා තිබීම හේතුවෙන් ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් අනූන රටකි. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට ආවේණික සතුන් හා ශාක විශේෂයන් විශාල වශයෙන් වඳ වී යාමේ තර්ජනයකට ලක්ව ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව විවිධ ඛනිජ සම්පත් රාශියකින් ආඪ්‍ය වේ. මෙම ඛනිජ ද්‍රව්‍යයන් අතරින් සමහරක් අනන්‍ය වන අතර සමහරක් ලෝකයේ ඉහළම ගුණාත්මක බවකින් යුතු ඛනිජ ලෙස පිළිගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර කිහිපය මුළුල්ලේ මෙම සම්පත් ජාවාරම් කිරීමට ගත් නීති විරෝධී ප්‍රයත්න රැසක් වාර්තා වී තිබේ.

අනෙක් අතට සංස්කෘතික දේපළ මංකොල්ලය දේශසීමා අතර සිදුවන ඉතා පැරණිතම සංවිධානාත්මක අපරාධයක් ලෙස පිළිගැනෙන අතර වර්තමානයේ දී එවැනි අපරාධ ලොව පුරා ව්‍යාප්ත වූ සංසිද්ධියක් බවට පත්ව ඇත. සංස්කෘතික උරුම ජාවාරම මගින් ජාතික උරුමයන් ක්ෂය කරන අතර සමාජයට තම වටිනාම වස්තූන් අහිමිකරන බව හඳුනාගනිමින් ශ්‍රී ලංකා

රේගුව මගින් මෙම ගැටළුවට ප්‍රමුඛතාවය ලබා දේ. සංස්කෘතික උරුමයන් ජාවාරම් කිරීම මගින් ජාතියේ උරුමය අහිමිකරන අතර, ඇතැම් සුවිශේෂී සහ වටිනාම සංස්කෘතික වස්තූන් අත්විඳීමට තිබෙන අවස්ථාව සමාජයට ක්‍රමයෙන් අහිමි කරයි. සෑම වසරකම කෞතුකාගාර, දේවස්ථාන, පෞද්ගලික කෞතුක භාණ්ඩ එකතූන් හා රජයේ ආයතන වලින් කෞතුක භාණ්ඩ දහස් සංඛ්‍යාවක් අතුරුදන් වේ. පැරණි ආයුධවල සිට සිතුවම් දක්වා ද කාසිවල සිට ඔරලෝසු දක්වා ද ආගමික වස්තු වල සිට පුරාවිද්‍යාත්මක සොයාගැනීම් දක්වා ද ලෙස ලෝකයේ පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයට අයත් දස දහස් ගණනක් නියැදි සොරකම් කරනු ලැබේ.

දේශසීමා අතර සිදුවන වන ජීවී, ස්වාභාවික සම්පත් සහ සංස්කෘතික දේපළ නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමේ ඉහළ යමින් පවතින තර්ජනය අවබෝධ කර ගනිමින් ශ්‍රී ලංකා රේගුව විසින් 1993 වර්ෂයේ දී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ආරම්භ කරනු ලැබිය. ආරම්භයේ දී ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය ලෙස හඳුන්වනු ලැබූ මෙම අංශය රේගු පරිපාලනයක් තුළ ගෝලීය වශයෙන් ස්ථාපිත කරනු ලැබූ මෙම ආකාරයේ ප්‍රථම විශේෂිත ඒකකය ලෙස සලකනු ලැබේ.

කාලයත් සමග ජෛව විවිධත්ව ආරක්ෂාව, පාරිසරික සංරක්ෂණය සහ සංස්කෘතික උරුමය සංරක්ෂණය උදෙසා තම වගකීම් පුළුල් කරමින් මෙම ඒකකය වර්තමාන ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ (BCNP) අංශය බවට පත්විය. මෙම ශාඛාව, රේගු ආඥාපනත සහ අනෙකුත් අදාළ දේශීය නීති මෙන්ම CITES වැනි ජාත්‍යන්තර එකඟතාවන් යටතේ කටයුතු කරමින්, වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්වයින් හා ශාක, වනාන්තර සහ සමුද්‍ර සම්පත්, ඛනිජ ද්‍රව්‍ය සහ පුරාවස්තු නීතිවිරෝධී ආනයනය, අපනයනය සහ රටක් හරහා තවත් රටකට රැගෙන යාම (transit) වැළැක්වීමේ වගකීම උසුලයි.

බුද්ධි තොරතුරු මත පදනම් වූ බලාත්මක කිරීම, අවදානම් පැතිකඩ සකස් කිරීම, ආයතන අතර සම්බන්ධීකරණය, විමර්ශන සහ නඩු පැවරීම් හරහා, ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ශ්‍රී ලංකාවේ අගනා ස්වභාවික හා සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීමේ ප්‍රධාන භූමිකාවක් අඛණ්ඩව ඉටු කරමින් සිටී. ගුවන්තොටුපළ, වරාය සහ බහාළුම් පර්යන්තයන්හි සිදු කරනු ලබන එහි මෙහෙයුම් මගින් ශ්‍රී ලංකා රේගුවේ සමාජ හා පාරිසරික ආරක්ෂණ උපායමාර්ගික අරමුණු සැලකිය යුතු ලෙස ශක්තිමත් කරමින්, ජාතික ආරක්ෂාව, පාරිසරික තිරසරභාවය සහ ජාත්‍යන්තර අනුකූලතාවයට ද දායකත්වයක් සපයයි.

**8.1.5.3.2 ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශය (BCNP) විසින් සිදුකරන ප්‍රධාන කාර්යයන්**

- සත්ව හා ශාක විශේෂ සහ ආශ්‍රිත නිෂ්පාදන සංචලනය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
- ඛනිජ වැනි අනෙකුත් ස්වාභාවික සම්පත් සංචලනය හා අදාළ ජාතික නීති බලාත්මක කිරීම.
- සංස්කෘතික දේපළ සහ කෞතුක භාණ්ඩ සංචලනය හා අදාළ ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
- බලපත්‍ර සහ අවසර පත්‍රයන් හි සඳහන් කොන්දේසි සම්බන්ධයෙන් අනුකූලතාවන් සහතික කිරීම.
- ජෛව විද්‍යාත්මක, ස්වාභාවික සහ සංස්කෘතික වශයෙන් වැදගත් වෙළඳ භාණ්ඩ දේශසීමාවන් හරහා සංචලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පාලන ක්‍රියාමාර්ග පැනවීමේ දී විවිධ රේඛීය නියෝජිත ආයතන සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ලබාදීම.

- **8.1.5.**3.3 මෙහෙයුම් ව්‍යුහය



#### 8.1.5.3.4 2025 වර්ෂය සඳහා කාර්යසාධනය

- මෙම වසර තුළ ජාවාරම් සහ අනුකූල නොවන ප්‍රයත්නයන් 53 ක් හසුකර ගැනීමට ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශයට හැකිවිය.
-

**8.1.5.6 රූපසටහන : අත්අඩංගුවට ගත් වෙළඳ භාණ්ඩ**







*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.6 වගුව : සමස්ත සිද්ධි සංඛ්‍යාලේඛන සැසඳීම**

| විස්තරය | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව | 45 | 50 | 19 |
| නිම කරන ලද සිද්ධි සංඛ්‍යාව | 60 | 7 | 7 |
| දඩ සහ රාජසන්තක කිරීම් මගින් අයකරගත් මුළු මුදල (රු.) | 4,460,000 | 23,469,036 | 18,008,571 |
| අතිරේක සටහන්කර A/E මගින් අයකරගත් මුළු මුදල (රු.) | 0 | 0 | 0 |
| විකිණීමෙන් ලද මුළු මුදල් (රු.) | 0 | 0 | 5,990,000 |
| 2025 වසර සඳහා මුළු අයකර ගැනීම් (රු.) | 4,460,000 | 23,469,036 | 23,998,571 |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.7 වගුව : 2025 වසරේදී ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශයේ ප්‍රධාන අත්අඩංගුවට ගැනීම්**

| වෙළඳ භාණ්ඩ වර්ගය | අත්අඩංගුවට ගත් මුළු ප්‍රමාණය |
|---|---|
| වියළි මුහුදු කැකිරි | 22.5 Kg |
| මුහුදු ඇල්ගී | 6.5 Kg |
| සජීවී ශාක | 1480 Nos |
| සජීවී මත්ස්‍යයින් | 1653 Nos |
| සජීවී කැස්බෑවුන්/ රතු කන් කැස්බෑවා | 2141 Nos |
| සජීවී සර්පයින් | 6 Nos |
| වියළි මෝර වරල් | 139.9 Kg |
| කොතලහිඹුටු මග් | 70 Nos |
| කොතලහිඹුටු කැබලි | 596.8 Kg |
| ගම්මාළු මග් | 12 Nos |
| දැව කොට | 61 Nos |
| සත්ව අස්ථි | 1 No |

| | |
|---|---|
| වල්ලපට්ටා කැබලි | 2 Kg |
| පුරාවස්තු | 5 Nos |
| සිප්පි කටු/ හක්ගෙඩි/කොරල් | 159 Nos |
| මත්ස්‍ය බොකු | 29.15 Kg |
| මොණර පිහාටු | 373 Nos |
| ඛනිජ ද්‍රව්‍ය | 61.8 Kg |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.8 වගුව : රැස්වීම්, පුහුණු වැඩසටහන්, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අනෙකුත් සහයෝගීතාවයන් - 2025**

| මාසය | ක්‍රියාකාරකම |
|---|---|
| ජනවාරි | • ශ්‍රී ලංකාවේ සමුද්‍ර ආරක්ෂිත ප්‍රදේශ (MPA) ජාල සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව - 2025.01.08<br>• ශ්‍රී ලංකා සමුද්‍රීය අධ්‍යයන කලාපීය මධ්‍යස්ථානයේ (RCMS) පුහුණු අවශ්‍යතා ඇගයීම් රැස්වීම (RCMS) - 2025.01.04<br>• කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ රැස්වීම - 2025.01.28 |
| පෙබරවාරි | • CITES මෝරු සහ විශේෂ හඳුනාගැනීමේ වැඩමුළුව - 2025.02.19 සහ 2025.02.20<br>• ජලජ සම්පත් අපනයනය පිළිබඳ රැස්වීම - 2025.02.19 |
| මාර්තු | • සංයෝජිත වර්ගීකරණ කමිටුවේ 75වන සැසිය (HSC) 2025.03.08 – 2025.03.23 |
| අප්‍රේල් | • SITA බුද්ධි තොරතුරු සහ ඉලක්කගත කිරීම - 2025.04.03<br>• ශ්‍රී ලංකා වනජීවී බලාත්මක කිරීමේ ජාලයේ (SLaWEN) විමර්ශන ක්‍රියාකාරී කණ්ඩායමේ සිව්වන රැස්වීම<br>• ඇන්තූරියම් වගාකරුවන් හා අපනයනකරුවන්ගේ සංගමය සමඟ රැස්වීම - 2025.04.22 |
| මැයි | • නීති විරෝධී වනජීවී වෙළඳාම පිළිබඳ ආයතන අතර සහයෝගිතා වැඩමුළුව (WCO INAMA ඉන්දියාව සහ දකුණු ආසියානු ව්‍යාපෘතිය) 2025.05.19 - 2025.05.23 |
| ජුනි | • නීති බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා වනජීවී ආරක්ෂණ පුහුණුව - 2025.06.04 – 2025.06.06<br>• එක්ස්-රේ ඡායාරූප විශ්ලේෂණ පුහුණු වැඩමුළුව - 2025.06.16 – 2025.06.19<br>• නීති විරෝධී ලෙස ආනයනය කරන ලද ජාවාරම් කරන ලද ජීවී සත්ව තොග මෙහෙයවීම සඳහා ප්‍රමිතිගත ක්‍රියාපටිපාටියක් සකස් කිරීම පිළිබඳ රැස්වීම - 2025.06.25 |
| ජූලි | • ජෙ.නි.රේ.අ. සහ නි.රේ.අ. සඳහා රේගු නීතිය පිළිබඳ ඉහළ පාඨමාලාව 2025.07.08, 2025.07.15 සහ 2025.07.21<br>• UNODC විසින් වනජීවී අපරාධ ස්ථාන කළමනාකරණය සහ විශේෂ හඳුනාගැනීම පිළිබඳ පුහුණුව - 2025.07.21 – 2025.07.26<br>• Thunder මෙහෙයුම – 2025 - 2025.07.20 – 2025.07.25<br>• Pierside Vessel Search Techniques පාඨමාලාව - 2025.07.21 – 2025.07.25<br>• රසදිය අඩංගු සම පැහැ ගැන්වීමේ නිෂ්පාදන ඉවත් කිරීම පිළිබඳ පුහුණුව 2025.07.29<br>• දකුණු ආසියානු වනජීවී නීති ක්‍රියාත්මක ජාලයේ (SAWEN) සහ ශ්‍රී ලංකා වනජීවී නීති ක්‍රියාත්මක ජාලයේ (SLaWEN) ඒකාබද්ධ 12 වන SAWEN විධායක කමිටු සැසිය, කොළඹ - 2025.07.31 |
| අගෝස්තු | • "ඉහළ අවදානම් සහිත මගීන් ඉලක්කගත කිරීම" පිළිබඳ පුහුණුව- 2025.08.25 - 2025.08.29<br>• සිද්ධි කළමනාකරණ කණ්ඩායම් රැස්වීම 2025.08.29 |
| සැප්තැම්බර් | • ශ්‍රී ලංකාවේ වනජීවී හැසිරවීම, බේරාගැනීම සහ නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳ CARE පුහුණුව 2025.09.11 සහ 2025.09.12<br>• living modified organisms හසුකර ගැනීම හා හඳුනාගැනීම සහ ජෛව ආරක්ෂාව සඳහා කාර්ටජිනා ප්‍රොටෝකෝලය ක්‍රියාත්මක කිරීමේදී රේගු නිලධාරීන්ගේ භූමිකාව පිළිබඳ වැඩමුළුව 2025.09.22 - 2025.09.26<br>• ජෙ.නි.රේ.අ. සහ නි.රේ.අ. සඳහා ASYCUDA WORLD පිළිබඳ පුහුණුව 2025.09.22 සංයෝජිත වර්ගීකරණ උසස් පාඨමාලාව 2025.09.29 සහ 2025.09.30<br>• කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ රැස්වීම 2025.09.13 සහ 2025.09.25 |
| ඔක්තෝබර් | • Pierside Vessel Search Techniques පාඨමාලාව ශ්‍රී ලංකාව 2025.10.13 සිට 2025.10.17 දක්වා<br>• මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට හා ප්‍රචණ්ඩකරණයට මුල්‍ය සැපයීම වැළැක්වීම පිළිබඳ පුහුණුව 2025.10.23<br>• පාර්ශ්වකරුවන් සමඟ වැඩමුළුව – NBSAP, BFP සහ 7වන NR 2025.10.14 සහ 2025.10.15<br>• පාර්ශ්වකරුවන් සඳහා ආරම්භක වැඩමුළුව – NBSAP, BFP සහ 7th NR - 2025.10.02<br>• "ශ්‍රී ලංකාවේ ස්වදේශීය නොවන වනජීවී සත්ව විශේෂයන්ගේ දේශීය වෙළඳාම නියාමනය කිරීම" පිළිබඳ කෙටුම්පත් නිර්දේශ පත්‍රය පිළිබඳ රැස්වීම 2025.10.27<br>• ශ්‍රී ලංකා වනජීවී නීති ක්‍රියාත්මක ජාලය (SLaWEN) ආකෘතිකරණය කිරීම සහ සම්මත ක්‍රියාපටිපාටි (SOPs) සංවර්ධනය කිරීම පිළිබඳ ඒකාබද්ධ රැස්වීම 2025.10.24<br>• මුහුදු කැකිරි (Sea Cucumber) සඳහා CITES අනුපත්‍රිකාව II ලැයිස්තුගත කිරීම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ආචාර්ය උපාධි (PhD) ශිෂ්‍යයන් සමඟ රැස්වීම 2025.10.28 |
| නොවැම්බර් | • ශ්‍රී ලංකාවේ සත්ව හා වෘක්ෂලතා සඳහා ආක්‍රමණශීලී විදේශීය විශේෂ (Invasive Alien Species - IAS) ප්‍රමුඛතා ලැයිස්තුව යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළුව 2025.11.06 සහ 2025.11.07<br>• බුද්ධිමය දේපළ (IP) නීති සහ නිෂ්පාදන හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුව 2025.11.12 |

| | |
|---|---|
| | • මගී සහ භාණ්ඩ පාලන වැඩසටහන: ඉහළ අවදානම් කළමනාකරණ වැඩමුළුව 2025.11.17 – 2025.11.21<br>• ජීව විවිධත්වය පිළිබඳ සම්මුතිය සඳහා 7 වන ජාතික වාර්තාව (7 වන ජාතික වාර්තාව) සංවර්ධනය කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡා වැඩමුළුව (CBD) 2025.11.20 |
| දෙසැම්බර් | • IWT එරෙහිව නඩුපැවරීමට නියෝග කරනු ලබන LE නියෝජිතායතන සඳහා නඩු පැවරීම පිළිබඳ (Prosecutorial) පුහුණුවේ තුන්වන අදියර 2025.12.16 – 2025.12.19<br>• සාගර කටයුතු, පරිසර හා දේශගුණික වෙනස්වීම් අංශය සහ පාර්ශ්වකරුවන් සම්බන්ධයෙන් පවතින කරුණු සාකච්ඡා කිරීම සඳහා ආයතන අතර රැස්වීම 2025.12.24 |

*මූලාශ්‍රය : සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.1.5.4. වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය

#### 8.1.5.4.1 හැඳින්වීම

දේශසීමාවන් හරහා සංවිධානාත්මක අපරාධ මැඩලීමේ අභිප්‍රායෙන් මගීන් සහ භාණ්ඩ දේශසීමා කණ්ඩායම (PCBT) හෝ බහාලුම් පාලන වැඩසටහන (CCP) ලෙස පෙර හැඳින්වූ මගී සහ බහාලුම් පාලන වැඩසටහන (PCCP) යටතේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සමඟ 2015.01.31 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ 2014 දී ශ්‍රී ලංකා රේගු වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය ස්ථාපනය කරන ලදී. මෙම ඒකකය බලාත්මක කිරීමේ පර්ෂදයේ සමාජ ආරක්ෂණ අංශය යටතේ පාලනය වේ. වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය ශ්‍රී ලංකා රේගුවේ සාමාන්‍ය රාජකාරි වලට අතිරේකව, අමතර ආරක්ෂක ස්ථරයක් ලෙස ක්‍රියා කරයි.

#### 8.1.5.4.2 වරාය පාලන ඒකකයෙහි විෂය පථය

- මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම
- UNODC හි සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- UNODC සහ WCO PCBT වෙතින් ලැබෙන තොරතුරු මගින් ආරම්භ කරන ලද සිද්ධි පිළිබඳ විමර්ශන සිදුකිරීම.
- දේශසීමාවන් හරහා අධි අවදානම් භාණ්ඩ ගමන් කිරීම ඉලක්ක කිරීම සඳහා WCO භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) පරිපාලනය කිරීම සහ භාවිතා කිරීම.
- අනෙකුත් ඒකකය විසින් ඉල්ලා සිටින අවස්ථාවන්හි දී ඒ සඳහා සහය වීමට Hazmat, TruNarc සහ UNODC විසින් සපයන ලද අනෙකුත් උපකරණ ක්‍රියාත්මක කිරීම.
- නෞකා නියෝජිතයන් විසින් ගණනය කරන ලද අතිකාල මුදල් ගෙවීම් සත්‍යාපනය කිරීම
- ආනයන, අපනයන, Transit සහ Transshipment බහාලුම් සංචරණය අධීක්ෂණය කිරීම.
- ලොව පුරා බහාලුම් සංචරණය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීමේ නියැළි අදාළ ජාතික සහ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- රටවල් අතර දේශසීමාවන් හිදී නීති විරෝධී භාණ්ඩ, තහනම් කරන ලද භාණ්ඩ, මත්ද්‍රව්‍ය සහ රටවල් අතර අපරාධ හා සම්බන්ධ අනෙකුත් වංචා හඳුනා ගැනීම, රඳවා ගැනීම හා හසුකර ගැනීම සහ බැක්ට්‍රැකින් (backtracking investigations) පරීක්ෂාවන් සිදුකිරීම.
- UNODC විසින් පරිත්‍යාග කරන ලද Hazmat සහ TruNarc වැනි තාක්ෂණික උපකරණ භාවිතයෙන් රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අනෙකුත් අංශ සහ ඒකක සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම.
- රේගු විෂය පථය යටතේ එන නීති විරෝධී භාණ්ඩ, තහනම් කරන ලද භාණ්ඩ, මත්ද්‍රව්‍ය, දේශසීමාවන් හරහා අපරාධ හඳුනා ගැනීම, රඳවා ගැනීම හා තහනම් කිරීම සහ මත්ද්‍රව්‍ය පාලන ඒකකය, පාරිභෝගික ආරක්ෂණ ඒකකය, අවදානම් කළමනාකරණ අංශය සහ නිවාරණ අංශය සමඟ සම්බන්ධීකරණයෙන් රේගු ආඥා පනත සහ අනෙකුත් අදාළ නීති වලට අනුකූලව එකී ආනයනය, අපනයන, මගී භාණ්ඩ, පාර්සල් හෝ Transshipment භාණ්ඩ නැවැත්වීම, රඳවා ගැනීම, පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම.
- වරාය පර්යන්තයන්හි වැඩි කාලයක් රඳවා සිටින බහාලුම් අධීක්ෂණය කිරීම

#### 8.1.5.4.3 ශ්‍රී ලංකා රේගුව (වරාය පාලන ඒකකය) භාවිතා කරන මෙවලම්

1. WCO Customs Enforcement Network (CEN)
   - අ. ContainerCOMM
   - ආ. AirCargoCOMM
2. WCO National Customs Enforcement Network (nCEN)
3. WCO Cargo Targeting System
4. AsyCuDa WORLD
5. AsyHub

වරාය පාලන ඒකකයෙහි ඇති විශේෂ උපකරණ

1. HAZMAT

අ. රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන HazMatID 360 පද්ධතිය මගින් ක්ෂේත්‍රයේ දී නොදන්නා ඝන ද්‍රව්‍ය, ජෙල් සහ ද්‍රාවණ ඉක්මනින් සහ විස්තීර්ණ ලෙස විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇත..



2. TRUNARC

ආ. අතේ රැගෙන යන Thermo Scientific™ TruNarc™ මත්ද්‍රව්‍ය විශ්ලේෂකය මගින් එක් නිශ්චිත පරීක්ෂා කිරීමක දී නිලධාරීන්ට සැක සහිත ද්‍රව්‍ය **530** කට වැඩි ප්‍රමාණයක් පරිලෝකනය කිරීමේ හැකියාව ඇත.




**8.1.5.4.4** වරාය පාලන ඒකකයේ අනෙකුත් කාර්යයන්

- වරාය පාලන ඒකකය විසින් පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් සපයන ලද බහාලුම් ලැයිස්තු භාවිතයෙන් දීර්ඝ කාලසීමාවක් පුරා කොළඹ වරායේ ඇති බහාලුම් අධීක්ෂණය කරනු ලබයි.
- මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) විසින් ආරම්භ කරන ලද බහාලුම් පාලන වැඩසටහන (CCP) භාවිතා කර මුහුදු සහ ගුවන් මාර්ගයෙන් ශ්‍රී ලංකාව තුළට සහ පිටතට ගමන් ගන්නා භාණ්ඩ අධීක්ෂණය කිරීම, විමර්ශණය කිරීම, රඳවා ගැනීම සහ සෝදිසි කිරීම සහ එමගින් UNODC සහ WCO සමඟ සම්බන්ධීකරණය කිරීම.
- වරාය පාලන ඒකකයේ නිලධාරීන් විසින් UNODC විසින් පරිත්‍යාග කරන ලද HazMat සහ TruNarc වැනි විශේෂ උපකරණ භාවිතා කර රසායන ද්‍රව්‍ය අඩංගු භාණ්ඩ තොග අහඹු ලෙස පරීක්ෂා කරයි.





### 8.1.5.4.5 කාර්යසාධන සාරාංශය

**8.1.5.9 වගුව : 2024 සහ 2025 වර්ෂවලදී අයකරගත් ආදායම**

| අනු අංකය | විස්තරය | අයකරගත් මුදල (රු.) 2025 | අයකරගත් මුදල (රු.) 2024 |
|---|---|---|---|
| 1 | මුළු රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/අලවියෙන් ලද මුදල් | 487,823,770 | 315,830,288.69 |
| 2 | යාත්‍රා අතිකාල අයකර ගැනීම් | 92,599,270 | 107,549,219.50 |
| එකතුව | | **580,423,040** | **423,379,507** |

*මූලාශ්‍රය: සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**2024 වසරට සාපේක්ෂව 2025 වසරේ ආදායම් වර්ධනය - 55%**

**8.1.5.10 වගුව : විමර්ශන සිද්ධීන්හි තත්ත්වය හා අයකර ගැනීම් - 2025**

| මාසය | ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව /NFA | එකතු කරන ලද දඩ එකතුව (රු.) | එකතු කරන ලද ලිහිල් කල රාජසන්තක කිරීම (රු.) | අලෙවියෙන් ලද මුදල් (රු.) | (දඩ/රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/අලෙවියෙන් ලද මුදල්) එකතුව (රු.) | අතිරේක සටහන්කර (A/E) මගින් අයකර ගත් මුදල (මිළ පිරික්සුම /දිගු කාමරය) (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 5 | 18 | 0.00 | 3,800,000 | 18,502,590 | 22,302,590 | 0.00 |
| පෙබරවාරි | 8 | 11 | 200,000 | 9,245,000 | 0.00 | 9,445,000 | 244,545 |
| මාර්තු | 6 | 7 | 0.00 | 4,545,000 | 764,350 | 5,309,350 | 571,301 |
| අප්‍රේල් | 6 | 3 | 200,000 | 11,810,000 | 0.00 | 12,010,000 | 0.00 |
| මැයි | 6 | 4 | 100,000 | 34,239,080 | 4,800,000 | 39,139,080 | 0.00 |
| ජූනි | 3 | 1 | 500,000 | 39,900,000 | 15,826,500 | 56,226,500 | 0.00 |
| ජූලි | 5 | - | 200,000 | 8,400,000 | 0.00 | 8,600,000 | 0.00 |
| අගොස්තු | 10 | - | 0.00 | 13,695,000 | 0.00 | 13,695,000 | 2,636,313 |
| සැප්තැම්බර් | 5 | 1 | 400,000 | 29,000,000 | 0.00 | 29,400,000 | 2,636,313 |
| ඔක්තෝබර් | 36 | 2 | 200,000 | 101,810,000 | 7,356,250 | 109,366,250 | 1,138,361 |
| නොවැම්බර් | 8 | | 200,000 | 49,350,000 | 0.00 | 49,550,000 | 89,607 |
| දෙසැම්බර් | 9 | | 1,000,000 | 131,780,000 | 0.00 | 132,780,000 | 129,455 |
| එකතුව | **107** | **47** | **3,000,000** | **437,574,000** | **47,249,690** | **487,823,770** | **7,445,895** |

*මූලාශ්‍රය: සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.7 රූපසටහන: රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/ අලෙවියෙන් ලද මුදල (රු. මි.)**




*මූලාශ්‍රය: සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

රසායනික පරීක්ෂණ

- HazMat භාවිතා කරමින් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
    - වරාය පාලන ඒකකය සඳහා - **27**
    - අනෙකුත් අංශ සඳහා - **13**

- TruNarc භාවිතයෙන් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
    - වරාය පාලන ඒකකය සඳහා - **15**
    - අනෙකුත් අංශ සඳහා - 05

**8.1.5.11 වගුව : යාත්‍රා අතිකාල අධීක්ෂණය - 2025**

| මාසය | අයකරගත් මුදල (රු.) | ගමන්වාර සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 921,498 | 340 |
| පෙබරවාරි | 5,375,691 | 301 |
| මාර්තු | 5,571,025 | 333 |
| අප්‍රේල් | 6,281,081 | 313 |
| මැයි | 9,965,254 | 320 |
| ජූනි | 13,481,576 | 326 |
| ජූලි | 10,553,925 | 316 |
| අගොස්තු | 4,794,915 | 317 |
| සැප්තැම්බර් | 9,928,890 | 316 |
| ඔක්තෝබර් | 12,186,525 | 327 |
| නොවැම්බර් | 8,249,220 | 284 |
| දෙසැම්බර් | 5,287,100 | 312 |
| එකතුව | **92,599,270** | **3806** |

*මූලාශ්‍රය: සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.8 රූපසටහන : යාත්‍රා අතිකාල අධීක්ෂණය**




*මූලාශ්‍රය: සමාජ ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.1.5.4.6 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ජයග්‍රහණයන්**

ආදායම් අරමුණු

රේගු නීතිය බලාත්මක කිරීමේ අරමුණ වන්නේ භාණ්ඩ තොග හඳුනා ගැනීම සහ ඉලක්ක කිරීම, ඒකාබද්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන සිදුකිරීම වැනි යෝජිත උපාය මාර්ග හරහා හොර බඩු ජාවාරම් කිරීමේ ප්‍රයත්නයන් වැලැක්වීමයි. එමගින්

අයකරගත් මුළු දඩ මුදල් ප්‍රමාණය රු. 3,000,000, මුළු ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් රු. 437,574,000, අලෙවියෙන් ලද මුදල් රු. 47,249,690 සහ මුළු අතිරේක සටහන්කර (A/E) මගින් අයකර ගැනීම් රු. 7,445,895 කි.

**2025** වසර තුළ වරාය පාලන ඒකකය විසින් මුළු එකතුව රු. 92,599,270 ක් වන යාත්‍රා අතිකාල ගාස්තු අධීක්ෂණය කරනු ලැබීය.

වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණු

අවදානම් ආකෘති සැකසීම සහ ලෝක රේගු සංවිධානයේ භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) භාවිතා කර වෙළඳ භාණ්ඩ ඇගයීම හරහා වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණ ලඟා කරගනු ලැබීය.

අනෙකුත් අරමුණු

ධාරිතා වර්ධනය

- මගී සහ භාණ්ඩ දේශසීමා කණ්ඩායම (PCBT) ලෙස මින් පෙර හඳුන්වන ලද මගී සහ භාණ්ඩ පාලන වැඩසටහන (PCCP) සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) බහාළුම් පාලන වැඩසටහනෙහි (CCP) සහයෝගීතාවය ඇතිව

ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන අංශයට අනුයුක්ත නිලධාරීන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් පවත්වනු ලැබීය.

**1. X කිරණ රූප විශ්ලේෂණ පුහුණුව**



2. නීති විරෝධී මත්ද්‍රව්‍ය හා පූර්ව ද්‍රව්‍ය (precursor) ජාවාරම් වැළැක්වීම පිළිබඳ පුහුණුව




3. අධි අවදානම් සහිත මගීන් ඉලක්ක කිරීම පිළිබඳ පුහුණුව



**4. ඉහළ අවදානම් කළමනාකරණ පුහුණුව**



**5.වරාය පාලන ඒකකය UNODC වැඩසටහන් සඳහා සත්කාරකත්වය සැපයීම.**

**මත්ද්‍රව්‍ය හා අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) මගී සහ බහාළුම් පාලන වැඩසටහනේ (PCCP) සාමාජිකයින් අතර දැනුම සහ අත්දැකීම් බෙදාගැනීම සහ හුවමාරු කරගැනීමේ අරමුණින් යුතුව නේපාල රේගු නිලධාරීන් සඳහා 2025.12.01 සිට 2025.12.03 දක්වා ශ්‍රී ලංකාවේ පවත්වන ලද UNODC අධ්‍යයන චාරිකාව සඳහා වරාය පාලන ඒකකය සත්කාරකත්වය සපයන ලදී.**



### 8.1.5.4.7 කැපී පෙනෙන ජයග්‍රහණ - 2025

**ගුවන් භාණ්ඩ පාලන ඒකකයේ (ACCU) ජයග්‍රහණ**

**කටුනායක ගුවන් භාණ්ඩ පර්යන්තයේදී ගුවන් භාණ්ඩ පාලන ඒකකය විසින් ඉහළ වටිනාකම් සහිත සීමා කරන ලද භාණ්ඩ තොග කිහිපයක් සාර්ථකව අල්ලා ගන්නා ලදී.**

**රසායනික ද්‍රව්‍ය සහ ඖෂධ අත්අඩංගුවට ගැනීම්**

N, N-Dimethylacetamide: **ආනයන පාලන බලපත්‍ර** (ICL) **අවශ්‍යතා මගහැරීම සඳහා** N, N-Dimethylamino **යනුවෙන් සාවද්‍ය ලෙස හඳුන්වා දී තිබූ ඉන්දියාවේ සිට එවන ලද ලීටර් 1 බෝතල් 18ක් රඳවා ගන්නා ලදී.**









- **Hydrolysate Collagen:** **එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට ගෙන එන ලද රු. 2,381,455 ක් වටිනා කොටස් 20,000 ක්, ජාතික ඖෂධ නියාමන අධිකාරි (NMRA) බලපත්‍රයක් නොමැතිවීම සහ "ආහාර වර්ණක" ලෙස ප්‍රකාශ කර තිබීම හේතුවෙන් රාජසන්තක කර විනාශ කිරීමට නියමිතව තිබේ.**










- **රූපලාවන්‍ය නිශ්පාදන: නියාමන අනුමැතිය මගහැරීම සඳහා සාවද්‍ය ලෙස වර්ගීකරණය කර තිබූ රු. 12,174,465 ක වටිනාකමකින් යුත් වර්ග 14 ක නිශ්පාදන (CeraVe, Vaseline, සහ The Ordinary ඇතුළු වර්ග වලට අයත්) රඳවා ගන්නා ලදී.**






- මස් සහ එළවළු: තාරා මස් කි.ග්‍රෑ.68ක් සහ එළවළු/ පලතුරු කි.ග්‍රෑ. 113 ක් අල්ලා ගන්නා ලදී. මෙම ද්‍රව්‍ය නිරෝධායන අනුමැතීන් රහිතව සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය අතර සඟවා ආනායනය කර තිබීම හේතුවෙන් රු. මිලියන 9.5 ක දඩ නියම කරන ලදී.










- විද්‍යුත් යතුරු පැදි: ආනයන පාලන බලපත්‍රයක් නොතිබීම හේතුවෙන් චීනයෙන් ගෙන එන ලද යතුරු පැදි 125ක් සහ බැටරි 330ක් (වටිනාකම රු. 30,435,754) රාජසන්තක කරන ලදී.





- **චීන ආසවිත ස්ප්‍රීතු: සුරාබදු දෙපාර්තමේන්තු අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් Alcohol 50% vol මත්පැන් බෝතල් 8,832 ක් සහ ෂොට් වීදුරු (shot glasses) 17,664 ක් (වටිනාකම: රු. 74,140,662) අත්අඩංගුවට ගන්නා ලදී.**






- **ඕස්ට්‍රේලියාවෙන් ගෙන එන ලද භාවිතා කරන ලද Cessna ගුවන් යානා තුනක් (172RG, R172K, සහ A152 වර්ගවල) රඳවා ගන්නා ලදී. මේවායේ මුළු වටිනාකම රු. මිලියන 128 ක් ඉක්මවන අතර ඒවා වලංගු ආනයන පාලන බලපත්‍රයක් රහිතව ආනයනය කර ඇත.**





- **දුඹුරු සීනි: සුදු සීනි ලෙස ප්‍රකාශ කරන ලද කි.ග්‍රෑ. 805,550 ක් (පූර්ණ බහාළුම් තොග 30ක්) අල්ලා ගන්නා ලද අතර රු. මිලියන 50ක ලිහිල් කරන ලද රාජසන්තක කිරීමක් සිදු කරන ලදී.**







- **කහ බඩ ඉරිඟු: සත්ව ආහාර සඳහා වන කි.ග්‍රෑ. 659,625 ක් (වටිනාකම රු. 172,423,020) බලපත්‍ර උල්ලංඝනය කිරීම හේතුවෙන් රු. මිලියන 40 ක රාජසන්තක කිරීම් මත නිදහස් කරන ලදී.**





- **සිගරට්: අයන් ඔක්සයිඩ් (Iron Oxide) ආවරණ තුළ සඟවා තිබූ විදේශීය සිගරට් 360,000ක් සොයාගෙන ඇත.**






- **යූරියා පොහොර: බලපත්‍ර රහිතව ආනයනය කරන ලද මෙ.ටො. 55ක් රාජසන්තක කර රු. මිලියන 8කට වෙන්දේසි කරන ලදී.**







## 8.2 ආදායම් හා සේවා පර්ෂදය

### 8.2.1 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය

### 8.2.2 ප්‍රකාශන අංශය

### 8.2.3 මධ්‍යම මිල පිරික්සුම් අංශය

### 8.2.4 ආදායම් හා සේවා (කටුනායක) අංශය

### 8.2.5 කර්මාන්ත හා සේවා අංශය

### 8.2.6 ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය

## 8.2.1 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය

**8.2.1.1** හැඳින්වීම

බලයලත් රේගු නිලධාරීන් විසින් මුහුදු මාර්ගයෙන් (sea cargo) ආනයනික භාණ්ඩ තොග පරීක්ෂා කිරීම, රේගු නිෂ්කාශන ක්‍රියා පටිපාටිය තුළ සිදුකරනු ලබන ප්‍රධාන කාර්යය වේ. මෙම කාර්යය ඉටුකිරීම සඳහා මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය (CCED) 2000.08.23 දින ස්ථාපනය කරන ලද අතර මෙම කාර්යය මූලිකවම අවදානම් කළමනාකරණය මත පදනම්ව ඇත. භාණ්ඩ තොගයක් පරීක්ෂා කිරීම සහ නිදහස් කිරීම සඳහා ගත වන සාමාන්‍ය කාලය, එකතු කරන ලද අමතර ආදායම සහ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස රේගු නීතිය හා අදාල නීති කඩකිරීම් හසුකර ගැනීම, යනාදිය මගින් මෙම භාණ්ඩ පරීක්ෂණ ක්‍රියාවලියේ ඵලදායීතාවය පෙන්වයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යාලය, රේගු අධ්‍යක්ෂකවරයෙකුගේ (CCED) ප්‍රධානත්වයෙන් රැන්ක් බහාලුම් පර්යන්තයෙහි ස්ථාපනය කර ඇති අතර එහි ශාඛා කොළඹ වරායේ, CSL (CVT), ග්‍රේ ලයින් අංගන 02 හි හා රැන්ක් බහාලුම් පර්යන්තයෙහි ක්‍රියාත්මක වේ. භාණ්ඩ පරීක්ෂා ක්‍රමවේදයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ලෝක රේගු සංවිධානය (WCO), ලෝක වෙළඳ සංවිධානය (WTO) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන විසින් නිර්දේශ කර ඇති මෙවලම් සහ තාක්ෂණයන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබේ. මෙම අංශයේ අරමුණ වන්නේ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී අදාල නියාමන පාලන ක්‍රම යොදාගන්නා අතරම ආනයනකරුවන් සඳහා උපරිම මට්ටමින් පහසුම් සැළසීමයි.

**8.2.1.2** අංශයේ ව්‍යුහය

රේගු අධ්‍යක්ෂ (CCED) ප්‍රධානත්වයෙන් යුතු මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය (CCED) ආදායම් හා සේවා පර්ෂදය යටතට අයත්වේ.



#### 8.2.1.3 පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය

පරීක්ෂා කිරීමට ලක්වන භාණ්ඩ වර්ග

- දේශීය භාවිතය සඳහා වන ආනයන
- ආයෝජන මණ්ඩල අනුමත ආයතන මගින් සිදුකරනු ලබන ආනයන

වරණීයතාව (**Selectivity**)

පරීක්ෂා කිරීමේ ප්‍රමාණය (Degree of Examination ) (රතු, ඇම්බර්, පරිලෝකනය කිරීම සහ නිදහස් කිරීම (Scan and release), පරීක්ෂා කිරීම් වලින් නිදහස් කිරීම) සහ තෝරා ගනු ලැබුවේ නම්, පරීක්ෂා කරන ස්ථානය අවදානම් කළමනාකරණ නිර්ණායක පදනම්කර ගනිමින් ASYCUDA පද්ධතිය හරහා ස්වයංක්‍රීයව තෝරාගනු ලැබේ.

අවදානම මත පදනම්ව භාණ්ඩ පරීක්ෂා කිරීම

- සම්පූර්ණ බහාලුම් භාණ්ඩ තොග (FCL)

    රතු වැනල භාණ්ඩ ග්‍රේ ලයින් 1 සහ ග්‍රේ ලයින් 11 අංගන ඔස්සේ ද ඇතැම්විට RCT අංගනයේදී ද පරීක්ෂා කරනු ලැබේ.

    RCT අංගනයේදී ඇම්බර් වැනල් පරීක්ෂා කිරීම් සිදුකරනු ලැබේ.

    අවශ්‍යතාවය අනුව පරීක්ෂා කිරීමේ අංගනයේ ජේ.නි.රේ.අ. විසින් අනුකූලතා මට්ටම, භාණ්ඩවල ස්වභාවය, පරීක්ෂණ අංගනයන්හි පවතින පහසුකම් ආදිය මත පදනම්ව පරීක්ෂා කිරීමේ මට්ටම ඇම්බර් සිට රතු වැනලය දක්වා ඉහළ නැංවීම සිදු කෙරේ.

    වෙළඳාම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් අඩු අවදානම් භාණ්ඩ තොග පරීක්ෂා කිරීම, ආනයනකරුගේ ඉල්ලීම අනුව ඔවුන්ගේ පරිශ්‍රයක දී පත්කරන ලද මණ්ඩලයක් (Panel appointed) මගින් සිදු කිරීම සඳහා ඉඩ සැලසිය හැකිය.

- පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL cargo)

    පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL cargo) වරාය තුළ හෝ NNR ගුදම්වල බෑම සිදු කළ පසු JCT, BQ සහ NNR සඳහා අනුයුක්ත කර ඇති මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශයෙහි කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ.

ආයෝජන මණ්ඩලීය ව්‍යවසායන් සඳහා වන භාණ්ඩ පරීක්ෂා කිරීම

නිදහස් වෙළඳ කලාප වලින් පිටත පිහිටුවා ඇති ආයෝජන මණ්ඩලීය ව්‍යවසායන් සඳහා ආනයනය කරන භාණ්ඩ CVT (BOI) හිදී පරීක්ෂා කරනු ඇත.

#### 8.2.1.4 කාර්යසාධනය

**8.2.1.1 වගුව : කාර්ය සාධනය - 2025**

| | | |
|---|---|---|
| රේගු සටහන්කර සංඛ්‍යාව | | 220,783 |
| පරීක්ෂා කිරීම් ආකාරය | ඇම්බර් | 68,450 |
| | විස්තරාත්මක | - |
| | HRC | - |
| | රතු වැනල | 73,962 |
| | අනෙකුත් (TIEP ආදී) | 18,476 |
| | ආයෝජන මණ්ඩල (BOI) | 59,895 |
| පූර්ණ නොවන බහාලුම් (LCL) සංඛ්‍යාව | | 118,066 |
| පරීක්ෂා කිරීම් ආකාරය | ඇම්බර් | 28,222 |
| | විස්තරාත්මක | - |
| | HRC | - |
| | රතු වැනල | 28,058 |
| | අනෙකුත් (TIEP ආදී) | 15,126 |
| | ආයෝජන මණ්ඩල (BOI) | 46,660 |
| සම්පූර්ණ බහාලුම් (FCL) සංඛ්‍යාව | | 140,582 |
| පරීක්ෂා කිරීම් ආකාරය | ඇම්බර් | 62,038 |
| | විස්තරාත්මක | - |
| | HRC | - |

| | | |
|---|---|---|
| | රතු වැනල | 58,993 |
| | අනෙකුත් (TIEP ආදී) | 6,033 |
| | ආයෝජන මණ්ඩල (BOI) | 13,518 |
| | | |
| **අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව** | | **1,123** |
| | | - |
| **අතිරේක සටහන්කර (AE) අයකරගත් රේගු සටහන්කර සංඛ්‍යාව** | | **2,389** |
| | | |
| **අතිරේක සටහන්කර (AE) හැර අයකරගැනීම් (රු.)** | | **873,154,960** |
| අනාවරණයකර ගැනීම් (රු.) | දඩ සහ වැඩිදුර රාජසන්තක කිරීම් | 747,530,971 |
| | අපහරණය | 95,693,983 |
| | | - |
| අතිකාල (රු.) | සාමාන්‍ය | 4,509,250 |
| | ආයෝජන මණ්ඩල (BOI) | 11,805,099 |
| | | - |
| අනෙකුත් ගාස්තු (රු.) | අයකරගත් SR ගාස්තු (රු.) | 1,444,900 |
| | මුද්‍රා ගාස්තු (රු.) | 3,950 |
| | බාහිර පරීක්ෂණ ගාස්තු (රු.) | 12,166,807 |
| | | |
| **අතිරේක සටහන්කර (A/E) අයකර ගැනීම් (මිල පිරික්සුම් හැර) (රු.)** | | **916,333,867** |
| රේගු ආනයන තීරු බදු (CID) | | 307,474,388 |
| ආනයන සෙස් බදු (EIC) | | 281,932,715 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | | 116,395,960 |
| එකතු කළ අගය මත බදු (VAT) | | 157,559,154 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | | 2,661,226 |
| සමාජ ආරක්ෂණ බදු (SSL) | | 36,711,834 |
| අධිභාර (SUR) | | - |
| XID | | 2,248,536 |
| වෙනත් | | 11,350,054 |
| **මුළු අයකර ගැනීම්** | | **1,789,488,827** |
| | | |
| **ඇපකර විස්තර** | | |
| ලියාපදිංචි කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාව | | 3,712 |
| නිදහස් කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාව | | 2,813 |
| ලියාපදිංචි කරන ලද පුද්ගලික ඇපකර සංඛ්‍යාව | | 1,578 |
| නිදහස් කරන ලද පුද්ගලික ඇපකර සංඛ්‍යාව | | 355 |

*මූලාශ්‍රය : මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.2.2 ප්‍රකාශන අංශය

### 8.2.2.1 හැඳින්වීම

ප්‍රකාශන අංශය යනු අදාළ ආනයනකරුවන් විසින් මුහුදු මාර්ගයෙන් ආනයනය කරන සියලුම භාණ්ඩ සම්බන්ධයෙන් රේගු සටහන්කර (Cusdecs) ඉදිරිපත් කළ විට ඊට අදාළ ඉදිරි කටයුතු කරනු ලබන ස්ථානයයි.

මෙම අංශය පහත ඒකකයන්ගෙන් සමන්විත වේ.

1. දිගු කාමරය
2. මෝටර් රථ අංශය
3. "D" ශාඛාව

### 8.2.2.2 අංශයේ විෂය පථය

මෙම අංශයේ ප්‍රධාන විෂය පථය වන්නේ ආනයනික භාණ්ඩ සඳහා වන රේගු ප්‍රකාශනවලට අදාළ කටයුතු සඳහා පහසුකම් සැපයීමයි. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් විශේෂයෙන් පහත පරිදි පහසුකම් සපයා ඇත.

- ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් නෞභාර ලේඛන ලබාගැනීම.
- DTI හරහා රේගු සටහන්කර ලබාගැනීම.
- රේගු සටහන්කරවලට අදාල තීරු බදු හා අනෙකුත් ගාස්තු මාර්ගගතව මෙන්ම බැංකු හරහා ගෙවීම.
- තෝරාගත් ආනයනකරුවන් සඳහා කඩිනම් (Fast Track) රේගු සටහන්කර සැකසීමේ පහසුකම සපයාදීම.
- වෙන් කරන ලද නිලධාරීන් විසින් රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීම.
- SLPA, SAGT සහ CICT අංගන වලින් FCL බහාලුම් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් නිකුත් කිරීම.

ආනයනකරුවන්ට අප්‍රමාදව රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීමේ පහසුකම් සැලසීම සඳහා "ASYCUDA World" පද්ධතිය හරහා ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය දැනට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. දිගු කාමරයේ (දෙවන මහලේ) ඇති "ASYCUDA" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියළු විස්තර ලබාගැනීමට කටයුතු කරන අතර එමඟින් පරිශීලකයින්ට DTI පහසුකම යොදාගෙන සිය කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඍජුවම ඇතුළත් කිරීමට ඉඩ ලබා දේ.

### 8.2.2.3 අංශයේ අරමුණු

- ආනයනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා පහසුකම් සැලසීම.
- භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා හා වෙනත් ආකාරවලින් සිදුවන ආදායම් අහිමිවීම් /විදේශ විනිමය අහිමි වීම් අවම කිරිම.
- "D" අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීතිවලට අනුකූලව බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.
- ආනයන භාණ්ඩ මත පනවන බදු මගින් රජයට ලැබිය යුතු ආදායම නියමිත පරිදි ගණනය කිරීම හා රැස් කිරීම.
- ව්‍යාපෘති සඳහා වන භාණ්ඩ තොග (project cargo) සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බදු සහන ලබා දෙමින් ඊට අදාළ නිෂ්කාශන පහසුකම් සැලසීම.
- බලපත්‍ර හිමියන්ට තම වාහන/ භාණ්ඩ ඉක්මනින් නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/ අනෙකුත් සංවිධාන/ මහජනයාට තාවකාලික රේගු සටහන්කර (provisional CusDecs) හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට පහසුකම් සැලසීම.
- රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු සහන/ තීරු බදු සහ අනෙකුත් බදු නිදහස් කිරීම් හා තාවකාලිකව නතර කිරීම් ලබාදීම.
- තහනම් කරන ලද සහ සීමා කරන ලද භාණ්ඩ පිළිබඳ ඵලදායී බලාත්මක කිරීමක් පවත්වා ගෙන යාම.

### 8.2.2.4 ප්‍රකාශන අංශයේ කාර්ය මණ්ඩලයේ වගකීම.

දිගු කාමරයේ කාර්ය මණ්ඩලය විසින් රේගු සටහන්කරවලට අදාළව ඉක්මනින් කටයුතු කිරීම සහ රජයට ලැබිය යුතු ආදායම එකතු කිරීම සිදුකරන අතරම, අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොරව ආනයන භාණ්ඩ නිෂ්කාශනය සහතික කරයි. මෙම නිලධාරීන් විසින් නිෂ්කාශන සඳහා ආනයන අපනයන පාලකවරයා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර සහ ඖෂධ පරීක්ෂා කිරීමේ ඒකකය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පරමාණුක බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි අනෙකුත් නියාමන ආයතනවලින් බලපත්‍ර සහ/හෝ විශේෂ අවසරයක් අවශ්‍ය කරන සහ ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය සහ පටවන රටේ වරාය පරීක්ෂණ වාර්තාව (Load Port Survey Report) ආදී අපනයනය කරන රට විසින් නිකුත් කරන සහතික අවශ්‍ය කරන භාණ්ඩ පිළිබඳව විමසිලිමත් වේ.

ඉක්මන් රේගු සටහන්කර ක්‍රියාවලියක් සඳහා, ආනයනකරුවන් විසින් පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකිරීම වැදගත් වේ.

- භාණ්ඩ නිෂ්කාශනය සඳහා නිෂ්කාශන හිමිකම් ලබාගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහන නැව් සමාගමෙන් ලබාගත් අවසරය.
- භාණ්ඩ තොගය පිළිබඳ සම්පූර්ණ විස්තරයක්.
- නිවැරදි සංයෝජිත සංකේතාංක පද්ධති නාමකරණ (Harmonized System Nomenclature) අනුව භාණ්ඩ වර්ගීකරණය කිරීම (රේගු ආනයන තීරුබදු පදනම් වන්නේ මේ මතය).
- අදාල මුදල් වර්ගය භාවිතා කරමින් අදාල හුවමාරු අනුපාතයට භාණ්ඩ වටිනාකම ප්‍රකාශ කිරීම.
- පිළිගත්/ අවසරලත් බැංකු හරහා භාණ්ඩ සඳහා ගෙවීම් (විනිමය හුවමාරුව) සිදුකිරීම.
- අදාල පරිදි අවශ්‍ය අවසර ලබාදීමේ ලේඛන, බලපත්‍ර, සහතික ආදිය රේගු සටහන්කරවලට ඇමිණීම.
- ඉහත සඳහන් සියලු අවශ්‍යතාවයන් සපුරා ඇති නම්, අදාළ නිලධාරීන්ට භාණ්ඩ නිෂ්කාශනය සඳහා එම රේගු සටහන්කරවල ඉදිරි කටයුතු සිදුකළ හැකිවේ.

**8.2.2.5** ඉහත සඳහන් කළ පරිදි මෙම අංශය ප්‍රධාන ශාඛා/ ඒකක 03 කින් සමන්විත වේ.

**8.2.2.5.1** දිගු කාමරය **(Long Room)**

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේ දී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර, අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත් විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා: ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් ආදායම එකතු කරන රාජ්‍ය ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැක. සමස්තයක් ලෙස මෙම අංශයෙහි කාර්යභාරය කාලයත් සමග සමාජ ආරක්ෂණ වගකීම් ඉටුකිරීම් වැනි පැතිකඩයන් කෙරෙහි විකාශනය වී තිබුණ ද මෙහි ප්‍රධානතම අරමුණවන ආදායම් රැස් කිරීමේ ප්‍රමුඛතාවයේ වෙනසක් සිදු වී නොමැත.

රේගු ආඥා පනතේ 10 වන වගන්තිය මගින් රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරා ඇත. තවද එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳව සත්‍ය සහ නිවැරදි ලෙස ප්‍රකාශයක් රේගුවට කළ යුතු අතර එකී භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු බදු (තීරු බදු ආදිය) ගෙවිය යුතුය.

රේගුව විසින් රේගු බදු පමණක් නොව පහත දැක්වෙන අනෙකුත් බදු වර්ග ද අයකිරීම සඳහා පහසුකම් සලසනු ලැබේ;

| | |
|---|---|
| එකතු කළ අගය මත බදු | Value Added Tax |
| වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු | Port and Airport Development Levy |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | Special Commodity Levy |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | Excise (Special Provisions) Duty |
| අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බදු | Cess on behalf of other government institutions |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | Social Security Contribution Levy |
| සුඛෝපභෝගී බදු | Luxury Tax |
| වාහන හිමිකම් බදු | Vehicle Entitlement Levy |

රේගු සටහන්කර සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් අංශ 05 කට බෙදා ඇත. (එක් ඒකකයක් නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරු දෙදෙනෙක් සහ රේගු අධිකාරිවරුන් හතර දෙනෙකුගෙන් (තක්සේරු නිලධාරීන්) සමන්විත වේ. අධීක්ෂණය හා පරිහරණය කිරීමේ පහසුව සඳහා රේගු සටහන්කර පහත පරිදි එක් එක් ඒකකය වෙත වෙන්කර ඇත.

| | | |
|---|---|---|
| A ඒකකය | - | රේගු සටහන්කරයන්හි අවසන් අංක 0 - 9 |
| B ඒකකය | - | රේගු සටහන්කරයන්හි අවසන් අංක 1 - 8 |
| C ඒකකය | - | රේගු සටහන්කරයන්හි අවසන් අංක 2 - 7 |
| D ඒකකය | - | රේගු සටහන්කරයන්හි අවසන් අංක 3 - 6 |
| E ඒකකය | - | රේගු සටහන්කරයන්හි අවසන් අංක 4 - 5 |

රේගු සටහන්කර ඉදිරිපත් කිරීම

**CusDec** යනු රේගු සටහන්කරවල කෙටි යෙදුමයි. ආනයනකරු විසින් රේගු සටහන්කර ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. රේගු සටහන්කර සමගින්, පහත සඳහන් අනෙකුත් ලේඛන PDF ආකාරයෙන් හෝ ස්කෑන් කරන ලද ලියවිල්ලක් ආකාරයෙන් උඩුගත කළ යුතු වේ.

- නෞභාර පත්‍රය (Bill of Lading)
- භාර දීමේ නියෝගය (Delivery Order)
- ඉන්වොයිස් පත්‍රය (විදේශ විනිමය අදාළ නොවන පදනමින් (NFE) භාණ්ඩ ආනයනයක දී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද)
- ඇසුරුම් ලේඛනය (Packing List)
- සංයෝජිත වර්ගීකරණය (HS) හඳුනා ගැනීමට අදාළ යම් තාක්ෂණික තොරතුරු ඇතුළත් ලේඛන
- නිෂ්පාදිත රට (Country of Origin) තහවුරු කිරීමට අදාළ ලියවිලි

- ආනයනය කරන ලද භාණ්ඩ සීමා කල භාණ්ඩ (Restricted Goods) නම් ඊට අදාළ ආනයන බලපත්‍ර . උදා:ICL, SLSI, NMRA ආදී බලපත්‍ර
- ණයවර ලිපි (Letter of Credit), ටෙලිග්‍රැෆික් මාර්ගයෙන් මාරුකිරීම (Telegraphic Transfer) වැනි ප්‍රේෂණ ක්‍රම සඳහා තහවුරු කිරීම්
- වෙනත් විශේෂ සහතික කිරීම් (රාජ්‍ය තාන්ත්‍රික, තීරු බදු සහන, ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්තාව ආදිය).

රේගු ආඥාපනතේ 12 හා 43 වගන්ති සහ "ආ" උපලේඛනයට අනුව රේගුව වෙත බලය පවරා ඇති පරිදි භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියකින් පනවා ඇති සීමාවන් හා තහනම් කිරීම් බලාත්මක කිරීම කළ යුතුය. ඉතා පුළුල් පරාසයක විහිදී ඇති මෙම විධිවිධානයන්හි ප්‍රතිඵලයක් ලෙස, රේගුවට දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥා පනත් හා රෙගුලාසි විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට සිදු වේ. 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත මේ අතරින් ප්‍රධාන වේ.

#### 8.2.2.5.2 මෝටර් වාහන ඒකකය

මෙ වනවිට ACCESS ජාලයේ යොදවා ඇති "ASYCUDA World" මෘදුකාංගය මගින් ශ්‍රී ලංකා රේගුවට භාණ්ඩ ආනයනයේදී සම්ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය පරීක්ෂා කිරීම සඳහා බැංකු සමඟ සම්බන්ධ වීමට හැකිවේ. ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සබැඳිය හරහා වාහන ආනයන තොරතුරු ලබා දෙන අතර, එමඟින් තීරු බදු හා රේගුව මගින් අයකරනු ලබන අනෙකුත් ගාස්තු නොගෙවන ලද වාහන ලියාපදිංචි වීම වැළැක්වීම සිදුවේ. රේගු සටහන්කර හා සම්බන්ධව කටයුතු කිරීමේදී නිලධාරීන් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

- ත්‍යාග වාහන හා පැරණි වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL)
- රාජ්‍ය සේවකයන්ට, පාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන මණ්ඩල නිලධාරීන් සඳහා සහනදායී හා තාවකාලික ආනයන බලපත්‍ර
- රාජ්‍ය තාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද තීරුබදු රහිත බලපත්‍ර
- ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන්කර

වාහන සඳහා වන රේගු සටහන්කර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී ඒකකයේ නිලධාරීන් විසින් පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතුය.

භාණ්ඩ විස්තර පහත ලේඛණ පරිදි නිසියාකාරව දක්වා ඇතිදැයි පරීක්ෂා කර බැලීම.

- ලියාපදිංචි කිරීමේ සහතිකය
- පරීක්ෂා කිරීමේ සහතිකය (Inspection Certificate)
- ඉන්වොයිසිය
- අංගනයේදී වාහන පරීක්ෂා කරන තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- ඉන්වොයිසිය අනුව වාහනයේ වයස නිවැරදිව ඇතුළත් කර ඇති ද යන්න.
- නිෂ්පාදිත රට නිවැරදිව ප්‍රකාශ කිරීම.
- නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද යන වග
- සඳහන් කරන ලද උපාංග පරීක්ෂා කිරීමේ සහතිකය සමඟ ගැලපීම.
- සහනදායී ආනයන සඳහා අදාල බලපත්‍රය ලබාදේ.
- භාණ්ඩ ආනයන හා අපනයන පාලකවරයා විසින් විවිධ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කරන ලද තාවකාලිකව තහනම් කරන ලද කාණ්ඩ යටතට ගැනේද යන්න

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (රථ වාහන) විසින් වාහන නිෂ්කාශනය සඳහා අවසර ලබාදේ.

#### 8.2.2.5.3 "D" ශාඛාව

"D" ශාඛාව අංශයේ ලේකම් කාර්යාලය ලෙස සැළකිය හැක. ඓතිහාසික වශයෙන් වසර 200 කට පමණ පෙර රේගු පාලක ජනරාල්වරයා පත්කිරීමේදී 'A' විෂයය, 'B' විෂයය, 'C' විෂයය ,'D' විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔහු යටතේ ලිපිකරුවන් හතර දෙනෙකු සේවයේ නියුතුව (4) සිට ඇත. 'A' විෂයයට අදාළ ලිපිකරු "වරාය ගාස්තු" සම්බන්ධ රාජකාරි ඉටුකළ අතර පසුව එම සමස්ත ඒකකය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් විකාශය වී වෙනම ආයතනයක් ලෙස ස්ථාපනය විය. තීරුබදු සහන ලබාදීම සහ බදු නිදහස් කිරීම් ලබාදීම සඳහා ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණය සිදු කළ පැරණි "D" ශාඛාව නැව් භාණ්ඩ ලේඛන භාරගැනීම ආදිය සිදු කරමින් තවමත් අඩු හෝ වැඩි වශයෙන් එම කාර්යයන්ම ඉටු කරනු ලබන අතර දිගටම මුල් නාමයෙන්ම හැඳින්වේ.

ආනයනකරුවන්/ මහජනයා සඳහා පහසුකම් සැළසීමට "D" ශාඛාව විවිධ ඒකකයන්ගෙන් සමන්විත වේ. ඒවානම්,

- DRA අංශය
- බැංකු ඇපකර ඒකකය
- තීරු බදු සහන ඒකකය
- තොග භාණ්ඩ අධීක්ෂණ ඒකකය
- කානේ (Carnet) ඒකකය
- Manifest ඒකකය
- විමර්ශන ඒකකය
- ජොෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීම්, ඉවත් කිරීමේ අංශය.

**8.2.2.6** "D" ශාඛාව විසින් සිදු කරනු ලබන වැදගත් මෙන්ම ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරු බදු සහන ලියාපදිංචි කිරීම සහ තීරු බදු රහිත පදනම මත එම භාණ්ඩ නිෂ්කාශනයට පහසුකම් ලබාදීම.
- පාර්ලිමේන්තුවේ අනුමත වූ ආදායම් සංරක්ෂණ ආඥාව අනුව තීරු බදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් නිෂ්කාශන සහතිකය පදනම් කර ගනිමින් රාජ්‍යතාන්ත්‍රික භාණ්ඩ සහ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ නිෂ්කාශනයට අවසර දීම.
- විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා තීරුබදු නිදහස් හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
- මුදල් අමාත්‍යාංශයේ උපදෙස්වලට අනුකූලව විලම්භනය කරන ලද ගෙවීම් කොන්දේසි යටතේ රාජ්‍ය ආයතන සඳහා එවන ලද භාණ්ඩ නිෂ්කාශනයේ දී පහසුකම් සැලසීම.
- විවිධ හේතු මත එම අවස්ථාවේදීම ක්‍රියාවලිය අවසන් කළ නොහැකි හා යම් කිසි කාර්යයන් සඳහා ආනයනය කරන ලදුව එම කාර්යය අවසන් වූ පසුව ප්‍රතිඅපනයනයන් සිදු කරනු ලබන භාණ්ඩ සඳහා වූ එහි නිෂ්කාශන ක්‍රියාවලිය (Provisional Basis) සිදු කිරීමට පහසුකම් සැලසීම.
- මුදල් අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රති-අපනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ (Project cargo) ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම.
- නාවුක නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන පරිදි නෞභාර ලේඛන භාරගැනීම හා ඒවා සංශෝධනය කිරීම.
- රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකර/ ආයතනික ඇපකර ලබාගැනීම.
- තාවකාලිකව CPD CARNET හෝ ATA CARNET මත ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
- තොග භාණ්ඩ ආනයනය අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අතිරේක අයකිරීම් (Additional Recoveries) ලබාගැනීම.
- මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම සඳහා තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම.
- එතනෝල් වැටලීම් හා කොටස් කරන ලද වාහන අත්අඩංගුවට ගැනීම වැනි විවිධ ආනයනය පාලන නීති / රේගු නීති කඩකිරීම් හසුකර ගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියාකිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

**8.2.2.7** කාර්යසාධනය

**8.2.2.1** වගුව : කාර්යසාධනය - **2025**

| | විස්තරය | CPC කේතය | |
|---|---|---|---|
| | DRA යටතේ ලියාපදිංචි කර ඇති තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව (ටින් මාළු) | 4200 OP1 | 08 |
| | DRA යටතේ නිමකරන ලද තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව (ටින් මාළු) | 4300 000 | 00 |
| | DRA (CPC/IOC) යටතේ ලියාපදිංචි කරන ලද තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව | 4200 151 | 119 |
| DRA | DRA යටතේ ලියාපදිංචි කරන ලද තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව (*CPC/*IOC) | 4300 151 | 77 |
| 1 | DRA (අනෙකුත්) යටතේ නිමකරන ලද තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව | 4200 OPI | 1,882 |
| 2 | DRA (අනෙකුත්) යටතේ අවසන් කරන ලද තාවකාලික රේගු සටහන්කර (Provisional CusDecs) සංඛ්‍යාව | 4300 000 | 122 |
| 3 | ලියාපදිංචි කරන ලද DCP CARNET සංඛ්‍යාව | | 26 |
| 4 | ලියාපදිංචි කරන ලද ATA CARNET සංඛ්‍යාව | 4200 205 | 28 |
| 5 | AD සටහන්කර සංඛ්‍යාව | 4000 799 | 02 |

| | | | |
|---|---|---|---|
| 6 | ලියාපදිංචි කරන ලද ගබඩා බිල් පත් (Bill of Stores) සංඛ්‍යාව | 4000 799 | 97 |
| 8 | ලියාපදිංචි කරන ලද Bill of Sight සංඛ්‍යාව | 4000 799 | - |
| 9 | ලියාපදිංචි කරන ලද Bulk Cargo සටහන්කර සංඛ්‍යාව | 4200 000 | 691 |
| 10 | නිම කරන ලද Bulk Cargo සටහන්කර සංඛ්‍යාව | 4300 000 | 199 |
| 11 | මුළු තොග අධීක්ෂණ ගාස්තු (රු.) | | 6,910,000.00 |
| 12 | ලියාපදිංචි කරන ලද **FRIC** සංඛ්‍යාව | 4200 060 | 93 |
| | | | |
| 1 | **ISFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | 4000 000 | 14,887 |
| 2 | **PSFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | 4000 000 | 778 |
| 3 | **SAFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | 4000 000 | 629 |
| 4 | **APTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | 4000 000 | 672 |
| 5 | **SAARC** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | 4000 000 | - |
| 6 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (දුම්රිය දෙපාර්තමේන්තුව) | 4000 223 | 08 |
| 7 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (නාගරික සංවර්ධන අධිකාරිය) | 4000 223 | 53 |
| 8 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය) | 4000 223 | 00 |
| 9 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය) | 4000 223 | - |
| 10 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය) | 4000 223 | 40 |
| 11 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් ( (ආරක්ෂක අමාත්‍යාංශය ) | 4000 223 | - |
| 12 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (දුම්රිය කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය) | 4000 223 | - |
| 13 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (මාර්ග සංවර්ධන අධිකාරිය) | 4000 223 | 02 |
| 14 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ශ්‍රී ලංකා නාවික හමුදාව) | 4000 223 | 05 |
| 15 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (උමා ඔය ව්‍යාපෘතිය) | 4000 223 | - |
| 16 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (රාජ්‍යතාන්ත්‍රික DPL) | 4000 223 | - |
| 17 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය) | 4000 223 | - |
| 18 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ජාතික උරුම අමාත්‍යාංශය ) | 4000 223 | - |
| 19 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) | 4000 223 | - |
| 20 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ගුවන්තොටුපළ හා ගුවන් සේවා දෙපාර්තමේන්තුව) | 4000 223 | - |
| 21 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (තාක්ෂණ අමාත්‍යාංශය) | 4000 223 | - |
| 22 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය) | 4000 223 | 92 |
| 23 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ලංකා විදුලිබල මණ්ඩලය) | 4000 223 | 26 |
| 24 | දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (වෙනත් අමාත්‍යාංශ) | 4000 223 | 749 |
| 25 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | 4000 223 | - |
| 26 | විලම්භනය කරන ලද VAT | 4000 571 | - |
| 27 | අනෙකුත් **NBT/XID/CESS/PAL** | 4000 735 | |
| 28 | බදු සහන ලයිස්තුව යටතේ ලබා දුන් බදු සහන | 4000 MLB | |
| | | | **19A** බදු නිදහස් කිරීම් |
| 1 | කිරි පිටි | 4000 151 | - |
| 2 | උණ ලී | 4000 151 | 12 |
| 3 | තිරිඟු පිටි | 4000 151 | 134 |

| | | | |
|---|---|---|---|
| 4 | ගෑස් තෙල් | 4000 151 | 181 |
| 5 | සාමාන්‍යය | 4000 151 | - |
| | | | වාහන බලපත්‍ර |
| 1 | සාමාන්‍යය | 4000 MLB | 8,439 |
| 2 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | 4000 MLB | |
| 3 | පා. ම. | 4000 MLB | |
| 4 | විදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ යටතේ | 4000 MLB | |
| 5 | පළාත් සභා | 4000 MLB | |
| | | | බැංකු ඇපකර 4200 OPI සහ 4200 100F |
| 1 | වසර තුළ ලබාගත් ඇපකර සංඛ්‍යාව | | 512 |
| 2 | වසර තුළ ලබාගත් ඇපකර වල මුළු වටිනාකම (රු.) | | 3,185,867,635.31 |
| 3 | නිදහස් කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාව | | 300 |
| 4 | නිදහස් කරන ලද ඇපකර වල මුළු වටිනාකම (රු.) | | 4,712,229,455.90 |
| 5 | ලැබුණු සහ බැංකුවේ තැන්පත් කරන ලද ගෙවීම් චෙක්පත් සංඛ්‍යාව | | 2 |
| 6 | තැන්පත් කරන ලද චෙක්පත් වල මුළු වටිනාකම (රු.) | | 10,076,466.00 |
| | | | නොහාර ලේඛණ |
| 1 | සංශෝධනය කරන ලද නොහාර ලේඛණ සංඛ්‍යාව | | 3,242 |
| 2 | අයකර ගනු ලැබූ මුළු දඩ ප්‍රමාණය (රු.) | | 268,567,633.60 |
| | | | දිගු කාමර සහ මෝටර් රථ අංශයේ දඩ |
| 1 | දඩ අයකරනු ලැබූ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | | 1,852 |
| 2 | අයකර ගනු ලැබූ මුළු දඩ ප්‍රමාණය (රු.) | | 145,887,893.19 |

*CPC – Ceylon Petroleum Corporation *IOC – Indian Oil Corporation

*මූලාශ්‍රය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.2.2 වගුව : 2025 වර්ෂය සඳහා ආදායම් රැස් කිරීම**

| ශාඛාව | ආදායම් රැස් කිරීම (රු.) |
|---|---|
| දිගු කාමරය | |
| CBHQ1 | 855,653,403,783 |
| CCCO | 0 |
| CBPP1 | 31,253,198 |
| CBPS1 | 1,795,150 |
| CBCDU | 936,550 |
| CEMPC | 114,715,157 |
| CBLR | 0 |
| CBPC1 | 37,738,024 |
| මුළු එකතුව - දිගු කාමරය | **855,839,841,862** |
| මෝටර් රථ ඒකකය | |
| CBMV1 | 237,705,397,685 |
| HBIM1 | 645,009,636,339 |
| මුළු එකතුව - මෝටර් රථ ඒකකය | **882,715,034,024** |
| **D** ශාඛාව | |
| DBRA1 | 482,762,283,334 |
| DBRA2 | 29,155,884 |
| මුළු එකතුව – **D** ශාඛාව | **482,791,439,218** |
| | |
| මුළු එකතුව | **2,221,346,315,104** |

*මූලාශ්‍රය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.2.1 රූපසටහන : ආදායම් රැස්කිරීම සැසඳීම (රු.මි.)**




*මූලාශ්‍රය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.2.3 වගුව : කටයුතු කරන ලද රේගු සටහන්කර - 2025**

| ශාඛාව | රේගු සටහන්කර සංඛ්‍යාව |
|---|---:|
| දිගු කාමරය | |
| CBHQ1 | 210,427 |
| CCCO1 | 38 |
| CBPP1 | 148 |
| CBPS1 | 5,280 |
| CBCDU | 110 |
| CEMPC | 103 |
| CBLR | 0 |
| CBPC1 | 59 |
| මුළු එකතුව - දිගු කාමරය | **216,165** |
| මෝටර් රථ ඒකකය | |
| CBMV1 | 13,300 |
| HBIM1 | 57,295 |
| මුළු එකතුව - මෝටර් රථ ඒකකය | **70,595** |
| **D** ශාඛාව | |
| DBRA1 | 1,913 |
| DBRA2 | 18 |
| මුළු එකතුව – **D** ශාඛාව | **1,931** |
| | |
| මුළු එකතුව | **288,691** |

*මූලාශ්‍රය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.2.2 රූපසටහන : කටයුතු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව සැසඳීම**




*මූලාශ්‍රය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.2.3 මධ්‍යම මිල පිරික්සුම් අංශය

### 8.2.3.1 හැඳින්වීම

වටිනාකම අනුව රේගු බදු ගණනය කරන අවස්ථාවන්හිදී ආනයනික භාණ්ඩවල (මෝටර් රථ හැර) වටිනාකම තක්සේරු කිරීම මධ්‍යම මිල පිරික්සුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මීට අමතරව, අත්හැර දමන ලද හෝ අත්අඩංගුවට ගනු ලැබූ භාණ්ඩ ටෙන්ඩර මගින් විකිණීමේ දී අදාළ භාණ්ඩ වල මිල පිරික්සුම් කිරීම ද මෙම අංශය යටතට පැවරේ. රේගු ආඥා පනතේ 51 හා 52 වන වගන්ති හා "ඉ" උපලේඛණය ඇතුලත් කර ඇති ලෝක වෙළඳ සංවිධානයේ (WTO) රේගු මිල පිරික්සුම් ගිවිසුමෙහි ඇතුලත් මිල පිරික්සුම් මූලධර්ම යොදාගනී. මෙම අංශය මගින් ක්‍රියාකාරී ඒකක අතර බෙදාහැරීම සඳහා වටිනාකම් පිළිබඳ දත්ත එකතු කිරීම හා සකස් කිරීම සඳහා නවීන මෙවලම් හා පර්යේෂණ පහසුකම් යොදාගනු ලැබේ. තවද රාජ්‍යය- පෞද්ගලික හවුල්කාරීත්වය ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැපයීම ද මෙම අංශය මගින් සිදු කරනු ලබයි.
මිල පිරික්සුම් කාර්යයන් ඉටුකිරීම සඳහා මිල පිරික්සුම් ඒකකය පහත පරිදි කාර්යාල තුනකින් සමන්විත වේ:

i. රැන්ක් බහාලුම් පර්යන්තයේ (RCT) පිහිටි මධ්‍යම මිල පිරික්සුම් අංශය.
ii. දිගු කාමරයේ ඇති Fast Track මිල පිරික්සුම් කාර්යාලය.
iii. කටුනායක ගුවන් භාණ්ඩ කාර්යාලයේ පිහිටි ප්‍රාදේශීය මිල පිරික්සුම් කාර්යාලය.

මධ්‍යම මිල පිරික්සුම් අංශයේ ප්‍රධාන කාර්යාලය ඔරුගොඩවත්ත රැන්ක් බහාලුම් පර්යන්තයේ පිහිටා ඇත. අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික) යටතට මෙම අංශය අයත්වන අතර මෙම අංශයේ සුපරීක්ෂණය රේගු අධ්‍යක්ෂ (මිල පිරික්සුම්) වෙත පැවරී ඇත. තවද නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු යටතේ මෙහෙයුම් කටයුතු පාලනය වේ.
තක්සේරු නිලධාරීන් හත් දෙනෙකුගේ (නියෝජ්‍ය රේගු අධිකාරීවරුන්) සහ සහකාර රේගු අධිකාරීවරුන් දස දෙනෙකුගේ සහය ඇතිව රේගු අධිකාරීවරුන් අට දෙනෙකු විසින් විමර්ශන, පර්යේෂණ, ලියාපදිංචි කිරීම්, පශ්චාත් සටහන් සංශෝධන, ගෙවීම් සත්‍යාපන හා ඇප සහතික කළමනාකරණය සිදුකරනු ලැබේ.

### 8.2.3.2 අංශයේ ප්‍රධාන කාර්යයන් :

- රේගු මිල පිරික්සුම හා සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු වලදී මිල පිරික්සුම් කමිටුවට සහයවීම.
- මිල පිරික්සුම් නීතිය කාර්යක්ෂම සහ ඒකීය ලෙස යෙදවීම සඳහා මිල පිරික්සුම් මෙවලම් (දත්ත ගබඩා සහ කලින් කලට සිදුකරන දැනුම්දීම් ඇතුලුව) සහ ප්‍රශස්ත ක්‍රියා පිළිවෙත් සංවර්ධනය කිරීම.
- වෙළඳ භාණ්ඩවල මිල සත්‍යාපනය කිරීම.
- මිල පිරික්සුම් කිරීමේ ගැටලු විසඳීමේදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් දිරිමත් කිරීම හා මිල තක්සේරුකරණයට අදාළ පර්යේෂණයන්හිදී රාජ්‍ය හවුල්කාරිත්වය දිරිමත් කිරීම.
- සංවේදී භාණ්ඩවල මිල ප්‍රවණතා අධීක්ෂණය කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.
- මිල පිරික්සුම් මාර්ගෝපදේශ සහ ක්‍රමවේද ඵලදායි ලෙස යෙදවීම හා අනුගමනය කිරීම තහවුරු කරගැනීම සඳහා මිල පිරික්සුම් පරීක්ෂාවන්/ විමර්ශනයන් සිදුකිරීම.
- රේගු මිල පිරික්සුම් වලට අදාළ කරුණු වලදී අදාල ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.
- අධ්‍යයනයන් සිදුකිරීම හා අවශ්‍ය ආදාන ලබාදීම තුළින් හුවමාරු මිල (transfer pricing) සම්බන්ධ ගැටලු විසඳීම.

### 8.2.3.3 කාර්යසාධනය

**8.2.3.1 වගුව : කටයුතු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව -2025**

| මාසය | මිල පිරික්සුම සඳහා යොමු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව | AE (Additional Entry) අයකරගත් සටහන්කර සංඛ්‍යාව | වටිනාකම ඉහළ නැංවීම % |
|---|---|---|---|
| ජනවාරි | 3,603 | 1,977 | 54% |
| පෙබරවාරි | 3,481 | 2,043 | 58% |
| මාර්තු | 3,272 | 1,555 | 47% |
| අප්‍රේල් | 3,150 | 1,507 | 47% |
| මැයි | 5076 | 1,771 | 34% |
| ජූනි | 4,739 | 1,712 | 36% |
| ජූලි | 5,090 | 1,918 | 37% |
| අගෝස්තු | 4,894 | 2,003 | 40% |
| සැප්තැම්බර් | 5,103 | 2,242 | 43% |
| ඔක්තෝබර් | 5,610 | 2,228 | 39% |
| නොවැම්බර් | 5,110 | 1,893 | 37% |
| දෙසැම්බර් | 6,125 | 2,183 | 35% |
| එකතුව | **55,253** | **23,032** | **41%** |

*මූලාශ්‍රය : මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.3.2** වගුව : ආදායම රැස්කිරීම සැසඳීම (රු.)

| මාසය | 2017 | | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 96,976,771 | | 162,436,213 | 137,861,340 | 144,183,848 | 122,928,057 | 161,908,100 | 236,485,869 | 1,117,635,145 | 934,052,323 |
| පෙබරවාරි | 92,588,732 | | 197,606,168 | 199,983,030 | 105,983,866 | 164,236,827 | 140,321,155 | 362,317,541 | 1,137,865,495 | 938,184,531 |
| මාර්තු | 124,223,659 | | 139,270,365 | 120,416,213 | 24,305,563 | 186,305,872 | 109,684,573 | 445,182,526 | 853,275,156 | 694,147,198 |
| අප්‍රේල් | 115,021,168 | | 172,654,159 | 132,439,443 | 63,162,192 | 158,725,332 | 122,498,186 | 583,851,468 | 627,449,467 | 713,766,217 |
| මැයි | 133,249,396 | | 145,106,782 | 193,606,520 | 39,312,834 | 156,899,840 | 85,905,778 | 449,202,751 | 735,205,779 | 771,481,018 |
| ජූනි | 137,691,728 | | 174,176,732 | 139,689,506 | 55,953,600 | 177,211,201 | 93,209,007 | 371,445,383 | 392,277,134 | 711,508,716 |
| ජූලි | 124,688,097 | | 118,414,464 | 169,113,512 | 98,974,903 | 84,991,835 | 68,459,191 | 685,811,153 | 892,380,007 | 801,723,731 |
| අගෝස්තු | 156,586,926 | | 156,252,561 | 180,739,571 | 120,472,762 | 119,628,995 | 126,660,162 | 707,436,899 | 897,857,056 | 958,738,266 |
| සැප්තැම්බර් | 144,727,507 | | 138,100,571 | 152,906,330 | 136,495,645 | 116,716,100 | 178,854,932 | 724,154,104 | 835,064,061 | 1,082,838,653 |
| ඔක්තෝබර් | 156,768,427 | | 176,677,684 | 149,523,186 | 144,617,361 | 98,523,887 | 251,229,133 | 765,088,807 | 926,479,158 | 1,000,689,839 |
| නොවැම්බර් | 169,522,592 | | 146,612,176 | 191,526,236 | 125,879,311 | 114,112,419 | 191,754,301 | 776,136,812 | 875,150,133 | 856,515,098 |
| දෙසැම්බර් | 181,737,644 | | 155,126,605 | 145,948,818 | 124,631,998 | 190,164,310 | 177,259,607 | 784,885,259 | 943,521,859 | 983,580,219 |
| | **1,633,782,647** | | **1,882,434,480** | **1,913,753,705** | **1,183,973,883** | **1,690,444,675** | **1,707,744,125** | **6,891,998,572** | **10,234,160,450** | **10,447,225,809** |

*මූලාශ්‍රය : මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.3.3** රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම




*මූලාශ්‍රය : මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.3.3 වගුව : මිල පිරික්සුම් කාර්යසාධනය (ගුවන් භාණ්ඩ)  - 2025**

| මාසය | රැස් කළ A/E (රු.) |
|---|---|
| ජනවාරි | 5,876,328.00 |
| පෙබරවාරි | 5,317,283.00 |
| මාර්තු | 9,611,015.00 |
| අප්‍රේල් | 6,094,956.00 |
| මැයි | 4,626,369.00 |
| ජූනි | 7,502,645.00 |
| ජූලි | 7,151,327.00 |
| අගෝස්තු | 7,090,546.00 |
| සැප්තැම්බර් | 10,214,239.00 |
| ඔක්තෝබර් | 19,753,358.00 |
| නොවැම්බර් | 10,542,808.00 |
| දෙසැම්බර් | 12,742,992.00 |
| එකතුව | **106,523,866.00** |

*මූලාශ්‍රය :    මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.2.3.4        රූපසටහන : මිල පිරික්සුම් (ගුවන් භාණ්ඩ) - රැස්කළ  A/E (රු.මි)**




*මූලාශ්‍රය :    මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

#### 8.2.3.4 මිල පිරික්සුම්, පර්යේෂණ හා විමර්ශන ඒකකය (VRIU)

**8.2.3.4 වගුව : කාර්යසාධනය**

| වසර | සිද්ධි සංඛ්‍යාව | පනවන ලද දඩ/ රාජසන්තක කිරීම් (රු.) |
|---|---|---|
| 2022 | 49 | 128,426,044 |
| 2023 | 53 | 231,196,843 |
| 2024 | 41 | 192,788,267 |
| 2025 | 85 | 516,092,734 |

*මූලාශ්‍රය : මධ්‍යම මිල පිරික්සුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

#### 8.2.3.5 2025 වර්ෂයේ සිදු කළ වැඩිදියුණු කිරීම්

- **'යොමු අගය (Reference Value) සෙවීමේ යෙදුම' ක් හඳුන්වාදීම**

මෙම යෙදුම ක්‍රියාත්මක කිරීමත් සමග රේගු මිල පිරික්සුම් අංශයේ නිලධාරීන්ට විවිධ භාණ්ඩ බොහෝ වර්ගයන්හි යොමු අගය පහසුවෙන් සොයාගත හැක.

වර්තමානයේ දී මෙම යෙදුම වැඩි දියුණු කෙරෙමින් පවතී.

- **Test Value සඳහා පොදු එකඟතාවයක් ඇතිකර ගැනීමට ආනයනකරුවන් සමග සාකච්ඡා පැවැත්වීම.**
  - ත්‍රී රෝද/ බයිසිකල් අමතර කොටස් ආනයනකරුවන් – දැනටමත් සංවිධානය කර ඇත
  - Hardware සංගමය – දැනටමත් සංවිධානය කර ඇත
  - පිඟන් ගඩොල් ආනයනකරුවන් – දැනටමත් සංවිධානය කර ඇත
  - වීදුරු ආනයනකරුවන් – දැනටමත් සංවිධානය කර ඇත

- මිල පිරික්සුම් සඳහා පෙරගත නියම (Advance Ruling for Valuation) ක්‍රියාත්මක කිරීමට ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව පූර්ව සැලසුම් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

## 8.2.4 ආදායම් හා සේවා (කටුනායක) අංශය

### 8.2.4.1 හැඳින්වීම

ආදායම් හා සේවා (කටුනායක) අංශය, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ පිහිටා ඇත. රේගු ආඥා පනතේ විධිවිධාන සහ වෙනත් අදාළ නීති සහ රෙගුලාසි යටතේ දේශ සීමා පාලන රෙගුලාසි බලාත්මක වන බව සාක්ෂාත් කරමින් අයවිය යුතු ආදායම එකතු කිරීම සහ ආනයන ගුවන් භාණ්ඩ නිෂ්කාශන සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ වගකීම වේ.

ශ්‍රී ලන්කන් ගුවන් සමාගම ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම භාණ්ඩ හැසිරවීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා රේගුවේ පාලනය යටතේ සේවාවන් ලබාදීම සඳහා SLFFA කාගෝ සර්විසස් සමාගම සහ සී/ස එක්ස්පෝ ඒවියේෂන්ස් සමාගම පර්යන්ත අංක 02 හි අනෙකුත් භාණ්ඩ මෙහෙයුම් නියෝජිතායතන සහ ස්වයං මෙහෙයුම් සේවා සැපයුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. සී/ස DHL පුද්ගලික සමාගම සහ සී/ස කලම්බු කාගෝ එක්ස්ප්‍රස් පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන බන්ධිත ගුදම්වලදී ප්‍රමුඛතා පදනම මත කුරියර් භාණ්ඩ ඉතා ඉක්මනින් නිෂ්කාශනය කරනු ලැබේ.

### 8.2.4.2 ප්‍රධාන කාර්යයන්

- ගුවන් මගින් ආනයනය කරනු ලබන භාණ්ඩ මත අයවිය යුතු රේගු බදු, සෙස් සහ අනෙකුත් ගාස්තු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- භාණ්ඩ ප්‍රකාශන සැකසීම සහ නිදහස් කිරීම.
- කර්මාන්ත හා සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන විවිධ අපනයන අරමුණු කරගත් පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායන් වෙත එවන ආනයන භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම.
- නරක්වන භාණ්ඩ, කුරියර් භාණ්ඩ, රාජ්‍ය තාන්ත්‍රික භාණ්ඩ සහ තැපැල් භාණ්ඩ ඇතුලු ගුවන් මගින් ආනයනය කරන ලද හදිසි ගුවන් භාණ්ඩ දිනය පුරා ඉක්මනින්ම නිෂ්කාශනය කිරීම.
| රේගු මූලස්ථාන අනු නියෝජිත සහතික පත්‍ර නිකුත් කිරීම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 11 | 31 | 15 | 15 | 2 | 74 |
| අයකරගත් මුදල | 1,527,960.00 | 1,375,250.00 | 1,548,900.00 | 1,157,320.00 | 1,299,240.00 | 1,678,200.00 | 1,542,300.00 | 1,287,380.00 | 1,515,630.00 | 1,433,050.00 | 1,304,870.00 | 1,774,220.00 | 17,444,320.00 |

*මූලාශ්‍රය : විශේෂිත සේවා අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.3.3 අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය

**8.3.3.1** හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය, ප්‍රධාන වශයෙන්ම පශ්චාත් නිෂ්කාශන විගණනය (PCA) සිදුකිරීමේ වගකීම දරයි. මිල පිරික්සුම් අංශය යටතේ පශ්චාත් නිෂ්කාශන හා විගණන ශාඛාව (PCAB) ලෙස 2000 වර්ෂයේදී පශ්චාත් නිෂ්කාශන විගණන කාර්යයන් ප්‍රථමයෙන් ආරම්භ විය. පශ්චාත් විගණන හා නෛෘහාර ලේඛන ඒකකය (PAMU) සහ විගණන හා පරීක්ෂණ ශාඛාව (A&ID) ඒකාබද්ධ කිරීමෙන් මෙම ශාඛාව ස්ථාපනය කරන ලදී.

වෙළඳාම යනු ආර්ථික වර්ධනයේ නියමුවකු වන අතර නිරතුරුව වර්ධනය වන ජාත්‍යන්තර වෙළඳාම සහ භාණ්ඩ නිෂ්කාශනය වේගවත් කිරීමේ අවශ්‍යතාවය සමගින් දේශසීමාවන්හි දී කෙටි කාලරාමුවක් තුළ රේගුව මගින් සියලු භාණ්ඩ තොග සඳහා බදු අයකිරීම පිළිබඳව නිශ්චිතව තීරණය කිරීම ප්‍රායෝගික නොවේ. එසේම වංචාවක් පිළිබඳව සැකයන් නැති නම් යම් ප්‍රශ්ණයක් විසඳන තෙක් භාණ්ඩ නිෂ්කාශනය ප්‍රමාද කිරීම ද සුදුසු නොවේ. එබැවින් පරිපාලනයන් බොහොමයක්ම, අවදානම් කළමනාකරණ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් දේශසීමාවේ දී තෝරාගත් සහ ඉලක්කගත පරීක්ෂා කිරීම් සිදුකරන අතරම පශ්චාත් නිෂ්කාශන පරිසරයක දී සිය පාලනය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. සිය සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස ඉලක්කගත කිරීම සඳහා පශ්චාත් නිෂ්කාශන විගණන අංශයට වේගවත් අවදානම් කළමනාකරණ වැඩසටහනක් අත්‍යාවශ්‍ය වේ.

ජාත්‍යන්තර වෙළඳාම වැඩිදියුණුවීමත්, ලෝක වෙළඳ සංවිධානයේ (WTO) රේගු මිල පිරික්සුම් ගිවිසුම සාර්ථක ලෙස ක්‍රියාත්මක වීමත් සමඟ 2010 වර්ෂයේදී පශ්චාත් නිෂ්කාශන විගණන අංශය (PCAD) ලෙස ඒ සඳහාම වෙන්වූ අංශයක් ස්ථාපනය කරන ලදී. දෙපාර්තමේන්තු නියෝග 883 (DOPL 883) අනුව, අනුකූලව කටයුතු කරන වෙළඳුන් සඳහා පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය හා රේගු නිෂ්කාශන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හඳුනා ගැනීමට හා වංචාවන් අනාවරණය කර ගැනීම සළකා අවදානම් කළමනාකරණ ඒකකය ස්ථාපනය කරනු ලැබිය. එබැවින් එය 2013 සැප්තැම්බර් 26 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනික පර්ෂදය තුළ එක් අංශයක් යටතට ගෙන “අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය (C&FD) ” ලෙස නම් කරනු ලැබිය.

කෙසේ වුවද, පසු කාලයේදී අවදානම් කළමනාකරණ ඒකකයේ කාර්යයන් පුළුල් වීමත් සමඟ එම ඒකකය, අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයෙන් වෙන්කර මධ්‍යම බුද්ධි අංශය යටතේ ක්‍රියාත්මක විය. එහි කාර්යයන් තවදුරටත් පුළුල්වීමත් සමඟ අවදානම් කළමනාකරණ ඒකකය, ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මකවන වෙනම අංශයක තත්වයට උසස් කරනු ලැබිය. වර්තමානයේදී “අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශය” පශ්චාත් නිෂ්කාශන විගණන (PCA) අංශය සහ මුදල් ආපසු ගෙවීමේ ශාඛාවෙන් සමන්විත වේ.

අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ වෙළඳ පහසුකරණය සහ රේගු පාලනය අතර සමතුලිතතාවට තහවුරු කිරීමයි. පශ්චාත් නිෂ්කාශන විගණන (PCA) ක්‍රියාවලිය එවන් එක් රේගු පාලන ක්‍රියාවලියකි. පශ්චාත් නිෂ්කාශන විගණන (PCA) ක්‍රියාවලිය යනු රේගුව මගින් භාණ්ඩ නිදහස් කිරීමෙන් පසුව අදාල වාණිජ දත්ත, වෙළඳ ගිවිසුම්, මූල්‍ය හා මූල්‍ය නොවන වාර්තා, භෞතික භාණ්ඩ තොග හා වෙළඳුන්ගේ වෙනත් වත්කම් පිළිබඳව සිදුකරන ව්‍යුහාත්මක පරීක්ෂා කිරීමකි. එහි අරමුණ වෙළඳුන්ගේ අනුකූලතාව මැනීම හා වැඩිදියුණු කිරීම වේ. ලෝක වෙළඳ සංවිධානයේ රේගු මිල පිරික්සුම් ගිවිසුමට අනුකූලවීම ඇතුළුව අරමුණු ගණනාවකදී රේගුවේ පාලනය ඵලදායි බව තහවුරු කිරීමේදී පශ්චාත් නිෂ්කාශන විගණනය අත්‍යාවශ්‍ය මෙවලමක් බව ප්‍රත්‍යක්ෂ වී ඇත. එය අනුකූලතාවය මැනීම හා ප්‍රතිඵල මත පදනම්ව අනාගත පාලනයන් සියුම්ව සකස් කිරීම මගින් රේගුවට එක් එක් වෙළඳුන් සඳහා අදාළ අවදානම් මට්ටම මැන බැලීම පහසු කරමින් ඵලදායි රේගු අවදානම් කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරයක් ද ඉටුකරයි.

පශ්චාත් නිෂ්කාශන විගණනයේ තවත් අරමුණක් වන්නේ රේගු ප්‍රකාශයන්හි නිරවද්‍යතාවය හා සත්‍යතාව තහවුරු කර ගැනීම හා ජාත්‍යන්තර වෙළඳ පහසුකරණය සිදුකරන අතරම, එම ලේඛන රේගු අවශ්‍යතාවන්ට අනුකූල වන බව තහවුරු කිරීම වේ. පශ්චාත් නිෂ්කාශන විගණනය මගින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ හැකියාව ලබාදේ. එසේම රේගු ක්‍රියාවලීන් හා අවශ්‍යතාවන් පිළිබඳව ව්‍යාපාරික ප්‍රජාව සඳහා වඩාත් හොඳ අවබෝධයක් ලබාදීම මෙන්ම රේගුව සඳහා සිය අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා වෙළඳුන් දිරිමත් කිරීම සිදු කෙරේ.

පශ්චාත් නිෂ්කාශන විගණනයේ මූලික කාණ්ඩ දෙකකි. එනම්, ගනුදෙනු පාදක විගණනය (TBA) හා පද්ධති පාදක විගණනය (SBA) වේ. ආනයන හෝ අපනයන ප්‍රකාශන පිළිබඳ විශේෂ විස්තර පරීක්ෂා කිරීම් ගනුදෙනු පදනම් විගණනය (TBA) වේ. සැකයක් ඇත්නම් රේගුවේ විගණක විසින් වැඩිදුර විස්තර ඉල්ලා දුරකථන හෝ විද්‍යුත් තැපැල ඔස්සේ ආනයනකරු/ප්‍රේෂණලාභියා හෝ ඔවුන්ගේ නියෝජිතයෙකු හා සම්බන්ධ වේ. ඉල්ලා සිටි සාක්ෂි රේගු කාර්යාලයේ සිටින රේගු විගණක වෙත යවනු ලැබේ. පද්ධති පාදක විගණන (SBA) යනු හඳුනාගත් ශක්තීන් හා දුර්වලතා ක්ෂේත්‍රයන්හි ගවේෂණය හා පරීක්ෂා කිරීම සිදු කරමින් ආනයනකරු හෝ අපනයනකරුගේ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රමාණුකූලව ඇගයීම වේ. ඉදිරිපත් කරන ලද රේගු ප්‍රකාශයන්හි නිරවද්‍යතාව තහවුරු කිරීම සහ ව්‍යාපාරයේ අදාල නෛතික අනුකූලතාවයේ මට්ටම පිළිබඳ අදහසක් ඇති කිරීම හා තහවුරු වූ දුර්වලතාවන් නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම විගණනයේ අරමුණ වේ.

ප්‍රධාන විගණන ක්‍රම දෙකට අමතරව, පශ්චාත් නිෂ්කාශන විගණනය තවත් කාණ්ඩ දෙකකින් සමන්විත වේ. ඒවා නම්, තේමා පදනම් විගණනයන් (Theme-Based Audits) හා විමර්ශනාත්මක ආකාර විගණනයන් (Investigative Type Audits) වේ. ශ්‍රී ලංකාවේ අනුකූල වෙළඳුන් සහ අනුකූල නොවන වෙළඳුන් යන කාණ්ඩ දෙකටම අයත් වෙළඳුන් හමුවේ. අනුකූල නොවන වෙළඳුන් පිළිබඳ ගැටළුව විසඳීම සඳහා අපට තේමා පදනම් විගණනය හා විමර්ශනාත්මක ආකාර විගණනය යන දෙකම සිදුකිරීම අවශ්‍යවේ.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් විශේෂඥ තාක්ෂණ සහය ලබාදීම මගින් ශ්‍රී ලංකා රේගුවේ පශ්චාත් නිෂ්කාශන විගණන පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා පසුගිය කාලයේ දී සම්පූර්ණ සහය ලබාදී ඇත. ADB විසින් පද්ධති පාදක විගණනය (SBA) ඇතුළුව විගණනයේ නව ක්ෂේත්‍ර ආවරණය කරමින් රේගු නිලධාරීන්ට පුහුණුව ලබාදී තිබේ. පද්ධති පාදක විගණනයන්හි අරමුණ ආනයනකරුවන්ගේ අවදානම් මට්ටමේ හඳුනා ගැනීමවේ. අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO)/ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) තත්වය ප්‍රදානය කිරීම ආකාරයෙන් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා

යෙදවුමක් ලෙස අනුකූල වෙළඳුන්ට පහසුකම් සැලසීම පුළුල් කිරීමේ නිර්ණායක වශයෙන් පද්ධති පාදක විගණනයන්හි ප්‍රතිඵල භාවිතා කළහැකි වේ.

### අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය- ඒකක හා ඒවායේ කාර්යයන්




### 8.3.3.2 පශ්චාත් නිෂ්කාශන විගණන (PCA) ඒකකය

සංශෝධිත කියෝතෝ ප්‍රඥප්තිය (Kyoto Convention) මගින් අර්ථ නිරූපනය කරන පරිදි, පශ්චාත් නිෂ්කාශන විගණනය (PCA) හෝ විගණන-පාදක කරගත් පාලනයන් යනු අදාල ව්‍යාපාරිකයන් (පුද්ගලයන්) සතුව ඇති පොත්පත්, වාර්තා, ව්‍යාපාර ක්‍රමවේද සහ වාණිජ දත්ත පරීක්ෂා කිරීම මගින් රේගු ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳව රේගුව සෑහීමකට පත්වනු ලබන ක්‍රියාමාර්ගවේ. ගනුදෙනු පදනම් කරගත් පාලන පරිසරයක සිට වඩා ශක්තිමත් විගණනය පදනම් කරගත් පරිපාලනයක් කරා මාරුවීම මගින් බහුවිධ ස්ථරවල අවදානම් පාදක පාලන ප්‍රවේශයක් යොදා ගැනීමට හැකිවන බැවින් පශ්චාද් නිෂ්කාශන විගණනය, රේගුවට මෙන්ම අනෙකුත් දේශසීමා නියාමන අධිකාරීන් සඳහා ද ඉතා වැදගත් පාලන ක්‍රමවේදයක් වේ. ගනුදෙනු පදනම් කරගත් පාලන ක්‍රම යනු දේශ සීමාව හරහා ගමන් කරන අවස්ථාවේදී එක් එක් නැව්බඩු තොග පාලනය සඳහා භෞතික පරීක්ෂා කිරීම්, භාණ්ඩවල වටිනාකම, සම්භවය සහ වර්ගීකරණය සත්‍යාක්ෂණය කිරීම, සාම්පල කිරීම, සහතික, බලපත්‍ර, අවසර පත්‍ර ආදිය සත්‍යාක්ෂණය කිරීම ආදියයි.

*මූලාශ්‍රය: ලෝක රේගු සංවිධානය (WCO)*

වාර්ෂික විගණන වැඩසටහනෙහි දක්වා ඇති පරිදි වෙළඳ භාණ්ඩය සහ වෙළඳ අවදානම විශ්ලේෂණය කිරීමේ පදනමින් තෝරා ගනු ලැබූ ඉලක්කගත මෙහෙයුම්කරුවන් කෙරේ යොමුවී හෝ සැලසුම් ගත, නිසි ආකාරයෙන් එක් එක් සිද්ධිය මත පදනම්ව පශ්චාත් නිෂ්කාශන විගණනයන් සිදු කළ හැකිවේ. තවද, යම් ආර්ථික මෙහෙයුම්කරුවන් සඳහා ලබා දෙන පහසුකම් පිරිනැමීම සඳහා නිර්ණායක ලෙසද විගණනය යොදා ගත හැකිවේ.

### 8.3.3.2.1 පශ්චාත් නිෂ්කාශන විගණනයේ මූලික අරමුණු

රේගුවේ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව රේගු ප්‍රකාශන සම්පූර්ණ කර ඇති බව තහවුරුකර ගැනීම පශ්චාත් නිෂ්කාශන විගණනයේ සමස්ත අරමුණ වේ. මෙහි විශේෂ අරමුණු වන්නේ:

- ➢ නෛතිකව අය විය යුතු ආදායම හඳුනාගෙන ඇති බව සහ ගෙවා ඇති බව තහවුරු කර ගැනීම.

- ශ්‍රී ලංකාවට ඇතුළු වන සහ පිටවන ස්ථානයන්හි දී අවම මැදිහත්වීමක් සහිතව ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීම.
- අදාල සියලු නීති සහ නියෝගයන්ට ඇති අනුකූලතාවය වැඩි කිරීම.
- රේගු ප්‍රකාශනයන්හි ඇති විෂමතාවයන් නිවැරදි කිරීම.
- පුද්ගලයෙකු විසින් නිසි ආකාරයෙන් පොත් සහ ගිණුම් පවත්වා ගන්නා බව තහවුරු කිරීම සහ සියලු රේගු ප්‍රකාශන සත්‍ය සහ නිවරදි බව ඔවුන්ගේ අභ්‍යන්තර පාලන පද්ධති මගින් තහවුරු කිරීම සහ,
- රේගු පාලනයේ සඵලතාවය තහවුරු කිරීම.

#### 8.3.3.2.2 පශ්චාත් නිෂ්කාශන විගණන (PCA) ශාඛාවේ කාර්යයන්

- විගණන වැඩසටහන් සංවර්ධනය කිරීම.
- ASyCuDa පද්ධතියේ ඇති වෙළඳුන් පිළිබඳ පසුගිය වාර්තා භාවිතා කරමින් විගණනලාභියෙකු තෝරා ගැනීම.
- Desk Audits සහ වෙනත් අත්‍යවශ්‍ය විගණන ක්‍රම මගින් විගණනය සඳහා සූදානම් වීම.
- Desk Audits තුළින් කිසියම් විෂමතාවයක් හෙලිදරව් වුවහොත් ක්ෂේත්‍ර විගණනයක් පැවැත්වීම.
- විගණනය මගින් අනාවරණය වූ වංචා විමර්ශනය කිරීම.
- විමර්ශන සහ වාර්තා නිමකිරීම.
- කිසියම් වංචාකාරි ක්‍රියාවක් සිදුවී තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා විමර්ශන සිදුකිරීම.
- වංචාවක් සිදුවී ඇති බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි තිබේනම්, රේගු පරීක්ෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ රේගු නීතියට අනුකූලව දණ්ඩන පැනවීම සහ රාජසන්තක කිරීම් නියම කිරීම.
- විගණනලාභීන් සඳහා ප්‍රතිපෝෂණයන් ලබාදීම.
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යෙදවුමක් ලෙස භාවිතා කිරීම සඳහා මධ්‍යම බුද්ධි අංශයේ, විමර්ශන අංශයේ සහ අවදානම් කළමනාකරණ අංශයේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම.
- අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා සමස්ත විගණන ක්‍රියාවලිය ඇගයීම.

#### 8.3.3.2.3 පශ්චාත් නිෂ්කාශන විගණනයේ දී තහවුරු කළ යුතු අයිතම

පශ්චාත් නිෂ්කාශන විගණනයන්හි දී වැදගත් ප්‍රකාශනයක් සඳහා අවශ්‍ය වන සියලු විස්තර කෙරෙහි පහත වගුවේ දක්වා ඇති පරිදි අවධානය යොමු කරනු ඇති අතර ඒ අනුව සමාගම් වල අනුකූලතා මට්ටම මනිනු ඇත. එමගින් අදාල සමාගම් විසින් යම් විෂමතාවන් හෝ වංචනික ක්‍රියා සිදුකර ඇති දැයි තීරණය කරනු ලැබේ. එසේ විෂමතාවන් හෝ වංචනික ක්‍රියා සිදුකර ඇති නම්, අතිරේක සටහන් හරහා ඒවා අයකර ගැනීමට හෝ රේගු ආඥාපනතේ (235 වන අධිකාරිය) අනුව දණ්ඩන පැනවීම මගින් ඒවා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ:

| බදු පදනම සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණ සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| - වටිනාකම<br>- ප්‍රමාණය<br>- මුදල් වර්ගය<br>- විනිමය අනුපාතය | - වර්ගීකරණය<br>- සාමාන්‍ය බදු අනුපාත අදාලකර ගැනීම<br>- වරණීය බදු අනුපාත | - බදු නිදහස් කිරීම් සාධාරණීකරණය කිරීම ප්‍රමාණය<br>- තීරු බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය | - සීමා කිරීම්<br>- තහනම් කිරීම්<br>- ආනයන බලපත්‍ර<br>- බුද්ධිමය දේපළ හිමිකම්<br>- CITES<br>- කර්තෘභාගය<br>- විනිමය පාලනය |

පශ්චාත් නිෂ්කාශන විගණනයට පෙර රේගු නිෂ්කාශනයේදී සහ/හෝ පූර්ව-නිෂ්කාශන සත්‍යාපන අවධියේ දී ඉහත අයිතම පරීක්ෂා කර බැලිය හැකි බව සඳහන් කළ යුතුය. ඒ අතර අනවශ්‍ය ද්විකරණය වැළැක්වීම හා PCA සුදුසුකම් උපරිම කිරීම හා නුසුදුසුකම් අවම කිරීම සඳහා පශ්චාත් නිෂ්කාශන විගණනය සඳහා වන ප්‍රවේශය රේගු නිෂ්කාශනයෙන් (පූර්ව නිෂ්කාශන සත්‍යාපනයෙන්) වෙනස් විය යුතුය. එක් සුදුසුකමක් ලෙස පශ්චාත් නිෂ්කාශන විගණන මගින් පශ්චාද් නිෂ්කාශන විගණන සිදුකරන නිලධාරීන්ට රේගු සටහන්කර වලට අමුණා ඇති ලේඛන පමණක් නොව විගණනලාභියා විසින් පසුගිය නිශ්චිත කාලසීමාවක් තුල තබා ගත් ගිණුම් පොත් වැනි අදාල පොත් හා වාර්තා ද පරීක්ෂාකර බැලිය හැකිවේ. එසේම පශ්චාත් නිෂ්කාශන විගණන මගින් භාණ්ඩ නිෂ්කාශනයේ සිට මාස 3 ක් ඇතුළත සාම්පල ඉල්ලා සිටීමට ද හිඟ බදු ප්‍රමාණයන් වසර දෙකක් තුළ අයකර ගැනීමට සහ වංචාවක් සිදුව ඇති බව නිරීක්ෂණය වන්නේ නම් සළකා බලන ලද කාලය නොසළකා රාජසන්තක කිරීම, දණ්ඩන පැනවීම සඳහා ද ඉඩ සැළසේ.

#### 8.3.3.2.4 සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP)

ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකරණ ගිවිසුමට (WTO-TFA) අත්සන් තබා ඇත. එකී ගිවිසුමෙහි විධිවිධාන ක්‍රියාත්මක වීමත් සමඟ, පශ්චාත් නිෂ්කාශන විගණනය "C" කාණ්ඩයේ වගකීමක් ලෙස හඳුනාගෙන තිබේ. අධාර දෙන නියෝජිතායතනයක් මගින් තාක්ෂණික සහය ලබාගැනීම "C" කාණ්ඩයේ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාවක් වේ. ඒ අනුව, ලෝක රේගු සංවිධානයේ (WCO) සහ ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ප්‍රමිතීන්ට අනුකූලව නිසි පශ්චාත් නිෂ්කාශන විගණන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇත. ආසියානු සංවර්ධන බැංකුව මේ වන විටත් PCA කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීමට සහ PCA අත්පොත ලෙස භාවිතා කිරීම සඳහා වන සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) කෙටුම්පත් කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදී ඇත. මේ වන විට සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය සකස් කිරීම අවසන් කර ඇති අතර 2023 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

#### 8.3.3.2.5 පශ්චාත් නිෂ්කාශන විගණනය (PCA) පිළිබඳ පුහුණු වැඩසටහන්

ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික සහය ලබාදීමේ කොටසක් ලෙස, ADB විසින් අඛණ්ඩව පශ්චාත් නිෂ්කාශන විගණන නිලධාරීන් පුහුණු කිරීම සිදු කරයි. පළමු පුහුණු වැඩසටහන 2019 වසරේදී පවත්වනු ලැබූ අතර ඉන්පසු 2021 සහ 2022 වසර වල පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිය.

2023 වර්ෂයේ දී ලෝක රේගු සංවිධානයේ සම්පත් දායකත්වයෙන් PCA අනුයුක්ත නිලධාරීන් සඳහා තවත් විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිය.

#### 8.3.3.2.6 අවදානම් කළමනාකරණ අංශය විසින් සිදුකරන ලද CEO/AEO වැඩසටහන සඳහා පහසුකම් සැලසීම

දේශ සීමාවන් අතර ගනු දෙනු හා සම්බන්ධයෙන් කාලය සහ පිරිවැය අඩුකිරීම මගින් භාණ්ඩ සංචලනය, නිදහස් කිරීම සහ නිෂ්කාශනය වේගවත් කිරීම මගින් ගෝලීය වෙළඳාම සුරක්ෂිත කිරීම සහ පහසුකම් සැලසීම අරමුණු කර ගනිමින් ලෝක රේගු සංවිධානයේ (WCO) පිළිගත් SAFE රාමුව සහ ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳ පහසුකරණ ගිවිසුමට අනුකූලව අවදානම් කළමනාකරණ අංශය මගින් CEO/AEO වැඩසටහන දියත් කර ඇත.

AEO වැඩසටහන මගින් ස්ථර දෙකක සහතිකකරණයක් පිරිනමනු ලැබේ. උදා:- ඉහළ මට්ටමේ නෛතික සහ මෙහෙයුම් අනුකූලතාවක් සහිත මෙහෙයුම්කරුවන් සඳහා අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO) සහ අනුකූලතා අවශ්‍යතාවන්ට අමතරව ඉහළ මට්ටමේ සැපයුම් ජාල ආරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගනු ලබන වෙළඳුන් සඳහා බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) තත්වය පිරිනමනු ලැබේ.

**8.3.3.1 වගුව : පශ්චාත් නිෂ්කාශන විගණන අංශයේ කාර්යසාධනය - 2025**

| විස්තරය | 2025 |
|---|---:|
| වසර තුළ ලියාපදංචි වූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව. | 92 |
| අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වීම්ද ඇතුළත්ව) | 60 |
| සිදුකරන ලද පද්ධති පාදක විගණන (SBA) සංඛ්‍යාව. | 06 |
| වැරදි සිදුකර ඇති බව නිගමනය කර රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | 47 |
| පනවන ලද රාජසන්තක කිරීම්/ දණ්ඩන වල මුළු එකතුව (රු.) | 1,988,260,470 |
| එකතු කරන ලද රාජසන්තක කිරීම්/ දණ්ඩන වල මුළු එකතුව (රු.) | 2,335,191,537 |
| අලෙවි මගින් එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.) | 1,422,596 |
| අතිරේක සටහන්කර ලෙස එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.) | 135,691,752 |
| පොළිය ලෙස එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.) | 11,640,802 |
| **අයකර ගත් මුළු එකතුව (රු.)** | **2,483,946,687** |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.2 වගුව : කාර්යසාධනය සැසඳීම**

| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| වසර තුළ ලියාපදංචි වූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | 119 | 87 | 130 | 185 | 92 |
| අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වූ විමර්ශන ද ඇතුළත්ව) | 35 | 61 | 117 | 154 | 60 |

| | | | | | |
|---|---|---|---|---|---|
| රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද විගණන වැරදි සංඛ්‍යාව | 27 | 53 | 80 | 167 | 47 |
| රාජසන්තක කිරීම්/ දණ්ඩන පැනවීම මගින් අයකර ගත් මුළු ප්‍රමාණය (රු) | 811,681,719 | 1 ,146,354,720 | 2,587,765,702 | 4,285,393,606 | 2,335,191,537 |
| අලෙවි මගින් එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.) | - | - | NIL | 47,499,403 | 1,422,596 |
| අතිරේක සටහන්කර ලෙස එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.) | 16,304,877 | 10,107,147 | 32,632,397 | 41,979,247 | 106,251,340 |
| අයකර ගත් මුළු එකතුව (රු.) | **853,483,565** | **1 ,156,461,867** | **2,980,308,099** | **4,608,117,163** | **2,483,946,687** |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.3** වගුව **:** පශ්චාත් විගණන සිද්ධි සැසඳීම

| වර්ෂය | වර්ෂය තුළ ලියාපදංචි වූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වූ විමර්ශන ද ඇතුළත්ව) | රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද පශ්චාත් විගණන සංඛ්‍යාව |
|---|---|---|---|
| 2021 | 119 | 35 | 27 |
| 2022 | 87 | 61 | 53 |
| 2023 | 130 | 117 | 80 |
| 2024 | 185 | 197 | 167 |
| 2025 | 92 | 60 | 47 |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.4** වගුව **:** ආදායම රැස්කිරීම සැසඳීම

| වර්ෂය | එකතු කරන ලද ආදායම (රු.) |
|---|---|
| **2021** | **853,483,565** |
| **2022** | **1,156,461,867** |
| **2023** | **2,980,308,099** |
| **2024** | **4,608,117,163** |
| **2025** | **2,483,946,687** |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.1** රූපසටහන **:** ආදායම රැස්කිරීම සැසඳීම




*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.5** වගුව : ලියාපදිංචි කරන ලද සහ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව

| වර්ෂය | ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| 2021 | 119 | 35 |
| 2022 | 87 | 53 |
| 2023 | 130 | 117 |
| 2024 | 185 | 197 |
| 2025 | 92 | 60 |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.2** රූපසටහන : ලියාපදිංචි කරන ලද සහ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව සැසඳීම




*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.3** ආපසු ගෙවීම් ශාඛාව

ආපසු ගෙවීමේ ශාඛාව ආයතනික පර්ෂදය යටතේ ඇති අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයේ කොටසක් වේ. ආපසු ගෙවීමේ ශාඛාව මගින් මූලිකවම රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 18 හා 22 වන වගන්ති යටතේ ආනයනය හෝ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා වැඩිපුර ගෙවන ලද තීරු බදු හා ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම හා යම් විදේශීය වරායකින් ආනයනය කර පසුව නැවත විදේශීය වරායකට ප්‍රති-අපනයනය කරන භාණ්ඩ සඳහා ගෙවූ බදු වලින් දහයෙන් නවයක් නොඉක්මවන ප්‍රමාණයක් ප්‍රතිපූර්ණය කිරීම සිදුකරනු ලැබේ.

ගෙවීම් සිදුකරන ලද දිනයේ සිට මාස 24 ක නියමිත කාලසීමාවක් තුළ හිමිකම් ඉල්ලා සිටින්නේ නම්, රේගු ආඥා පනතේ 18 වන වගන්ති යටතේ ආනයනය හෝ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා වැඩිපුර ගෙවන ලද තීරු බදු හා ගාස්තු ආපසු ගෙවනු ලැබීමක් සඳහා ආනයනකරුවකුට හිමිකම් ඇත. රේගු ආඥාපනතේ 22 වන වගන්තිය අනුව, විදේශීය වරායකින් ආනයනය කර පසුව නැවත විදේශීය වරායකට ප්‍රති-අපනයනය කරන භාණ්ඩ සඳහා ගෙවූ බදු වලින් දහයෙන් නවයක් නොඉක්මවන ප්‍රමාණයක ආපසු ගෙවීමක් ලබා ගැනීමට ආනයනකරුට හිමිකම් ඇත.

**8.3.3.6** වගුව : ආපසු ගෙවූ හිමිකම්වල තත්වය

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි වූ අයදුම්පත්/ හිමිකම් | 75 | 93 | 77 | 116 | 88 |
| සම්පූර්ණ කරන ලද ආපසු ගෙවීම් (පෙර ලියාපදංචි වූ ඒවා ද ඇතුලුව) | 96 | 79 | 98 | 37 | 88 |
| ප්‍රතික්ෂේප වූ අයදුම්පත්/ හිමිකම් | 32 | 15 | 6 | 13 | 13 |

*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

8.3.3.3 රූපසටහන : ආපසු ගෙවූ හිමිකම් සැසඳීම




*මූලාශ්‍රය : අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.3.4 නිගමනය**

ආනයන හා අපනයන මෙහෙයුම්වලට බලපාන රාජ්‍ය පරිපාලන සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුව 2025 වර්ෂය සාපේක්ෂව ස්ථාවර වසරක් විය. පසුගිය වර්ෂයන් මෙන් නොව, බොහෝ නියාමන පාලනයන් ලිහිල් කරනු ලැබූ අතර, එමගින් අවම සීමාකිරීම් යටතේ වෙළඳ කටයුතු සිදු කිරීමට හැකියාව ලැබුණි. කෙසේවුවද, මෙම සාපේක්ෂ වශයෙන් හිතකර මෙහෙයුම් පරිසරය තිබියදී ද, මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රේගුවට අතිවිශාල ආදායම් ඉලක්කයක් පවරා තිබුණි. මෙම ඉලක්කය සපුරාලීම විශාල අභියෝගයක් වූ අතර, ඒ සඳහා අඛණ්ඩ උත්සාහයක් සහ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් අවශ්‍ය විය. එබැවින්, 2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මගින් එවකට පැවති ආර්ථික තත්ත්වයන් පමණක් නොව, එහි නිලධාරීන්ගේ සාමූහික කැපවීම සහ උත්සාහවන්තභාවය ද පිළිබිඹු කරයි.

මෙම පසුබිම තුළ, අනුකූලතා හා පහසුකම් සැපයීමේ අංශය තමාවෙත පැවරී ඇති ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් තම දෛනික කාර්යයන් ඉටුකරන ලදී. මෙම අංශය තම වගකීම් සාර්ථකව ඉටු කරමින් නියමිත ඉලක්ක සපුරාලීමට සමත් වූ අතර, එමගින් උසස් මෙහෙයුම් කාර්යක්ෂමතාවක් සහ කාර්යසාධනයක් පිළිබිඹු කරන ලදී.

2025 වර්ෂයේ දී අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයේ (C&FD) නිලධාරින් විසින් පශ්චාත් විගණන සිද්ධි 92 ක් ලියාපදිංචි කර ඇති අතර පෙර වර්ෂයේ සිද්ධි ද ඇතුළත්ව සිද්ධි 60 ක් අවසන් කිරීමට ඔවුන්ට හැකිවිය. රේගු වැරදි සිදුවී ඇති බව තහවුරු වූ පශ්චාත් නිෂ්කාශන විගණන සංඛ්‍යාව 47 කි. අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය මගින් වර්ෂය තුළ අයකර ගත් මුළු මුදල රු. 2,483,946,687/-. කි. දණ්ඩන/ රාජසන්තක කිරීම් ලෙස අයකර ගත් මුළු මුදල රු. 2,335,191,537/- කි. භාණ්ඩ අපහරණය කිරීම මගින් අයකර ගත් මුළු මුදල රු. 1,422,596/-ක් වූ අතර, අතිරේක සටහන්කර තුලින් අයකරගැනීම් රු. 106,251,340 /- ක් සහ ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොළිය ලෙස අයකරගත් මුළු මුදල රු. 11,640,802/- ක් විය.

කාර්යසාධනය සම්බන්ධ දත්ත විශ්ලේෂණය කිරීමේදී, 2025 වර්ෂයේ ආපසු අයකරගැනීම් අනෙකුත් වර්ෂවලට සමාන අගයක පැවති බවත්, 2024 වර්ෂයේ ආපසු අයකරගැනීම් එයට ව්‍යතිරේකයක් ලෙස පවතින බවත් නිරීක්ෂණය කළ හැක. කෙසේ වෙතත්, 2025 වර්ෂයේ ලියාපදිංචි වූ සිද්ධි සංඛ්‍යාවට සාපේක්ෂව, සතුටුදායක සිද්ධි සංඛ්‍යාවක් අවසන් කිරීමට නිලධාරීන් පියවර ගෙන ඇති බවද නිරීක්ෂණය කිරීම වැදගත් වේ. එසේම, අවසන් නොවූ සිද්ධි අවසන් කිරීමට ද අඛණ්ඩ පියවර ගෙන ඇති බව ද පැහැදිලි වේ.

තවද, ආරම්භ කරන ලද විමර්ශනයන්ගෙන් 80%කට වැඩි ප්‍රමාණයක් වැරදි තහවුරු කිරීම් සහ දණ්ඩන හා රාජසන්තක කිරීම් පැනවීම මගින් අවසන් කිරීමට හැකිවීම මගින් පශ්චාත් විගණන විමර්ශන මෙහෙයවීමේ කාර්යක්ෂමතාවය නිරූපණය වේ. කෙසේවුවද, අවසාන වශයෙන් මෙයින් පෙනී යන්නේ වෙළඳුන්ගේ අනුකූලතා මට්ටම තවමත් සතුටුදායක මට්ටමක් කරා පැමිණ නොමැති බවයි.

මෙම අංශයට අයත් ආපසු ගෙවීමේ ශාඛාව වෙත ආපසු ගෙවීම් සඳහා අයදුම් පත් 88 ක් ලැබී තිබූ අතර ආපසු ගෙවීම් හිමිකම් 101ක් අවසන් කිරීමට හැකිවිය.

අවසාන වශයෙන් අවශ්‍ය සම්පත් වෙන්කර දීම සහ කලින් කලට පුහුණුව ලබාදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නේ නම් අනුකූලතා සහ පහසුකම් සැළසීමේ අංශයේ කාර්යසාධනය වඩාත් කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කළ හැකි බව සඳහන් කිරීම වැදගත්ය.

## 8.3.4 මගී සේවා (කොළඹ) අංශය

### 8.3.4.1 හැඳින්වීම

මෙම වාර්තාව මගින් මගී සේවා අංශයේ 2025 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධනය ඉදිරිපත් කරනු ලැබේ. කාර්යසාධන විශ්ලේෂණය, අදාළ උප ඒකක මගින් ඉදිරිපත් කරනු ලබන මාසික අයකරගැනීම් දත්ත මත පදනම් වේ.

### 8.3.4.2 ප්‍රධාන කාර්යයන්

- රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන්ගේ ගමන්මළු හා භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම.
- ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද අයිතම ආනයනය හා අපනයනය වැළැක්වීම.
- සමාජයේ සමාජ - ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම.
- කැටුව නොයන මගී ගමන් මලු (UPB) ගුදම් පාලනය හා අධීක්ෂණය කිරීම.

### 8.3.4.3 කැටුව නොයන මගී ගමන් මලු (UPB) ගුදම් ලයිස්තුව

ගමන් මලු කාර්යාලය - අලෙවි (BO Sales)
ගමන් මලු කාර්යාලය - රූන්ක් බහාලුම් පර්යන්තය (BO RCT)
ගමන් මලු කාර්යාලය - නව නුගේ පාර (BO NNR)
ලක්සිරි සේවා - කොළඹ/ නින්දවුර්
ට්‍රාන්ස්කෝ - වත්තල
මිඩ්කෝ
ට්‍රයිකෝ - කොළඹ
සිලෝන් ෂිපින් ලයින්ස් - කොළඹ/අඩාලච්චේන
සෙරන්ඩිබ්
ට්‍රයිගෝ - ජා ඇල

### 8.3.4.4 කාර්යසාධනය

8.3.4.1 වගුව : කාර්යසාධනය - UPB ගුදම්

| ගමන් මලු කාර්යාලය - අලෙවි | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | - |
| පැකේජ සංඛ්‍යාව | - |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 15,178,509.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 19,991,544.00 |
| EIC | 283,248.00 |
| වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (PAL) | 6,467,735.15 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | - |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 492,848.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | - |
| VAL | - |
| SRC | 12,271,846.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 154,450.00 |
| අතිකාල | 16,679,777.62 |
| දඩ | 1,900,745.00 |
| අනෙකුත් ගාස්තු | 276,079,926.13 |
| TW ගාස්තු | 19,296,291.00 |
| මුළු එකතුව | 368,796,920.35 |

| ගමන් මලු කාර්යාලය - රූන්ක් බහාලුම් පර්යන්තය | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 4,403 |
| පැකේජ සංඛ්‍යාව | 224,191 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 15,958,382.00 |
| EIC | 39,859,352.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 48,658,182.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 20,764,609.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 2,728,790.00 |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 8,280,237.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | - |
| VAL | - |
| SRC | - |
| මුද්‍රා ගාස්තු (SEAL) | - |
| අතිකාල | 5000.00 |
| දඩ | 43,467,488.00 |
| අනෙකුත් ගාස්තු | 2,302,800.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | 182,024,840.00 |

| ගමන් මලු කාර්යාලය - නව නුගේ පාර | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 12,839 |
| පැකේජ සංඛ්‍යාව | 68,377 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තිරුබදු (CID) | 20,211,451.00 |
| EIC | 23,312,662.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 37,246,820.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 14,163,822.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 2,943,440.00 |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 3,985,555.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 8,000.00 |
| VAL | - |
| SRC | 547,470.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 2,439,652.00 |
| අතිකාල | - |
| දඩ | 14,184,612.00 |
| අනෙකුත් ගාස්තු | 130,818.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | **119,174,302.00** |

| ලක්සිරි සේවා | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 26,322 |
| පැකේජ සංඛ්‍යාව | 60,311 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තිරුබදු (CID) | 19,573,931.00 |
| EIC | 33,185,967.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 37,034,813.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 16,283,368.00 |
| සෙස් බදු (CESS) | .00 |
| නිෂ්පාදන බදු (Excise Duty) | 2,502,976.00 |
| රේගු අධිභාර (SUR) | .00 |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 7,497,078.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 961,184.00 |
| VAL | - |
| SRC | 555,700.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 175,000.00 |
| අතිකාල | 7,839,636.00 |
| දඩ | 19,689,582.18 |
| අනෙකුත් ගාස්තු | 1,477,664.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | **146,776,899.18** |

| ට්‍රාන්ස්කෝ (වත්තල) | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 39,949 |
| පැකේජ සංඛ්‍යාව | 140,528 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තිරුබදු (CID) | 20,276,529.00 |
| EIC | 65,896,302.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 53,339,109.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 24,524,091.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 2,208,496.00 |
| රේගු අධිභාර (SUR) | 53,179.00 |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 12,658,842.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 25,348.00 |
| VAL | - |
| SRC | 520,553.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 180,000.00 |
| අතිකාල | 5,601,685 |
| දඩ | 16,124,876.00 |
| අනෙකුත් ගාස්තු | - |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | **201,409,010.00** |

| මිඩ්කෝ | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 23,563 |
| පැකේජ සංඛ්‍යාව | 109,725 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තිරුබදු (CID) | 14,419,517.00 |
| EIC | 43,199,580.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 36,363,247.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 16,836,976.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 1,588,826.00 |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 7,762,249.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 352,699.00 |
| VAL | - |
| SRC | 166,450.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | - |
| අතිකාල | 5,822,620.00 |
| දඩ | 10,750,001.00 |
| අනෙකුත් ගාස්තු | 1,000.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | **137,263,165.00** |

| ටුයිකෝ (කොළඹ) | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 28,072 |
| පැකේජ සංඛ්‍යාව | 80,196 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 25,656,608.00 |
| EIC | 36,827,304.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 46,351,387.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 21,832,158.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 3,456,349.00 |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 9,071,894.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 37,230.00 |
| VAL | - |
| SRC | 420,850.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 462,500.00 |
| අතිකාල | 2,752,166.00 |
| දඩ | 5,412,734.00 |
| අනෙකුත් ගාස්තු | 12,348,857.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | 164,630,037.00 |

| සිලෝන් ෂිපින් ලයින්ස් (කොළඹ) | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 325,642 |
| පැකේජ සංඛ්‍යාව | 126,279 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 32,009,154.00 |
| EIC | 58,838,565.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 64,380,318.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 26,819,590.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 1,546,119.00 |
| රේගු අධිභාර (SUR) | 11,880.00 |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 12,055,945.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 12,696.00 |
| VAL | - |
| SRC | 729,207.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 195,000.00 |
| අතිකාල | 7,173,075.00 |
| දඩ | 44,000,041.00 |
| අනෙකුත් ගාස්තු | 15,252,731.00 |
| TW ගාස්තු | 60,750.00 |
| මුළු එකතුව | 263,085,071.00 |

| සෙරන්ඩිබ් | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 9,664 |
| පැකේජ සංඛ්‍යාව | 66,954 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 20,801,081.00 |
| EIC | 19,613,742.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 19,532,094.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 8,453,776.00 |
| සෙස් බදු (CESS) | - |
| නිෂ්පාදන බදු (Excise Duty) | 592,007.00 |
| රේගු අධිභාර (SUR) | 8,375.00 |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 4,001,279.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | - |
| VAL | - |
| SRC | 418,850.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 592,007.00 |
| අතිකාල | 3,904,689.50 |
| දඩ | 3,670,713.00 |
| අනෙකුත් ගාස්තු | 9,789.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | 81,588,613.50 |

| ටුයිගෝ | |
|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව | 9,262 |
| පැකේජ සංඛ්‍යාව | 26,353 |
| | ප්‍රමාණය (රු.) |
| රේගු ආනයන තීරුබදු (CID) | 3,855,390.00 |
| EIC | 5,407,469.00 |
| එකතු කළ අගය මත බදු (VAT) | 9,609,719.00 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) | 3,823,994.00 |
| සෙස් බදු (CESS) | 3,587,082.00 |
| නිෂ්පාදන බදු (Excise Duty) | 474,665.00 |
| රේගු අධිභාර (SUR) | - |
| සමාජ ආරක්ෂක දායක බදු (SSL) | 921,935.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | - |
| VAL | - |
| SRC | 67,300.00 |
| මුද්‍රා ගාස්තු (SEAL) | 951,425.00 |
| අතිකාල | - |
| දඩ | 1,807,430.00 |
| අනෙකුත් ගාස්තු | 2,533,176.00 |
| TW ගාස්තු | - |
| මුළු එකතුව | 33,039,585.00 |

*මූලාශ්‍රය : මගී සේවා (කොළඹ) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.4.2** වගුව : **2025** වර්ෂයේ ආදායම රැස්කිරීමේ සාරාංශය

| උප ඒකකය | වාර්ෂික අයකරගැනීම් (රු.) |
|---|---:|
| ලක්සිරි සේවා (කොළඹ) කැටුව නොඑන මගී ගමන් මළු | 146,776,899.18 |
| ලක්සිරි සේවා (නිනදවූර්) කැටුව නොඑන මගී ගමන් මළු | 8,072,756.00 |
| ට්‍රාන්ස්කෝ (වත්තල) කැටුව නොඑන මගී ගමන් මළු | 201,409,010.00 |
| මිඩ්කෝ - කැටුව නොඑන මගී ගමන් මළු | 137,263,165.00 |
| ට්‍රයිකෝ (කොළඹ) කැටුව නොඑන මගී ගමන් මළු | 164,630,037.00 |
| සිලෝන් ෂිපින් ලයින්ස් (කොළඹ) කැටුව නොඑන මගී ගමන් මළු | 263,085,071.00 |
| සිලෝන් ෂිපින් ලයින්ස් (අඩ්ඩාලච්චේන) කැටුව නොඑන මගී ගමන් මළු | 2,965,161.00 |
| සෙරන්ඩිබ් - කැටුව නොඑන මගී ගමන් මළු | 81,588,613.50 |
| ගමන් මළු කාර්යාලය (අලෙවි) කැටුව නොඑන මගී ගමන් මළු | 368,796,920.35 |
| ගමන් මලු කාර්යාලය (රැන්ක් බහාලුම් පර්යන්තය) කැටුව නොඑන මගී ගමන් මළු | 182,024,590.00 |
| නව නුගේ පාර - කැටුව නොඑන මගී ගමන් මළු | 119,174,302.00 |
| ට්‍රයිගෝ (ජා ඇල) කැටුව නොඑන මගී ගමන් මළු | 33,039,585.00 |
| රේගු අධ්‍යක්ෂ මගී සේවා පරිපාලන | 4,177,050.00 |
| එකතුව | **1,713,003,160.03** |

*මූලාශ්‍රය : මගී සේවා (කොළඹ) අංශය, ශ්‍රී ලංකා රේගුව*

- **2024** වර්ෂයේ මගී සේවා (කොළඹ) අංශයේ මුළු අයකරගැනීම් = රු. 1,348,102,681.55
- **2025** වර්ෂයේ මගී සේවා (කොළඹ) අංශයේ මුළු අයකරගැනීම් = රු. 1,713,003,160.03
- ප්‍රතිශත වෙනස = +27.07%

**8.3.4.1** රූපසටහන : මුළු අයකරගැනීම් සැසඳීම (රු.මි.)




*මූලාශ්‍රය : මගී සේවා (කොළඹ) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.4.4** වෙළඳ (සේවා) පහසුකරණ අරමුණු යටතේ සැලසුම් කරන ලද මූලික ක්‍රියාකාරකම්

**මගී සේවා අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ මගීන්ගේ කැටුව නොඑන පුද්ගලික මගී ගමන්මළු නිෂ්කාශනය කිරීමයි. මෙම බොහෝ මගීන් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් වන අතර ඔවුහු ශ්‍රී ලංකාවට විදේශ මුදල් එවීමෙහි නිරත වෙති. පුළුල්වන වෙළඳ හිඟයට එරෙහිව සැළකිය යුතු සහනයක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ඉපැයීම් වල ප්‍රධාන අංගයක් ලෙස විදේශ ප්‍රේශණ පවතී. UPB දීමනා ක්‍රමය යටතේ ශ්‍රී ලාංකික සේවකයින්ගේ කැටුව නොඑන මගී ගමන්මළු නිෂ්කාශනය කරමින් මගී සේවා අංශය ඔවුන්ගේ සුබසාධනය ඉහළ නැංවීමේ ප්‍රධාන කාර්යයක් ඉටුකරයි. මෙම ක්‍රියාවලිය කාර්යක්ෂම සහ සඵලදායී කිරීම සඳහා බොහෝ පියවර ගෙන ඇත. එයට අමතරව ඔවුන් විසින් ත්‍යාග ලෙස එවනු ලබන භාණ්ඩ අදාළ බදු සහ තීරුබදු අයකරගෙන ලබන්නන් වෙත නිදහස් කරනු ලැබේ.එම නිෂ්කාශනයන්හි තොරතුරු පහත පරිදි වේ.**

**8.3.4.3** වගුව **:** වෙළඳ පහසුකරණය යටතේ කාර්යසාධනය

| කාර්යය | ප්‍රධාන කාර්යය | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගුදම් මෙහෙයුම් විධිමත් කිරීම | **2025** | | | ට්‍රයිගෝ | ට්‍රයිකෝ | ලක්සිරි | සීඑස් එල් | මිඩ්කෝ | සෙරන්ඩිබ් | ට්‍රාන්ස්කෝ | නව නුගේ පාර | ආර්සීටී |
| | මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධා රහිත නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරීම. | නිෂ්කාශනය කරන ලද පැකේජ සංඛ්‍යාව | යූපීබී | 9,029 | 36,858 | 29,194 | 62,660 | 28,367 | 12,214 | 53,946 | 47,259 | 116,564 |
| | | | ත්‍යාග | 17,324 | 43,338 | 31,117 | 63,619 | 81,358 | 54,740 | 86,582 | 21,118 | 107,627 |
| | | නිෂ්කාශනය කරන ලද බහාළුම් සංඛ්‍යාව | | 137 | 899 | 469 | 1,252 | 368 | 187 | 650 | 360 | 1,002 |

*මූලාශ්‍රය : මගී සේවා (කොළඹ) අංශය, ශ්‍රී ලංකා රේගුව*

- ✓ නිෂ්කාශනය කරන ලද මුළු කැටුව නොඑන මගී ගමන් මළු සංඛ්‍යාව - 406,496
- ✓ නිෂ්කාශනය කරන ලද මුළු ත්‍යාග පැකේජ සංඛ්‍යාව - 499,269

**8.3.4.5** භාණ්ඩ අපහරණය කිරීම

UPB **ගුදම්වල අත්හැර දමන ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ ක්‍රමයෙන් එකතු වීම නිසා එහි ගබඩා ඉඩකඩ අඩු වෙමින් පවතී. එබැවින් ගබඩා ඉඩකඩ ලබා ගැනීම සඳහා අපහරණ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය. එය සවිබල ගන්වමින්,** 2025 **ජූනි මාසයේ සිට සියලුම** UPB **ගුදම්වල එක් රැස්වී තිබූ අත්හැර දමන ලද භාණ්ඩ ඉවත් කිරීමේ අරමුණින්** ‘Disposal Weekend’ **නම් ඵලදායී ඉවත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව මාසිකව ක්‍රියාත්මක කරමින් පවතින අතර, එමඟින් ගබඩා කිරීමේ ඉඩ සන මීටර්** 100**කට වඩා වැඩි ප්‍රමාණයකින් ලබා ගැනීමට හැකි වී ඇත. තවද මෙම ව්‍යාපෘතියට සමගාමීව, රාජසන්තක කරන ලද චේන්සෝ** (Chainsaws) 306**ක්** 2025 **නොවැම්බර් මාසයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට භාර දෙන ලද අතර, ඒවා මෑතකදී දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුර සහ නායයෑම් තත්වයන්හිදී ගලවා ගැනීමේ හා සහන මෙහෙයුම් සඳහා ඉතා ප්‍රයෝජනවත් විය.**

## 8.3.5 මගී සේවා (කටුනායක) අංශය

### 8.3.5.1 හැඳින්වීම

මගී සේවා (කටුනායක) අංශය ශ්‍රී ලංකා රේගුවේ ආයතනික පර්ෂදය යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ රාජ්‍ය ආදායම ආරක්ෂා කිරීම සහ රටේ සමාජ-ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා දේශසීමාවන්හි දී රේගු නීතිය සහ අනෙකුත් අදාල නීති ඵලදායී ලෙස බලාත්මක කරන අතරම මගීන් සහ මගී ගමන්මලු සංචලනය සඳහා පහසුකම් සැලසීමයි.

### 8.3.5.2 මූලික අරමුණු

- නෛතික අරමුණු සඳහා මගීන් සහ ගමන් මලු නිෂ්කාශනය සඳහා පහසුකම් සැළසීම.
- දේශ සීමාවන් හරහා සීමාකරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ පාලනය කිරීම.
- රටේ සමාජ ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික අයිතීන් සුරක්ෂිත කිරීම.
- රාජ්‍ය ආදායම ආරක්ෂා කිරීම.

### 8.3.5.3 කාර්යයන්:

- සද්භාවී මගීන් සහ ඔවුන්ගේ ගමන් මලු රට තුළට සහ පිටතට ගමන් කිරීම සඳහා පහසුකම් සැළසීම.
- එක් ගුවන්යානයකින් තවත් ගුවන්යානයකට මාරුවන මගීන් සහ ඔවුන්ගේ ගමන්මලු සංචලනය සඳහා පහසුකම් සැළසීම.
- ප්‍රභූ ගමන් බිමන් (VVIP, VIP), සේද මාවතේ (Silk Route) සහ වාණිජමය වශයෙන් වැදගත් වන මගීන්ගේ (CIP) ප්‍රවේශය සහ පිටවීම සඳහා පහසුකම් සැලසීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන සහ පිටවන ගුවන් යානා සහ කාර්ය මණ්ඩලය සඳහා නිෂ්කාශන කටයුතු සිදුකිරීම.
- රටින් පිටතට යන ගුවන් යානා සඳහා අනුමැතීන් (clearance) නිකුත් කිරීම.
- මගී ගමන් මලු සඳහා තීරු බදු නිදහස් ගමන් මලු දීමනාව ලබාදීම.
- වාණිජ ප්‍රමාණයෙන් සහ වාණිජ ස්වභාවයේ භාණ්ඩ අඩංගු වන ගමන් මලු වලින් තීරු බදු සහ අනෙකුත් බදු රැස්කර ගැනීම.
- ATA Carnet පත්, ඇපකර සහ විශේෂ තැන්පතු ආදිය මත භාණ්ඩ නිදහස් කිරීම සහ පසු විපරම් කාර්යයන් සිදු කිරීම.
- රට තුළට රැගෙන එන සහ ඉන් පිටතට රැගෙන යන මැණික් පාර්සල් සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම.
- රට තුළට පැමිණෙන සහ රටින් පිටවන මගීන් විසින් සිදුකරන ලද විදේශ මුදල් පිළිබඳ රේගු ප්‍රකාශන මාර්ගගතව ඉදිරිපත් කිරීම සහ නිල ලදුපතක් නිකුත් කිරීම.
- මගියා පිටත් වූ පසුව, ඇටෝර්නි බලපත්‍රය මත බලය පවරන ලද පුද්ගලයින්ට කැටුව නොයන ගමන් මලු නිෂ්කාශනය කිරීමට හැකිවන පරිදි ඉතිරි ගමන් මලු ලබාදීම අනුමත කිරීම.
- අක්‍රමවත්ව හසුරුවන ලද ගමන් මලු (mishandled baggages) නිෂ්කාශනය කිරීම.
- රාජ්‍ය තාන්ත්‍රික ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- අවශ්‍යය වන්නේ නම් මගීන් පරීක්ෂා කිරීම.
- සීමාකරන ලද හෝ තහනම් කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය පාලනය කිරීම සහ වැළැක්වීම.
- රේගු වැරදි හඳුනා ගත් අවස්ථාවන්හි දී පරීක්ෂණ සහ විමර්ශන සිදුකිරීම.
- සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය වන්නේ නම් උසාවි ක්‍රියාමාර්ග මගින් දණ්ඩන අයකර ගැනීමට සහ රාජසන්තක කිරීම් සිදුකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- රේගුවේ අධීක්ෂණය යටතේ හිමිකම් නොකී භාණ්ඩ අපහරණය සඳහා පහසුකම් සැලසීම.
- රේගුවේ අධීක්ෂණය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ රඳවා ගනු ලබන භාණ්ඩ විනාශ කිරීම අධීක්ෂණය කිරීම.
- රාජසන්තක කරන ලද හෝ රඳවා ගනු ලැබූ භාණ්ඩ ආරක්ෂා කිරීම සහ අපහරණය කිරීම.
- රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) විධිවිධානයන්ට අනුකූලව රාජසන්තක කරන ලද අයිතම අපහරණය කිරීම, දණ්ඩන සහ රාජසන්තක කිරීම් පැනවීම.
- ගුවන්තොටුපලේ ක්‍රියාත්මක අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.

**8.3.5.1 වගුව : ආදායම එකතු කිරීම - 2025**

| තීරුබදු | මුදල (රු.) |
|---|---|
| රේගු ආනයන තීරු බදු (CID) | 177,536,291 |
| එකතුකළ අගය මත බදු (VAT) | 473,248,215 |
| වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (PAL) | 62,867,041 |
| ආනයන CESS | 326,367,647 |
| අධිභාර | 0 |
| XID | 64,150 |
| සමාජ ආරක්ෂණ බදු (SSL) | 74,534,660 |
| දඩ | 355,522,321 |
| සිද්ධි සඳහා වන දණ්ඩන | 126,739,617 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 70,000 |
| අනෙකුත් | 393,630 |
| එකතුව | 1,597,343,572.00 |

| අනෙකුත් ගාස්තු | මුදල (රු.). |
|---|---|
| SR ගාස්තු | 1,967,102.00 |
| අතිකාල ගාස්තු | 9,609,650.00 |
| DFS රේගු ගාස්තු | 745,235.00 |
| පරිගණක ගාස්තු | 5,903,500.00 |
| ඡායා පිටපත් | 71,880.00 |
| එකතුව | 18,297,367.00 |
| | |
| මුළු ආදායම එකතු කිරීම | **1,615,640,939.00** |

*මූලාශ්‍රය : මඟී සේවා (කටුනායක) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.5.2 වගුව : 2025 වර්ෂයේ හසුකර ගැනීම්**

| | |
|---|---|
| හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | : 133 |
| රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකමේ එකතුව (රු.) | : 6,163,506,713 |
| රාජසන්තක කරන ලද විදේශ මුදල් වල වටිනාකම (රු.) | : 65,742,582.97 |
| රාජසන්තක කරන ලද මැණික් ගල් වල වටිනාකම (රු.) | : 132,990,648 |
| රාජසන්තක කරන ලද රත්‍රං වල වටිනාකම (රු.) | : 1,822,395,121 |
| රාජසන්තක කරන ලද අනෙකුත් භාණ්ඩ වල වටිනාකම (රු.) | : 4,143,592,180 |
| අනාවරණය කරගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය | : කි.ග්‍රෑ.272.1 |

හසුකර ගන්නා ලද අනෙකුත් සීමාකරන ලද/ තහනම් කරන ලද අයිතම ප්‍රමාණයන්

| කාණ්ඩය | රත්‍රං ( Raw /ආභරණ) | රත්‍රං පෙල්/ paste | එනසාල් | විලවුන් | කෘමිනාශක/ පළිබෝධනාශක | පොහොර |
|---|---|---|---|---|---|---|
| බර (කි.ග්‍රෑ.) | 36.32 | - | 3,515.5 | 4,169.45 | 114.40 | නිෂ්පාදන 083 |

| කාණ්ඩය | ජංගම දුරකථන | E- සිගරට් | සිගරට් |
|---|---|---|---|
| ඒකක සංඛ්‍යාව | 6,392 | 3,635 | 7,637,478 |

සටහන : රත්‍රං ප්‍රතිශතය නිර්ණය කිරීමේ සහ සංයෝජිත වර්ගීකරණ ක්‍රියාවලියෙන් පසුව වටිනාකම නියම කිරීමට ඇති සහ රත්‍රං පෙල්/ paste ඇතුළත් කර නොමැත.

*මූලාශ්‍රය : මඟී සේවා (කටුනායක) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.5.3** වගුව : **2025** වර්ෂයේ දී මගීන් සඳහා සපයන ලද සේවාවන්

| | |
|---|---|
| පැමිණි ගුවන්යානා සංඛ්‍යාව | 33,430 |
| පැමිණි මගීන් සංඛ්‍යාව | 4,986,795 |
| පිටත්වූ ගුවන්යානා සංඛ්‍යාව | 33,445 |
| පිටත්වූ මගීන් සංඛ්‍යාව | 5,028,438 |
| තීරු බදු සහ අනෙකුත් බදු ගෙවීමෙන් අනතුරුව රතු වැනලය ඔස්සේ නිෂ්කාශන කරන ලද මගීන් සංඛ්‍යාව | 23,392 |
| තීරු බදු නිදහස් දීමනාව සඳහා හිමිකම් කියන ලද මගීන් සංඛ්‍යාව | 49,030 |
| නිෂ්කාශනය කරන ලද අක්‍රමවත්ව හසුරුවන ලද (mishandled baggages) ගමන් මලු සංඛ්‍යාව | 25,904 |
| පැමිණීමේ පර්යන්තය හරහා ගමන් කළ ප්‍රභූන් සංඛ්‍යාව | 1,196 |
| පිටවීමේ පර්යන්තය හරහා ගමන් කළ ප්‍රභූන් සංඛ්‍යාව | 1,186 |

*මූලාශ්‍රය : මගී සේවා (කටුනායක) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.5.4** වගුව : ආදායම රැස්කිරීම සැසඳීම

| වර්ෂය | මුළු එකතුව | පෙර වර්ෂය හා සැසඳීමේදී ආදායම වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|
| 2018 | 404,875,536.00 | - |
| 2019 | 452,738,967.00 | 12 |
| 2020 | 139,679,711.00 | -69 |
| 2021 | 124,119,902.00 | -11 |
| 2022 | 637,675,154.00 | 414 |
| 2023 | 1,313,385,295.00 | 106 |
| 2024 | 1,492,753,967.00 | 12 |
| 2025 | 1,615,640,939.00 | 8 |

*මූලාශ්‍රය : මගී සේවා (කටුනායක) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.3.5.1** රූපසටහන : ආදායම රැස්කිරීම සැසඳීම (රු. බි.)




*මූලාශ්‍රය : මගී සේවා (කටුනායක) අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.4 ඩිජිටල්කරණ පර්ෂදය

### 8.4.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### 8.4.2 අවදානම් කළමනාකරණ අංශය

### 8.4.3 නීති කටයුතු අංශය

### 8.4.4 අපනයන අංශය

### 8.4.5 ආදායම් හා සේවා (පළාත්) අංශය

## 8.4.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

**8.4.1.1** හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය (ICT), විශ්වාසනීය, සුරක්ෂිත සහ නිරවුල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සේවා සපයමින් ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධානතම අංශයක් ලෙස කටයුතු කරයි. මෙම අංශය රේගු සටහන්කර (CusDecs) අඛණ්ඩව පැය **24** පුරාම සකස් කිරීමට සහ වෙබ් පාදක සේවා සැපයීමට පහසුකම් සලසන අතර එමගින් රේගු මෙහෙයුම් සුමට ලෙස ක්‍රියාත්මක වීම සහතික කරයි.
CusDecs සැකසීමේ ක්‍රියාවලිය සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය කිරීම තුළින්, වේගවත්, නිවැරදි සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් රේගු පරිපාලනයේ කාර්යක්ෂමතාවයට, විනිවිදභාවයට සහ ඵලදායී තීරණ ගැනීමට දායක වී ඇත. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් වලට අනුකූලව, ICT අංශය රේගු ප්‍රකාශන සහ ආධාරක ලේඛන ඉලෙක්ට්‍රොනික් ඉදිරිපත් කිරීම සහ සැකසීම සඳහා ශක්තිමත්, කාර්යක්ෂම සහ අසමර්ථවීමෙන්-ආරක්ෂිත පරිගණක පද්ධති හා ක්‍රියාවලීන් හඳුන්වා දීම අඛණ්ඩව සිදු කරයි.

**8.4.1.2** ප්‍රධාන කාර්යයන්

- රේගු ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය මගින් දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කිරීමට සහාය වීම.
- අඛණ්ඩව සේවා සැපයීම සහතික කිරීම සඳහා පද්ධති, ජාල, දෘඩාංග සහ දත්ත සමුදායන් ඇතුළු ICT යටිතල පහසුකම් මෙහෙයවීම, නඩත්තුව සහ පරිපාලනය කිරීම.
- රේගු කළමනාකරණය, ශ්‍රී ලංකා රේගු අංශ, අනෙකුත් රාජ්‍ය ආයතන සහ පාර්ශ්වකරුවන් වෙත කාලෝචිත, නිවැරදි සහ විශ්වාසනීය තොරතුරු පද්ධති සහ කළමනාකරණ වාර්තා සැපයීම.
- ජාත්‍යන්තර ප්‍රශස්ථ පිළිවෙත්වලට අනුකූලව **ASYCUDA World, ASYHUB, eCCR, eRegistration, nCEN** සහ තිනෙත් පද්ධතිය ඇතුළු මධ්‍යගත රේගු පද්ධති අඛණ්ඩව තක්සේරු කිරීම, වැඩිදියුණු කිරීම සහ උසස් කිරීම.
- ICT අංශයට අනුයුක්ත නිලධාරීන්ගේ ICT දැනුම සහ කුසලතා අඛණ්ඩව වැඩිදියුණු කිරීම මගින් ධාරිතා සංවර්ධනය.
- ශ්‍රී ලංකා රේගුව පුරා ICT සාක්ෂරතාව පුළුල් කිරීම සහ ICT පද්ධති හා මොඩියුල පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අනෙකුත් රාජ්‍ය ආයතන සහ පර්යන්ත මෙහෙයුම්කරුවන් සමඟ දත්ත ඒකාබද්ධ කිරීම / බෙදා ගැනීම.
- IECD, IRD සහ RMV සමඟ API ඒකාබද්ධ කිරීම.
- සමාරම්භයේ ප්‍රමුඛ ආයතනය ලෙස ජාතික තනි කවුළු ව්‍යාපෘතියට (National Single Window Project) තාක්ෂණික සහාය ලබාදීම.
- නියමු ව්‍යාපෘතියක් ලෙස බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) සමාගම් සමඟ කඩදාසි රහිත ලේඛන සැකසීම හඳුන්වා දීම.

**8.4.2.3 2025** වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ප්‍රධාන කාර්යයන්

1. නැව් මාර්ග සහ භාණ්ඩ ප්‍රේෂණකරුවන්ට ASYHUB පද්ධතියට නෞභාර පත්‍ර සහ නැව් භාණ්ඩ ලේඛන ඉදිරිපත් කිරීම සක්‍රිය කරමින් ASYHUB අදියර 1 සම්පූර්ණ කිරීම.
2. වරප්‍රසාදලත් ප්‍රවේශ කළමනාකරණ පද්ධතිය(Privileged Access Management system) හඳුන්වා දීම.
3. පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම් මත දැනුවත් කිරීමේ / පුහුණු සැසි පැවැත්වීම (සහභාගිවන්නන් 2,500 ක් සඳහා දළ වශයෙන්සැසි 25 ක් පමණ).
4. යාත්‍රා ගාස්තු හා අයකිරීම් සම්බන්ධ පද්ධති වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම.
5. බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවන් (AEOs) සඳහා කඩදාසි රහිත ලේඛන නිෂ්කාශන පහසුකම් හඳුන්වා දීම.
6. වාහන සත්‍යාපන ද්වාරය (Vehicle Verification Portal) වැඩි දියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
7. SVAT යෝජනා ක්‍රමය අවසන් කිරීමෙන් පසු අපනයනකරුවන්ට පහසුකම් සැලසීම සඳහා පද්ධති නවීකරණය කිරීම.
8. මෝටර් රථ ප්‍රවාහන රෙජිස්ට්‍රාර් (RMV) වෙත පද්ධති ඒකාබද්ධ කිරීමත් සමඟ වාහන පිටුව (Vehicle Page) වැඩිදියුණු කිරීම.
9. ට්‍රක් රථ රියදුරන් සඳහා SMS දැනුම්දීම් සේවා හඳුන්වා දීම.
10. වාණිජ බැංකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ කරමින් e-Remittance පද්ධතිය වැඩිදියුණු කිරීම.
11. බැංකු ඇපකර ඉලෙක්ට්‍රොනික් ලේඛනකරණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම.
12. ගමන්මළු කාර්යාලයේ (Baggage Office) ඉල්ලීම මත නව ආදායම් වාර්තාකරණ පහසුකමක් වැඩිදියුණු කිරීම.
13. ශ්‍රී ලංකන් ගුවන් සේවා වෙබ් සේවාවල වැඩිදියුණු කිරීම් සිදු කිරීම.
14. විමර්ශන හා නිරීක්ෂණ අංශයන්ගේ ඉල්ලීම පරිදි Bonding–THINETH ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම්.
15. අවදානම් කළමනාකරණ අංශයේ ඉල්ලීම මත තෝරා ගැනීමේ මොඩියුලය (Selectivity Module) වැඩිදියුණු කිරීම්.
16. පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම (සහභාගිවන්නන් 2,500 කට අධික ප්‍රමාණයක් ආවරණය කරන සැසි 25 ක් පමණ).
17. ජාතික තනි කවුළු (NSW) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබාදීම.
18. ආයෝජන මණ්ඩලයේ (BOI) අවශ්‍යතා සඳහා පද්ධති වැඩිදියුණු කිරීම්.

19. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සම්බන්ධ සහනාධාර භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම සඳහා පද්ධති නවීකරණය කිරීම.

**8.4.1.1** වගුව : කාර්යසාධන දත්ත - 2025

| **8.4.1.4** පද්ධති වැඩිදියුණු කිරීම් | |
|---|---|
| කාර්යය | තත්වය |
| දැනට පවතින ටෙන්ඩර් පටිපාටිය වෙනුවට ඉ- වෙන්දේසි ක්‍රමය හඳුන්වාදීම. | සිදු කරමින් පවතී |
| වෙළඳ පහසුකම් සඳහා අදාළ WCO උපකරණ ක්‍රියාත්මක කිරීම - ASYHUB පූර්ව ආගමන CusDec සැකසුම් ක්‍රියාත්මක කිරීම | සිදු කරමින් පවතී |
| EXADATA දෘඪාංග අලුත් කිරීම | සිදු කරමින් පවතී |
| ASYCUDA යෙදුම් සේවාදායක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | සිදු කරමින් පවතී |
| DR අඩවිය වැඩිදියුණු කිරීම සහ විධිමත් කිරීම | සිදු කරමින් පවතී |
| අන්ත ලක්ෂ්‍ය හඳුනාගැනීම් සහ ප්‍රතිචාර පද්ධතිය (Endpoint Detection and Response System) (EDR) සහ Privilege Access කළමනාකරණ පද්ධතිය (PAM) ක්‍රියාත්මක කිරීම | නිමකර ඇත |
| තීරණාත්මක යටිතල පහසුකම් තුළ නැගෙනහිර-බටහිර ගමනාගමනය (East-West Traffic) පාලනය කිරීම සඳහා බෙදා හරින ලද ෆයර්වෝලයක් (Distributed Firewall) ක්‍රියාත්මක කිරීම | සිදු කරමින් පවතී |
| Security Event කළමනාකරණ පද්ධතිය (SIEM) ක්‍රියාත්මක කිරීම | සිදු කරමින් පවතී |
| පරිසර අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ දත්ත මධ්‍යස්ථානය සඳහා ප්‍රවේශ පාලනය | සිදු කරමින් පවතී |
| ශ්‍රී ලංකා රේගු ශාඛා කාර්යාලවල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සඳහා ශාඛා ජාල යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ LAN-WAN අභිසාරීතාව සාක්ෂාත් කර ගැනීම. | සිදු කරමින් පවතී |
| ශ්‍රී ලංකා රේගුව සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් කමිටුවක් නිර්මාණය කිරීම | සිදු කරමින් පවතී |
| වාහන සත්‍යාපන ද්වාරය (Vehicle Verification Portal) වැඩි දියුණු කිරීම | නිමකර ඇත |
| ක්‍රියාකාරී නාමාවලිය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති නිර්මාණය කිරීම | සිදු කරමින් පවතී |

| **8.4.1.5** පද්ධති නඩත්තුව | |
|---|---|
| කාර්යය | යාවත්කාලීන කිරීම් ගණන |
| බදු රීති යාවත්කාලීන කිරීම සහ තීරුබදු යාවත්කාලීන කිරීම | ~1,321 |
| පද්ධති දෝෂ නිවැරදි කිරීම | ~283 |
| දත්ත සමුදායේ කාර්ය සාධනය සුසර කිරීම | ~287 |

| **8.4.1.6 .** සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණය | | | | |
|---|---|---|---|---|
| වර්ගය | ඉල්ලීම් | නිමකරන ලද | අවසන් වී නොමැති | අයකර ගන්නා ලද මුදල (රු.) |
| වාර්තා ගණන - රේගුවෙන් පිටත සිට | 552 | 552 | - | 448,600/- |
| වාර්තා ගණන - රේගුව තුළ සිට | 1,050 | 1,050 | - | |
| | | | | 448,600/- |

| **8.4.1.7** විගණන | | | |
|---|---|---|---|
| අයිතමය | ආරම්භ කරන ලද | නිමකරන ලද | අවසන් වී නොමැති |
| සිද්ධි ගණන | 98 | 43 | 55 |
| | | | |
| | රඳවාගත් | නිදහස් කරන ලද | |
| බහාලුම් සංඛ්‍යාව | 33 | 29 | 4 |
| | | | සම්පූර්ණ අයකරගැනීම් |
| අයකරගත් ප්‍රමාණය (රු) | | | 376,381,430.50 |

| **8.4.1.8 HELP DESK** | | |
|---|---|---|
| වාර්තා කරන ලද ගැටළු වර්ග | ලැබුණු සහ නිමකළ | අවසන් වී නොමැති |
| WH, CDN, Blend Sheet, Remittance සහ CusDec ගැටළු පිළිබඳ කටයුතු කිරීම | 2,500 | නැත |
| ඉ-ගෙවීම් ගැටළු | 1,005 | නැත |
| THINETH පද්ධති ගැටළු දෝෂ නිරාකරණය කිරීම | 620 | නැත |
| ජංගම දුරකථන අංකය හරහා පාරිභෝගික සහාය | දිනකට ඇමතුම් 200-250 | නැත |
| රේගු යෙදවුම් නඩත්තු කිරීම | 250 | නැත |

| | | |
|---|---|---|
| ඉ- නෞභාර පත්‍ර ලියාපදිංචිය සහ දෝශ නිරාකරණය | 1,300 | නැත |

| **8.4.1.9 ජාල පරිපාලනය (NETWORK ADMINISTRATION)** | | |
|---|---|---|
| කාර්යය | ලැබුණු සහ නිමකළ | අවසන් වී නොමැති |
| ෆයර්වෝල්ස්, WAF, EDR, QMS, NAC, NMS වැනි විවිධ ආරක්ෂක පද්ධතිවලින් ආරක්ෂක අනතුරු ඇඟවීම් සහ ලොග් නිරීක්ෂණය කිරීම | ~11,500 | නැත |
| පද්ධති, ජාල සහ යෙදුම්වල සාමාන්‍ය ආරක්ෂක පරීක්ෂාවන් සහ විගණන සිදු කිරීම | ~325 | නැත |
| ආරක්ෂක සිදුවීම් සමාලෝචනය, විශ්ලේෂණය සහ ප්‍රතිචාර දැක්වීම | ~250 | නැත |
| ෆයර්වෝල්, WAF, EDR, QMS, NAC, NMS පරිපාලන කාර්යයන් | ~600 | නැත |
| ජාලය සහ ආරක්ෂාව සම්බන්ධ රැස්වීම්/සාකච්ඡා/සංසදවලට සහභාගී වීම | ~50 | නැත |
| APN/Router නිකුත් කිරීම සහ දුරස්ථ ස්ථානවල වින්‍යාසගත කිරීම | ~100 | නැත |
| සංවිධානයේ ජාල යටිතල පහසුකම් නිර්මාණය කිරීම සහ සැලසුම් කිරීම | ~75 | නැත |
| ජාල නඩත්තු කාර්යයන් | ~900 | නැත |
| දෝෂ නිරාකරණය සහ මූලික ජාල ගැටළු නිරාකරණය කිරීම | ~650 | නැත |
| සම්බන්ධතාවය ස්ථාපිත කිරීම/පවත්වා ගැනීම සඳහා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම | ~100 | නැත |

| **8.4.1.10 පද්ධති පරිපාලනය** | | |
|---|---|---|
| කාර්යය | ලැබුණු සහ නිමකළ | අවසන් වී නොමැති |
| HCL ඩොමිනෝ ඊමේල් සර්වර් පරිපාලනය සහ අධීක්ෂණ කාර්යයන් | ~550 (දෛනික නිරීක්ෂණ සමඟ) | නැත |
| HCL ඩොමිනෝ ඊමේල් පරිශීලක ලියාපදිංචිය සහ වින්‍යාස කිරීමේ කාර්යයන් | ~175 (ඉල්ලීම් මත පදනම්ව) | නැත |
| IBM AIX සේවාදායක අධීක්ෂණ සහ පරිපාලන කාර්යයන් | ~350 (දෛනික නිරීක්ෂණ සමඟ) | නැත |
| VMWare පරිපාලන කාර්යයන් | ~370 (දෛනික නිරීක්ෂණ සමඟ) | නැත |
| ප්‍රතිපාදන සහිත සේවාදායක (Provisioned Server) අධීක්ෂණය සහ වින්‍යාස කිරීම | ~650 (දෛනික නිරීක්ෂණ සමග) | නැත |
| අවශ්‍ය මෘදුකාංග ස්ථාපනය සහ සේවාදායක | ~130 | නැත |
| දෛනික සේවාදායක පරිපාලන කාර්යයන් (CERT අලුත් කිරීම, ගබඩා පුළුල් කිරීම ආදිය) | ~200 | නැත |
| ක්‍රියාකාරී නාමාවලි පරිශීලක ලියාපදිංචිය සහ වින්‍යාසය | ~600 | නැත |
| Oracle EXAData පරිපාලන කාර්යයන් | ~300 | නැත |
| EXSI Dell Node VM වින්‍යාසය වෙනස් කිරීම | ~80 | නැත |

| **8.4.1.11 වෙබ් අඩවිය** | | |
|---|---|---|
| කාර්යය | ලැබුණු සහ නිමකළ | අවසන් වී නොමැති |
| වෙබ් අඩවියේ තීරුබදු වෙනස් කිරීම් යාවත්කාලීන කිරීම | 09 | නැත |
| වෙබ් අඩවියේ විනිමය අනුපාත ප්‍රකාශ කිරීම | 52 | නැත |
| ටෙන්ඩර් අලෙවිය වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම | 33 | නැත |
| HRD මුල් පිටුව යාවත්කාලීන කිරීම | - | නැත |
| BCNP වෙබ් පිටුව යාවත්කාලීන කිරීම | - | නැත |
| මුල්පිටු බැනරයේ RMU නිවේදන පළ කිරීම | - | නැත |
| BOI සම්බන්ධීකරණ මුල් පිටුව යාවත්කාලීන කිරීම | - | නැත |
| රාජකාරි සංශෝධන ගැසට් ප්‍රකාශනය කිරීම | - | නැත |
| ආනයනකරුවන් සඳහා මාර්ගගත ලියාපදිංචිය සම්බන්ධ දැන්වීම් පළ කිරීම | 6 | නැත |
| BCNP වෙබ් පිටුවේ ජාත්‍යන්තර සංවිධාන ලැයිස්තුව යාවත්කාලීන කිරීම | - | නැත |
| මුල් පිටුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තුවල රේගු සම්බන්ධතා විස්තර යාවත්කාලීන කිරීම | 2 | නැත |
| මුල් පිටුවේ බැනර් ලේඛන යාවත්කාලීන කිරීම | 1 | නැත |
| වෙබ් අඩවියේ Asycuda විකල්ප සබැඳිය යාවත්කාලීන කිරීම | 1 | නැත |

*මූලාශ්‍රය : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.4.2 අවදානම් කළමනාකරණ අංශය

**8.4.2.1 හැඳින්වීම**

ලෝක රේගු සංවිධානය (WCO) විසින් හඳුන්වා දෙන ලද SAFE ප්‍රමිති රාමුවට අනුකූලව, රේගු පරිසරය තුළ ඵලදායී අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රේගුව විසින් අවදානම් කළමනාකරණ ඒකකය පිහිටුවන ලදී. මෙම පදනම මත පිහිටා, එම ඒකකය 2021 වසරේදී ප්‍රතිව්‍යුහගත කර පූර්ණ අංශයක් දක්වා උසස් කරන ලද අතර, එතැන් සිට එය අවදානම් කළමනාකරණ අංශය ලෙස නම් කරන ලදී.

නියාමන පාලනය සහ වෙළඳ පහසුකම් සැලසීම අතර නිසි සමතුලිතතාවයක් සහතික කරමින්, ශ්‍රී ලංකා රේගුව පුරා අවදානම් මත පදනම් වූ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේ වගකීම අවදානම් කළමනාකරණ අංශය වෙත පැවරී ඇත. අවදානම් කළමනාකරණය නවීන රේගු මෙවලමක් ලෙස උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා, ජාත්‍යන්තර රේගු පරිපාලනයන් විසින් අනුගමනය කරනු ලබන හොඳම පිළිවෙත් සහ අවදානම් කළමනාකරණ සංකල්ප පිළිබඳ විශේෂිත පුහුණුවක් සහ මනා අවබෝධයක් ඇති නිලධාරීන්ගෙන් මෙම අංශය සමන්විත වේ.

වර්තමානය වන විට, පද්ධති, ක්‍රියාවලීන් සහ මෙහෙයුම් පටිපාටි අඛණ්ඩව වැඩිදියුණු කිරීම හරහා දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ අංශය සක්‍රිය කාර්යභාරයක් ඉටු කරයි.

**8.4.2.2** අංශය විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

i. අවදානම් පාදක භාණ්ඩ වරණීයතාව සහ අවදානම් කළමනාකරණය.
ii. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන.
iii. ක්‍රියාවලි නැවත සකස් කිරීම (Process Re-engineering) සහ විමර්ශන සිදුකිරීම.
iv. ජාතික ආනයන මිළ පිරික්සුම් දත්ත ගබඩා ඒකකය.

**8.4.2.2.1 අවදානම් පාදක භාණ්ඩ වරණීයතාවය (RISK BASED CARGO SELECTIVITY)**

ප්‍රධාන පාලන රාමුව ලෙස සැලකෙන අවදානම් කළමනාකරණ සම්මත මෙහෙයුම් කාරියපටිපාටියේ **(SOP)** දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව වැඩි දියුණු කර සකස් කරන ලද අවදානම් පරාමිතීන් සහ පැතිකඩ භාවිතයෙන්, ශ්‍රී ලංකා රේගුවේ අවදානම් පාදක භාණ්ඩ වරණීයතා යාන්ත්‍රණය, **ASYCUDA** පද්ධතියේ ඇති වරණීයතා මොඩියුලය හරහා ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. මෙම කාර්යය සඳහාම පත් කර ඇති විශ්ලේෂක කණ්ඩායමක් විසින් ආනයන දත්ත අඛණ්ඩව පරීක්ෂා කරනු ලබන අතර, එමඟින් අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ උචිත අවදානම් පැතිකඩ (Risk profiles) සැකසීම සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ අංශයේ (RMD) රේගු අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයාගේ සමීප අධීක්ෂණය යටතේ සිදු කෙරෙන නිරන්තර සහ තථ්‍ය කාලීන (Real-time) විශ්ලේෂණ ඇගයීම් හරහා මෙම අංශයේ වරණීයතා කණ්ඩායම විසින් භාණ්ඩ තේරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ සංශෝධනය කිරීම කළමනාකරණය කරනු ලබයි. මෙම විශ්ලේෂණයන් හරහා හඳුනාගනු ලබන කැපී පෙනෙන ප්‍රවණතා, මතු වන අවදානම් හෝ සැලකිය යුතු වෙනස්කම් ඇගයීම සහ අනුමැතිය සඳහා වහාම අවදානම් කළමනාකරණ කමිටුව (RMC) වෙත ඉදිරිපත් කරනු ලැබේ. එම අනුමැතිය ලැබුණු පසු, තහවුරු කරන ලද අවදානම් පැතිකඩ ASYCUDA පද්ධතියේ තේරීම් නිර්ණායකවලට ඇතුළත් කරනු ලබන අතර එමගින් ඉහළ අවදානමක් සහිත භාණ්ඩ තොග සාධනීය ලෙස ඉලක්ක කර ගන්නා අතරම අනුකූල වෙළෙඳුන්ගේ භාණ්ඩ නිෂ්කාශන කටයුතු සඳහා පහසුකම් සැලසීමටත් අවස්ථාව සැලසේ.

**8.4.2.2.1.1 2025 වර්ෂයේ භාණ්ඩ වරණීයතා අංශයේ ජයග්‍රහණ**

අ. භෞතික පරීක්ෂණ සඳහා යොමුකරන බහාලුම් සංඛ්‍යාව අවම කිරීම.
ආ. අවදානම්පාදක භාණ්ඩ වරණීයතා ක්‍රියාවලියේ අභිවර්ධනය සඳහා දැනට පවතින අවදානම් පාදක භාණ්ඩ වරණීයතා නිර්ණායක සහ අවදානම් පැතිකඩවල් තවදුරටත් වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදුකිරීම.
ඇ. **ASYCUDA** පද්ධතිය හරහා බහාලුම් තේරීම කළමනාකරණය කිරීම මගින් බහාලුම් පරීක්ෂණ අංගන සහ **X-ray** ස්කෑන් යන්ත්‍රවල ධාරිතාවය වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම.
ඈ. ජාතික වෙළඳ පහසුකරණ කමිටුවේ මග පෙන්වීම යටතේ, සම්බන්ධීකරණය කරන ලද අවදානම් කළමනාකරණ තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවක් (Coordinated Risk Management Technical Working Group) ආරම්භ කරන ලද අතර, සම්බන්ධීකරණය කරන ලද අවදානම් පාදක දේශසීමා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම

සහ වැඩිදියුණු කරන ලද අන්තර් නියෝජිතායතන සහයෝගීතාවය මගින් කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රධාන දේශසීමා නියාමන පාර්ශවකරුවන් සමග රැස්වීම් පවත්වන ලදී.

ඉ. අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි (OGA) අනුමැතීන් අවශ්‍ය වන බාහිර පැනල පහසුකම (out panel facility), අදාළ බලධාරීන්ගෙන් නියාමන අනුමැතිය අවශ්‍ය වන භාණ්ඩ තොග සඳහා ද ව්‍යාප්ත කරන ලදී. පෙර පැවති ක්‍රියාපටිපාටිය අනුව, එවැනි භාණ්ඩ තොග බහාළුම් කිහිපයක් ලෙස පැමිණි විට, තෝරාගත් බහාළුම් ප්‍රතිශතයක් රැන්ක් බහාළුම් පර්යන්තය (RCT) වෙත යොමු කර, අදාළ නියාමන අධිකාරිය විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබීය. යොමු කරන ලද බහාළුම් සඳහා නිෂ්කාශන ලබා දෙන තුරු, එම භාණ්ඩ තොගයට අයත් අනෙකුත් බහාළුම් වරාය පරිශ්‍රය තුළම රඳවා තබා ගත යුතු විය. නව ක්‍රමවේදය යටතේ, අදාළ අනෙකුත් රාජ්‍ය ආයතනයේ එකඟතාවය සහිතව, රැන්ක් බහාළුම් පර්යන්තය (RCT) වෙත යොමු කළ කන්ටේනර් සඳහා නිෂ්කාශනය ලැබෙන තුරු, භාණ්ඩ භාරගන්නා තැනැත්තන්ට ඉතිරි කන්ටේනර් තම ගබඩාව වෙත රැගෙන යාමට අවසර ලබා දී ඇත. මෙම පියවර මගින් බහාළුම් වරාය තුළ රැඳී සිටින කාලය අඩු වන අතර, නියාමන අධීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාමද සහතික කරනු ලැබේ.

ඊ. ශ්‍රී ලංකා රේගුව පුරා අවදානම් හඳුනාගැනීම සහ වාර්තා කිරීම සඳහා වන ආයතනික රාමුව ශක්තිමත් කිරීම සඳහා සියලුම ප්‍රධාන අංශ නියෝජනය කරමින් අවදානම් වාර්තාකරණ නිලධාරීන් පත් කරන ලදී. මෙම මුලපිරීම සඳහා එමගින් දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි සමස්ත කාර්යක්ෂමතාවය ශක්තිමත් කෙරේ.

උ. ASYCUDA පද්ධතිය හරහා රඳවාගැනීම් සිදු කිරීම මගින්, තෝරාගත් පූර්ණ නොවන බහාලුම්(LCL) තොග ස්වයංක්‍රියව පරීක්ෂන සඳහා යොමු කිරීම සඳහා, පද්ධති පාදක යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. මෙම යාන්ත්‍රණය යටතේ, හඳුනාගත් පූර්ණ නොවන බහාළුම් (LCL) තොග ආදායම් අධීක්ෂණ අංශයේ (RTF), නිවාරණ (Preventive) සහ අවදානම් කළමනාකරණ (RMD) අංශයන්හි අදාළ පරීක්ෂණ අංශ වෙත යොමු කරනු ලබන අතර එමගින් ස්වයංක්‍රීය, අවදානම් පදනම්ව යොමු කිරීමේ ක්‍රියාවලියක් තුළ නියාමන පාලන බලයන් ශක්තිමත් කරන අතර, පෞද්ගලික මැදිහත්වීම් අවම කරනු ලැබේ.

ඌ. අනෙකුත් රාජ්‍ය ආයතනවල අනුමැතීන් අවශ්‍ය නොවන තෝරාගත් භාණ්ඩ ආනයනය කරන, අවදානම් අඩු භාණ්ඩ බාරගන්නා පුද්ගලයින් සඳහා "ගුදම් නිෂ්කාශනය" (Warehouse Release) නමැති නව පහසුකම් යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. මෙම පියවර යටතේ, භාණ්ඩ තොග බහාළුම් කිහිපයක් ලෙස පැමිණි විට, අවදානම් ඇගයීමේ මත පදනම්ව පූර්වයෙන් නිර්ණය කරන ලද බහාළුම් ප්‍රතිශතයක් භෞතික පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අතර , ඉතිරි බහාළුම් භාණ්ඩ බාරගන්නාගේ බන්ධිත පරිශ්‍රයට නිදහස් කරමින්, සම්පූර්ණ භාණ්ඩ තොගය පිළිබඳ අවසන් රේගු තීරණය ලබා දෙන තුරු ආරක්ෂිතව තබා ගනු ලබයි. මෙම පහසුකම ආයතනික ඇපකරුවකු යටතේ ක්‍රියාත්මක වන අතර එමගින් ආදායම් සුරක්ෂිතතාවය සහතික කරන අතරම, වැඩිදියුණු කරන ලද භාණ්ඩ මෙහෙයවීමට පහසුකම් සලසමින්, වරාය තදබදය අඩු කරමින්, බහාළුම් රැඳී සිටීමේ කාලය අවම කරමින්, රේගුවේ පාලනයට බාධා නොවන ආකාරයෙන් ක්‍රියාත්මක වේ.

එ. ASYCUDA පද්ධතිය තුළ පෙර තිබූ වංචා පිළිබඳ කේත පද්ධතිය (Fraud Code System) වැඩිදියුණු කර, අවදානම් විශ්ලේෂණය ශක්තිමත් කිරීමේ අරමුණින් ප්‍රතිපෝෂණ කේත පද්ධතියක් (Feedback Code System) ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. වැඩි දියුණු කරන ලද පද්ධතිය මගින් නියාමන හා පරීක්ෂණ ප්‍රතිඵලයන්හි ඇති ප්‍රතිපෝෂණ ක්‍රමානුකූලව ග්‍රහණය කර ගැනීමේ සහ විශ්ලේෂණය කිරීමේ හැකියාව ලැබෙන අතර එමගින් අනාවරණය කරගත් අක්‍රමිකතා අදාළ අංශය සහ ශාඛාව අනුව විශේෂිතව හඳුනාගෙන අධීක්ෂණය කිරීමට හැකියාව ලැබේ. මෙම වැඩිදියුණු කිරීම මගින් අවදානම් ඇගයීම වඩා කාර්යක්ෂම කරමින්, දත්ත මත පදනම්වූ අවදානම් පැතිකඩ නවීකරණය කිරීමට පහසුකම් සලසන අතර, ශ්‍රී ලංකා රේගුව පුරා අවදානම මත පදනම් වූ වරණීය ක්‍රියාවලිය අඛණ්ඩව වැඩි දියුණු කිරීමට දායක වේ.

### 8.4.2.2.2 බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන (AUTHORISED ECONOMIC OPERATOR PROGRAMME)

2017 පෙබරවාරි 22 වන දින ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳ පහසුකරණ ගිවිසුම (TFA) බලාත්මක වීමත් සමඟ, දේශසීමා වෙළඳාමේ විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කරගත් කැපවීම් මාලාවක් ශ්‍රී ලංකාව භාර ගත්තේය. මෙම කැපවීම් සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වූයේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහනක් හඳුන්වාදීම වන අතර ඒ සඳහාම වෙන්වූ AEO ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී.

සැපයුම් දාම ආරක්ෂාව, මූල්‍ය විශ්වාසනීයතාව සහ රේගුවේ නීති සහ රෙගුලාසි තිරසර අයුරින් අනුගමනය කිරීම පෙන්නුම් කරන අනුකූල ආනයනකරුවන් සහ අපනයනකරුවන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන නිර්මාණය කර ඇත. සුදුසුකම් ලබන සහභාගීවන්නන්ට භෞතිකව සිදුකරන පරීක්ෂණ අඩු කිරීම, භාණ්ඩ තොග සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීම, සහ සාමාන්‍ය මිල පිරික්සුම් සඳහා යොමු කිරීම්වලින් නිදහස් කිරීම

ඇතුළත් පහසුකම් ලබා දීම මගින් වෙළඳ පහසුකරණය සරල කිරීමට සහ කාර්යක්ෂම නියාමන පාලනයක් පවත්වාගෙන යාමට සහාය ලබා දෙයි.

**8.4.2.2.2.1 2025 වර්ෂයේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහනෙහි ජයග්‍රහණයන්**

අ. සුදුසුකම් ලත් ආයතන හතළිහකට (40) බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) තත්ත්වය ප්‍රදානය කරනු ලැබූ අතර අදාළ පහසුකම් ප්‍රතිලාභ ද ලබා දෙන ලදී.

ආ. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ, සුදුසුකම් ලත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ව්‍යවසායන්ට (MSME) AEO පහසුකම් ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීමේ සහ ඒවා සුරක්ෂිත හා අනුකූල ජාත්‍යන්තර සැපයුම් දාමවලට ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීමේ අරමුණින්, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහාය ලත් යෝජනාව යටතේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ව්‍යවසාය (MSME) වැඩසටහන ආරම්භ කරන ලදී.

ඇ. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ, බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) Logistics Operator Tier හඳුන්වා දෙන ලද අතර, එය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා අදාළ වලංගු කිරීමේ මාර්ගෝපදේශ මේ වන විට සකස් කෙරෙමින් පවතී.

ඈ. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) Tier 2 වැඩසටහන ආරම්භ කරන ලද අතර, එය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශය සහ වලංගු කිරීමේ මාර්ගෝපදේශ මේ වන විට සකස් කෙරෙමින් පවතී.

ඉ. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ, බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) සහභාගිවන්නන් සම්බන්ධයෙන් ස්ථානීය නිරීක්ෂණ සහ වලංගු කිරීම් පහළොවක් (15) සිදු කරන ලදී.

**8.4.2.2.3 ක්‍රියාවලි නැවත සැකසීම සහ විමර්ශනය කිරීම**

සිදුකරන ලද අවදානම් තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ක්‍රියාවලි නැවත සැකසීමේ කණ්ඩායම විසින් ඒවායේ පවතින යම් දෝෂයක් සහ නීතියෙන් ගැලවීයාමේ මාර්ග හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ විශ්ලේෂණයක් සිදු කරනු ලැබීය. පද්ධතියේ පවතින හඳුනාගත් ගැටලු සහ එකී ගැටලු විසඳීම සඳහා වන නිර්දේශ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාපතිත්වය දරන RMC හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවධානය සඳහා වාර්තා කරන ලදී. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අනුමැතිය සහ නිර්දේශ මත, තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදුකිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි, යම් අවහිරතා හා සම්බන්ධ ගැටලු හඳුනා ගැනීම සඳහා RMD විසින් ක්‍රියාත්මක කිරීම් අඛණ්ඩව අධීක්ෂණය කරයි.

**8.4.2.2.3.1 2025 වර්ෂයේ ක්‍රියාවලි නැවත සැකසීමේ ජයග්‍රහණයන්**

2025 වර්ෂයේ අවදානම් කළමනාකරණ අංශයේ (RMD) ක්‍රියාකාරී සැලැස්මට අනුව, බැඳුම්කර ක්‍රියාවලිය (Bonding Process) සඳහා වඩාත් ආරක්ෂිත ක්‍රියාවලියක් නැවත සකස් කර සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බව තීරණය කරනු ලැබීය. ඒ අනුව පවත්නා ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය මගින් කර්මාන්ත හා සේවා අංශයේ නිලධාරීන් සමග 2025 අප්‍රේල් 29 වන දින රැස්වීමක් කැඳවන ලදී. මෙම රැස්වීම අතරතුර දී, සම්පූර්ණ ක්‍රියාවලියට අදාළ අවදානම් හා දුර්වලතා කිහිපයක් හඳුනාගනු ලැබූ අතර එමඟින් අවදානම් කළමනාකරණ අංශය (RMD) විසින් පාලන ක්‍රම ශක්තිමත් කිරීම හා කාර්යපටිපාටි ඒකාබද්ධතාවය සහතික කිරීම සඳහා entrepôt වෙළඳ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නැවත සකස් කිරීම අවශ්‍ය බවට තීරණය කරන ලදී.

ඉන්පසුව, බැඳුම්කර අංශයේ, ගුවන් භාණ්ඩ පර්යන්තයේ සහ වරාය තුළ මෙහෙයුම් ආශ්‍රිත වර්තමාන මෙහෙයුම් භාවිතාවන් නිරීක්ෂණය කිරීම සඳහා නිලධාරීන් කණ්ඩායමක් පත් කරන ලදී. මෙම ක්ෂේත්‍ර නිරීක්ෂණ මඟින් නිලධාරීන්ට ක්‍රියාපටිපාටිමය අඩුපාඩු සහ පාලන දුර්වලතා කිහිපයක් හඳුනාගැනීමට හැකි වූ අතර, ඒවා විස්තරාත්මක වාර්තාවක ලේඛනගත කරන ලදී. මෙම වාර්තාවේ දක්වා ඇති සොයාගැනීම් සහ නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා රේගුවේ ඉහළ කළමනාකාරිත්වයෙන් වැඩිදුර මඟපෙන්වීම් හා උපදෙස් ලබාගැනීම සඳහා දෙසැම්බර් මාසයේදී අවදානම් කළමනාකරණ කමිටුවට විධිමත් ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

**8.4.2.2.3.2 විමර්ශන**

ඒ සඳහා කැප වූ පළපුරුදු විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් රේගු ක්‍රියාවලි වල පවතින අවදානම් ක්ෂේත්‍ර සහ දෝෂ හඳුනා ගැනීමේ අභිලාෂය ඇතිව විවිධ වංචා හසුකර ගැනීම සහ විමර්ශනය කිරීම සිදු කරයි. එවැනි විමර්ශනවල ප්‍රධාන අරමුණ වන්නේ විවිධ අවදානම් ක්ෂේත්‍ර හඳුනාගෙන, දෙපාර්තමේන්තු අවදානම් කළමනාකරණ

අරමුණු සාක්ෂාත් කිරීමේදී තෝරාගැනීමේ සහ ප්‍රති ඉංජිනේරුගත කිරීමේ ක්‍රියාවලීන්ට ඒවා ප්‍රයෝජනවත් කර ගැනීමයි. 2025 වර්ෂයේ සිදු කරන ලද විමර්ශනවල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

**8.4.2.1** වගුව : **විමර්ශනවල ජයග්‍රහණ - 2025**

| | | |
|---|---|---|
| 1 | ආරම්භ කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව | 71 |
| 2 | ස්වයංක්‍රීයව රඳවාගත් (Auto detained) සිද්ධි | 28 |
| 3 | හසුකරගත් සිද්ධි | 43 |
| 4 | අවසන් කරන ලද ස්වයංක්‍රීයව රඳවාගත් (Auto detained) මුළු සිද්ධි සංඛ්‍යාව (e-CCR යාවත් කාලීන කරන ලද) | 26 |
| 5 | අවසන් කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව (e-CCR යාවත් කාලීන කරන ලද) | 16 |
| 6 | සාර්ථක වූ ස්වයංක්‍රීයව රඳවාගත් (Auto detained) මුළු සිද්ධි සංඛ්‍යාව (අයකර ගැනීම් සහිත) | 17 |
| 7 | සාර්ථක වූ හසුකරගත් මුළු සිද්ධි සංඛ්‍යාව (අයකිරීම් සහිත) | 31 |
| 8 | මුළු NFA සිද්ධි සංඛ්‍යාව (Auto detained) | 6 |
| 9 | මුළු NFA සිද්ධි සංඛ්‍යාව (හසුකරගැනීම්) | 5 |
| 10 | පරීක්ෂණ අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාව (Auto detained) | 5 |
| 11 | පරීක්ෂණ අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාව (හසුකරගැනීම්) | 7 |
| 12 | සාර්ථකත්ව අනුපාතය (Auto detained) | 77.27% |
| 13 | සාර්ථකත්ව අනුපාතය (හසුකරගැනීම්) | 86.11% |
| 14 | මුළු අයකර ගැනීම් (රු.) | 272,713,134 |
| 15 | මුළු අයකර ගැනීම් (රු.) - (Auto detained) | 46,566,044 |
| 16 | මුළු අයකර ගැනීම් (රු.) - හසුකරගත් සිද්ධි | 226,147,090 |
| 17 | සාර්ථකත්වයකට අයකරගැනීම් සාමාන්‍යය (රු.) - (Auto detained) | 2,739,179 |
| 18 | සාර්ථකත්වයකට අයකරගැනීම් සාමාන්‍යය (රු.) - හසුකරගැනීම් | 7,295,067 |
| | | |
| 19 | මේ වන විට ගෙවා ඇති මුළු අයකර ගැනීම් (රු.) | 272,713,134 |

*මූලාශ්‍රය : අවදානම් කළමනාකරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.4.2.2.4 ජාතික ආනයන මිල පරික්සුම් දත්ත ගබඩා ඒකකය (NIVDU) වෙබ් ද්වාරය සහ දත්ත ගබඩාව නඩත්තු කිරීම**

අවදානම් කලමනාකරණ අරමුණු සඳහා දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම් සහ පුළුල් කිරීම් වේගවත් කිරීම සඳහා 2023 වසරේදී ජාතික ආනයන මිල පිරික්සුම් දත්ත ගබඩා ඒකකය (NIVDU) අවදානම් කළමනාකරණ අංශය යටතට ගනු ලැබීය. අපනයන භාණ්ඩයන්හි අදාල වටිනාකම පමණක් නොව අදාල නිලධාරීන්ට පහසුකම් සළසන විවිධ මෙහෙයුම් මෙවලම් වැඩිදියුණු කර ඇති අතර මිල පරික්සුම් ඒකකයේ නිලධාරීන්ට මෙන්ම අනෙකුත් අදාල නිලධාරීන් සඳහා ද මිල පිරික්සුම් දත්ත පද්ධතියට ප්‍රවේශය ලබා දී ඇත. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා පදනම ලෙස ද දත්ත ගබඩාව භාවිතාවේ.

අ. ගනුදෙනු අගයන් (transactional values) 6480 ක් යාවත්කාලීන කරන ලදි.
ආ. ගනුදෙනු නොවන අගයන් (non-transactional values) 1417 ක් යාවත්කාලීන කරන ලදි.
ඇ. සංයෝජිත වර්ගීකරණ මාර්ගෝපදේශ 80 ක් දත්ත සමුදායට එකතු කරන ලදි.
ඈ. NIVDU පරිශීලක ගිණුම් 39 ක් ලබා දෙන ලදි.

**8.4.2.3 ශ්‍රී ලංකා රේගුව සඳහා ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම.**

දෙපාර්තමේන්තුව තුළ ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ අංශය විසින් උපායමාර්ගික මුලපිරීම් ගණනාවක් ආම්භ කර ඇත. ඒ අතුරින් වඩාත්ම සුවිශේෂී වැඩිදියුණු කිරීම වනුයේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය (ARMS) වන අතර, එය විනිවිදභාවය ඉහළ නංවමින් දූෂණ ක්‍රියාවන් අවම කරමින් අවදානම් කළමනාකරණ කාර්යයන් නවීකරණය කිරීම අරමුණුකරගත් පරිවර්තනීය ව්‍යාපෘතියකි.
මෙම ව්‍යාපෘතිය **2024** අගෝස්තු මාසයේදී **ARMS** අදියර **1** සහ **ARMS** අදියර **2** ලෙස වෙනම අදියර දෙකකට වෙන් කරන ලදී.

**8.4.2.4** ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය අදියර 1

අවදානම් කළමනාකරණ පද්ධතියේ **1** වන අදියර, රේගු ලේඛන දැනුම්දීමේ පද්ධතිය **(Customs Document Notification System)** (CDNS) නම් දත්ත විශ්ලේෂණ වේදිකාවක් සහ දත්ත විශ්ලේෂණ මෙවලම් **(DAT)** නම් වෙබ් සේවාවක් වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිවලින් පසුව **ARMS 1** වන අදියර වැඩි දියුණු කිරීම සඳහා වන තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් **2024** සැප්තැම්බර් මස ආරම්භ කරන ලද අතර වඩාත්ම සුදුසු වෙළඳ සමාගම ලෙස Creative Web Technologies (පුද්) සමාගම තෝරාගන්නා ලදී. **2025** පෙබරවාරි **7** වන දින කොන්ත්‍රාත්තු අත්සන් කිරීමෙන් පසුව වැඩි දියුණු කිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

**8.4.2.5** රේගු ලේඛන දැනුම්දීමේ පද්ධතිය **(CDNS)**

**CDNS** යනු ශ්‍රී ලංකා රේගුව සහ ආනයනකරුවන්, අපනයනකරුවන් සහ බලපත්‍රලාභී ප්‍රකාශකයින් ඇතුළු එහි පාර්ශවකරුවන් අතර තත්‍ය කාලීන සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කරන ලද වෙබ් සේවාවකි. රේගු ලේඛන දැනුම්දීමේ පද්ධතිය, ස්වයංක්‍රීයකරණය කෙරෙහි වූ ශ්‍රී ලංකා රේගුවේ කැපවීම සහ බැඳීම සහ ජාත්‍යන්තර ප්‍රශස්ථ භාවිතයන් කෙරෙහි වූ එහි දැඩි කැපවීම විදහා දක්වමින් **2025** අගෝස්තු මස එළිදක්වන ලදී. වර්තමානයේ දී රේගු ලේඛන දැනුම්දීමේ පද්ධතිය ලියාපදිංචි ඇගයීම් පරිශීලකයින් **588** කින් සමන්විත වේ.

පරිශීලකයින්ගෙන් දායකත්ව ගාස්තුවක් එකතු කිරීමට සැලසුම් කර ඇති අභ්‍යන්තර ගෙවීම් ද්වාරයක් (payment gateway) **CDNS** තුළ ඇතුළත් වේ. මෙම ආකෘතිය මගින් තිරසර භාවයට දායකත්වය දක්වනු පමණක් නොව රජය සඳහා බදු නොවන ආදායමක් උත්පාදනය කිරීමක්ද සිදුවේ. දායකත්ව ගාස්තු ව්‍යුහය සහ ගෙවීම් ද්වාර යාන්ත්‍රණය ගැසට් කිරීම සඳහා වූ විධිමත් ඉල්ලීමක් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිචාර මෙතෙක් ශ්‍රී ලංකා රේගුව වෙත ලැබී නොමැත.

තවද, රේගු ලේඛන දැනුම්දීමේ පද්ධතිය **(CDNS)** තුළ අඩංගුවන දත්ත මගින් එක් දිනක් ප්‍රමාද වූ දත්ත නිරූපණය කරන බැවින් වර්තමානයේදී තත්‍ය කාලීන දත්ත වෙත ප්‍රවේශ විය නොහැක. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව සඳහා වන නව දත්ත සමුදාය පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීමේ කාර්යයයේ නිරත වී සිටින අතර, ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ වූ පසුව මෙම ගැටළුව විසඳෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**8.4.2.6** දත්ත විශ්ලේෂණ මෙවලම **(Data Analytics Tool)**

ශ්‍රී ලංකා රේගුව තුළ භාවිතා කරනු ලබන සියළුම ප්‍රධාන දත්ත සමුදායන් ඒකීය පද්ධතියක් තුළට ඒකාබද්ධ කිරීම දත්ත විශ්ලේෂණ වේදිකාවේ අරමුණ වන අතර එමගින්, රේගු මෙහෙයුම්වල දී ගතික පුවරු සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම මගින් උසස් අවදානම් පැතිකඩ සහ තත්‍ය කාලීන කාර්යසාධන අධීක්ෂණයට ඉඩ කඩ සලසා දෙයි.

වර්තමානයේදී, දත්ත විශ්ලේෂණ මෙවලම වැඩි දියුණු කිරීම ක්‍රියාත්මක වෙමින් පවතින අතර දත්ත විශ්ලේෂණ මෙවලමෙන් **75%**ක් සම්පූර්ණ කර ඇති බව Creative Web Technologies (පුද්) සමාගම වාර්තා කර ඇත.

**8.4.2.2 වගුව : 2025 ක්‍රියාකාරී සැලැස්මට අනුව අවදානම් කළමනාකරණ අංශයේ කාර්ය සාධනය**

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 1 ඉලක්කය ආදායම උපරිම කිරීම | 1.1. අංක 1.1 ලැබිය යුතු ආදායම් එකතු කිරීම | උසස් අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | වැඩිදියුණු කළ අනුකූලතා මට්ටම් | **1.1.1** RMC සමඟ සම්බන්ධීකරණය කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 1.1.1.1. RMC වෙත අවදානම් විශ්ලේෂණ වාර්තා සකස් කිරීම | RMC වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 5 /මාස 2025.12.31. | වාර්තා **40** ( RMC රැස්වීම් **8** කදී) (බහාළුම් පර්යන්ත තෝරා ගැනීම, භාණ්ඩ වැනල තෝරාගැනීම, පරීක්ෂණ ප්‍රතිඵල සාරාංශය, ස්වයංක්‍රීය රඳවාගැනීම් (Auto Detained) සාරාංශය, ප්‍රතිපෝෂණ කේත විශ්ලේෂණය (Feedback Code Analysis) |
| | | | | | | 1.1.1.2. වෙළඳුන්ගේ ඉල්ලීම් මත RMC වෙත වාර්තා සකස් කිරීම | RMC වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 4 /මාස 2025.12.31. | ඉල්ලීම් **41**ක් සඳහා පහසුකම් සලසන ලදී (RMD රේගු අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලදී) |
| | | | | | | 1.1.1.3. RMC රැස්වීම් කැඳවීම | කැඳ වූ රැස්වීම් සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 1 /මාස 2025.12.31. | රැස්වීම් 10 ක් කැඳවන ලදී (විශේෂ රැස්වීම් 2 ක් ඇතුළුව) |
| | | | | | | 1.1.1.4. අවදානම් ලේඛනය සමාලෝචනය කිරීම සහ වැඩි දියුණු කිරීම | සිදු කළ සමාලෝචන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 1 /මාස 2025.12.31. | සමාලෝචන 13 |
| | | | | | | 1.1.1.5. SOP සහ අවදානම් කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම | සිදු කරන ලද සමාලෝචන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 31.07.2025 | කාර්ය මණ්ඩල හිඟකම සහ රාජකාරී බහුලත්වය හේතුවෙන් සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කළ නොහැකි විය. |
| | | | | 1.1.2 ORA සහ අනෙකුත් දේශ සීමා නියෝජිතායතන සමග සම්බන්ධීකරණය | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 1.1.2.1. ORA සහ අනෙකුත් දේශ සීමා නියෝජිතායතන සමග සාකච්ඡා | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 4 /වසර 2025.12.31. | (SLSI) 01 ක් CRMTWG රැස්වීම් 04 |
| | | | | | | 1.1.2.2. අදාළ අවබෝධතා ගිවිසුම්/ | සකස් කරන ලද ලේඛන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 4 /වසර 2025.12.31. | 04 SLSI, FCA, APH, NPQS |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලේඛන/ උපදෙස් සකස් කිරීම | | | | HS කේත ලැයිස්තුව සත්‍යාපනය සඳහා එක් එක් CRMTWG සාමාජිකයා වෙත යොමු කරන ලදී. |
| | | | | | | 1.1.2.3. පවතින ක්‍රියාවලීන්හි අවදානම් ගැටළු සහ එයින් මිදීමේ මාර්ගය හඳුනා ගැනීම | විසඳන ලද ගැටළු සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 01 – OGA බාහිර පැනලය පෙර සියලුම OGA යොමු කරන ලද HS කේත එක් ලැයිස්තුවක විය. වර්තමානයේ දී ඒවා අදාළ OGA වලට වර්ග කර වෙනම ලැයිස්තු ලෙස පද්ධතියට ඇතුළත් කර ඇත |
| | | | | 1.1.3. කාර්යක්ෂම භාණ්ඩ තේරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 1.1.3.1. වත්මන් තේරීම් රීති/ ලැයිස්තු සමාලෝචනය කිරීම | පවත්වන ලද සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 4 /සති 2025.12.31. | අභ්‍යන්තර රැස්වීම් 100ක් පමණ අළුතින් නිර්මාණය කරන ලද CBHQ1 රීතිය භාණ්ඩ තෝරාගැනීම සඳහා ව්‍යුහගත, පැතිකඩ මත පදනම් වූ ප්‍රවේශයක් සමග සැලසුම් කරන ලදී. |
| | | | | | | 1.1.3.2. තේරීම් රීති වෙනස් කිරීමේ ශක්‍යතාව තක්සේරු කිරීම | තේරීම් රීති පිළිබඳ සමාලෝචන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 2 /සති 2025.12.31. | දළ වශයෙන් සමාලෝචන 70ක් (මෙම සමාලෝචනවල ප්‍රතිඵලයක් ලෙස රීති සංශෝධන 39ක් සාර්ථකව සිදු කරන ලදී) |
| | | | | | | 1.1.3.3. තේරීම් ලැයිස්තුවේ වෙනස්කම් වල ශක්‍යතාව තක්සේරු කිරීම | තේරීම් ලැයිස්තුවේ සමාලෝචන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 3 /සති 2025.12.31. | දළ වශයෙන් සමාලෝචන 200 ක් (මෙම සමාලෝචනවල ප්‍රතිඵලයක් ලෙස ලැයිස්තු සංශෝධන 153ක් සාර්ථකව සිදු කරන ලදී) |
| | | | | | | 1.1.3.4. තේරීම් රීති වෙනස් කිරීම මත | රීති වෙනස්වීම් මත ක්‍රියාත්මක | තේරීම් කණ්ඩායම | 40 /සති 2025.12.31. | ආසන්න වශයෙන් සමාකරණ 600 ක් |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සමාකරණ ක්‍රියාත්මක කරවීම | වන සමාකරණ සංඛ්‍යාව | | | |
| | | | | | | 1.1.3.5. තේරීම් ලැයිස්තුවේ වෙනස්කම් මත සමාකරණ (simulations) ක්‍රියාත්මක කරවීම | ලැයිස්තු වෙනස්කම් මත ධාවනය වන සමාකරණ සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 20 / සතිය 2025.12.31. | ආසන්න වශයෙන් සමාකරණ 800 ක් |
| | | ස්වයංක්‍රියකරණය වැඩි දියුණු කිරීම | අවම මානව මැදිහත්වීම | 1.1.4. භාණ්ඩ තෝරා ගැනීම ස්වයංක්‍රීයකරණය කිරීම | 2025.08.07. | 1.1.4.1. ආදායම් වාර්තා කිරීමේ උපකරණ පුවරුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම (අදියර 1) | ආදායම් වාර්තා කිරීමේ උපකරණ පුවරුව (අදියර 1) ක්‍රියාත්මක වෙමින් පවතී | තේරීම් කණ්ඩායම | 2025.08.07. | සංවර්ධනයෙන් 75% සම්පූර්ණ කරන ලදී. |
| | | | | | | 1.1.4.2. භාණ්ඩ තොග තත්ව යෙදුම (Consignments Status App) සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම (අදියර 1) | භාණ්ඩ තොග තත්ව යෙදුම (අදියර 1) ක්‍රියාත්මක වෙමින් පවතී | තේරීම් කණ්ඩායම | 2025.07.07 | වැඩි දියුණු කිරීම් සම්පූර්ණ කර ඇති අතර **2025.08.15** දින ආරම්භ කර ඇත. ගෙවීම් ද්වාරය සඳහා වන අනුමැතිය තවමත් ලැබී නැත. CDNS මගින් එක් දිනක ප්‍රමාදයක් සහිතව තොරතුරු නිරූපණය කරයි; එමනිසා, වර්තමානයේ දී තත්‍යකාලීන දත්ත වෙත ප්‍රවේශ විය නොහැක. |
| | | | | 1.1.5. ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කර පවත්වාගැනීම (ARMS) | 2025.12.31. | 1.1.5.1. ARMS අදියර 2 සඳහා තාක්ෂණික කමිටුව පිහිටුවීම | ARMS අදියර 2 තාක්ෂණික කමිටුව පිහිටුවන ලදී. | තේරීම් කණ්ඩායම | 2025.03.31 | ඇතැම් සාමාජිකයින් විශ්‍රාම ගොස් ඇති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව නැවත පත් කිරීම අවශ්‍ය වේ. |
| | | | | | | 1.1.5.2. SRS ලේඛනය සැකසීම සඳහා ARMS අදියර 2 තාක්ෂණික කමිටු රැස්වීම් පැවැත්වීම | පවත්වන ලද රැස්වීම් ගණන | තේරීම් කණ්ඩායම | .2025.05.31 | රැස්වීම් 01 |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 1.1.5.3. ARMS අදියර 2 සඳහා SRS ලේඛනය අවසන් කිරීම සහ අනුමැතිය ලබා දීම | ARMS අදියර 2 සඳහා SRS ලේඛන සකස් කිරීම අවසන් කෙරෙමින් පවතින අතර අනුමත වෙමින් පවතී | තේරීම් කණ්ඩායම | 2025.06.30 | ARMS 2 අදියර හි අපේක්ෂිත කාර්යයන් ASSY 5 හඳුන්වාදීමත් සමග ආවරණය වන බව තොරතුරු සන්නිවේදන අංශය දැනුම් දී ඇත. |
| | | | | | | 1.1.5.4. අවසන් කරන ලද ලේඛනය සඳහා ශ්‍රී ලංකා රේගු නෛතික අනුමැතිය ලබා ගැනීම | ව්‍යාපෘති යෝජනාව සඳහා නෛතික අනුමැතිය ලබා ගනිමින් පවතී | තේරීම් කණ්ඩායම | 2025.09.30 | |
| | | | | | | 1.1.5.5. ARMS අදියර 2 හි තෙවන පාර්ශවීය සංවර්ධකයා සමඟ ගිවිසුමක් අත්සන් කිරීම සහ සංවර්ධනය ආරම්භ කිරීම | ARMS අදියර 2 හි සංවර්ධනයේ තෙවන පාර්ශ්වකරු සහ SLC අතර ගිවිසුමක් අත්සන් කෙරේ | තේරීම් කණ්ඩායම | 2025.12.31. | |
| | 1.2. අංක 1.2. ආදායම් අහිමිවීම වළක් වාගැනීම | සිදුවිය හැකි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම | සුපිළිපන්න තා මට්ටම් වැඩි කිරීම | 1.2.1. තක්සේරු කිරීම සඳහා තේරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 1.2.1.1. වර්තමාන මිල පිරික්සුම් රීති/ලේඛන/ නිර්ණායක සමාලෝචනය කිරීම | තේරීම් රීති/ලැයිස්තු/නිර්ණායක පිළිබඳ සමාලෝචන සංඛ්‍යාව | තේරීම් කණ්ඩායම | 1 /මාස 2025.12.31. | 06 මිල පිරික්සුම් ලැයිස්තු යාවත්කාලීන කිරීම් (VAL _HS_MID ලැයිස්තුව- 1 VAL_HS_RED ලැයිස්තුව- 2 VAL_COMPLIANT ලැයිස්තුව- 2 CBBD1_VAL_MID-1) ගුවන් භාණ්ඩ මිල පිරික්සුම් රීති (KTFT2, DHL, Colombo Cargo) |
| | | | | 1.2.2. NIVDB, RMS දක්වා | 2025.07.31 | 1.2.2.1. ARMS අදියර 1 සමඟ NIVDB | NIVDB ARMS අදියර 1 සමඟ | NIVDB කණ්ඩායම | 31.07.2025 | ඒකාබද්ධ කිරීම කටයුතු සම්පූර්ණ කරන ලදි |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | උසස් කිරීම සහ ඒකාබද්ධ කිරීම | | ඒකාබද්ධ කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම | ඒකාබද්ධ කෙරෙමින් පවතී | | | |
| | | | | 1.2.3 NIVD වෙබ් ද්වාරය සහ දත්ත ගබඩාව නඩත්තු කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 1.2.3.1. මිල පිරික්සුම් දත්ත ගබඩාවට ගනුදෙනු වටිනාකම් (transactional values) එකතු කිරීම | එකතු කළ යොමු අගයන් (reference values) සංඛ්‍යාව | NIVDB කණ්ඩායම | 500 /මාස 2025.12.31. | ගනුදෙනු වටිනාකම් 6480 |
| | | | | | | 1.2.3.2. මිල පිරික්සුම් දත්ත ගබඩාවට ගනුදෙනු නොවන වටිනාකම් (non-transactional values) එකතු කිරීම | එකතු කරන ලද යොමු අගයන් සංඛ්‍යාව | NIVDB කණ්ඩායම | 150 /මාස 2025.12.31. | ගනුදෙනු නොවන 1417 |
| | | | | | | 1.2.3.3. NIVDB සඳහා HS මාර්ගෝපදේශ තවදුරටත් වැඩි දියුණු කිරීම | එකතු කරන ලද HS කේත සංඛ්‍යාව | NIVDB කණ්ඩායම | 10 /මාස 2025.12.31. | HS කේත 80 |
| | | | | | | 1.2.3.4. NIVDB භාවිතය පුළුල් කිරීම | ලබා දී ඇති පරිශීලක ගිණුම් සංඛ්‍යාව | NIVDB කණ්ඩායම | 300/වසර 2025.12.31. | පරිශීලක ගිණුම් 39ක් ලබා දී ඇත |
| 2. ඉලක්කය **2:** නීත්‍යානුකූල වෙළඳාම පහසුකරණය | 2.1. අංක 2.1. වෙළඳ පහසුකරණය පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම්/ බැඳියාවන් | AEO පදනම පුළුල් කිරීම | නීත්‍යානුකූල වෙළඳුන් ඉහළ නැංවීම සඳහා පුළුල්කරන ලද AEO පදනම | 2.1.1. AEO කමිටුව සමඟ සම්බන්ධීකරණය | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.1.1.1. AEO කමිටු රැස්වීම් කැඳවීම | කැඳවනලද රැස්වීම් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 1 /මාස 2025.12.31. | රැස්වීම 05 |
| | | | | 2.1.2. AEO අයදුම්පත් ලබා ගැනීම සහ වලංගු කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.1.2.1. අයදුම්පත් භාර ගැනීම | ලද අයදුම්පත් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 2025.12.31. | අයදුම්පත් 51 ක් |
| | | | | | | 2.1.2.2. අයදුම්පත් වලංගු කිරීම | වලංගු කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 5 /මාස 2025.12.31. | අයදුම්පත් 42 ක් |
| | | | | 2.1.3 ආයතන 38කට AEO Tier- | 20.08.2025 | 2.1.3.1. ආයතන 18කට AEO tier-I | ප්‍රදානය කළ ආයතන සංඛ්‍යාව | AEO කණ්ඩායම | 26.01.2025 | ආයතන 19 |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූල වීම | | | I තත්ත්වය ප්‍රදානය කිරීම | | තත්ත්වය ප්‍රදානය කිරීම (02 වටය) | | | | |
| | | | | | | 2.1.3.2. ආයතන 20කට AEO tier-I තත්ත්වය ප්‍රදානය කිරීම (03 වටය) | ප්‍රදානය කළ ආයතන සංඛ්‍යාව | AEO කණ්ඩායම | 20.08.2025 | ආයතන 22 |
| | | | | 2.1.4. AEO වලංගු කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.1.4.1. වලංගු කිරීම සඳහා සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන ප්‍රමිතිකරණය (Standardized) කිරීම | ප්‍රමිතිගත (standardized) ලේඛන සංඛ්‍යාව | AEO කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | ලේඛන 3ක් කෙටුම්පත් කර ඇති අතර අවසන් කිරීමට බලාපොරොත්තුවේ. |
| | | | | | | 2.1.4.2. ස්වයං තක්සේරු පිරික්සුම් ලැයිස්තු (self-assessment check lists) හඳුන්වා දීම (AEO Tier II හි විභව ක්‍රියාකරුවන් සඳහා) | ස්වයං ඇගයීම් ප්‍රශ්ණාවලිය (self-assessment questionnaire) ක්‍රියාත්මක කිරීම | AEO කණ්ඩායම | 31.03.2025 | ආරම්භ කිරීමට නියමිතය |
| | | | | | | 2.1.4.3. අවශ්‍ය පරිදි AEO Tier II අයදුම්පත (application) වැඩි දියුණු කිරීම | සිදු කරන ලද වැඩිදියුණු කිරීම් සංඛ්‍යාව | AEO කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | ආරම්භ කිරීමට නියමිතය |
| | | | | 2.1.5 AEOs සඳහා පහසුකම් සැලසීම සඳහා OGAs සමඟ සාකච්ඡා කිරීම | 01.08.2025 | 2.1.5.1. නිෂ්කාශන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා OGAs සමඟ සාකච්ඡා කිරීම | OGA හි පහසුකම් ලබා ගත් AEOs සංඛ්‍යාව | AEO කණ්ඩායම | 01.08.2025 | 04 (කැලණි කේබල්ස්, බවර්ස්, යුනිලීවර්, හේලීස් ඇග්‍රෝ)<br>OGA අනුමැතිය අවශ්‍ය AEO ආයතනයන්හි ආනයන අපනයනයට අදාළ HS කේතයන් CRMTWG සාමාජිකයින්ට සමාලෝචනය සඳහා ලබා දෙන ලදී. |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | **2025-12-31** දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2.1.6 AEOහි පශ්චාත් බලයලත් විගණනය | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.1.6.1. AEO සඳහා ස්ථානීය නැරඹුම් (on-site visits) සහ වලංගු කිරීම ආරම්භ කිරීම | සිදුකරන ලද ස්ථානීය නැරඹුම් සහ වලංගු කිරීම් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 4 /මාස 2025.12.31. | ස්ථානීය නැරඹුම් 15 |
| | | | | | | 2.1.6.2. AEO ස්ථානීය නැරඹුම් සඳහා නිගමන වාර්තා සකස් කිරීම | ස්ථානීය නැරඹුම් පිළිබඳ අවසන් වාර්තා සංඛ්‍යාව | AEO කණ්ඩායම | 4 /මාස 2025.12.31. | සමාලෝචන වාර්තා 15 |
| | | | | 2.1.7. රේගු මුලස්ථාන නිෂ්කාශන නියෝජිතයින් (CHA) සඳහා AEO යෝජනා ක්‍රමය හඳුන්වා දීම | 2025.06.30 | 2.1.7.1. CHA සඳහා සම්මත ආකෘතියක් ලෙස වැඩි දියුණු කිරීම සඳහා AEO ඉල්ලුම්පත නවීකරණය කිරීම | CHA සඳහා සම්මත AEO අයදුම් පත්‍රය හඳුන්වා දීම | AEO කණ්ඩායම | 30.06.2025 | **2026** ජූලි මාසයට සැලසුම් කර ඇත |
| | | | | | | 2.1.7.2. CHA සඳහා AEO වලංගුකරණ නිර්ණායක නවීකරණය කිරීම | CHA සඳහා වලංගු කිරීමේ නිර්ණායක ක්‍රියාත්මක කිරීම | AEO කණ්ඩායම | 30.06.2025 | **2026** ජූලි මාසයට සැලසුම් කර ඇත |
| | | | | 2.1.8 රේගු මුලස්ථාන නිෂ්කාශන නියෝජිතයින් (CHA) සඳහා AEO යෝජනා ක්‍රමය ප්‍රදානය කිරීම (CHA) | 2025.12.31. | 2.1.8.1. රේගු මුලස්ථාන නිෂ්කාශන නියෝජිතයින් 05 දෙනෙකු සඳහා AEO CHA යෝජනා ක්‍රමය ප්‍රදානය කිරීම | ප්‍රදානය කරන ලද ආයතන සංඛ්‍යාව | AEO කණ්ඩායම | 2025.12.31. | ඉහත 2.1.7 අවසන් කරන තුරු අපේක්ෂාවෙන් සිටී |
| | | | | 2.1.9 හරිත වැනලය අත්හිටුවීම | 2025.12.31. | 2.1.9.1. වත්මන් හරිත වැනල සමාගම් දැනුවත් කිරීම | දැනුම් දී ඇති සමාගම් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 2025.12.31. (දැනටමත් සම්පූර්ණ කර ඇත ) | සමාගම් 39 |
| | | | | 2.1.10 AEO අයදුම්පත් | 2025.12.31. | 2.1.10.1 වලංගු කිරීමේ කාලසීමාව | යාවත්කාලීනක රන ලද | AEO කණ්ඩායම | 2025.12.31. | සිදු කිරීමට නියමිතය |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ක්‍රියාවලිය සඳහා කාල රාමුවක් ඇතුළත් කිරීමට මෙහෙයුම් මාර්ගෝපදේශය සංශෝධනය කිරීම | | ලෙස දින 90 ක් ඇතුළත් කිරීම | මෙහෙයුම් මාර්ගෝපදේශය | | | |
| | | | | 2.1.11 AEO වැඩසටහනට SME/MSME ඇතුළත් කිරීම | 2025.12.31. | 2.1.11.1. SME/MSME AEO වලංගුකිරීමේ මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම | SME/MSME සඳහා වලංගු කිරීමේ මාර්ගෝපදේශය | AEO කණ්ඩායම | 2025.12.31. | කටයුතු සිදුවෙමින් පවතී |
| | | | | | | 2.1.11.2. SME/MSME AEO මෙහෙයුම් මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම | SME/MSME සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශය | AEO කණ්ඩායම | 2025.12.31. | සම්පූර්ණ කරන ලදී |
| | | | | | | 2.1.11.3. SME/MSME AEO යෙදුම් සහ යෙදුම් මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම | SME/MSME සඳහා අයදුම්පත් සහ අයදුම්පත් මාර්ගෝපදේශය | AEO කණ්ඩායම | 2025.12.31. | කටයුතු සිදුවෙමින් පවතී |
| | | | | 2.1.12 AEO අලුත් කිරීමේ සැකසුම් කාලරාමුව (renewal processing timeline) සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශය සංශෝධනය කිරීම | 2025.12.31. | 2.1.12.1. අලුත් කිරීමේ කාලය ලෙස දින 90 ක් ඇතුළත් කිරීම | යාවත්කාලීන කළ මෙහෙයුම් මාර්ගෝපදේශය | AEO කණ්ඩායම | 2025.12.31. | සිදු කිරීමට නියමිතය |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2.1.13 වෙබ් අඩවියේ AEO ආයතන ලැයිස්තුගත කිරීම | 2025.09.04 | 2.1.13.1. වෙබ් අඩවියේ, සියලුම AEO දරන්නන්ගේ ලැයිස්තුවක් ඇතුළත් කිරීම | යාවත්කාලීන කරන ලද AEO වෙබ් අඩවිය | AEO කණ්ඩායම | 04.09.2025 (දැනටමත් සම්පූර්ණ කර ඇත) | සම්පූර්ණ කරන ලදි |
| | | | | 2.1.14 සියලුම වැනල ඔස්සේ AEO සඳහා වෙන්වූ Cusdecs වෙන්කර හඳුනාගැනීමට හා වෙන්කර ගැනීමට හැකිවීම | 2025.07.30 | 2.1.14.1. සියලුම CUSDEC වල AEO හඳුනාගැනීම් ඇතුළත් කිරීම | CUSDEC වල 08 කොටුවේ "AEO Tier-I" එකතු කරන ලදී | AEO කණ්ඩායම | 30.07.2025 (දැනටමත් සම්පූර්ණ කර ඇත) | සම්පූර්ණ කරන ලදි |
| | | | | 2.1.15 AEO වලංගුකරණ ක්‍රියාවලිය සඳහා ආනයනකරුගේ (Consignee) අවදානම් පැතිකඩ (Risk Profile) ඒකාබද්ධ කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.1.15.1. වලංගු කිරීමේ අවස්ථාවේදී ආනයනකරුගේ අවදානම් පැතිකඩ සලකා බැලීම | වලංගුකරණය කරන අවස්ථාවේදී ආනයනකරුගේ අවදානම් පැතිකඩ සලකා බැලීම | AEO කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | සම්පූර්ණ කරන ලදි |
| | 2.2 අංක 2.3. අනුකූල නොවන වෙළඳාම වැළැක්වීම | බලාත්මක කිරීම සහ පාලනය ශක්තිමත් කිරීම | වැඩිකරන ලද අනුකූලතා මට්ටම් | 2.2.1. අවදානම් පැතිකඩ සහ ක්‍රියාවලි වල සඵලතාවය සත්‍යාපනය කිරීම සඳහා අවදානම් ආනයන සහ අපනයන පිළිබඳව විමර්ශනය කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.2.1.1. බහාලුම් රඳවා තබා ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම | ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 2025.12.31. | 71 |
| | | | | | | 2.2.1.2. තෝරා (Selectivity) ගැනීම සඳහා, රඳවා තබා ඇති බහාලුම්වල පරීකෂණ ප්‍රතිඵල වාර්තා කිරීම | රඳවා තබාගත් සහ ප්‍රතිඵල වාර්තා කළ බහාලුම් සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 1/සතිය 2025.12.31. | 55 |
| | | | | | | 2.2.1.3. විමර්ශන වලින් අයවිය යුතු ගාස්තු අයකර ගැනීම | පරීක්ෂණ වලින් අයකරගත් A/E, දඩ මුදල් සහ | විමර්ශන කණ්ඩායම | 2025.12.31. | රු. 272,713,134/- (2025) රු. 101,421,600/- (2024 හෝ පෙර) |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | රාජසන්තක කිරීම් ප්‍රමාණය | | | |
| | | | | | | 2.2.1.4. ආරම්භ කරන ලද නඩු අවසන් කිරීම | අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 2025.12.31. | 59<br>2025 ආරම්භ කළ නඩු වලින් 12ක් පමණක් විභාග වෙමින් පවතී |
| | | | | 2.2.2. අවසන් නොවුණු සිද්ධි අවසන් කිරීම (සිද්ධි 136) | 2025.12.31. | 2.2.2.1. අවසන් නොවුණු සිද්ධි 35ක විමර්ශන අවසන් කිරීම | අවසන් කළ නිම නොවූ (pending) සිද්ධි සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 2025.06.30 | 35 |
| | | | | | | 2.2.2.2. අවසන් නොවුණු සිද්ධි 65ක විමර්ශන අවසන් කිරීම | අවසන් කළ නිම නොවූ (pending) සිද්ධි සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 2025.12.31. | 65 |
| | | | | 2.2.3. රඳවා තබා ඇති බහාලුම් නිදහස් කිරීම | 31.07.2025 | 2.2.3.1. දීර්ඝ කාලයක් රඳවාගෙන සිටි කන්ටේනර් 13ක් නිදහස් කර සිද්ධි අවසන් කිරීම | මුදා හරින ලද බහාලුම් සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | 31.07.2025 | 2 (මුළු ගණන 24) |
| | | | | 2.2.4. ත්‍යාග බෙදා හැරීමේ ගොනු සකස් කිරීම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.2.4.1. ත්‍යාග බෙදා හැරීමේ ගොනු සකස් කිරීම | සකස් කරන ලද ත්‍යාග බෙදා හැරීමේ ගොනු සංඛ්‍යාව | විමර්ශන කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 12 |
| | | | | 2.2.5 ස්වයංක්‍රීය තේරීම හරහා බලාත්මක කිරීමේ අංශ වෙත යොමු කරන ලද භාණ්ඩ තොග | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 2.2.5.1. පූර්ණ බහාළුම් තොග (FCL) යොමු කිරීම | යොමු කරන ලද පූර්ණ බහාළුම් තොග (FCL) සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 2 /සතිය 2025.12.31. | FCL 120<br><br>95% ක සාර්ථකත්ව අනුපාතයක් ලබා ඇත |
| | | | | | | 2.2.5.2. පූර්ණ නොවන බහාළුම් තොග (LCL) යොමු කිරීම ආරම්භ කිරීම | යොමු කර ඇති පූර්ණ නොවන බහාළුම් තොග (LCL) සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 31.05.2025 | LCL 26<br><br>96% ක සාර්ථකත්ව අනුපාතයක් ලබා ඇත |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2.2.5.3. ගුවන් භාණ්ඩ තොග සඳහා යොමු කිරීම් ආරම්භ කිරීම | යොමු කර ඇති ගුවන් භාණ්ඩ තොග සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 31.08.2025 | සිදු කිරීමට නියමිතයි |
| 3. ඉලක්කය 4: විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා සංවිධානය පරිවර්තනය කිරීම | 3.1 අංක 4.1. පර්යේෂණ සහ නව්‍ය නවීකරණය තුළින් පද්ධති සහ ක්‍රියා පටිපාටි විධිමත් කිරීම | රේගු මෙහෙයුම්වල අකාර්යක්ෂමතා සහ බාධක (bottlenecks) හඳුනා ගැනීම සඳහා පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ විස්තීරණ සමාලෝචන පැවැත්වීම | නිවැරදි කිරීම සඳහා හඳුනාගත් අකාර්යක්ෂමතා සහ බාධක | 3.1.1. එක් එක් අංශයේ අවදානම් වාර්තාකරණ නිලධාරීන් (RROs) සමඟ සම්බන්ධීකරණය | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 3.1.1.1. අවදානම් වාර්තාකරණ නිලධාරීන් තෝරා ගැනීම සහ පත් කිරීම | RRO ලෙස පත්කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 31.03.2025 | නිලධාරීන් 31 පත්කරන ලදී |
| | | | | | | 3.1.1.2. RRO සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම | පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 4 / Year 2025.12.31. | 2025.08.25 දින HRD හි එක් සැසියක් පැවැත්විණි.<br><br>දෙවන සැසිය පවත්වන ලෙස ඉල්ලා 2025.10.08 දිනැති ව HRD වෙත ලිපියක් යවන ලදී. |
| | | | | | | 3.1.1.3. අවදානම් වාර්තාකරණ නිලධාරීන් සමඟ සාකච්ඡා | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | 1 / මාස 2025.12.31. | සාකච්ඡා 5 ක් (බැඳුම්කර, මිල පිරික්සුම්, ප්‍රකාශන, ගුවන් භාණ්ඩ, මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය) |
| | | | | | | 3.1.1.4. පවතින ක්‍රියාවලීන්හි අවදානම්, ගැටළු සහ ඉන් මිදීමේ මාර්ගය හඳුනා ගැනීම | විසඳන ලද ගැටළු සංඛ්‍යාව | තේරීම් (Selectivity) කණ්ඩායම | අඛණ්ඩ ක්‍රියාවලිය 2025.12.31. | 03 (ගුදම් නිදහස් කිරීම (Warehouse Release), ප්‍රතිපෝෂණ කේත (Feedback Code), කුරියර් සහ විද්‍යුත් වාණිජ්‍ය KTFT2, KTCC2, KTDH2 වරණීයතාවය) |
| | | | | 3.1.2 බැඳුම්කර භාණ්ඩ සඳහා පවත්නා ක්‍රියාවලිය නැවත | 31.07.2025 | 3.1.2.1. මෙහෙයුම් ඒකක සමඟ සාකච්ඡා පැවැත්වීම. | පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 30.04.2025 | සාකච්ඡා 04 (බැඳුම්කර) |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සකස් කිරීම (Re-engineering) | | 3.1.2.2. පවතින ක්‍රියාවලිය සිතියම්ගත කිරීම | සිතියම්ගත කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 31.05.2025 | 01 අන්තරාල (Entrepot) |
| | | | | | | 3.1.2.3. නැවත සකස් කරන ලද ක්‍රියාවලි සම්පූර්ණ (Finalize) කිරීම | අවසන් කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 30.06.2025 | 01 අන්තරාල (Entrepot) |
| | | | | | | 3.1.2.4. නැවත සකස් කරන ලද ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නැවත සකස් කළ ක්‍රියාවලි සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 31.07.2025 | RMC වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදි |
| | | | | 3.1.3. BOI භාණ්ඩ සඳහා පවත්නා ක්‍රියාවලිය නැවත සකස් කිරීම (Re-engineering) | 30.11.2025 | 3.1.3.1. මෙහෙයුම් ඒකක සමඟ සාකච්ඡා පැවැත්වීම. | සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 31.08.2025 | සාකච්චා 01 |
| | | | | | | 3.1.3.2. පවතින ක්‍රියාවලිය සිතියම්ගත කිරීම | සිතියම්ගත කළ ක්‍රියාවලි සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 30.09.2025 | සිදුවෙමින් පවතී (සිද්ධිය හඳුනාගෙන ලියාපදිංචි කර ඇත) |
| | | | | | | 3.1.3.3. නැවත සකස් කරන ලද ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම | අවසන් කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව | ක්‍රියාවලිය නැවත සකස් කිරීමේ කණ්ඩායම | 31.10.2025 | ආරම්භවීමට නියමිතයි |
| | | | | | | 3.1.3.4. නැවත සකස් කරන ලද ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නැවත සකස් | ක්‍රියාවලිය නැවත සකස් | 30.11.2025 | ආරම්භවීමට නියමිතයි |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | කළ ක්‍රියාවලි සංඛ්‍යාව | කිරීමේ කණ්ඩායම | | |
| | 3.2 අංක 4.3. ගතික ආයතනික සංවර්ධනය සහ සම්පත් ප්‍රශස්ත කිරීම සහතික කිරීම | හවුල්කරුවන් සමඟ දැනුම, ප්‍රවීණත්වය සහ ප්‍රශස්ථ භාවිතයන් හුවමාරු කර ගැනීම | සම්මත කරගත් භාවිතයන් මත රේගු කාර්ය සාධනය වැඩිදියුණු කිරීම | 3.2.1. අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම | 2025.12.31. | 3.2.1.1. වරණීයතාවය (selectivity) පිළිබඳ අභ්‍යන්තර පුහුණුවීම් පැවැත්වීම | පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව | තේරීම් (selectivity) කණ්ඩායම | 4/වසර 2025.12.31. | පුහුණු 04 |
| | | | | 3.2.2. ARMS පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම | 2025.12.31. | 3.2.2.1. RMD කාර්ය මණ්ඩලය සඳහා ARMS මෙහෙයුම් පිළිබඳ පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම් පැවැත්වීම. | පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව | තේරීම් (selectivity) කණ්ඩායම | 4/වසර 2025.12.31. | පුහුණු 04 |
| | | | | | | 3.2.2.2. අනෙකුත් මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා ARMS මෙහෙයුම් පිළිබඳ පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම. | පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව | තේරීම් (selectivity) කණ්ඩායම | 1/වසර 30.11.2025 | ප්‍රකාශන, ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ, CCED, මිල පිරික්සුම් අංශ සඳහා පුහුණු සැසි **04** |
| | | | | 3.2.3. AEO වැඩසටහන පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම | 2025.12.31. | 3.2.3.1. අයදුම්පත් පරීක්ෂා කිරීම සහ වලංගු කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම. | දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව | AEO කණ්ඩායම | 4/වසර 2025.12.31. | සැසි 4 |
| | | | | | | 3.2.3.2. ආර්ථික මෙහෙයුම්කරුවන් (Economic Operators) සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම | දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව | AEO කණ්ඩායම | 1/වසර 30.11.2025 | සැසි 06 |

| ඉලක්කය | අරමුණ | උපාය මාර්ගය | ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සම්පූර්ණ කළ දිනය | කාර්යය | KPI | වගකීම | ක්‍රියාව සම්පූර්ණ කළ දිනය | 2025-12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 3.2.3.3. නිලධාරීන් AEO වලංගුකරුවන් ලෙස පිළිගැනීම | පිළිගත් නිලධාරීන් සංඛ්‍යාව | AEO කණ්ඩායම | 2025.12.31. | නිලධාරීන් හිගය නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය |

*මූලාශ්‍රය : අවදානම් කළමනාකරණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.4.3 නීති කටයුතු අංශය

**8.4.3.1** හැඳින්වීම

නීති කටයුතු අංශය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නීති උපදේශකයා වන අතර, එමගින් සියලු නීතිමය සහ නඩු කටයුතු හසුරුවනු ලබයි. මෙය 1994 අගෝස්තු 10 දිනැති DOPL 231 යටතේ 1994 දී ස්ථාපිත කරන ලදි.

**8.4.3.2** අරමුණු

- අනෙකුත් අංශ සඳහා අවශ්‍ය නෛතික මත ලබාදෙන බව සහතික කිරීම.
- දෙපාර්තමේන්තුවට අදාළ සියලු නීතිමය කරුණු සහ නඩු කටයුතු සම්බන්ධව අවශ්‍ය පියවර ගෙන ඇති බව සහතික කිරීම.

**8.4.3.3** කාර්යයන්

- දෙපාර්තමේන්තු නිලධාරීන්ට ඔවුන් විසින්ම කටයුතු කළ හැකි නීතිමය ගැටලු පිළිබඳ උපදෙස් ලබා දීම.
- අනෙකුත් ගැටළු පිළිබඳව දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීතිපති උපදෙස් ඉල්ලා සිටීම.
- නීති සංශෝධන පිළිබඳව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කිරීම.
- නීති අත්පොත සකස් කිරීම සහ එය කාලානුරූපව යාවත්කාලීන කිරීම.
- නඩු පිළිබඳ සාරාංශ එකතු කර ගැනීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ සියලු නඩු ගොනු වලට අදාළව ක්‍රියා කිරීම.
- පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම පිළිබඳ කාර්යපටිපාටි සම්බන්ධව වැඩි දියුණු කිරීම් යෝජනා කිරිම.
- රේගු නීති අඛණ්ඩව සමාලෝචනය කිරීම.
- ජාත්‍යන්තර නීති- ජාත්‍යන්තර සම්මුති, සන්ධාන, ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් වලට අදාළ කරුණු වලට මැදිහත් වීම.

**8.4.3.1** වගුව : වර්තමාන කාර්ය මණ්ඩලය

| තනතුර | වර්තමාන කාර්ය මණ්ඩලය |
|---|---|
| රේ. අ. | 1 |
| ජ්‍යේ. නි. රේ. අ. | 1 |
| නි .රේ. අ. | 2 |
| නි. රේ. අධි. | 0 |
| ස. රේ. අ. | 6 |
| රේ. ප. | 2 |
| රේ. නි. | 1 |
| ක. සේ. නි. | 2 |
| රියදුරු | 2 |
| කා. කා. ස. | 2 |
| එකතුව | **19** |

*මූලාශ්‍රය : නීති කටයුතු අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.4.3.2** වගුව : ප්‍රගති සමාලෝචනය - 2025

| | | |
|---|---|---|
| ලබාදුන් නෛතික මත සහ සහභාගී වූ උපදෙස් දීම් **(consultations)** | | |
| **1** | නීති කටයුතු අංශයෙන් ඉල්ලා සිටින ලද අභ්‍යන්තර නෛතික මත | 105 |
| **2** | නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති නෛතික මත සංඛ්‍යාව | 28 |
| **3** | නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහභාගී වූ උපදෙස් ලබාදීම් (consultations) සංඛ්‍යාව | 109 |
| ලියාපදිංචි වූ අධිකරණ නඩු සංඛ්‍යාව | | |
| **1** | ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | 09 |
| **2** | අභියාචනාධිකරණ අයදුම්පත් | 75 |
| **3** | දිසා අධිකරණ අයදුම්පත් | 03 |
| **4** | මහාධිකරණ අයදුම්පත් | 02 |
| | සම්පූර්ණ නඩු සංඛ්‍යාව | 89 |
| **2025.12.31** වනවිට නිම වී නොමැති අධිකරණ නඩු සංඛ්‍යාව | | |
| **1** | නිම වී නොමැති මුළු නඩු | **317** |
| අවසන් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ අයදුම්පත් | | |
| 1 | ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | 13 |
| 2 | අභියාචනාධිකරණ අයදුම්පත් | 19 |
| | නිෂ්ප්‍රභා කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 32 |
| අනෙකුත් නෛතික කරුණු සංඛ්‍යාව | | |
| 1 | සහාය වූ මහාධිකරණ / දිස්ත්‍රික් අධිකරණ/ මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත් සංඛ්‍යාව | 100 |
| 2 | සහය වූ ජාත්‍යන්තර ගිවිසුම් සංඛ්‍යාව | 06 |
| 3 | සහය වූ දේශීය ගිවිසුම් සංඛ්‍යාව | 05 |

*මූලාශ්‍රය : නීති කටයුතු අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.4.4 අපනයන අංශය

### 8.4.4.1 හැඳින්වීම

අපනයන අංශය මගින් ක්‍රියාවලීන් සරල කිරීම හා ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් අපනයන රේගු සටහන්කර සම්බන්ධයෙන් කටයුතු කිරීම තුළින් ප්‍රතිනැව්ගත කිරීම (transshipment) හරහා ජාත්‍යන්තර නීත්‍යානුකූල භාණ්ඩ සංචලනය ප්‍රවර්ධනය කරමින් අපනයනයන් හා ප්‍රති අපනයනයන් (re-exports) නිෂ්කාශනය සඳහා පහසුකම් සැළසේ. මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජීය වටිනාකම් ආරක්ෂා කිරීමේ වගකීම ද දරයි.

### 8.4.4.2 ප්‍රධාන කාර්යයන්

- මෙම අංශය, වරාය මගින් හා ගුවන්තොටුපොළ මගින් කරනු ලබන සියලු අපනයන සම්බන්ධයෙන් කටයුතු කරයි.
- මෙරටින් අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධ සියලු කටයුතු සඳහා දායක වීම.
- රේගු අවශ්‍යතා සහ ආරක්ෂක හේතු සඳහා අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම.
- අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අපනයන බදු, සෙස් බදු රැස් කිරීම.
- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් රඳවා තබන ස්ථාන (Container Freight Station) කළමනාකරණය.
- බහු දේශ ඒකාබද්ධ තොග ගබඩා (Multi Country Consolidation Warehouses) පවත්වාගෙන යාම.
- කානේ (Carnet) ක්‍රමය යටතේ තාවකාලික ආනයන සඳහා පහසුකම් සැලසීම.
- ආපසු ගෙවීම් (refund) ඉල්ලීම් අනුමත කිරීම.
- නැව්ගත කිරීමේ සහතික (shipment certificates) නිකුත් කිරීම.
- තීරුබදු ප්‍රතිදාන (duty rebate) ලේඛන සහතික කිරීම.
- නිදහස් ප්‍රති- ආනයන සහතික (Free Re-Importation Certificates) ලියාපදිංචිය.
- ප්‍රභවස්ථාන රීති (Rules of Origin) වලට අදාළව වාණිජ දෙපාර්තමේන්තුවට නැව්ගත කිරීම සහතික කිරීම.
- ප්‍රතිනැව්ගත කිරීම් (Transshipments) සඳහා පහසුකම් සැලසීම.
- ජාතික වෙළඳ සංඛ්‍යා ලේඛන සැපයීම.
- රටේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අයිතීන් ආරක්ෂා කිරීම
- අනෙකුත් රාජ්‍ය ආයතන සහ පුද්ගලික අංශය ඇතුළුව සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය ගොඩනගා ගැනීම.
- ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට දායකවන පද්ධති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
- අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපරිම ලෙස භාවිතයට ගැනීම.

### 8.4.4.3 කාර්ය සාධනය

**8.4.4.1 වගුව : ආදායම රැස්කිරීම – 2025**

| | වටිනාකම (රු.) |
|---|---:|
| අපනයන බදු | 16,692,578 |
| අපනයන සංවර්ධන මණ්ඩලයේ සෙස් බද්ද | 1,346,168,058 |
| සෙස්-රබර් | 6,645,437 |
| සෙස්-තේ | 563,950,418 |
| තේ Medical Aid Cess | 493,042 |
| සෙස්-පොල් | 182,927,822 |
| Royalty බද්ද | 31,061 |
| අපනයන පැනල් ගාස්තු | 73,238,400 |
| බාහිර පරීක්ෂණ ගාස්තු | |
| ශ්‍රී ලංකන් ගුවන් සේවා ගාස්තු | 2,010,601 |
| සංශෝධන ගාස්තු, සංශෝධන දඩ සහ අවලංගු කිරීමේ ගාස්තු | 9,548,310 |
| අතිකාල ගාස්තු | 42,302,689 |
| නැව්ගත කිරීමේ සහතික ගාස්තු ( Shipment Certificate fees) | 172,500 |
| පරිගණක ගාස්තුව | 38,147,250 |

*මූලාශ්‍රය : අපනයන අංශය, ශ්‍රී ලංකා රේගුව*

ඉදිරිපත් කරන ලද සහ අවසන් කරන ලද රේගු සටහන්කර (**CusDecs**) සංඛ්‍යාව

| | | |
|---|---|---|
| **i.** අපනයන කාර්යාලය | - | 83,450 |
| **ii.** ගුවන් භාණ්ඩ | - | 61,059 |
| එකතුව | - | **144,509** |

පැනල් අයදුම්පත්

| | | |
|---|---|---|
| පරීක්ෂණ ගණන | - | 11,157 |

ජංගම ගිණුම්

| | | | |
|---|---|---|---|
| **i.** | පෙරගෙවුම් ගිණුම් හිමියන් සංඛ්‍යාව | - | 149 |
| **ii** | ක්‍රියාත්මක ජංගම ගිණුම් සංඛ්‍යාව | - | **83** |
| **iii.** | කාලය තුළ තැන්පතු | - | රු. **26,309,241,780** |
| **iv.** | කාල සීමාව තුළ හර කරන ලද මුළු මුදල | - | රු. **26,380,474,516** |

| | | |
|---|---|---|
| ඉල්ලීම සඳහා නිකුත් කරන ලද **FRIC** සංඛ්‍යාව | - | 525 |
| ගබඩා බිල්පත් (**Bill of Stores**) සංඛ්‍යාව | - | 95 |
| නිකුත් කරන ලද නැව්ගත කිරීමේ සහතික (**Shipment Certificates**) සංඛ්‍යාව | - | 690 |
| එකතු කරන ලද නැව්ගත කිරීමේ සහතික ගාස්තු | - | රු. 172,500 |
| රේගු වැරදි සඳහා අයකර ගන්නා ලද දඩ මුදල් | - | රු. 1,750,000 |

## 8.4.5 ආදායම් සහ සේවා (පළාත්) අංශය

**8.4.5.1 හැඳින්වීම**

ආදායම් හා සේවා (පළාත්) අංශය රේගු ප්‍රතිසංස්කරණ හා නවීකරණ වැඩසටහන හරහා ප්‍රාදේශීය පර්ශදය යටතේ 2010 අගෝස්තු මාසයේදී ස්ථාපිත කරන ලදී. වර්තමානයේදී එය රේගු මන්දිරයේ C කොටසේ 7වන මහලේ පිහිටා ඇත.

**8.4.5.2 පළාත් අංශයේ ව්‍යුහය**

- පළාත් අංශය, අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ඩිජිටල්කරණ) මගින් පාලනය වේ.
- රේගු අධ්‍යක්ෂ (පළාත්) සියළුම පළාත් කාර්යාලයන්හි ප්‍රධානියා වේ.

**8.4.5.3 ආයතනික ව්‍යුහය**




**8.4.5.4 ශ්‍රී ලංකා රේගුවේ ආදායම් සහ සේවා – පළාත් අංශය විසින් සිදු කරනු ලබන රාජකාරි**

- රේගු තීරුබදු සහ අනෙකුත් බදු එකතු කිරීම පරිපාලනය කිරීම
- ප්‍රාදේශීය පර්ෂදය තුළ සිදුකරනු ලබන වෙළඳ කටයුතු සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම
- කඩිනමින් නිෂ්කාශනය කිරීම මගින් මගීන්ට පහසුකම් සැලසීම
- රේගු ආඥාපනත සහ කලාපයේ ආදායම් හා සමාජ ආරක්ෂණ නීතීන්ට අදාළ අනෙකුත් නීති යටතේ සිදු කරනු ලබන වැරදි විමර්ශනය කිරීම හා නඩු පැවරීම මගින් නීති බලාත්මක කිරීම.
- රේගු කාර්යයන්හි නිරත වන අතර ශ්‍රී ලංකා රේගුවේ අනෙකුත් අංශ සමග සම්බන්ධීකරණය කිරීම.

**8.4.5.5** කාර්යසාධන සාරාංශය

**8.4.5.1** වගුව **: 2025** වර්ෂයේ ආදායම රැස්කිරීම

ගුවන්තොටුපළ සහ වරාය

| ප්‍රධාන කාර්යසාධන දර්ශක **(KPI)** | **MRIA** | පලාලි | **KKS** | එකතුව |
|---|---|---|---|---|
| එකතු කරන ලද රේගු බදු සහ අනෙකුත් බදු (රු.) | 154,193.00 | 2,303,989.00 | 94,820,496.00 | 97,278,678.00 |
| දඩ මුදල් (රු.) | 30,100.00 | 868,601.00 | 27,223,500.00 | 28,122,201.00 |
| අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු (රු.) | 1,332,550.00 | 1,119,000.00 | 2,322,200.00 | 4,773,750.00 |
| එකතුව (රු.) | 1,516,843.00 | 4,291,590.00 | 124,366,196.00 | 130,174,629.00 |

උප නිවාරණ කාර්යාල

| ප්‍රධාන කාර්යසාධන දර්ශක **(KPI)** | හම්බන්තොට | ගාල්ල | කොග්ගල | ත්‍රි.මලය | **KKS** | එකතුව |
|---|---|---|---|---|---|---|
| එකතු කරන ලද රේගු බදු සහ අනෙකුත් බදු (රු.) | 7,788,213.92 | 751,922.00 | - | 325,778.00 | - | 8,865,913.92 |
| දඩ මුදල් (රු.) | 555,000.00 | 230,000.00 | - | 714,196.00 | 210,000.00 | 1,709,196.00 |
| අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු (රු.) | 34,720,839.40 | 10,207,722.00 | - | 23,814,216.00 | 1,095,000.00 | 69,837,777.40 |
| එකතුව (රු.) | 43,064,053.32 | 11,189,644.00 | - | 24,854,190.00 | 1,305,000.00 | 80,412,887.32 |

කැටුව නොඑන මගී ගමන්මළු (UPB) ගුදම්

| ප්‍රධාන කාර්යසාධන දර්ශක **(KPI)** | ටුයිකෝ- ගාල්ල | ටුයිකෝ - කුරුණෑගල | **CSL**-මහනුවර | එකතුව |
|---|---|---|---|---|
| එකතු කරන ලද රේගු බදු සහ අනෙකුත් බදු (රු.) | 31,993,482.00 | 45,869,377.00 | 31,200,111.00 | 109,062,970.00 |
| දඩ මුදල් (රු.) | 564,527.00 | 3,201,610.00 | 5,819,540.00 | 9,585,677.00 |
| අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු (රු.) | 222,450.00 | 7,146,900.00 | 687,353.00 | 8,056,703.00 |
| එකතුව (රු.) | 32,780,459.00 | 56,217,887.00 | 37,707,004.00 | 126,705,350.00 |

තැපැල් තක්සේරු ශාඛා

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ගාල්ල තැපැල් තක්සේරු | මහනුවර තැපැල් තක්සේරු | ත්‍රි.මලය තැපැල් තක්සේරු | යාපනය තැපැල් තක්සේරු | එකතුව |
|---|---|---|---|---|---|
| එකතු කරන ලද රේගු බදු සහ අනෙකුත් බදු (රු.) | 15,266,408.00 | 32,418,868.00 | 1,166,770.00 | 22,404,406.00 | 71,256,452.00 |
| දඩ මුදල් (රු.) | 934,424.00 | - | - | 724,250.00 | 1,658,674.00 |
| අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු (රු.) | 17,600.00 | 25,500.00 | - | 38,350.00 | 81,450.00 |
| එකතුව (රු.) | 16,218,432.00 | 32,444,368.00 | 1,166,770.00 | 23,167,006.00 | 72,996,576.00 |

*මූලාශ්‍රය : ආදායම් හා සේවා (පළාත්) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.4.5.2** වගුව : මඟී පහසුකම් සැලසීම

කැටුව නොඑන මඟී ගමන්මළු (UPB) ශුදම්

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | | ටුයිකෝ-ගාල්ල | CSL-මහනුවර | ටුයිකෝ - කුරුණෑගල | එකතුව |
|---|---|---|---|---|---|
| නිෂ්කාශනය කළ පැකේජ ගණන | UPB | 14,182 | 17,511 | 27,487 | 59,180 |
| | තයාග | 5,908 | 7,902 | 9,500 | 23,310 |
| පාර්සල් නිෂ්කාශනය සඳහා ගතවන කාලය (මිනිත්තු) *භාණ්ඩ තොගය මත රඳා පවතී | | මිනිත්තු 45 | මිනිත්තු 20 | මිනිත්තු 34 | අදාළ නොවේ |

ගුවන්තොටුපළ සහ වරාය

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | MRIA | පලාලි | KKS | එකතුව |
|---|---|---|---|---|
| ලබා දී ඇති ගුවන් යානා / යාත්‍රා නිෂ්කාශන සංඛ්‍යාව | 688 | 561 | 183 | 1,432 |
| නිෂ්කාශනය කරන ලද මගීන් සංඛ්‍යාව | 148,761 | 29,462 | 24,578 | 202,801 |
| ගමන් මලු නිෂ්කාශනය සඳහා කාල සීමාව (මිනිත්තු) | මගීන් සංඛ්‍යාව අනුව ගමන් මලු නිෂ්කාශන කාලය ගුවන් යානයෙන් ගුවන් යානයට වෙනස් වේ. | මගීන් සංඛ්‍යාව අනුව ගමන් මලු නිෂ්කාශන කාලය ගුවන් යානයෙන් ගුවන් යානයට වෙනස් වේ. | මගීන් සංඛ්‍යාව අනුව යාත්‍රාවෙන් යාත්‍රාවට වෙනස් වේ | - |

උප නිවාරණ කාර්යාල

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | හම්බන්තොට | ගාල්ල | කොග්ගල | ත්‍රි.මලය | KKS | එකතුව |
|---|---|---|---|---|---|---|
| ලබා දී ඇති යාත්‍රා නිෂ්කාශන සංඛ්‍යාව | 926 | 308 | - | 153 | 183 | 1,566 |
| නිෂ්කාශනය කරන ලද කාර්ය මණ්ඩල (crew members) සාමාජිකයින් සංඛ්‍යාව | ලබා ගත නොහැක | 11468 | - | 1218 | - | 12,686 |
| ගමන් මලු නිෂ්කාශන කාල සීමාව | පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ | ගමන් මලු නිෂ්කාශනය කිරීමේ කාලය කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව මත රඳා පවතී | - | - | - | අදාළ නොවේ |

තැපැල් තක්සේරු ශාඛා

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ගාල්ල තැපැල් තක්සේරු | මහනුවර තැපැල් තක්සේරු | ත්‍රි.මලය තැපැල් තක්සේරු | යාපනය තැපැල් තක්සේරු | එකතුව |
|---|---|---|---|---|---|
| නිෂ්කාශනය කරන ලද පාර්සල් ගණන | 7,075 | 9,198 | 3,022 | 7,105 | 26,400 |
| පාර්සල් නිෂ්කාශනය සඳහා ගතවන කාල සීමාව (මිනි.) | 9 | 15 | 15 | 15 | අදාළ නොවේ |

*මූලාශ්‍රය : ආදායම් හා සේවා (පළාත්) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.4.5.3** වගුව : පාරිසරික හා සමාජ ආරක්ෂණය

ගුවන්තොටුපළ සහ වරාය

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | MRIA | පලාලි | KKS | එකතුව |
|---|---|---|---|---|
| පරීක්ෂා කර නිෂ්කාශනය කරන ලද මගීන් සංඛ්‍යාව | 148,761 | 29,462 | 24,578 | 54,040 |
| දඩ මුදල් | 30,100.00 | 868,601.00 | 27,223,500.00 | 28,122,201.00 |
| රාජසන්තක කිරීම් සංඛ්‍යාව | - | 40 | 42 | 82 |
| රඳවා ගන්නා ලද භාණ්ඩ සංඛ්‍යාව | 12 | 37 | 109 | 158 |

උප නිවාරණ කාර්යාල

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ගාල්ල | කොග්ගල | ත්‍රි.මලය | හ.තොට | KKS | එකතුව |
|---|---|---|---|---|---|---|
| රාජසන්තක කිරීම් සංඛ්‍යාව | - | - | - | - | 3 | 3 |
| රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව | - | - | - | - | 12 | 12 |

කැටුව නොඑන මගී ගමන්මළු (UPB) ගුදම්

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ට්‍රයිකෝ- ගාල්ල- | ට්‍රයිකෝ - කුරුණෑගල | CSL-මහනුවර | එකතුව |
|---|---|---|---|---|
| දඩ මුදල් (රු.) | 564,527.00 | 3,201,610.00 | 5,819,540.00 | 9,585,677.00 |
| රාජසන්තක කිරීම් සංඛ්‍යාව | 37 | 35 | 56 | 128 |
| රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව | 112 | 216 | 240 | 568 |

තැපැල් කත්සේරු ශාඛා

| ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ගාල්ල තැපැල් තක්සේරු | මහනුවර තැපැල් තක්සේරු | ත්‍රි.මලය තැපැල් තක්සේරු | යාපනය තැපැල් තක්සේරු | එකතුව |
|---|---|---|---|---|---|
| පරීක්ෂා කළ භාණ්ඩ තොග සංඛ්‍යාව | 7,075 | 9,198 | 3022 | 7,105 | 26,400 |
| දඩ මුදල් (රු.) | - | - | - | 719,750 | 719,750 |
| රාජසන්තක කිරීම් සංඛ්‍යාව | 12 | - | - | 25 | 37 |
| රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව | 22 | 15 | 19 | 44 | 100 |

*මූලාශ්‍රය : ආදායම් හා සේවා (පළාත්) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.4.5.1** රූපසටහන : ආදායම සැසඳීම




*මූලාශ්‍රය : ආදායම් හා සේවා (පළාත්) අංශය, ශ්‍රී ලංකා රේගුව*

- 2024 වසර හා සැසඳීමේදී ගුවන් තොටුපළ ආදායමෙහි 80.52 % ක වැඩිවීමක් සාක්ෂාත් කර ගන්නා ලදී.
- 2024 වසර හා සැසඳීමේදී නිවාරණ උප කාර්යාලවල 4.98 % ක ආදායම් වැඩිවීමක් සාක්ෂාත් කර ගන්නා ලදී.
- 2024 වසර හා සැසඳීමේදී කැටුව නොඑන මගී ගමන්මළු ගුදම්වල ආදායමෙහි 36.91 % ක වැඩිවීමක් සාක්ෂාත් කර ගන්නා ලදී.
- 2024 වසර හා සැසඳීමේදී තැපැල් තක්සේරු ශාඛාවල ආදායමෙන් 3.84% ක වැඩිවීමක් සාක්ෂාත් කර ගන්නා ලදී.

**8.4.5.6 2025 ක්‍රියාකාරී සැලැස්මේ ජයග්‍රහණ**

**2024 වර්ෂය සමඟ සැසඳීමේදී සමස්තයක් වශයෙන් 17.83% ක ආදායම් වැඩිවීමක් සාක්ෂාත් කර ගන්නා ලදී.**

| **01.** ආදායම් අරමුණ යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම් | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම | වත්මන් ප්‍රගතිය |
| 1.1 ආවේක්ෂණය කිරිම සහ මගීන් කැටුව එන ගමන්මළු පරික්ෂා කිරීම.<br>1.1.1 ලැබිය යුතු ආදායම අයකර ගැනීම තැපැල් තක්සේරු කාර්යාල<br>භාණ්ඩ පරික්ෂා කිරිම සහ නියමිත වර්ගීකරණය හා මිල තක්සේරු කිරිම තීරණය කිරිම.<br>අදාළ වන්නේ නම් පරික්ෂා කරන ලද අයිතමයන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. මධ්‍යම තැපැල් හුවමාරුවෙන් රඳවාගන්නා ලද සියළුම පාර්සල් පරික්ෂා කරමින් පවත්න අතර අයවිය යුතු ආදායම එකතු කර ගනිමින් පවතී.වෙළඳ ප්‍රමාණයන් සොයාගතහොත් දණ්ඩන පනවන ලදී. |
| 1.1.2. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වල මගීන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරිම (ගුවන් සහ තොටුපළ).<br>භාණ්ඩ පරික්ෂා කිරිම සහ නියමිත වර්ගීකරණය හා මිල තක්සේරු කිරිම තීරණය කිරිම.<br>අදාළ වන්නේ නම් පරික්ෂාකරන ලද අයිතමයන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරිම.<br>අවශ්‍යවිට රේගු ආඥාපනත අදාළ කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. 2024 වර්ෂයේදී යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වල කාර්යයන් සිදු කරන ලදී. |
| 1.1.3. උප නිවාරණ කාර්යාලවලින්, අයවිය යුතු ආදායම එකතු කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. |
| 1.2 අතිකාල ගාස්තු එකතු කිරිම.<br>1.2.1අතිකාල වාර්තා පවත්වා ගැනීම සහ අදාළ ගාස්තු එකතු කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. |

| **02.** මගීන්ට පහසුකම් සැලසීමේ අරමුණ යටතේ සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම | වත්මන් ප්‍රගතිය |
| 2.1.මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධාවකින් තොර නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. |
| 2.2. මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධාවකින් තොර නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. |
| 2.3. කැටුව එන ගමන්මළු නිෂ්කාශනය සඳහා සුමට ක්‍රියාවලියක් සහතික කිරිම. | ක්‍රියාත්මක කරන ලදී. |
| 2.4. තීරු බදු රහිත පහසුකම යටතේ මගීන්ට මිලදී ගැනීම් සිදු කිරීමට ඉඩසලසා දීම. | ක්‍රියාත්මක කරන ලදී. |
| 2.5. කන්කසන්තුරය වරායේ භාණ්ඩ මෙහෙයුම්/මගී නිෂ්කාශන සඳහා පහසුකම් සැලසීම.<br>**2.5.1.** මානව සම්පත් කළමනාකරණ අංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව භාණ්ඩ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් වෙන් කිරීම.<br>**2.5.2** සේවා සැපයුම් අංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව භෞතික සම්පත් සැපයීම | තොටුපළ සේවාවන්හි (ferry service) මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ අඩු කාර්ය මණ්ඩල තත්වය හේතුවෙන් අවම කාර්ය මණ්ඩලයක් සහිතව කටයුතු කරයි.<br>ABF වෙතින් පරිත්‍යාග ලෙස ලබා ගන්නා ලද පහත් ඇඳ (low bed) ඇති X-Ray ස්කෑනර් යන්ත්‍ර දෙකක් සවි කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

| 03. පාරිසරික- සමාජීය ආරක්ෂාව | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම | වත්මන් ප්‍රගතිය |
| 3.1.<br><br>3.1.1. සීමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ රඳවා ගැනීම සඳහා නෛතික අවශ්‍යතාවන් වලට අනුකූල වීම (යාපනය - තැපැල් තක්සේරු ශාඛාව) | ක්‍රියාත්මක කරන ලදි. |
| 3.1.2. සීමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වලින් රටතුළට පැමිණීම පාලනය කිරීම (ගුවන් සහ තොටුපළ) | ක්‍රියාත්මක කරන ලදි. |

| 04. ආයතනික සංවර්ධනය යටතේ සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම | වර්තමාන ප්‍රගතිය |
| 4.1. පළාත් කාර්යාල සමග සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කිරීම.<br>4.1.1. අනෙකුත් අංශ සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවය මත පළාත් කාර්යාල සමග නිසි කලට සන්නිවේදනය කිරීම<br>4.1.2. අවශ්‍ය පරිදි පළාත් කාර්යාලයන්හි සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා අනෙකුත් අංශ සහ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම. | ක්ෂණික පණිවුඩ යැවීම, කඩිනම් යාවත්කාලීන කිරීම්, සහ තත්‍ය කාලීන සහයෝගීතාව සඳහා වට්ස්ඇප් (WhatsApp) යෙදුම සන්නිවේදන මෙවලමක් ලෙස භාවිතා කිරීම.<br><br>කාලෝචිත සහ කාර්යක්ෂම සන්නිවේදනයක් ලබාදීම සඳහා 100% සාර්ථකත්ව අනුපාතයක් සාක්ෂාත් කරගන්නා ලදී. |
| 4.2. පළාත් කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම<br>4.2.1. යාපනය කලාපයේ නිසි රේගු මෙහෙයුම් සහතික කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ඉල්ලා සිටීම. | දෙපාර්තමේන්තුවේ දැනට පවතින ඌන සේවක තත්ත්වය හේතුවෙන් සියලුම පළාත් කාර්යාල අවම කාර්ය මණ්ඩලයකින් ක්‍රියාත්මක වේ. |
| 4.3. කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් සහ නිසි නවාතැන් පහසුකම් ඉදිකිරීම.<br>4.3.1. යාපනය කලාපයේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් සහ නිසි නවාතැන් පහසුකම් සැපයීම සඳහා රේගු පරිපාලනයේ අවධානය යොමු කරවීම.<br>4.3.2. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා සේවා සැපයුම් අංශය සමග සම්බන්ධීකරණය කිරීම.<br>4.3.3. පලාලි ගුවන් තොටුපලේ සහ KKS වරායේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් සහ නිසි නවාතැන් පහසුකම් ඉදිකිරීමට පියවර ගැනීම. | කලාපයේ ඉඩම් 13ක් රේගු ඉඩම් ලෙස හඳුනාගෙන ඇත.<br>විවේකාගාර ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. යාපනයේ පමණක් නොව හම්බන්තොට, මත්තල, සහ කේ.කේ.එස් යන ප්‍රදේශවල ද නිලධාරි විවේකාගාර ඉදිකිරීමට මේ වන විට සාකච්ඡා කෙරෙමින් පවතී. තවද, නිශ්චිත අවශ්‍යතා එක්රැස් කිරීම, ව්‍යුහාත්මක සැලසුම් අවසන් කිරීම සහ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. |

## 8.5 මානව සම්පත් පර්ෂදය

### 8.5.1 මානව සම්පත් කළමනාකරණ අංශය

### 8.5.2 මානව සම්පත් සංවර්ධන අංශය

### 8.5.3 සේවා සැපයුම් අංශය

### 8.5.4 කාර්ය මණ්ඩල සේවා අංශය

## 8.5.1 මානව සම්පත් කළමනාකරණ අංශය

### 8.5.1.1 හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟාකර ගැනීමෙහිලා අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා ඵලදායි ලෙස මානව සම්පත කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ.

මෙම අංශය, දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම මගින් එහි දැක්ම ළඟාකර ගැනීම සහ එකී කාර්යය සඳහා අවශ්‍ය වන උපායමාර්ගික සැලසුම සකස් කිරීම සඳහා දක්ෂ සහ සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමේ කාර්යයන් ඉටු කරයි. මානව සම්පත් කළමනාකරණ අංශය ශ්‍රම බලකාය අභිප්‍රේරණය කරමින්, ඔවුන්ගේ හැකියාවන් හඳුනා ගනිමින් සහ කාලීනව ඇති වන ගැටළු සඳහා විසඳුම් ලබාදෙමින් ඔවුන්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට ප්‍රයත්න දරයි.

තවද, මානව සම්පත් කළමනාකරණ අංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතන විසින් කලින් කළට නිකුත් කරන ලද නියෝග, මාර්ගෝපදේශ සහ නියෝගයන්ට අනුගත වෙමින් විශ්‍රාමයාම, උසස්වීම්, ස්ථානමාරු, විශ්‍රාම ගැන්වීම සහ කාර්යසාධනය පවත්වා ගැනීම හා අදාල කාර්යයන් ඉටු කරයි.

### 8.5.1.2 ප්‍රධාන කාර්යයන්:

- බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදුකිරීම, පුරප්පාඩු පිරවීම සහ උසස්වීම් ලබාදීම.
- සේවකයින් පිළිබඳ වාර්තා තබා ගැනීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම. .
- කාර්යසාධනය කළමනාකරණය කිරීම.
- නිලධාරීන් බඳවා ගැනීම හා සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම.
- අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- වන්දි ගෙවීම සහ සේවකයින්ගේ දිරි දීමනා කළමනාකරණය.
- සංවිධාන සැලසුම් සකස් කිරීම.

### 8.5.1.3 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය

| | මූලික කාර්යයන් | ඒ පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 1. | අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ, රේගු අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරුවලට උසස් කිරීම | 2025 වර්ෂය තුළදී,<br>• අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක් සඳහා පත්වීම් ලිපි ලබා දී ඇත.<br>• ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ තනතුරු 04 ක් සඳහා උසස්වීම් ලබා දී ඇත.<br>• රේගු අධ්‍යක්ෂ තනතුරු 14 ක් සඳහා පත්වීම් ලබා දී ඇත. රේගු අධ්‍යක්ෂ තනතුරු 06 ක් සඳහා වැඩ බැලීමේ පදනම් යටතේ උසස්වීම් ලබා දී ඇති අතර තනතුරු 01 ක් සඳහා රාජකාරී ආවරණ පදනම් යටතේ උසස්වීම් ලබා දී ඇත.<br>• ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු 13ක් සඳහා පූර්ණකාලීන රාජකාරී ආවරණ පදනම යටතේ උසස්වීම් ලබා දී ඇති අතර තනතුරු 18ක් රාජකාරී ඉටුකිරීමේ පදනම මත උසස්වීම් ලබා දී ඇත.<br>• නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු 34ක් සඳහා පූර්ණකාලීන රාජකාරී ආවරණ පදනම යටත් උසස්වීම් ලබා දී ඇත |
| 2. | නව බඳවා ගැනීමේ පරිපාටියට (SOR) අනුව සහකාර රේගු අධිකාරී - II ශ්‍රේණිය තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම | සහකාර රේගු අධිකාරී II ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා 2024..03.23 වන දින පවත්වනු ලැබූ විභාගයේ ප්‍රතිඵල හා 2024.09.27,28 හා 29 යන දිනයන්හි පැවති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත |

| | මූලික කාර්යයන් | ඒ පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග |
|---|---|---|
| | | තවදුරටත් පැවති පුරප්පාඩු 04ක් සම්පූර්ණ කිරීම සඳහා පත්වීම් ලබා දී ඇත.<br><br>සහකාර රේගු අධිකාරී II ශ්‍රේණියේ පුරප්පාඩු 200ක් සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. |
| 3. | රේගු පරීක්ෂක (IC) තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීම | රේගු පරීක්ෂක තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීමට අදාල විභාගය 2024.02.17 වන දින පවත්වනු ලැබූ විභාගයේ ප්‍රතිඵල හා 2024.07.27 හා 28 යන දිනයන්හි පැවති සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිඵල ලේඛනය අනුව තවදුරටත් පැවති පුරප්පාඩු 12ක් සම්පූර්ණ කිරීම සඳහා පත්වීම් ලබි දී ඇත. |
| 4. | රේගු නියාමක තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම | රේගු නියාමක තනතුරේ පුරප්පාඩු 51ක් සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත |
| 5. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම | • රේගු පරීක්ෂක තනතුරේ II ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2025.09.13, හා 14 දිනයන්හි පවත්වා ඇත.<br>• රේගු පරීක්ෂක තනතුරේ I ශ්‍රේණියට අදාළ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය2024 නොවැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.01.26 දින පවත්වා ඇත.<br>• සහකාර රේගු අධිකාරී තනතුරේ II ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2024 නොවැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.02.22 සහ 23 දිනයන්හි පවත්වා ඇත.<br>• රේගු නියාමක තනතුරේ III ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2024 දෙසැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.02.16 දින පවත්වා ඇත.<br>• සහකාර රේගු අධිකාරී තනතුරේ II ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2025 දෙසැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2026.01.24 සහ 25 දිනයන්හි පැවැත්වීමට දින නියම කර ඇත.<br>• රේගු නියාමක තනතුරේ II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් වාචික පරීක්ෂණය 2025.11.25 දින පවත්වා ඇත |
| 6. | පත්වීම් ස්ථිර කිරීම | නියමිත අවශ්‍යතා සම්පූර්ණ කළ සහකාර රේගු අධිකාරීවරුන් 56 දෙනෙකුගේ, රේගු පරීක්ෂක නිලධාරීන් 28 දෙනෙකුගේ හා රේගු නියාමකවරුන් 05 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කිරීම සිදුකර ඇත. |
| 7. | විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය සිදුකිරීම | 2025 වසරේ නිලධාරීන් 73 දෙනෙකුගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාල ලිපි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඇත.<br><br>2025 වසරේ නිලධාරීන් 56 දෙනෙකුගේ සංශෝධිත විශ්‍රාම වැටුප සකස් කිරීමට කටයුතු කර ඇත. |
| 8. | නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු ක්‍රියාවලිය සිදුකිරීම | 2025 වර්ෂය තුලදී දෙවතාවක් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදුකර ඇත. |

| | මූලික කාර්යයන් | ඒ පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 9. | කාර්යසාධනය ඇගයීම මත පදනම්ව වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ ක්‍රියාවලිය සිදුකිරීම | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව 2026.01.01 ට රේගු දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන සකස්කර අවසන් කර ඇත.<br><br>2025 වර්ෂය තුල රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල නිලධාරීන් 1,775 ක් සඳහා වැටුප් වර්ධක ලබා දී ඇත. |
| 10. | නිලධාරීන්ගේ කාර්යසාධනය මත පදනම්ව දිරි දීමනා ලබාදීම | අදාල සුදුසුකම් සපුරන ලද සියළුම නිලධාරීන් සඳහා 2025 වර්ෂය තුල දිරි දීමනා ලබා දීම සිදුකර ඇති අතර 2024 වසරේ ගෙවීමට නියමිතව තිබූ දිරි දීමනා ද මෙම වසරේ ගෙවන ලදි. |
| 11. | මානව සම්පත් කළමනාකරණ අංශයේ සාමාන්‍ය එදිනෙදා කාර්යයන් ඉටුකිරීම | 2025 වර්ෂයේදී,<br>• ලිපි 21,596ක් දෛනික තැපැල වෙත ලැබී තිබුන අතර ලිපි 23,202ක් දෛනික තැපැල මඟින් බෙදා හරින ලදි.<br>• වාහන අවසරපත්‍ර (Vehicle Pass) 201ක් නිකුත් කර ඇත.<br>• නිලධාරීන් 256ක ගේ ආපදා ණය ඉල්ලුම් පත් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.<br>• නිලධාරීන් 135ක් රාජකාරී විදේශ නිවාඩු ද 10ක් පෞද්ගලික දිගුකාලීන විදේශ නිවාඩු ද 453 ක් පෞද්ගලික කෙටි කාලීන විදේශ නිවාඩු ද ලබාගෙන ඇත.<br>• රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2025 හා 03/2025 (I) අනුව දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු දායක ක්‍රමයට නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.<br>• අනෙකුත් එදිනෙදා සිදුකල යුතු ආයතනික කටයුතු ද මෙම අංශය විසින් සිදුකර ඇත. |

## 8.5.2 මානව සම්පත් සංවර්ධන අංශය

### 8.5.2.1 හැඳින්වීම

නවීකරණය, ගෝලීයකරණය, වේගවත් තාක්ෂණික වැඩි දියුණු කිරීම්, සංවිධාන ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාදාමයන් සහ සේවක මණ්ඩල ප්‍රශස්තකරණය වැනි නැගී එන ප්‍රවණතාවන් සමඟ ලෝකයේ සෑම රටකම රේගු පරිපාලනයන් විශාල අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. මෙම වර්ධනයන් රේගු පරිපාලනයන්හි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයේ අවශ්‍යතාවය සමඟ සමීපව සම්බන්ධ වී ඇති අතර, මානව සම්පත් සංවර්ධනයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමේ තීරණාත්මක වැදගත්කම අවධාරණය කරයි.

වසර 200කට වැඩි අත්දැකීම් සහිත ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන රාජ්‍ය ආයතනයක් වන අතර, ජාතියේ දේශසීමා පාලන ආයතනයක් ලෙස කටයුතු කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවකි. ආදායම එකතු කිරීම, රේගු නීතිය බලාත්මක කිරීම, නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සහ සමාජ ආරක්ෂණය යන මූලික අරමුණු පෙරදැරිව රටේ සමාජ ආර්ථික යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා රේගුව මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කෙරේ.

මෙම වගකීම් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා, වෘත්තීමයභාවය, ධනාත්මක ආකල්ප සහ සේවා ආචාර ධර්මයන්හි ඉහළ ප්‍රමිතිය සහිතව සිය වගකීම් ඉටුකළ හැකි දැනුමැති සහ උසස් නිපුණතාවන්ගෙන් යුත් පුද්ගලයින් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ.

මෙකී කැපවීම තුළ, ස්වකීය දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් නොව, රේගු සහ දේශසීමා ආරක්ෂණ කාර්යයෙහි නියැලී සිටින බාහිර පාර්ශවකරුවන්ගේ ධාරිතා ප්‍රවර්ධනය කෙරෙහි ද ශ්‍රී ලංකා රේගුව සෑම විටම සිය අවධානය යොමු කරයි.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයින්ගේ දැනුම, කුසලතා, ආකල්ප සහ වෘත්තීය නිපුණතාවන් වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය (HRD) විසින් දේශීය ප්‍රවීණයින් මගින් සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ඇතිව කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සහ වැඩමුළු ක්‍රියාත්මක කරනු ලැබේ.

### 8.5.2.2 ප්‍රධාන කාර්යයන්

#### 8.5.2.2.1 විදේශීය නියෝජිතායතන මගින් පිරිනමන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ලෝක රේගු සංවිධානය (WCO), ලෝක වෙළඳ සංවිධානය (WTO), එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන මගින් ශ්‍රී ලංකා රේගුවට ලැබෙන අවස්ථා සහ නිල ඇරයුම් පදනම් කර ගෙන, මානව සම්පත් කමිටුවේ අනුමැතිය සහිතව එකී වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ සම්පූර්ණ වගකීම මානව සම්පත් සංවර්ධන අංශය (HRD) වෙත පැවරී ඇත.

ජාත්‍යන්තර ස්වභාවයේ රේගු සහ දේශ සීමා කළමනාකරණ කරුණු සමඟ සමගාමී වන සමුළු, වැඩමුළු, පුහුණු පාඨමාලා, රැස්වීම්, පශ්චාත් උපාධි වැඩසටහන්, සහ සම්මන්ත්‍රණ ආදිය මෙම විදේශ පුහුණු අවස්ථාවන්ට අයත්වේ.

මෙම වැඩසටහන් විවිධ ආකාර වලින් පවත්වනු ලැබේ. ඇතැම් පුහුණු වැඩසටහන් විදේශීයව පැවැත්වෙන අතර තෝරාගත් රේගු නිලධාරීන්ට විදේශ රටවලට යාමට අවශ්‍ය වන අතර අනෙකුත් පුහුණු වැඩසටහන් විදේශීය සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාව තුළ පැවැත්වේ. මෙයට අමතරව, රැස්වීම්, සම්මන්ත්‍රණ, වෙබිනාර් ආදී පුහුණු වැඩසටහන් කිහිපයක් මාර්ගගතව පවත්වනු ලැබේ.

#### 8.5.2.2.2 දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම

පුද්ගල දක්ෂතා සහ නිසඟ හැකියාවන් හඳුනා ගැනීම සමඟින් අදාල ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි දැනුම සහ දැනුවත්භාවය ඉහළ නංවමින් සේවකයින්ගේ නිපුණතා සංවර්ධනයට සහාය වීමට දේශීය පුහුණු වැඩසටහන් සැලසුම් කරනු ලැබේ.

සුදුසුකම්ලත් සහ පළපුරුදු දේශීය සම්පත් දායකයින් යොදා ගනිමින් මානව සම්පත් සංවර්ධන අංශය මගින් රේගුවේ සියලු ස්ථරයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වයි. දෙපාර්තමේන්තුව තුළ පැනනැගෙන පුහුණු අවශ්‍යතා තක්සේරුවක් මත පදනම්ව සකස්කරන ලද අනුමත වාර්ෂික පුහුණු ක්‍රියාකාරී සැලසුමකට අනුකූලව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.
මානව සම්පත් සංවර්ධන අංශය සෑම වසරක් අවසානයේදීම, දෙපාර්තමේන්තුවේ සියලු අංශ වලින් පුහුණු යෝජනා සහ නිර්දේශ කැඳවනු ලැබේ. ලැබෙන ප්‍රතිපෝෂණයන් සහ ආයතනික ප්‍රමුඛතා සැළකිල්ලට ගෙන, ඉදිරි වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර, ක්‍රියාත්මක කර අධීක්ෂණය කරනු ලැබේ.

**8.5.2.2.3** ප්‍රතිපත්ති, සැලසුම් සහ ධාරිතා සංවර්ධන වගකීම්

නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ මූලික වගකීමට අමතරව, පුහුණු හා මානව සම්පත් සංවර්ධනයට අදාල පහත සඳහන් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද මානව සම්පත් සංවර්ධන අංශයට පැවරී ඇත:

- පුහුණු ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ක්‍රමවේද සකස් කිරීම, යාවත්කාලීන කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම ;
- දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික අරමුණු සමග සෑම මට්ටමකම සේවකයින්ගේ ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ සමාරම්භයන් ගැලපීම;
- නවක බඳවා ගැනීම් සහ විශේෂයෙන්ම පළපුරුදු නිලධාරීන්ගේ රැකියා තනතුරු වෙනස් කිරීමේදී පුහුණු විෂය මාලාව ප්‍රමිතිගත කිරීම සහ යාවත්කාලීන කිරීම;
- සේවකයින්ට කාලීන සහ ජාත්‍යන්තරව පිළිගත් පුහුණු අවස්ථාවන් සලසාදීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන (WCO,WTO, UNODC සහ අනෙකුත් අදාළ ආයතන) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතා සහ මෙහෙයුම් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත්වීම;
- පුහුණු ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදන සහ ඵලදායි ඉගෙනුම් පරිසර ප්‍රවර්ධනය කිරීම;.
- රේගු නිලධාරීන් අතර සේවා අචාර ධර්ම පිළිබඳ දැනුවත් භාවය සහ පිළිපැදීම ශක්තිමත් කිරීම;
- මානව සම්පත් කළමනාකරණයේ ජාත්‍යන්තර අවශ්‍යතා සහ ප්‍රශස්ථ භාවිතා සමඟ ධාරිතා ගොඩනැගීමට අදාල සියළු කරුණු සම්බන්ධීකරණය කිරීම;
- ඒ අනුව ක්‍රමානුකූලව පුහුණු අවශ්‍යතා තක්සේරු පැවැත්වීම සහ පුහුණු කිරීම් වලට ප්‍රමුඛත්වය ලබාදීම;
- වාර්ෂික පුහුණු සැලැස්ම සහ විෂය මාලා සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම;
- පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම;
- පුහුණු වැඩසටහන්හි ඵලදායීබව සහ බලපෑම අධීක්ෂණය කිරීම සහ ඇගයීම;
- රේගු නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීණතා පාඨමාලා සංවිධානය කිරීම;

**8.5.2.2.4** පාර්ශවකරුවන් සඳහා පුහුණු සහ ආධාරක සේවා

මෙයට අමතරව, මානව සම්පත් සංවර්ධන අංශය මගින් පහත සඳහන් සහායක සහ පුළුල් කාර්යයන් සිදු කරනු ලැබේ:

- යුධ හමුදාව, පොලිසිය, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ සංවිධාන, සහ විශ්වවිද්‍යාල වැනි බාහිර ආයතන විසින් ඉල්ලා සිටි විට අවශ්‍ය පුහුණු වැඩසටහන් ලබාදීම;
- රේගු මූලස්ථාන අනු නියෝජිතයින් සඳහා සහතික පත් වැඩසටහන් පැවැත්වීම;
- රේගු කරුණු පිළිබඳව පාර්ශවකරුවන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට සුදුසුකම්ලත් රේගු නිලධාරීන් සම්පත්දායකයින් ලෙස සැපයීම;
- රේගු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල සහ ඉගෙනුම් සම්පත් පහසුකම් පවත්වා ගැනීම සහ ඒ වෙත ප්‍රවේශය ලබාදීම.

**8.5.2.3** මානව සම්පත් සංවර්ධන අංශයේ සේවක සංඛ්‍යාව

වර්තමානයේ මෙම අංශය පහත **01** වගුවේ විස්තර කර ඇති පරිදි අවම සේවක සංඛ්‍යාවකින් කටයුතු කරනු ලැබේ. මෙම සීමිත සම්පත් මධ්‍යයේ වුවද, කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අංශය වෙත පැවරී ඇති සියලු කාර්යයන් නියමිත වේලාවට කාර්යක්ෂමව ඉටු කරනු ලැබේ.

**8.5.2.1** වගුව : වර්තමාන සේවක සංඛ්‍යාව

| ශ්‍රේණිය | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| රේගු අධ්‍යක්ෂ | 01 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය රේගු අධිකාරී | 00 |
| සහකාර රේගු අධිකාරී | 06 |
| රේගු පරීක්ෂක | 02 |
| කළමනාකරණ සේවා නිලධාරීන් | 03 |
| එකතුව | **14** |

*මූලාශ්‍රය : මානව සම්පත් සංවර්ධන අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.5.2.4 2025 වර්ෂයේදී මෙම අංශයේ ජයග්‍රහණයන් :

#### 8.5.2.4.1 රේගු කාර්ය මණ්ඩලය සඳහා දේශීය පුහුණු වැඩසටහන්

**2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්/ මානව සම්පත් කමිටුව විසින් යොමුකරන ලද පරිදි, මානව සම්පත් සංවර්ධන අංශය, 2025 වසරේදී රේගු කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා දේශීය පුහුණු වැඩසටහන් 53 ක් (ආයතනය තුළ සහ ඉන් පිටත) පවත්වනු ලැබූ අතර එකී වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව (ශ්‍රේණි අනුව) පහත වගුවේ (වගුව 02) දැක්වේ. රේගු කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලා තුනක් ද මෙයට ඇතුළත් වේ.**

8.5.2.2 වගුව : දේශීය පුහුණු වැඩසටහන් සඳහා රේගු කාර්යමණ්ඩලයේ සහභාගිත්වය (ආයතනය තුළ සහ බාහිරව)

| ශ්‍රේණිය | සහභාගිත්වය (ආයතනය තුළ සහ බාහිරව) | ශ්‍රේණිය | සහභාගිත්වය (ආයතනය තුළ සහ බාහිරව) |
|---|---|---|---|
| අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් | 01 | රේගු අධ්‍යක්ෂ | 08 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 104 | නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 189 |
| රේගු අධිකාරී | 48 | නියෝජ්‍ය රේගු අධිකාරී | 54 |
| සහකාර රේගු අධිකාරී | 1335 | රේගු පරීක්ෂක | 116 |
| රේගු නියාමක | 64 | පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකරණ සේවා නිලධාරී | 31 | වෙනත් | 02 |
| කාර්යාල කාර්ය සහායක | **08** | | |

*මූලාශ්‍රය : මානව සම්පත් සංවර්ධන අංශය, ශ්‍රී ලංකා රේගුව*

#### 8.5.2.4.2 බාහිර පාර්ශවකරුවන් සඳහා දේශීය පුහුණු වැඩසටහන්

පිටස්තර පාර්ශවකරුවන් විසින් ඉල්ලීම් කරන පරිදි සහ මානව සම්පත් කමිටුවේ අනුමැතිය ඇතිව, මානව සම්පත් සංවර්ධන අංශය විසින් 2025 වසර තුළ විවිධ ආයතන සඳහා පුහුණු වැඩසටහන් ගණනාවක් සම්බන්ධීකරණය කර පවත්වන ලදී. මෙයට ලංකා වාණිජ මණ්ඩලය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) මෙන්ම තවත් රාජ්‍ය ආයතන , පුද්ගලික අංශයේ සංවිධාන, සහ විශ්ව විද්‍යාල ඇතුළත් වේ.

එකී ඉල්ලීම් වල ස්වභාවය සහ විෂය පථය අනුව සමහර වැඩසටහන් රේගු දෙපාර්තමේන්තුව තුළ පවත්වන ලද අතර අනෙකුත් බොහෝ අවස්ථාවන්හිදී දෙපාර්තමේන්තුවේ සිටින සුදුසුකම්ලත් සම්පත් දායකයින්ව පුහුණු වැඩසටහන් සිදු කිරීම සඳහා ඉල්ලීම් සිදුකරන ආයතන වෙත ලබාදෙන ලදී.

- බාහිර පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 38

#### 8.5.2.4.3 විදේශීය පුහුණු වැඩසටහන්

**2025 වසරේදී මානව සම්පත් සංවර්ධන අංශය විසින් විදේශයන්හිදී, ශ්‍රී ලංකාවේදී සහ මාර්ගගත ආකාරයෙන් පවත්වනු ලැබූ විදේශ පුහුණු වැඩසටහන් 112ක් සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.**

රේගු නිලධාරීන් සඳහා 2025 වර්ෂය තුළ පවත්වනලද විදේශ පුහුණු වැඩසටහන් වර්ග වගුව **8.5.2.3** මගින් නිරූපණය වන අතර විදේශ පුහුණු වැඩසටහන් සඳහා රේගු නිලධාරීන්ගේ සහභාගිත්වය (ශ්‍රේණි අනුව) වගුව **8.5.2.4** මගින් නිරූපණය වේ.

8.5.2.3 වගුව : 2025 වර්ෂය තුළ පවත්වනලද විදේශ පුහුණු වැඩසටහන් වර්ග

| විදේශ වැඩසටහන් | | එකතුව: 112 | |
|---|---|---|---|
| • වෘත්තීය සංවර්ධන වැඩසටහන් | - 01 | • රැස්වීම් | - 36 |
| • සම පහසුකම්සපයන්නා | - 01 | • කමිටු | - 03 |
| • ක්‍රියාකාරී කණ්ඩායම් | - 05 | • වැඩමුළු | - 19 |
| • සම්මන්ත්‍රණ | - 03 | • කෙටි පාඨමාලා | - 03 |
| • විද්‍යුත් ඉගෙනුම් වැඩසටහන් | - 01 | • පුහුණු වැඩසටහන් | - 29 |
| • කරුණු සෙවීමේ අදියර | - 01 | • සමුළු | - 05 |
| • හවුල්කාරිත්ව | - 01 | • මෙහෙයුම් කමිටු සාමාජික | - 01 |
| • උපදේශක | - 01 | • සම්මන්ත්‍රණ | - 02 |

*මූලාශ්‍රය : මානව සම්පත් සංවර්ධන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.5.2.4 වගුව : විදේශ සමුළු/සම්මන්ත්‍රණ/පුහුණු වැඩසටහන් සඳහා සහභාගිත්වය (ශ්‍රේණි අනුව)**

| ශ්‍රේණිය | සහභාගිත්වය | ශ්‍රේණිය | සහභාගිත්වය |
|---|---|---|---|
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 00 | අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් | 19 |
| ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ | 02 | රේගු අධ්‍යක්ෂ | 17 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 38 | නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 72 |
| රේගු අධිකාරී | 32 | නියෝජ්‍ය රේගු අධිකාරී | 31 |
| සහකාර රේගු අධිකාරී | 228 | වෙනත් | 04 |

*මූලාශ්‍රය : මානව සම්පත් සංවර්ධන අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.5.2.4.4** රේගු මූලස්ථාන අනු නියෝජිත පුහුණුව සහ විභාග

රේගු මූලස්ථාන අනු නියෝජිතයින් (CHA) සහ වාප්පු සහකාරවරුන් (WA) සඳහා වන සහතික පත් පාඨමාලාව ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් පවත්වනු ලබන වඩාත්ම හොඳින් ස්ථාපිත සහ පිළිගත් පුහුණු වැඩසටහනයි.

මෙම පුහුණු පාඨමාලාව මගින් රේගු නිෂ්කාශන ක්‍රියාවලි, ආනයන සහ අපනයන ක්‍රියාවලි, රේගු ආඥා පනත හා අදාල නීති, භාණ්ඩ වර්ගීකරණය, රේගු මිල පිරික්සුම් ශිල්පීය ක්‍රම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාපරිපාටි, ASYCUDA පද්ධතිය මෙන්ම පාරිසරික සහ සමාජ ආරක්ෂණ ප්‍රඥප්ති ආදී විෂයයන් පිළිබඳ පුළුල් දැනුමක් ලබාදේ. මෙම පාඨමාලාව මූලික වශයෙන් පළපුරුදු රේගු නිලධාරීන් විසින් පවත්වනු ලබන අතර ඇතැම් තෝරාගත් මොඩියුල සඳහා අදාළ බාහිර ආයතන වලින් ද විෂය ආශ්‍රිත සම්පත් දායකයින් කැඳවනු ලැබේ.
බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතවරයෙකු බවට පත්වීම සඳහා වන පදනම මෙම වැඩසටහන මගින් සකස්කරන බැවින් මෙම පුහුණු වැඩසටහනට ඉහළ ඉල්ලුමක් පවතී. CHA බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම සඳහා මෙම වැඩසටන සඳහා සහභාගී වී පාඨමාලාව අවසානයේ පවත්වන ලිඛිත විභාගය සමත්වීම අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයකි. බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතයින් රටෙහි ආනයන සහ අපනයන වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ සහ රේගු නියමයන්ට අනුකූල වීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.
බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතයෙකු/වාප්පු සහකරුවකු වීමට අමතරව මෙම විභාගය අවසානයේදී පිරිනමනු ලබන සහතික පත්‍රයට ඇති ඉහළ පිළිගැනීම හේතුවෙන් සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම වැඩසටහනෙහි ලියාපදිංචි වේ. මානව සම්පත් සංවර්ධන අංශය මගින් පිරිනමනු ලබන මෙම සහතික පත්‍රය ලබාදෙනු ලබන පුහුණුවේ ගුණාත්මකභාවය සහ අදාළත්වය නිරූපණය කරන දේශීයව මෙන්ම විදේශීයව ද පිළිගන්නා සහතික පත්‍රයකි.

2025 වසරේ පවත්වන ලද CHA/WA 01 වන සහ 02වන කණ්ඩායම්වල විස්තර පහත වගුවේ දැක්වේ.

**8.5.2.5 වගුව : 2025 CHA/WA සහතිකපත් පාඨමාලා විභාගයේ සාරාංශය - 01 වන සහ 02 වන කණ්ඩායම්**

| විභාගය | සහභාගිවූවන් | සුදුසුකම් ලත් සහභාගිවූවන් | ප්‍රතිශතය |
|---|---|---|---|
| CHA/WA සහතික පත් පාඨමාලාව 01 කණ්ඩායම | 396 | 262 | 66.16% |
| CHA/WA සහතික පත් පාඨමාලාව 02 කණ්ඩායම | 260 | 176 | 67.69% |

*මූලාශ්‍රය : මානව සම්පත් සංවර්ධන අංශය, ශ්‍රී ලංකා රේගුව*

- **2025.12.31** දින වන විට මානව සම්පත් සංවර්ධන අංශය මගින් අයදුම්කරුවන් **300** දෙනෙකුගෙන් සමන්විත **03** වන කණ්ඩායම සඳහා CHA සහතික පත්‍ර පාඨමාලාව පවත්වමින් සිටී.

**8.5.2.5** මානව සම්පත් සංවර්ධන අංශය මගින් ලබාදෙන අනෙකුත් සේවාවන්

**8.5.2.5.1** පශ්චාත් උපාධි වැඩසටහන් සඳහාවන පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය කිරීම

පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම රේගු නිලධාරීන්ට අනාගත උසස්වීම් ලබාගැනීමේදී ඉතා වැදගත් වේ. රේගු නිලධාරින් විසින් ඒ වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන අංශය සේවය ලබාදේ.

මෙමගින් රේගු නිලධාරීන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා උසස් අධ්‍යාපන කටයුතු වල නිරතවීමට දිරිමත් කරනවා පමණක් නොව, දීර්ඝ කාලීනව ශ්‍රී ලංකා රේගුව සමස්ත රාජ්‍ය අංශයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් සහිත ආයතනයක් බවට පත්වනු ඇත.

**8.5.2.5.2** වාර්ෂික පුහුණු අවශ්‍යතා සමීක්ෂණ පැවැත්වීම

මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන කුසලතා, දැනුම සහ නිපුණතාවන් හඳුනා ගැනීම සඳහා පුහුණු අවශ්‍යතා සමීක්ෂණ පැවැත්වීම සහ ප්‍රතිපෝෂණයන් මත පදනම්ව අනාගත පුහුණු කාලසටහන් සැලසුම් කිරීම.

**8.5.2.5.3** රේගු පුස්තකාල පහසුකම්

මානව සම්පත් සංවර්ධනයේ වැදගත් අංගයක් වන රේගු පුස්තකාලය 2005.01.26 දින ස්ථාපිත කරන ලද අතර එය මානව සම්පත් සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ එහි අනුබද්ධ ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී.

මෙමගින් දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සපයන අතර සාමාජිකයින් නොවන තැනැත්තන්ට ද පුස්තකාලය භාවිතා කිරීමේ හැකියාව පවතී. පොත් වලට අමතරව විවිධ සඟරා සහ පුවත්පත් පුස්තකාලය සතුවන අතර දෙපාර්තමේන්තුව මගින් සකස් කරනු ලබන දෙපාර්තමේන්තු නියෝග සහ වාර්තා පුස්තකාලය මගින් රැස්කර අනාගත අවශ්‍යතා සඳහා ආරක්ෂා කරනු ලැබේ

පුස්තකාල සාමාජිකත්වය වැඩි වෙමින් පවතින බව නිරීක්ෂණය වී ඇති අතර,
(අ) හඳුන්වාදීමට නියමිත නව පුස්තකාල මෘදුකාංගය (තීරු කේත ක්‍රමයක් සහිත)
(ආ) නවීන පරිගණක වැඩි සංඛ්‍යාවක් සහිතව අන්තරජාල පහසුකම් සැලසීම

වැනි පහසුකම් පුස්තකාලයට සැපයීම අවශ්‍ය වේ.

**8.5.2.6** වර්තමානයේ මානව සම්පත් සංවර්ධන අංශය මුහුණ දෙන අභියෝග සහ ඒ සඳහා යෝජනා

මේ වන විට අනුමත කාර්ය මණ්ඩලට වඩා ඉතා අඩු සංඛ්‍යාවක සේවක හිඟයක් සහිතව මානව සම්පත් සංවර්ධන අංශය තම කාර්යයන් ඉටුකරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලයට නියමිත කාලසීමාවන් තුළ තම රාජකාරී ඉටුකර දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට විශාල කාර්යභාරයක් කළමනාකරණය කරගත යුතුව ඇත.

සමස්ත රේගු දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධන වගකීම දරන මානව සම්පත් කළමනාකරණ අංශයට අවශ්‍ය සේවා සැපයුම් සහ යටිතල පහසුකම් අවශ්‍යතාවන් සපුරාලිය යුතුව පවතී. පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් දේශන ශාලා හෝ අමතර ඉඩ පහසුකම් සහ දේශන කාර්යක්ෂමව පැවැත්වීම සඳහා ලැප්ටොප් පරිගණක මෙයට ඇතුළත් වේ.

**8.5.2.7** මීළඟ පියවර

- ව්‍යාපාරිකයින් සඳහා රේගු වැඩමුළු ක්‍රියාත්මක කිරීම.
- මෑතකදී පිහිටුවන ලද පුහුණු සංවර්ධන කමිටුව යටතේ සමස්ත රේගු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම සහ වැඩි දියුණු කිරීම.
- නව පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා 2027 වර්ෂය සඳහා වන පුහුණු අවශ්‍යතා සමීක්ෂණයක් පැවැත්වීම.

**8.5.2.8** ප්‍රධාන ජයග්‍රහණයන්

- රේගු නිලධාරීන් සඳහා දේශීය පුහුණු වැඩසටහන් 53ක් සංවිධානය කරන ලද අතර, රජයේ සහ අනෙකුත් ආයතනවල වැඩසටහන් සඳහා සම්පත් දායකයින් 38 දෙනෙකු ලබාදෙන ලදී.
- රේගු නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් 112ක් (මෙයට විදේශ අරමුදල් සපයන දේශීය පුහුණු වැඩසටහන් 17ක් ද ඇතුළත් වේ) සංවිධානය කරන ලදී.
- අයදුම්කරුවන් 438 දෙනෙකු සඳහා රේගු මූලස්ථාන අනු නියෝජිත (CHA) සහතික පත් පිරිනැමීම නිමකරන ලද අතර මීලඟ වසරේ වැඩසටහන සඳහා තවත් 300 දෙනෙකු ලියාපදිංචි විය.
- සහකාර රේගු අධිකාරී, රේගු පරීක්ෂක සහ රේගු නියාමක ඇතුළු රේගු නිලධාරීන් 257ක් සඳහා භාෂා ප්‍රවීණතා පාඨමාලා පවත්වන ලදී.
- ශ්‍රී ලංකා රේගුවේ පුහුණු සංවර්ධන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලදී.
- මානව සම්පත් සංවර්ධන අංශය යටතේ පුහුණු සංවර්ධන කමිටුව ස්ථාපිත කරන ලදී. මෙම කමිටුවට ශ්‍රී ලංකා රේගු පුහුණු පද්ධතියේ සංවර්ධනය මාර්ගෝපදේශනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත.
- ශ්‍රී ලංකා රේගුවේ සම්පත් දායකයින් ඇගයීම සඳහා වැඩසටහනක් සංවිධානය කර, රේගු හා අනෙකුත් ආයතනවල නිලධාරීන් 101 දෙනෙකුට සහතිකපත් ප්‍රදානය කරන ලදී.

**8.5.2.9** මානව සම්පත් සංවර්ධනය

2025 වර්ෂය සඳහාවන දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ 6.2 පරිච්ඡේදය යටතේ ප්‍රකාශයට පත්කර ඇත.

## 8.5.3 සේවා සැපයුම් අංශය

### 8.5.3.1 හැඳින්වීම

රජය විසින් පවරනු ලබන අත්‍යවශ්‍ය රාජකාරීන් ඉටුකිරීමේදී සේවා සැපයුම් අංශය දෙපාර්තමේන්තුව තුළ වැදගත් කාර්යයක් ඉටු කරනු ලැබේ. ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් යුතුව සේවා කටයුතු ඇතුලුව රේගුවේ සෑම අංශයක් සඳහාම සියලු අවශ්‍යතා සහ සේවාවන් සැපයීම සේවා සැපයීම් අංශයේ ප්‍රධාන අරමුණ වේ.

### 8.5.3.2 ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වේලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයුම් ලබාදීම.
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ වලට අනුගත වෙමින් විනිවිදභාවයෙන් යුතුව කාර්යයන්, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම.
- විධිමත් තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා කළමනාකරණ පද්ධතියක් සහතික කරමින් , මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා ප්‍රශස්ත භාවිතය සහතික කරමින් නිසි ලෙස ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුවේ සියලු චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය කිරීම.
- සැලසුම්ගත පරිදි නව රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ඉදිකිරීම් කටයුතු සතුටුදායක ලෙස නිම කිරීම සහ විධිමත් පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
- දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය ප්‍රශස්ත ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීම සහතික කිරීම.

### 8.5.3.3 2025 වර්ෂය සඳහා කාර්යසාධනය

2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා රේගුවේ භෞතික සම්පත් වැඩි සියුණු කිරීම කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරන ලදී. මෙම වගකීම සම්පූර්ණයෙන්ම සේවා සැපයුම් අංශය වෙත පවරා ඇත. එබැවින්, දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා වන සැපයුම් හා සේවාවන් නිසි කලට සැපයීම මෙම අංශයේ ප්‍රධාන වගකීම විය.කෙසේවුවද, මෙම සැපයුම් හා සේවා අවශ්‍යතාවයන් 2025 වර්ෂය තුළදී අපේක්ෂිත පරිදි සම්පූර්ණ කිරීමට අංශයට හැකිවිය.

සේවා සැපයුම් අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් 2025 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද රු. මි. 1,542.69 ක්වූ සංශෝධිත ඇස්තමේන්තුවෙන් රු. මි. 1,104.55 ක් උපයෝජනය කර ඇත. උපයෝගිකරණ අනුපාතයේ 72% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. එසේම, රු. මි. 1,728.40 ක් වූ ප්‍රාග්ධන වියදම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුවෙන් රු. මි. 258.38 ක් උපයෝජනය කර ඇත. උපයෝගීකරණ අනුපාතයේ 15% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. ඉහත ප්‍රගතියට අදාළ ප්‍රධාන සැපයුම් හා සේවාවන් කිහිපයක කාර්යසාධනය පහත සවිස්තරාත්මකව දක්වා ඇත.

**8.5.3.1 වගුව : අයවැය යෝජනාවල ප්‍රගතිය - 2025**

| | අයවැය යෝජනාව | ඇස්තමේන්තුව රු.මි. | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | කෙරවලපිටිය රේගු පරීක්ෂණ අංගනයේ ඉඩම් අත්පත්කර ගැනිම සහ මූලික සැකසුම් කාර්යයන් | - | - | නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට, ඉඩම් ගොඩ කිරීම සහ ජලාපවහන පද්ධතිය ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලැබී ඇත.<br>*ඉඩම මැනීම සඳහා 2025.12.30 දින මිනින්දෝරු දෙපාර්තමේන්තුවට රු. 100,393.53 ක මුදලක් ගෙවන ලදී. |
| 2 | ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ලුහුබැඳයාමේ පද්ධතිය | - | - | සකස්කරන ලද පිරිවිතර සමාලෝචනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇති අතර, ඉදිරි සාකච්ඡා සඳහා එම ආයතනයේ නියෝජිතයෙකු සම්බන්ධකර ගැනීම සඳහා ඉල්ලීමක් කර ඇත. |
| 3 | කොළඹ වරාය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා උසස් පරිලෝකන පද්ධතිවල මූලික වැඩිදියුණු කිරීම් සහ ස්ථාපනය කිරීම | - | - | දැනටමත් පත්කර ඇති කමිටුව මගින් පිරිවිතර සකස් කරමින් පවතී. |

*මූලාශ්‍රය : සේවා සැපයුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.5.3.2** වගුව **: 2025** වර්ෂයේදී වෙන්කළ ප්‍රතිපාදන තුළ සම්පූර්ණ කරන ලද ප්‍රධාන කාර්යයන්

| වැය විෂය අංකය | ප්‍රධාන කාර්යය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මි.) | මූල්‍ය කාර්යසාධනය (රු. මි.) | % | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | භාණ්ඩ | **1594.16** | **390.33** | | |
| 1201 | ලිපිද්‍රව්‍ය | 88.72 | 78.79 | 90 | වර්ෂය තුළදී ලිපිද්‍රව්‍ය අයිතම 85ක් අවස්ථා තුනකදී මිලදී ගන්නා ලදී. |
| 1203-002 | නිල ඇඳුම් | 80.00 | 28.12 | 35 | රාජකාරී නිල ඇඳුම්, සපත්තු 1,426 ක් මේස් 2,852 ක් සහ වෙනත් නිල ඇඳුම් උපාංග 20ක් වර්ෂය තුළ මිලදී ගැනීම සඳහා නිලධාරීන් 687 දෙනෙකුට දීමනාවක් ලබාදෙන ලදී. |
| 1205 | අනෙකුත් මිලදී ගැනීම් | 63.24 | 45.31 | 72 | ඇඳ ඇතිරිලි 3,621 ක්, කොට්ට උර 3,625 ක්, *TSS* බෑග් 6,200 ක්, පොලිසැක් බෑග් 56,000 ක්, පිඟන් භාණ්ඩ 924ක් සහ අනෙකුත් භාණ්ඩ (ඉවත දැමිය හැකි මුහුණු ආවරණ 5,500 අත් පිරිසිදුකාරක ලීටර් 4 කෑන් 50, මිලි 500 බෝතල් 100, අත් වැසුම් 2500 ආදිය) මිලදී ගැනීම |
| 2102 | ලී බඩු සහ කාර්යාලයීය උපකරණ | 22.70 | 18.97 | 84 | පුටු 210, ඇඳන් 14, මේස 28, වානේ කබඩ් 49, රෙදි රාක්ක 04 |
| 2103 | යන්ත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 324.80 | 86.98 | 27 | මුද්‍රණ යන්ත්‍ර 90, වායු සමීකරණ යන්ත්‍ර 14, *UPS* 85, *LAN-WAN* ශාඛා ජාලය ඒකාබද්ධ කිරීම සහ නවීකරණය කිරීම, පරිගණක සහ ආශ්‍රිත ඉලෙක්ට්‍රොනික අයිතම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය පිරිනැමීමට ප්‍රසම්පාදනයෙන් 90%ක් සම්පූර්ණ කර ඇත. බහාළුම් පරිලෝකන පද්ධතියේ රඳවා ගන්නා ලද ඇ.ඩො. 211,473,80 ක 4 වන සේවා ගෙවීම |
| 2106 | මෘදුකාංග සංවර්ධනය | 342.70 | 99.59 | 29 | පවත්නා *oracle* පද්ධතියේ ප්‍රසම්පාදනය අඛණ්ඩව පවත්වා ගැනීම සම්පූර්ණ කරන ලදී, ඉ- ලංසු පද්ධති ප්‍රසම්පාදනයේ ලංසු කැඳවීම, *Distributed Firewall* සහ *Security Information* සහ *Event Management (SIEM)* පද්ධතිය සඳහා ලංසු ලේඛන සහ තාක්ෂණික පිරිවිතර සකස් කරමින් පවතී |
| 003-2106 | ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ මෘදුකාංගයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 100.00 | 32.57 | 33 | ව්‍යාපෘතිය එහි අවසන් අදියරේ පවතින අතර කාර්යය සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත් ඒජන්සිය විසින් කරන ලද ඉල්ලීම පරිදි 2026.02.27 දක්වා කාලය දීර්ඝ කරන ලදී. |
| 004-2103<br>004-2106 | වැඩි දියුණු කරන ලද Oracle Exudates පද්ධතිය | 572.00 | 00.00 | - | ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා අදාළ කාර්යයන් 90%ක් සම්පූර්ණ කර ඇත. ප්‍රසම්පාදන ප්‍රමාණය ද අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කර ඇත. ඒ අනුව, අදාළ තෝරාගත් ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත. |
| | <u>පවත්නා සේවා ගිවිසුම</u><br>කෘත්‍රිම බුද්ධිය Rapiscan පද්ධතියට ඒකාබද්ධ කිරීම සහ පවත්නා සේවා ගිවිසුම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම | | | | මෙම ව්‍යාපෘතිය ඉදිරි වසර පහ සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා පත් කළ විශේෂඥ කමිටුවේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී. |

| වැය විෂය අංකය | ප්‍රධාන කාර්යය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මි.) | මූල්‍ය කාර්යසාධනය | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | (රු. මි.) | % | |
| | කාර්යයන් | **275.80** | **30.66** | | |
| 1303<br>2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම | 26.50<br>249.30 | 20.26<br>10.40 | 76<br>0.4 | 9 වන මහලේ ආපන ශාලාවේ හානිවී තිබූ ටයිල් ඉවත් කර අළුතින් සවි කිරීම, අභ්‍යන්තර කටයුතු ඒකකය වැඩි දියුණු කිරීම (වෙන් කිරීමේ කටයුතු), 7 වන මහලේ වෙන් කිරීමේ කටයුතු, මෝගන් පාර රේගු නිල නිවාස අළුත්වැඩියා කිරීම, කටුනායක ගුවන්තොටුපළ රේගු විවේකාගාරය අළුත්වැඩියා කිරීම, රේගු නියාමක විවේකාගාරයේ අළුත්වැඩියා කටයුතු, (නාන කාමර, දොර, ජල කාන්දු වීම), කටුනායක විවේකාගාරයේ විදුලි ජනන යන්ත්‍රය සවිකිරීම, ආරක්ෂක අරමුණු සඳහා ගමන්මළු සුරක්ෂිතාගාරයේ වානේ රාමු ඉදිකිරීම, පැරණි දිගු කාමර ගොඩනැගිල්ල සඳහා වාහන ආවරණ (රථ ගාල), මූලස්ථාන ගොඩනැගිල්ලේ ආපන ශාලාව නවීකරණය කිරීම, බේරුවල, ත්‍රිකුණාමලය, ගාල්ල උප නිවාරණ කාර්යාල නවීකරණය කිරීම සහ කොළඹ වරාය යකඩ ගේට්ටුව අළුත්වැඩියා කිරීම, ඩිස්කොතෙක් කොටසේ අළුත්වැඩියා කටයුතු |
| | සේවා | **1,401.13** | **941.95** | | |
| 1202-009 | සංචිත වාහන සඳහා ඉන්ධන | 84.30 | 77.09 | 91 | වාහන 131ක් සඳහා ඉන්ධන (මූලස්ථානය සහ ප්‍රාදේශීය කාර්යාල) |
| 1203-001 | ආහාර | 78.50 | 77.90 | 99 | රේගු නිලධාරීන් සඳහා දිවා ආහාර, රාත්‍රී ආහාර සහ කෙටි ආහාර සපයන ලදී. ( කොළඹ වරාය සහ හම්බන්තොට වරාය) |
| 1302, 2002 | යන්ත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 182.69 | 26.17 | 14 | වායු සමීකරණ, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, පිරිපහදු ඒකක, පරිලෝකන යන්ත්‍ර ආදිය නඩත්තු කිරීම |
| 1402 | තැපැල් සහ විදුලි සංදේශ | 98.50 | 95.58 | 97 | ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල මාසික බිල්පත් ගෙවීම |
| 1403 | විදුලිබලය සහ ජලය | 230.00 | 201.61 | 88 | ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල මාසික බිල්පත් ගෙවීම |
| 1404 | කුලී සහ දේශීය බදු | 105.00 | 73.09 | 70 | ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල බදු කුලී සහ දේශීය බදු |
| 1405 | පිරිසිදු කිරීම් සහ සනීපාරක්ෂක සේවා | 96.00 | 95.49 | 99 | සේවා ගිවිසුම් (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල) |
| 1407 | ආරක්ෂක සේවා | 43.04 | 43.03 | 100 | 2024.04.01 *සිට* 2025.03.31 දක්වා සේවා ගිවිසුම් අත්සන් කරන ලදී (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල) |
| 1408 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන සඳහා බදු කුලී | 80.00 | 67.83 | 85 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන 17ක් සඳහා කල්බදු ගෙවීම |
| 1409-138 | යන්ත්‍රෝපකරණ සහ කාර්යාලයීය උපකරණ සේවා ගිවිසුම් | 112.40 | 83.44 | 74 | සේවා ගිවිසුම් 23ක් සඳහා සහ ගිවිසුම් මගින් ආවරණය නොවූ අතිරේක නඩත්තු කටයුතු සඳහා ගෙවීම් කිරීම. |
| 1409-139 | වාහන රක්ෂණ | 3.00 | 2.60 | 87 | වාහන ඇණිය රක්ෂණය කිරීම (සියළුම වාහන පූර්ණ රක්ෂණය කර ඇත) |
| 1409-140 | විවිධ සේවා වියදම් | 33.70 | 14.55 | 43 | රේගු භූමිවල නාම පුවරු සවිකිරීම ආදී විවිධ සේවා වියදම්, මායිම් රේඛා යෙදීම |
| 001-1304 | ASYCUDA පද්ධතිය | 150.00 | 0.00 | - | 06 වන අතිරේකය අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත |
| 003-1403<br>003-1409-140 | නව බහාළුම් පරිලෝකන ව්‍යාපෘතිය | 40.00 | 25.12 | 63 | 2025 වර්ෂය තුළ විදුලි සහ ජල බිල්පත් ගෙවීම, ගිනි ආරක්ෂක සේවා ගිවිසුම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1301 2003 | වාහන ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව | 64.00 | 58.45 | 93 | **වර්ෂය තුළ දෙපාර්තමේන්තු වාහන 131 ක් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.** |
| | මුළු වියදම | 3,271.09 | 1,362.93 | | |

*මූලාශ්‍රය : සේවා සැපයුම් අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.5.4 කාර්ය මණ්ඩල සේවා අංශය

### 8.5.4.1 අරමුණු

සියලුම ක්‍රියාමාර්ග නෛතික, නිල හා සංවිධානාත්මක ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කරමින් වගකීම, විනය, වගවීම සහ ඒකාබද්ධතාවය නිරන්තරයෙන්ම ආරක්ෂාවන පරිසරයක් කෙරෙහි අවධානය යොමු කරවනු ලබන ශක්තිමත් රාජකාරිමය ආචාර ධර්ම සංස්කෘතියක් වර්ධනය කිරීම.

### 8.5.4.2 ප්‍රධාන කාර්යයන්

I. **විනය කටයුතු පාලනය කිරීම:**
අදාල නිලධාරීන්ට එරෙහිව මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සහ ආයතන සංග්‍රහයේ II වෙළුමේ දක්වා ඇති පරිදි ක්‍රියාත්මක කිරීම.

II. **රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම:**
සියලු අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

III. **විගණන හා කළමනාකරණ රැස්වීම් (AMC) සම්බන්ධීකරණය කිරීම:**
මුදල් අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ රැස්වීම් (AMC) සම්බන්ධීකරණය කිරීම.

IV. **රාජ්‍ය ගිණුම් කාරක සභාවට (COPA) ඉදිරිපත් කළ යුතු වාර්තා සකස් කිරීම.**
සියලු අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් COPA වාර්තා සඳහා පිළිතුරු සකස් කිරීම සහ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

V. **පාර්ලිමේන්තු ප්‍රශ්ණ සඳහා පිළිතුරු සැපයීම**
පාර්ලිමේන්තු ප්‍රශ්ණ සඳහා සියලු අංශ වලින් නිරීක්ෂණ/පිළිතුරු ලබාගැනීම සහ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

VI. නෛතික ආයතන (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් කොමිසම, පාර්ලිමේන්තු උප කමිටු ආදී) සමඟ සම්බන්ධීකරණය කිරීම.

### 8.5.4.3 2025 වර්ෂය සඳහා අංශයේ කාර්යසාධනය

#### 8.5.4.1 වගුව : විනය කළමනාකරණය

| මූලික විමර්ශන | | |
|---|---|---|
| 2025 වසරේ සිදුකරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව. | නිමකරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව. | පොරොත්තු මූලික විමර්ශන සංඛ්‍යාව. |
| 08 | 02 | 06 |

| විධිමත් විනය පරීක්ෂණ | | |
|---|---|---|
| පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව | නිමකරන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව | පොරොත්තු විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව |
| 17 | 11 | 06 |

*මූලාශ්‍රය : කාර්ය මණ්ඩල සේවා අංශය, ශ්‍රී ලංකා රේගුව*

#### 8.5.4.2 වගුව : විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| විගණන විමසුම් | | |
|---|---|---|
| ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු සපයා ඇති විගණන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු සැපයීමට ඇති විගණන විමසුම් සංඛ්‍යාව |
| 21 | 16 | 05 |

*මූලාශ්‍රය : කාර්ය මණ්ඩල සේවා අංශය, ශ්‍රී ලංකා රේගුව*

8.5.4.3 වගුව : පාර්ලිමේන්තු ප්‍රශ්ණ සහ ප්‍රශ්ණමාලා සඳහා පිළිතුරු සැපයීම

| පාර්ලිමේන්තු ප්‍රශ්ණ සහ ප්‍රශ්ණමාලා | | |
|---|---|---|
| ලැබුණු ප්‍රශ්ණ සංඛ්‍යාව | පිළිතුරු සපයා ඇති ප්‍රශ්ණ සංඛ්‍යාව | පිළිතුරු සැපයීමට ඇති ප්‍රශ්ණ සංඛ්‍යාව |
| 15 | 15 | නැත |

*මූලාශ්‍රය : කාර්ය මණ්ඩල සේවා අංශය, ශ්‍රී ලංකා රේගුව*

- **විනය අනුමත කිරීම**
  **ආයතනික රාජකාරි සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය වෙත සම්පූර්ණ විනය අනුමත කිරීම් 7,244 ක් ලබා දී ඇත.**

- **විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්**
  **2025 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශය මගින් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.**

- **සේවා සැපයුම් අංශය ශක්තිමත් කිරීම**

**මූලික විමර්ශන ක්‍රියාවලිය වේගවත් කිරීම**
**අනවශ්‍ය ප්‍රමාදයන් නොමැතිව මූලික විමර්ශන නිමකරන බව තහවුරු කිරීම අවශ්‍ය කෙරේ. එබැවින්, අවශ්‍ය කාලසීමාව තුළ එකී විමර්ශන සිදුකරන ලද බව තහවුරු කිරීම සඳහා පසු විපරම් සිදු කරයි.**

## 8.6 සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පවතින අංශ

### 8.6.1 ආදායම් අධීක්ෂණ අංශය

### 8.6.2 අභියාචනා අංශය

### 8.6.3 මූල්‍ය අංශය

### 8.6.4 පද්ධති සහ ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

### 8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

### 8.6.6 අභ්‍යන්තර කටයුතු ඒකකය

## 8.6.1 ආදායම් අධීක්ෂණ අංශය

### 8.6.1.1 හැඳින්වීම

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ආදායම් අධීක්ෂණ අංශය (RTF), ක්ෂණිකව ක්‍රියාත්මක වන හදිසි වැටලීම් බලකායක් ලෙස ක්‍රියා කරන අතර සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් පරිචයන් මෙන්ම රේගු මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වයට බලපාන අක්‍රමිකතා තුරන් කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ සියලුම ක්‍රියාකාරකම් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටියි.

රේගු අධ්‍යක්ෂකවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන මෙම අංශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, රේගු අධිකාරී, නියෝජ්‍ය රේගු අධිකාරී, සහකාර රේගු අධිකාරී, රේගු පරීක්ෂක, රේගු නියාමක තනතුරු දරන නිලධාරීන්ගෙන් මෙන්ම ලිපිකරු කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වේ.

ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු හා අනෙකුත් සියලුම නීති රීතිවලට අනුකූලව සියලුම භාණ්ඩ නිෂ්කාශනය කර ඇති බව සහතික කිරීම සඳහා සියලුම ආනයනයන් හා අපනයනයන් ආදායම් අධීක්ෂණ අංශය විසින් අධීක්ෂණය කරනු ලබන අතර පුද්ගලික ගමන් මලු, තැපැල් සහ කුරියර් පාර්සල් ඇතුලුව ආනයනය කරන ලද හෝ අපනයනය කරන ඕනෑම භාණ්ඩයක් පරීක්ෂා කිරීම සඳහා නතර කිරීමට හා නැවත පරීක්ෂා කිරීමට හෝ අත්පත් කරගැනීමට බලය ඇත. තවද ආදායම් අධීක්ෂණ අංශය විසින් ගුවන්තොටුපලවල් හිදී, ගුවන් භාණ්ඩ, කුරියර් පාර්සල් ගබඩා, කැටුව නොයන මගී ගමන් මලු ගබඩා, පාර්සල් තැපැල්, සාමාන්‍ය නැව් භාණ්ඩ, ආයෝජන මණ්ඩල භාණ්ඩ, බැඳුම්කර භාණ්ඩ සහ අපනයන භාණ්ඩ ආදිය අනපේක්ෂිත අයුරින් හදිසි පරීක්ෂා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාලන හස්තයක් ලබාදීම සහ දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටීමයි. කාර්ය මණ්ඩලය විසින් රැස් කරන ලද බුද්ධි තොරතුරු සහ මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත ආදායම් අධීක්ෂණ අංශය විසින් විවිධ බලාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

දිගු කාමරයේ, ගුදම්වල, ගුවන් භාණ්ඩ, තැපැල් පාර්සල්, කුරියර් සේවාවන්හි භාණ්ඩ නිෂ්කාශනය කිරීම මෙන්ම භාණ්ඩ නිෂ්කාශනය කිරීම සඳහා වන විශේෂ ක්‍රියා පටිපාටි පිළිබඳව ද මෙම අංශය සුපරීක්ෂාකාරීව සිටී.

### 8.6.1.2 ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුව තුළ සුපිළිපන්බව ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් භාවිතයන් තුරන් කිරීම.
- පැමිණිලි හා චෝදනා සම්බන්ධයෙන් කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.
- සම්පත් යෙදවීම මගින් අර්බුදකාරි තත්වයන් කළමනාකරණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහය වීම.
- ආනයනය හෝ අපනයනය කරන යම් භාණ්ඩ අතරමග නවතාලීම හා නැවත පරීක්ෂා කිරීම සහ අනුගමනය කරන ලද ක්‍රියාවලියේ නිරවද්‍යභාවය සත්‍යාපනය කිරීම.
- ගුවන්තොටුපලේදී හෝ කැටුව නොයන ගමන්මලු ගුදම් වලදී මගීන් හා මගී ගමන් මලු අතරමග නවතාලීම හෝ පරීක්ෂා කිරීම.
- පාර්සල් තැපැල්, කුර්යර් සේවාවන්හිදී භාණ්ඩ නිෂ්කාශනයේදී සහ භාණ්ඩ නිෂ්කාශනය සඳහා වන වෙනත් විශේෂ ක්‍රමවේදයන් පිළිබඳ සුපරීක්ෂාකාරී බව පවත්වා ගැනීම.

**8.6.1.1 වගුව : 2025 වර්ෂයේ අයකරගැනීම්**

**(රු.)**

| 2025 | අංශය | රාජසන්තක කිරීම්/ ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් | දඩ/ලිහිල් කරන ලද දඩ/ලිහිල් කරන ලද වැඩිදුර රාජසන්තක කිරීම් | අතිරේක සටහන්කර (දිගු කාමරය) | ගමන්මළු මත තීරු බදු සහ අනෙකුත් බදු | අලෙවි ආදායම | SR සහ අනෙකුත් ගාස්තු | එකතුව | අතිරේක සටහන්කර (මිල පිරික්සුම්) | රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි **208,445,283.30** | ප්‍රධාන කාර්යාලය | 68,757,992.00 | 15,586,987.00 | 8,261,277.00 | 1,863,364.00 | 2,636,748.30 | - | **97,106,368.30** | 4,457,754.00 | 45,194,058.00 |
| | මෙහෙයුම් | 37,530,493.00 | 74,180.00 | - | 4,256,279.00 | - | - | **41,860,952.00** | - | 9,663,829.00 |
| | ජංගම | 60,066,189.00 | 8,009,425.00 | 110,962.00 | 1,291,387.00 | - | - | **69,477,963.00** | 6,050,936.00 | 8,937,670.00 |
| පෙබරවාරි **232,580,300.24** | ප්‍රධාන කාර්යාලය | 58,224,639.00 | 16,837,900.00 | 2,657,947.00 | 3,206,308.00 | 30,121,618.14 | - | **111,048,412.14** | 11,977,434.00 | 1,007,048.00 |
| | මෙහෙයුම් | 29,543,207.00 | 950,000.00 | 446,223.00 | 64,159.00 | 9,836,716.35 | - | **40,840,305.35** | 2,614,777.00 | 3,943,007.00 |
| | ජංගම | 47,882,268.00 | 15,068,870.00 | 218,735.00 | 10,863,003.75 | 6,658,706.00 | - | **80,691,582.75** | 5,370,207.00 | 26,276,003.10 |
| මාර්තු **455,566,575.12** | ප්‍රධාන කාර්යාලය | 126,916,651.00 | 11,039,548.00 | 5,468,093.00 | 4,001,394.00 | 13,340,089.40 | - | **160,765,775.40** | 9,984,888.00 | 18,208,848.75 |
| | මෙහෙයුම් | 127,228,537.00 | 6,572,950.00 | 2,535,718.00 | 834,333.00 | 13,572,301.72 | - | **150,743,839.72** | 5,841,974.00 | 8,358,382.00 |
| | ජංගම | 126,295,472.00 | 14,005,345.00 | 1,243,818.00 | 2,512,325.00 | - | - | **144,056,960.00** | 5,095,700.00 | 158,237,068.88 |
| අප්‍රේල් **345,626,375.98** | ප්‍රධාන කාර්යාලය | 105,113,809.00 | 13,026,200.00 | 3,434,152.00 | - | 6,891,139.03 | - | **128,465,300.03** | 3,949,164.00 | 22,397,248.00 |
| | මෙහෙයුම් | 96,307,701.00 | 6,675,000.00 | 2,627,020.00 | 1,763,045.00 | 8,664,871.95 | - | **116,037,637.95** | 10,575,086.00 | 18,994,896.00 |
| | ජංගම | 76,598,535.00 | 4,454,800.00 | 1,021,289.00 | 78,614.00 | 18,970,200.00 | - | **101,123,438.00** | 5,652,187.00 | 33,937,003.02 |

(රු.)

| 2025 | අංශය | රාජසන්තක කිරීම්/ ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් | දඩ/ලිහිල් කරන ලද දඩ/ලිහිල් කරන ලද වැඩිදුර රාජසන්තක කිරීම් | අතිරේක සටහන්කර (දිගු කාමරය) | ගමන්මළු මත තීරු බදු සහ අනෙකුත් බදු | අලෙවි ආදායම | SR සහ අනෙකුත් ගාස්තු | එකතුව | අතිරේක සටහන්කර (මිල පිරික්සුම්) | රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මැයි **296,611,437.89** | ප්‍රධාන කාර්යාලය | 85,632,833.68 | 11,862,357.00 | 1,326,798.00 | 2,389,098.00 | 11,579,949.21 | - | **112,791,035.89** | 6,231,202.00 | 7,510,441.00 |
| | මෙහෙයුම් | 56,565,832.00 | 3,761,680.00 | 2,538,532.00 | 611,390.00 | - | - | **63,477,434.00** | 4,556,207.00 | 54,874,490.00 |
| | ජංගම | 90,527,000.00 | 12,365,875.00 | 793,026.00 | 4,371,560.00 | 12,285,507.00 | - | **120,342,968.00** | 6,078,444.00 | 18,599,407.20 |
| ජුනි **371,556,052.68** | ප්‍රධාන කාර්යාලය | 90,816,333.33 | 9,550,000.00 | 4,499,414.00 | - | 2,486,504.59 | - | **107,352,251.92** | 13,421,524.00 | 6,753,668.00 |
| | මෙහෙයුම් | 96,810,997.00 | 10,450,000.00 | 2,229,928.00 | 633,819.00 | 10,594,507.76 | - | **120,719,251.76** | 11,014,584.00 | 56,145,834.00 |
| | ජංගම | 93,392,185.00 | 15,635,000.00 | 2,517,569.00 | 511,234.00 | 31,428,561.00 | - | **143,484,549.00** | 8,880,815.00 | 26,245,049.00 |
| ජුලි **385,994,687.33** | ප්‍රධාන කාර්යාලය | 109,353,822.00 | 11,577,278.00 | 1,206,464.00 | 1,355,005.00 | 7,416,989.03 | 6,150.00 | **130,915,708.03** | 7,070,501.00 | 438,492,844.36 |
| | මෙහෙයුම් | 89,188,517.00 | 8,050,000.00 | 2,549,399.00 | - | 8,008,472.30 | - | **107,796,388.30** | 10,863,463.00 | 9,083,702.00 |
| | ජංගම | 130,780,874.00 | 6,620,400.00 | 2,238,909.00 | 700,490.00 | 6,941,918.00 | - | **147,282,591.00** | 9,945,044.00 | 15,700,190.00 |
| අගෝස්තු **388,609,183.45** | ප්‍රධාන කාර්යාලය | 121,840,000.00 | 10,301,350.00 | 2,476,427.00 | 1,943,175.00 | 5,216,338.45 | 1,533,950.00 | **143,311,240.45** | 12,309,093.00 | 7,319,440.49 |
| | මෙහෙයුම් | 116,695,010.00 | 8,450,000.00 | 9,856,636.00 | - | 2,317,637.75 | 8,600.00 | **137,327,883.75** | 15,049,299.00 | 15,952,676.51 |
| | ජංගම | 80,686,009.00 | 11,413,915.00 | 2,143,580.00 | 3,657,255.25 | 9,431,150.00 | 638,150.00 | **107,970,059.25** | 12,986,548.00 | 8,946,877.00 |
| සැප්තැම්බර් **505,495,532.00** | ප්‍රධාන කාර්යාලය | 148,336,000.00 | 15,394,649.00 | 4,451,683.00 | 1,064,995.00 | 81,592.00 | 99,300.00 | **169,428,219.00** | 12,230,647.00 | 2,400,755.33 |
| | මෙහෙයුම් | 116,067,357.00 | 22,343,090.00 | 3,406,164.00 | 2,266,484.00 | - | 430,419.00 | **144,513,514.00** | 22,679,421.00 | 68,771,335.00 |
| | ජංගම | 157,360,077.00 | 19,187,866.00 | 4,493,893.00 | 4,162,106.00 | 5,979,307.00 | 370,550.00 | **191,553,799.00** | 15,379,584.00 | 16,751,790.00 |

(රු.)

| 2025 | අංශය | රාජසන්තක කිරීම්/ ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් | දඩ/ලිහිල් කරන ලද දඩ/ලිහිල් කරන ලද වැඩිදුර රාජසන්තක කිරීම | අතිරේක සටහන්කර (දිගු කාමරය) | ගමන්මළු මත තීරු බදු සහ අනෙකුත් බදු | අලෙවි ආදායම | SR සහ අනෙකුත් ගාස්තු | එකතුව | අතිරේක සටහන්කර (මිල පිරික්සුම්) | රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝම්බර් **451,748,420.50** | ප්‍රධාන කාර්යාලය | 117,602,481.00 | 27,088,090.00 | 5,682,389.00 | 5,059,210.00 | - | 60,800.00 | **155,492,970.00** | 16,669,388.00 | 12,591,144.24 |
| | මෙහෙයුම් | 159,633,856.00 | 12,559,780.00 | 2,329,031.00 | 1,173,082.00 | - | 358,503.50 | **176,054,252.50** | 11,951,444.00 | 6,505,010.00 |
| | ජංගම | 104,889,008.00 | 9,166,725.00 | 2,774,164.00 | 400,954.00 | 2,922,847.00 | 47,500.00 | **120,201,198.00** | 14,382,053.00 | 48,570,253.00 |
| නොවැම්බර් **347,376,941.80** | ප්‍රධාන කාර්යාලය | 82,571,638.00 | 16,745,917.00 | 1,379,646.00 | 5,087,599.00 | 1,115,937.00 | 196,250.00 | **107,096,987.00** | 8,698,249.00 | 2,461,968.00 |
| | මෙහෙයුම් | 122,946,203.00 | 13,130,000.00 | 1,119,908.00 | 99,714.00 | 633,390.80 | 406,400.00 | **138,335,615.80** | 22,157,252.00 | 21,450,961.00 |
| | ජංගම | 90,200,000.00 | 8,669,000.00 | 2,130,878.00 | 537,211.00 | - | 407,250.00 | **101,944,339.00** | 7,940,131.00 | 146,350,248.00 |
| දෙසැම්බර් **467,042,041.70** | ප්‍රධාන කාර්යාලය | 192,867,000.00 | 17,981,835.70 | 4,726,564.00 | 638,246.00 | 16,417,100.00 | 412,375.00 | **233,043,120.70** | 19,528,476.00 | 10,968,037.79 |
| | මෙහෙයුම් | 101,858,681.00 | 8,363,000.00 | 5,495,575.00 | 587.00 | 7,361,320.00 | 48,100.00 | **123,127,263.00** | 18,134,283.00 | 9,196,484.00 |
| | ජංගම | 99,345,000.00 | 6,260,000.00 | 3,511,066.00 | 582,952.00 | 716,490.00 | 456,150.00 | **110,871,658.00** | 16,679,058.00 | 844,208.00 |
| එකතුව | | **3,616,432,207.01** | **409,229,012.70** | **103,902,877.00** | **67,980,378.00** | **253,627,909.78** | **5,480,447.50** | **4,456,652,831.99** | **376,406,817.00** | **1,367,641,875.67** |
| මුළු අයකරගැනීම් (රු.) | | **4,456,652,831.99** | | | | | | | | |

*මූලාශ්‍රය : ආදායම් අධීක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.6.2 අභියාචනා අංශය

### 8.6.2.1 හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ අභියාචනා අංශය, ලෝක රේගු සංවිධානයේ (WCO) සංශෝධිත කියෝතෝ ප්‍රඥප්තියේ (RKC) හා ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමේ (TFA) විධිවිධාන යටතේ දක්වා ඇති ජාත්‍යන්තරව පිළිගත් වෙළඳ භාවිතයන්ට අනුකූලව පිහිටුවා ඇත. සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය වෙළඳ පහසුකරණයේ දී වැදගත් භූමිකාවක් ඉටුකරනු ලැබේ.

අභියාචනා අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරන අභියාචනා සුපරීක්ෂාකාරීව සළකා බලමින් වෙළඳ ක්‍රියාවලීන් විධිමත් කිරීමයි. කරුණු සවිස්තරාත්මකව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, මෙම අංශය මගින් දැනුම්දෙන ලද නිර්දේශ ලබා දී අවශ්‍ය පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි.

සමාලෝචනය සහ නිවැරදි කිරීමේ කාර්යයන් සඳහා සුදුසු කාර්යක්ෂම අභියාචනා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, අභියාචනා කමිටුව ස්ථාපනය කර ඇත. රේගු අධ්‍යක්ෂ (අභියාචනා) නිල බලයෙන් මෙම කමිටුවේ සාමාජිකයෙකු වන අතර අනෙකුත් සාමාජිකයින් නිරන්තරයෙන් රැස්වීම් සඳහා සහභාගි වෙමින් අඛණ්ඩව සහය ලබාදේ.
රේගු අධ්‍යක්ෂ (අභියාචනා) වෙත ලැබෙන අභියාචනා වල වලංගුභාවය සහ අදාළත්වය පිළිබඳව දැඩි ලෙස පරීක්ෂා කරනු ලැබේ. ඉදිරි කටයුතු සඳහා වැඩිදුර තොරතුරු අවශ්‍යවන අභියාචනා අදාළ කරුණු පිළිබඳව විස්තරාත්මක වාර්තා සහ වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා අදාල අංශ වෙත යොමු කරනු ලැබේ.
මෙම අත්‍යවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් පසුව පමණක් වැඩිදුර සළකා බැලීම සඳහා සහ යම් සහනයක් සැලසීම සඳහා අභියාචනා කමිටුවට මෙම අභියාචනා ඉදිරිපත් කිරීමට රේගු අධ්‍යක්ෂවරයාට (අභියාචනා) හැකිවේ.
සෑම වර්ෂයකම අභියාචනා කමිටුව වෙත යොමු කරන අභියාචනා සංඛ්‍යාව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම අංශයට යොමුකරන අභියාචනා සංඛ්‍යාව මත සෘජුවම රඳාපවතින බව සඳහන් කල යුතුය.

### 8.6.2.2 කාර්යසාධනය

**8.6.2.1 වගුව : ලැබුණු අභියාචනා සංඛ්‍යාව**

| | **2025.01.01** දිනට | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලැබුණු අභියාචනා සංඛ්‍යාව | - | 7 | 7 | 7 | 12 | 18 | 13 | 11 | 04 | 09 | 11 | 02 | 06 | 107 |
| අවසන් කරන ලද අභියාචනා සංඛ්‍යාව | - | 14 | 10 | 08 | 02 | 12 | 08 | 04 | 11 | 11 | 13 | 01 | 12 | 106 |
| අවසන් නොවූ අභියාචනා සංඛ්‍යාව | 75 | 68 | 65 | 64 | 74 | 80 | 85 | 92 | 85 | 83 | 81 | 82 | 76 | 76 |

*මූලාශ්‍රය : අභියාචනා අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.2.2 වගුව : පවත්වන ලද අභියාචනා කමිටු රැස්වීම් සංඛ්‍යාව**

| | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජකාරි කරන බ්‍රහස්පතින්දා දින සංඛ්‍යාව | 5 | 4 | 3 | 4 | 4 | 4 | 4 | 4 | 4 | 5 | 4 | 2 |
| පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | 5 | 3 | 4 | 1 | 3 | 3 | 3 | 3 | 3 | 4 | 3 | 3 |
| අනුගමන අනුපාතය | 100% | 75% | 133.3% | 25% | 75% | 75% | 75% | 75% | 75% | 80% | 75% | 150% |

*මූලාශ්‍රය : අභියාචනා අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.2.3 වගුව : අවසන් නොවූ අභියාචනා ගොනු**

| අවසන් නොවීමට හේතුව | අවසන් නොවූ අභියාචනා සංඛ්‍යාව |
|---|---|
| අංශය මගින් ඉදිරිපත් කිරීමට ඇති වාර්තා | 70 |
| අභියාචක විසින් ඉදිරිපත් කිරීමට ඇති වාර්තා | 00 |
| අනෙකුත් රේගු තාක්ෂණික කමිටු හෝ අධිකරණය මගින් ඉදිරිපත් කිරීමට ඇති වාර්තා | 06 |
| කමිටුව මගින් සමාලෝචනය කිරීමට ඇති අභියාචනා | 00 |
| **අවසන් නොවූ මුළු අභියාචනා** | **76** |

*මූලාශ්‍රය : අභියාචනා අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.6.3 මූල්‍ය අංශය

### 8.6.3.1 මූල්‍ය අංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය අංශය, දෙපාර්තමේන්තුව තුළ නිවැරදි මූල්‍ය කළමනාකරණය තහවුරු කිරීම, වගවීම ශක්තිමත් කිරීම, සහ මහජන සම්පත්/අරමුදල් කාර්යක්ෂමව භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අතිශය වැදගත් භූමිකාවක් ඉටු කරනු ලැබේ. මුදල් රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලවීම සහතික කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවට සහාය වීමේ දී මෙම අංශයේ කාර්යයන් ප්‍රධාන වේ.

රජයේ ආදායම නිසි ලෙස එකතු කිරීම, වාර්තා කිරීම සහ වාර්තාගත කිරීම සඳහා පහසුකම් සලසන නිවැරදි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාමේ වගකීම මූල්‍ය අංශය මගින් දරනු ලැබේ. මෙයට අමතරව, ඒ මගින් සුදුසු මූල්‍ය පාලනයක් සහතික කරමින් වගවීමේ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා රේගුවේ සියලු මෙහෙයුම් ඒකක සඳහා පූර්ණ මූල්‍ය කළමනාකරණ සහාය ලබාදෙයි.

රජයේ ප්‍රධානතම ආදායම් උත්පාදන ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා රේගුව රජයේ සමස්ත බදු ආදායමෙන් 50% කට වැඩි ප්‍රමාණයකට දායකවෙයි. මෙහිදී, ආදායම් නිරවද්‍යභාවය සුරක්ෂිත කිරීමේ දී සහ දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය මෙහෙයුම් ඵලදායීව සහාය වීම සහතික කිරීමේ දී මූල්‍ය අංශය තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලැබේ.

**8.6.3.2** දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් පිළිබඳ වගකීම මූල්‍ය අංශය මගින් දරනු ලැබේ.

අ. වියදම සහ ආදායම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.

ආ. බදු ආදායම සහ බදු නොවන ආදායම එකතු කිරීම, වාර්තාගත කිරීම සහ වාර්තා කිරීම.

ඇ. අනුමත අයවැය සීමාවන් තුළ වියදම කළමනාකරණය කිරීම සහ අමතර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ඈ. මුදල් කළමනාකරණය සහ බැංකු ගිණුම් අධීක්ෂණය කිරීම.

ඉ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, විගණකාධිපති සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් වෙත නියමිත කාල රාමුව අනුව මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

ඊ. විවිධ අරමුදල් සහ ගිණුම් පරිපාලනය කිරීම.
- i.රේගු තැන්පතු ගිණුම්;
- ii.රේගු ත්‍යාග අරමුදල;
- iii.රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂා කිරීම්, සහ තොරතුරු සහ සන්නිවේදන ගාස්තු අරමුදල;
- iv.රේගු නිලධාරීන්ගේ වන්දි සහ කළමනාකරණ අරමුදල;
- v.අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම;
- vi.රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් "බී" ගිණුම;

උ. වාර්ෂික විසර්ජන පනත සහ ජාතික විගණන පනත අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

ඌ. විගණකාධිපතිවරයා සහ අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂ විසින් මතු කරනු ලබන විගණන විමසුම් සහ වාර්තා පිළිබඳව පිළිතුරු, පැහැදිලි කිරීම් සහ නිරීක්ෂණ ලබාදීම.

එ. අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු (APIT) වලට අදාළ කටයුතු.

ඒ. සරප් කටයුතු පරිපාලනය කිරිම

### 8.6.3.3 ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා (CFO) ගේ අධීක්ෂණය යටතේ මූල්‍ය අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා වෙත පැවරී ඇති අතර දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය කළමනාකරණ කාර්යයන්හි අධීක්ෂණය, සම්බන්ධීකරණය හා පරිපාලනය මූල්‍ය අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇත.

මෙම වගකීම් සඳහා සහාය ලබා දීමට නියෝජ්‍ය අධ්‍යක්ෂවරු හතර දෙනෙක් සහ පරිපාලන නිලධාරියෙක් මේ සඳහා පත්කර ඇත. මීට අමතරව සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායකයින්ගෙන් සමන්විත 114 දෙනෙකු සහිත සහාය කාර්ය මණ්ඩලයක් මූල්‍ය අංශයට අනුයුක්ත කර ඇත.

මුදල් අංශයේ මනා ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා එය පහත උප අංශ යටතේ සංවිධානය වී ඇත.

- ආදායම් අංශය
- ගෙවීම් සහ බදු අංශය
- වැටුප් සහ අතිකාල අංශය
- අරමුදල් කළමනාකරණ ඒකකය
- විවිධ සේවා අංශය
- සරප් අංශය

### 8.6.3.4 ආදායම් අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) ගේ සෘජු අධීක්ෂණය යටතේ වන ආදායම් අංශය, රජයේ ආදායම කාර්යක්ෂමව සහ ආරක්ෂිතව එකතු කිරීම සහ වාර්තාගත කිරීම සහතික කිරීමේ දී කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කරනු ලැබේ. නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන යාම, ආදායම් වාර්තා කිරීම සහ රජයට අරමුදල් නිසිකලට මාරු කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා වන වගකීම මෙම අංශය මගින් දරනු ලබන අතර, එමඟින් මූල්‍ය ස්ථාවරත්වය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා සහාය ලබා දෙනු ලැබේ.

මෙම අංශය, රේගු මෙහෙයුම් මධ්‍යස්ථාන වල ස්ථාපිත කර ඇති එකතු කිරීමේ මධ්‍යස්ථාන 48 ක ජාලයක් මගින් තම ආදායම් එකතු කිරීමේ වගකීම් ඉටු කරනු ලැබේ. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සහ මහජන බැංකුවේ ඩියුක් වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආදායම් රැස් කිරීමේ ගිණුම් 02 ක් හා සම්බන්ධ උප ආදායම් රැස්කිරීමේ ගිණුම් 19 ක් මගින් මෙම ආදායම් රැස්කිරීමේ කාර්යයන්ට සහාය ලබා දෙයි.

ආදායම් අංශයේ ප්‍රධාන කාර්යයක් වනුයේ සියලුම ආදායම් එකතු කිරීම් නිවැරදිව වාර්තා කරන බව සහ විගසින්ම ප්‍රේෂණය කරනු ලබන බව සහතික කිරීමයි. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව මගින් එකතු කරනු ලබන ආදායම, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ගිණුමට දෛනික පදනමින් මාරු කරනු ලැබේ. නිසිකලට සිදුවන මෙම ප්‍රේෂණ යාන්ත්‍රණය මගින් රජයේ මූල්‍ය වගකීම් ප්‍රමාදයකින් තොරව ඉටු කිරීම සඳහා භාණ්ඩාගාරයට හැකියාව ලබාදෙන අතර, ජාතික මට්ටමේ මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය ද ශක්තිමත් කරයි.

මෙම අංශය, විනිවිදභාවය ඉහළ නැංවීම, ආදායම අහිමිවීම් අවම කිරීම, සහ මුදල් රෙගුලාසි හා අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම සහතික කිරීම සඳහා ද දායකත්වය ලබාදෙයි.

#### 8.6.3.4.1 ආදායම් අංශයේ ප්‍රධාන කාර්යයන්

- වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම.

  ජාතික අයවැය ඉලක්ක සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ වලට අනුකූලව වාර්ෂික ආදායම් පුරෝකථන සකස් කිරීම.

- ආදායම් එකතු කිරීම අධීක්ෂණය කිරීම සහ සැසඳීම
  දිවයින පුරා ඇති ආදායම් එකතු කිරීමේ මධ්‍යස්ථාන 48න් දෛනික මුදල් පත්‍රිකා එකතු කිරීම හා සත්‍යාපනය කිරීම සහ නිරවද්‍යතාවය හා සම්පූර්ණබව සහතික කිරීම සඳහා එම එකතු කිරීම් අදාළ බැංකු ප්‍රකාශන සමග සැසඳීම

- හිඟ ආදායම් මුදල් අයකර ගැනීම
  රාජ්‍ය ආයතන සහ අනෙකුත් ආයතනවලින් අයවිය යුතු හිඟ ආදායම් මුදල් පිළිබඳ පසු විපරම් කර ඒවා අයකර ගැනීම.

- භාණ්ඩාගාරය සහ අනෙකුත් අදාළ ආයතන වෙත ආදායම වාර්තා කිරීම
  පවරන ලද ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය ඇතුළුව දෛනික සහ මාසික ආදායම් කාර්යසාධන වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

- CIGAS වාර්තා ඉදිරිපත් කිරීම
  ආදායම එකතු කිරීම පිළිබඳ මාසික CIGAS සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

- ආදායම් ගිණුම් සකස් කිරීම
  දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ආදායම් ගිණුම සකස් කිරීමට සහාය වීම සහ එය විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම.

- **VAT ආපසු ගෙවීම් අරමුදල මාරු කිරීම**
- පවත්නා රෙගුලාසිවලට අනුකූලව, මාසික අගය එකතු කළ බදු (VAT) ආදායම් එකතු කිරීම්වලින් කොටසක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ VAT ආපසු ගෙවීම් අරමුදල වෙත මාරු කිරීම සහ ගිණුම්ගත කිරීම.
- ආදායම් ආපසු ගෙවීම් ක්‍රියාත්මක කිරීම
  **පහත දැක්වෙන කාණ්ඩ තුන යටතේ ආදායම ආපසු ගෙවීම ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම.**
  - **රේගු ආඥා පනතේ 18 සහ 22 වන වගන්ති වලට අනුකූලව ආපසු ගෙවීම් සිද්ධි භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.**
  - **මු.රෙ. 118 යටතේ වැඩිපුර ගෙවීම් සහ අමතර ගෙවීම් සඳහා ආපසු ගෙවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීම.**
  - **රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2020 යටතේ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සිදුකර ඇති ද්විකරණ දෝෂ හේතුවෙන් සිදුකරන ලද ගෙවීම් සඳහා ආපසු ගෙවීම් සිදුකිරීමට කටයුතු කිරීම.**

**8.6.3.1 වගුව : තථ්‍ය ආදායම එකතු කිරීම සහ වාර්ෂික ඇස්තමේන්තුව සැසඳීම - (රු. මි.)**

| ආදායම් කේතය | විස්තරය | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | තථ්‍ය | ඇස්තමේන්තුගත | තථ්‍ය |
| 1001.01.00 | ආනයන තීරු බදු | 175,000 | 111,147 | 240,000 | 275,894 |
| 1001.02.00 | අපනයන තීරු බදු | 35 | 27 | 32 | 18 |
| 1001.03.00 | IECD බලපත්‍ර ගාස්තු | - | - | - | 42 |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 175,000 | 170,014 | 177,000 | 180,853 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 58,000 | 79,133 | 87,700 | 88,728 |
| 1001.05.02 | අපනයන සෙස් බදු | 2,000 | 1,995 | 2,300 | 1,644 |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 95,000 | 115,199 | 145,000 | 164,599 |
| 1002.05.01 | නිෂ්පාදන බදු- සිගරට් | 143,000 | 117,145 | 100,000 | 101,173 |
| 1002.05.03 | පෙට්‍රල් හා ඩීසල් | 135,000 | 200,200 | 180,000 | 240,575 |
| 1002.05.04 | මෝටර් වාහන | 30,000 | 58,562 | 396,000 | 471,751 |
| 1002.05.99 | වෙනත් | 5,000 | 8,039 | 12,000 | 12,120 |
| 2003.07.10 | වාහන හිමිකම් බද්ද | 165 | 240 | 1,400 | 2,260 |
| 2003.02.17 | ඇඟළුම් අලෙවිය | - | 121 | - | 103 |
| 2003.03.01 | දඩ සහ රේගු රාජසන්තක කිරීම් | - | 8,024 | - | 5,415 |
| | මුළු රේගු ආදායම | **818,200** | **869,846** | **1,341,432** | **1,545,175** |
| 2004.04.02 | ආර්ථික සේවා ගාස්තු වටිනාකම | - | 201 | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද | - | 8 | - | 407 |
| 1002.01.04 | ආනයන මත එකතු කළ අගය මත බදු | 660,000 | 597,493 | 820,000 | 891,390 |
| 1002.16.00 | සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 55,000 | 64,392 | 70,000 | 72,614 |
| 1003.01.00 | සුඛෝපභෝගී වාහන බද්ද | - | 2,772 | - | 52,048 |
| 2003.02.99 | විවිධ | - | 297 | - | 383 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | - | 122 | - | 129 |
| | අනෙකුත් ආදායම් එකතුව | **715,000** | **665,285** | **890,000** | **1,016,971** |
| | | | | | |
| | මුළු ආදායම | **1,533,200** | **1,535,131** | **2,231,432** | **2,562,146** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.6.3.5 ගෙවීම් සහ බදු අංශය

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තු වලට අනුකූලව සියලුම ගෙවීම් සිදු කිරීම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගෙවීම්) ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ගෙවීම් අංශයේ වගකීම වේ.

ඒකාබද්ධ අරමුදල් ප්‍රතිපාදන යටතේ සිදු කරනු ලබන ගෙවීම් වලට අමතරව, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, රේගු ත්‍යාග අරමුදල, අතිකාල අරමුදල, අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම ඇතුළුව ශ්‍රී ලංකා රේගුව මගින් මෙහෙයවනු ලබන විවිධ අරමුදල් හා අත්තිකාරම් ගිණුම් වලට අදාළ ගෙවීම් සම්බන්ධව ද මෙම අංශය කටයුතු කරනු ලැබේ.

පරිගණකගත රජයේ ඒකාබද්ධ ගිණුම් පද්ධතිය (CIGAS) සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා මෙම අංශය ගෙවීම් සිදු කිරීම සහ කළමනාකරණය කිරීම සිදුකරනු ලැබේ.

**8.6.3.5.1** ගෙවීම් අංශයේ ප්‍රධාන කාර්යයන්

අදාල වර්ෂයන්හි ඇස්තමේන්තු හා සන්සන්දනාත්මකව **2024** සහ **2025** තුළ සිදුකරන ලද ගෙවීම් පහත දක්වා ඇත (**8.6.3.2** වගුව);

1. **අයවැය කළමනාකරණය**
   වාර්ෂික අයවැය සකස් කිරීම සඳහා තොරතුරු ඇතුළත් කිරීම, ITMIS පද්ධතියට අයවැය ඇස්තමේන්තු උඩුගත කිරීම, සහ අවශ්‍ය අවස්ථාවලදී අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අවශය පියවර ගැනීම.
2. වියදම් වාර්තාගත කිරීම සහ වාර්තා කිරීම
   නියමිත රෙගුලාසි වලට අනුව වියදම් දැරීමෙන් පසුව නිවැරදි වියදම් වාර්තා පවත්වාගැනීම සහ කාලානුරූප මූල්‍ය වාර්තා සකස් කිරීම .
3. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම කළමනාකරණය කිරීම
   රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අදාළව වියදම් සීමා නිර්ණය කිරීම සහ අධීක්ෂණය කිරීම .
4. බැංකු ගිණුම් පරිපාලනය
   මුදල් රෙගුලාසිවලට අනුකූලව දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම් දෙක පරිපාලනය කිරීම සහ පවත්වාගෙන යාම.
5. වියදම් පාලනය
   අනුමත අයවැය ප්‍රතිපාදන තුළ වාර්ෂික වියදම් අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම (රූ. බි. 6.3) .
6. ගෙවීම් සිදු කිරීම සහ සහතික කිරීම
   ස්ථාපිත කර ඇති මූල්‍ය කාර්යපටිපාටීන්ට අනුකූලව වැටුප්, භාණ්ඩ, කාර්යයන්, සහ සේවා වලට අදාළ ගෙවීම් සහතික කිරීම සහ සිදු කිරීම.
7. මාසික වියදම් වාර්තා ඉදිරිපත් කිරීම
   මාසික වියදම් ප්‍රකාශන CIGAS හරහා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
8. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම
   රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම ඇතුළුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ජාතික විගණන කාර්යාලයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
9. වැටුප් පරිපාලනය
   **SLIP** පද්ධතිය හරහා සේවකයින් **2300** කට ආසන්න සංඛ්‍යාවක් සඳහා වැටුප්, අතිකාල, ත්‍යාග, පරීක්ෂණ මණ්ඩල ගාස්තු, සංචිත ගෙවීම, දිරි දීමනා, ගමන් වියදම් ඇතුළු කාර්ය මණ්ඩල වේතන ගෙවීම් **SLIP** පද්ධතිය හරහා නියමිත දිනට ගෙවීම.

**8.6.3.2** වගුව : වියදම් කළමනාකරණය

| වියදම් කළමනාකරණය (රූ.මි.) | | | | | | |
|---|---|---|---|---|---|---|
| විස්තරය | **2024** | | | **2025** | | |
| | ඇස්තමේන්තු ගත | තත්‍ය | භාවිතා කළ % | ඇස්තමේන්තු ගත | තත්‍ය | භාවිතා කළ % |
| පුනරාවර්තන | 3,878 | 3,684 | 95% | 4,719 | 4,138 | 88% |
| ප්‍රාග්ධන | 594 | 459 | 77% | 1,830 | 342 | 19% |
| රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම | 55 | 32 | 58% | 55 | 55 | 100% |
| එකතුව | **4,527** | **4,175** | **92%** | **6,604** | **4,535** | **69%** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.3.6** බදු අංශය

දෙපාර්තමේන්තුවේ සේවකයින්ට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) පරිපාලනය කිරීමේ සහ APIT දත්ත සමුදාය කළමනාකරණය කිරීමේ වගකීම මූල්‍ය අංශය මගින් දරනු ලැබේ.
ශ්‍රී ලංකා රේගු සේවකයින් තම සාමාන්‍ය වැටුප්වලට අමතරව අතිකාල ගෙවීම්, දිරි දීමනා, ත්‍යාග, පැනල් ගෙවීම් සහ සංචිත ගෙවීම් ඇතුළු විවිධ මූල්‍ය ප්‍රතිලාභ ලබන බැවින්, රාජ්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වැදගත් බදු ගෙවන්නන් ලෙස සැලකේ. ඒ අනුව, බද්දට යටත් ආදායම මත පදනම්ව (taxable income) සෑම සේවකයෙකු සඳහා ම අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කිරීම බදු අංශය මගින් සිදු කරනු ලබන අතර, දේශීය ආදායම් පනත සහ අදාළ රෙගුලාසි වලට අනුකූලව එම බදු අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශණය කරන බවට සහතික වේ.

8.6.3.6.1 බදු අංශයේ කාර්යයන්

1. **අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කිරීම**
   ත්‍යාග, පැනල් ගෙවීම් සහ සංචිත ගෙවීම් ඇතුළුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිදු කරනු ලබන වැටුප් සහ අනෙකුත් ගෙවීම් මත මාසික පදනමින් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කිරීම.
2. **අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) අයකරගැනීම සහ ප්‍රේශණය කිරීම**
   සේවකයින්ගෙන් APIT අයකරගැනීම සහ එම එකතු කරගන්නා ලද බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වෙත නිසි කලට ප්‍රේශණය කිරීම.
3. **අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) දත්ත සමුදාය නඩත්තු කිරීම**
   දෙපාර්තමේන්තු සේවකයින්ට අදාළව APIT දත්ත සමුදාය නඩත්තු කිරීම සහ නිරන්තරව යාවත්කාලීන කිරීම.
4. **බදු වාර්තා නිකුත් කිරීම**
   ආදායම් බදු අවශ්‍යතා සඳහා අදාළ නිලධාරීන්ට බදු වාර්තා (T.10 ආකෘතිය) නිකුත් කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික බදු ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) විස්තර පහත පරිදි වේ;

8.6.3.3 වගුව : අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT)

| බදු වර්ෂය | සේවකයින් සංඛ්‍යාව | අයකරගන්නා ලද APIT බදු (රු.මි.) |
|---|---|---|
| **2024 අප්‍රේල් 01-2025 මාර්තු 31** | 3,312 | 1,938 |
| **2025 අප්‍රේල් 01-2026 මාර්තු 31** | 3,384 | 2,265 |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.3.7** වැටුප් හා අතිකාල අංශය

දෙපාර්තමේන්තුවේ සේවය කරන 2300 කට ආසන්න කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ අතිකාල ගෙවීමේ වගකීම නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැටුප් හා අතිකාල) ගේ සෘජු අධීක්ෂණය යටතේ ඇති වැටුප් හා අතිකාල අංශය වෙත පැවරී ඇත.

අංක. 1520/17 සහ 2007.10.26 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව, සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බැහැරව රේගු නිලධාරීන්ගේ සේවය ලබාගන්නා ආනයනකරුවන්, අපනයනකරුවන්, සහ අනෙකුත් පාර්ශවයන්ගෙන් අතිකාල ගාස්තු අයකර ගැනීමේ සහ ගිණුම්ගත කිරීමේ වගකීම ද මෙම අංශය වෙත පැවරී ඇත. මෙම ගාස්තු අය කරනු ලබන්නේ සාමාන්‍ය සේවා කාලයෙන් පරිබාහිරව රාජකාරි ඉටු කරන නිලධාරීන්ට දීමනා සැපයීම සඳහාය.

එසේ අයකරගත් මුදල්, දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන රේගු අතිකාල අරමුදල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු අරමුදල, සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අරමුදල් ගිණුමට බැරවේ. මෙම අරමුදල් මගින් සිදුකරනු ලබන ගෙවීම් අනුමත ගෙවීම් යෝජනා ක්‍රම අනුව සහ අදාළ මුදල් රෙගුලාසි වලට අනුකූලව සිදුකරනු ලැබේ. මෙම අරමුදල් නිසි පරිදි ගිණුම්ගත කිරීම, අධීක්ෂණය කිරීම, සහ වාර්තා කිරීම ද මෙම අංශය මගින් සහතික කරනු ලැබේ.

8.6.3.7.1 වැටුප් හා අතිකාල අංශයේ ප්‍රධාන කාර්යයන්

- වැටුප් ගෙවීම
  දෙපාර්තමේන්තුවේ 2,300 කට ආසන්න සේවකයින් සඳහා මාසික වැටුප් සැකසීම සහ නිසි කලට සහ නිවැරදිව ගෙවීම් සිදු කිරීම.
- වැටුප්/ආදායම් වාර්තා නිකුත් කිරීම
  බැංකු ණය, බදු ප්‍රකාශන, සහ අනෙකුත් පරිපාලන අවශ්‍යතා වැනි රාජකාරිමය අවශ්‍යතා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉල්ලා සිටින විට වැටුප් සහ ආදායම් සත්‍යාපන වාර්තා නිකුත් කිරීම
- අරමුදල් අයවැය සකස් කිරීම
  රේගු අතිකාල අරමුදල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු අරමුදල, සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අරමුදල සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.

- අතිකාල ආදායම ඇස්තමේන්තුගත කිරීම සහ එකතු කිරීම
  සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බාහිරව රේගු සේවා ඉල්ලා සිටිනු ලබන නාවික නියෝජිතයින්, ගුවන් සමාගම්, ගුදම් මෙහෙයුම්කරුවන්, සහ අනෙකුත් පාර්ශවකරුවන් ඇතුළු අදාළ පාර්ශවයන්ගෙන් අතිකාල ගාස්තු ඇස්තමේන්තු කිරීම සහ එකතු කිරීම.

- අතිකාල ගෙවීම
  සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බාහිරව රාජකාරීන් ඉටු කරනු ලබන නිලධාරීන්ට අතිකාල සකස් කිරීම සහ ගෙවීම.

- අවසන් ගිණුම් සකස් කිරීම
  රේගු අතිකාල අරමුදල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු අරමුදල, සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අරමුදලට අදාළව අවසන් ගිණුම් සකස් කිරීම.

ඒ අනුව, රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදලේ පසුගිය වසර දෙක සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය පහත වගුවල දැක්වේ.

**8.6.3.4** වගුව : රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල

| විස්තරය | රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල් (රු.මි.) | | | | | |
|---|---|---|---|---|---|---|
| | අතිකාල අරමුදල | | OE අරමුදල | | ICT අරමුදල | |
| | **2024** | **2025** | **2024** | **2025** | **2024** | **2025** |
| ආරම්භක ශේෂය | 1,652 | 1,514 | 334 | 410 | 7 | 5 |
| ලැබීම් | 908 | 1,118 | 307 | 373 | 15 | 16 |
| රජය සඳහා දායකත්වය | (89) | (110) | (116) | (86) | (3) | (4) |
| ගෙවීම් | (957) | (1,426) | (116) | (92) | (14) | (13) |
| **අවසන් ශේෂය** | **1,514** | **1,096** | **410** | **606** | **5** | **4** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

වැටුප් ගෙවීම පිළිබඳ විස්තර පහත දැක්වේ;

**8.6.3.5** වගුව : වැටුප් ගෙවීම

| වර්ෂය | සේවක සංඛ්‍යාව | ගෙවන ලද දළ වැටුප් (රු.මි.) |
|---|---|---|
| 2024 | 2,265 | 1,875 |
| 2025 | 2,279 | 2,244 |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.6.3.8 අරමුදල් කළමනාකරණ අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (අරමුදල් කළමනාකරණ) ගේ සෘජු අධීක්ෂණය යටතේ ඇති මෙම අංශය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන විවිධ තැන්පතු ගිණුම්වලට අදාළ අරමුදල් ලැබීම, වාර්තා කිරීම සහ ගිණුම්ගත කිරීම සඳහා වන වගකීම දරයි. මෙම ලැබීම් වලට ප්‍රධාන වශයෙන්ම දඩ, අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අලෙවියෙන් ලද මුදල් සහ අනෙකුත් විවිධ තැන්පතු ඇතුලත්වේ. දඩ සහ අලෙවියෙන් ලැබෙන මුදල් ප්‍රථමයෙන්ම ප්‍රධාන තාවකාලික රඳවාගැනීමේ තැන්පතු ගිණුමට බැර කරනු ලැබේ. නඩු කටයුතු සහ අභියාචනා ක්‍රියාවලිය නිමවූ පසුව, රේගු ආඥාපනතේ 153 වන වගන්තිය යටතේ අනුමත යෝජනාක්‍රම වලට අනුකූලව එකී ලැබීම් රේගු ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි සහ කළමනාකරණ අරමුදල සහ අනෙකුත් සංචිත අරමුදල් සඳහා මාරුකරනු ලැබේ.

#### 8.6.3.8.1 අරමුදල් කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යයන්

- අයවැය සැකසීම
  රේගු ත්‍යාග අරමුදල සහ රේගු නිලධාරීන්ගේ වන්දි සහ කළමනාකරණ අරමුදල සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම.
- අත්තිකාරම් ගිණුම් කළමනාකරණය
  අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම (ARABA Account) ඇතුළුව අනුමත අත්තිකාරම් ගිණුම්වල වියදම් සීමාවන් නිර්ණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

- තැන්පතු ලෙජර පවත්වාගෙන යාම
  ව්‍යවස්ථාපිත ගෙවීම්, ටෙන්ඩර් තැන්පතු, සහ අනෙකුත් විවිධ තැන්පතු වලට අදාළව තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු ගිණුම් සඳහා තැන්පතු ලෙජර පවත්වාගෙන යාම, සහ බැංකු හා සරප් කවුළු හරහා ලැබෙන සියලුම ලැබීම් වාර්තා කිරීම.
- දෛනික මුදල් වාර්තා කිරීම
  ගිණුම්කරණ හා වාර්තා කිරීමේ අරමුණු සඳහා සරප් කවුළු වලට අදාළ දෛනික මුදල් පත්‍ර (Daily Cash Sheets) සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම .
- අරමුදල් ලැබීම් බෙදාහැරීම
  ත්‍යාග ගෙවීම් සකස්කරන අවස්ථාවේ තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු ගිණුමෙන් රේගු ත්‍යාග අරමුදල, වන්දි අරමුදල, ඒකාබද්ධ අරමුදල, සහ අනෙකුත් අදාළ අරමුදල් වෙත මාරුකිරීමේ නියෝගයක් හරහා ලැබීම් මාරුකිරීම.
- විකිණුම් සහ දඩ මුදල් සත්‍යාපනය කිරීම
  ත්‍යාග ගෙවීම් ගොනු සැකසීමේදී වාර්තා වී ඇති අලෙවි සහ දඩ මුදල් සත්‍යාපනය කිරීම.
- නිලධාරීන් සඳහා ගෙවීම් සිදුකිරීම
  සේවකයින්ට ගෙවිය යුතු පරීක්ෂණ මණ්ඩල රාජකාරි, සංචිත රාජකාරි සහ පරීක්ෂණ ගාස්තු ගෙවීමට අදාළව ගෙවීම් කිරීම සඳහා ඉල්ලීම් පත්‍ර සැකසීම.
- අවසාන ගිණුම් සැකසීම
  රේගු ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු ගිණුම, සහ අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම **(ARABA)** සඳහා අවසන් ගිණුම් හා වාර්ෂික සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම.

ඒ අනුව, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන අතර එම මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කෙරේ.

**8.6.3.6** වගුව : රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල/ රේගු නිලධාරීන්ගේ වන්දි හා කලමනාකරණ අරමුදල

| විස්තරය | රේගු ත්‍යාග අරමුදල (රු.මි.) | | රේගු නිලධාරීන්ගේ කලමනාකරණ සහ වන්දි අරමුදල (රු.මි.) | |
|---|---|---|---|---|
| | **2024** | **2025** | **2024** | **2025** |
| ආදායම | 8,976 | 8,631 | 3,414 | 3,459 |
| වියදම | (8,507) | (8,237) | (67) | (63) |
| අතිරික්තය | 469 | 394 | 3,347 | 3,397 |
| ස්ථාවර වත්කම් | - | - | 5 | 2.33 |
| අරමුදල් ශේෂය | 2,313 | 2,707 | 15,837 | 19,237 |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.3.8.2** අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම

ඉහත අරමුදල් වලට අමතරව, නීතිවිරෝධී ලෙස ආනයනය හෝ අපනයනය කරන ලද සහ ඉන්පසුව රේගුව විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ සහ අයිතම අපහරණය සඳහා වන වියදම් පියවීම සඳහා මෙම අංශය විසින් "අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම (ARABA)" නමින් අත්තිකාරම් ගිණුමක් ද පවත්වා ගෙන යනු ලැබේ.

එම භාණ්ඩ ගබඩා කිරීම, මෙහෙයවීම, ප්‍රවාහනය, සහ අපහරණය සඳහා වැයවන මුදල් පළමුව මෙම ගිණුම හරහා පියවාගෙන පසුව අදාල රාජසන්තක කරන ලද භාණ්ඩ අලෙවි කිරීමෙන් ලැබෙන මුදල් මගින් පියවා ගනී.

අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුමේ පසුගිය වසර දෙකක විස්තර පහත දැක්වේ:

**8.6.3.7** වගුව : පසුගිය වර්ෂ දෙක සඳහා අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම

| විස්තරය | 2024 (රු.මි.) | | | 2025 (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | වියදම | ලැබීම් | ශේෂය | වියදම | ලැබීම් | ශේෂය |
| සීමාවන් | 16 | 05 | 70 | 20 | 1.5 | 80 |
| තථ්‍ය | 11 | 14 | 28 | 7 | 1.6 | 34 |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

ඉහත අරමුදල් සහ අත්තිකාරම් ගිණුම් වලට අමතරව මෙම අංශය යටතේ පහත දැක්වෙන තැන්පතු ගිණුම් ද **(8.6.3.8 වගුව)** පවත්වා ගෙන යනු ලැබේ.

**8.6.3.8** වගුව : තැන්පතු ගිණුම් විස්තර

| විස්තරය | තැන්පතු ගිණුමේ නම (රු.මි.) | | | | | |
|---|---|---|---|---|---|---|
| | ටෙන්ඩර | | ව්‍යවස්ථාපිත ගෙවීම් මත තාවකාලික රඳවා ගැනීම් | | මගීන් විසින් රැගෙන එන භාණ්ඩ සඳහා තැන්පතු රඳවා ගැනීම | |
| | 2024 | 2025 | 2024 | 2025 | 2024 | 2025 |
| ආරම්භක ශේෂය | 74 | 106 | 16,250 | 17,756 | 1 | 0.4 |
| වසර තුළ ලැබීම් | 669 | 164 | 46,033 | 51,168 | 11 | 12.7 |
| | **743** | **271** | **62,283** | **68,925** | **12** | **13.1** |
| වසර තුළ ගෙවීම් | (637) | (191) | (44,527) | (46,504) | (11) | (12.9) |
| අවසන් ශේෂය | **106** | **80** | **17,756** | **22,420** | **0.4** | **0.2** |

*මූලාශ්‍රය : මූල්‍ය අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.6.3.9 විවිධ සේවා අංශය

විවිධ සේවා අංශයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ;

- පරිපාලනමය සහාය
  මූල්‍ය අංශයට පොදු පරිපාලනමය සහ මෙහෙයුම් සහාය ලබාදීම.
- පිරිස් පරිපාලනය
  කාර්ය මණ්ඩල පැමිණීම, නිවාඩු පරිපාලනය, සහ කාර්යාල ගබඩා කළමනාකරණය කිරීම සුපරීක්ෂණය.
- ආදායම් වාර්තා නිකුත් කිරීම
  රාජකාරිමය අවශ්‍යතාවන් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ආදායම් සත්‍යාපන වාර්තා නිකුත් කිරීම.
- තැපැල පරිපාලනය
  මූල්‍ය අංශයට අදාළව නිල ලිපි හුවමාරු සහ තැපැල මෙහෙයවීම සහ පරිපාලනය කිරීම.
- ලිපිගොනු ලියාපදිංචි කිරීම
  ත්‍යාග,සංචිත, සහ පරීක්ෂණ මණ්ඩල ගෙවීම්වලට අදාළව ලිපිගොනු ලියාපදිංචි කිරීමේ කටයුතු මෙහෙයවීම.

### 8.6.3.10 සරප් අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) ගේ අධීක්ෂණය යටතේ පරිපාලන නිලධාරිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන සරප් අංශය, මුදල් ගනුදෙනු මෙහෙයවීම සහ නිල ලදුපත් නිකුත් කිරීමේ වගකීම දරයි.

කොළඹ වරාය, රේගු මූලස්ථානය, කටුනායක ගුවන්තොටුපල, මත්තල ගුවන්තොටුපල, හම්බන්තොට සහ පලාලි ගුවන්තොටුපල ඇතුළු දිවයින පුරා පිහිටි ස්ථානවල සරප් කවුන්ටර් 15 ක් පිහිටුවා ඇත. එයින් කවුන්ටර 10ක් අඛණ්ඩ ආදායම එකතු කිරීමට පහසුකම් සැලසීමට සහ ආනයනකරුවන්ට, අපනයනකරුවන්ට, සහ අනෙකුත් පාර්ශවයන්ට අඛණ්ඩ සේවාවක් ලබාදීම සඳහා දින 7ම පැය 24ම විවෘතව පවතී.

## 8.6.4 පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

### 8.6.4.1 හැඳින්වීම

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රධානියා වන්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකි. අක්‍රමිකතා නැවත සිදුවීම සහ සුපිළිපන්භාවයේ අඩුපාඩු වළක්වා ගැනීම සඳහා ක්‍රමවත් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ දී මෙහෙයුම් කළමනාකරණයට සහය වීම සහ ඒ හා සම්බන්ධ අවදානම් වලට අනුකූලව අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම මෙම නව අංශය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාව විය.

දෙපාර්තමේන්තුවේ සියලු අංශයන්හි සෑම මූලික ක්‍රියාවලි සහ සහාය ක්‍රියාවලින්හි දී සම්පත් භාවිතයේ ඵලදායිතාවය සහ අරපිරිමැසුම් බව ඇගයීම සඳහා විගණනයන් සිදු කිරීම මෙම අංශයේ විෂය පථයට අයත්වේ.

### 8.6.4.2 ප්‍රධාන කාර්යයන්

- හැකි සෑම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් එකතුවන බව සනාථ කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- 
  - මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය හා සුපිළිපන්බව
  - මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය
  - වත්කම් ආරක්ෂා කිරීම
  - නීති, රෙගුලාසි හා ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීම

  ඇතුලුව ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාළව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීම.
- අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුව මත පදනම්ව විගණන සැලසුම් සකස් කිරීම හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
- හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව හෝ ඉහළ කළමනාකරණය විසින් ඉල්ලා සිටි විට හෝ අවශ්‍ය විට එම තොරතුරු ලබා දීම.
- දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල අපේක්ෂිත පරිදි කෙතරම් දුරට තීරණය කරන ලද ඉලක්ක හා අරමුණු සමඟ අනුකූලදැයි නිශ්චය කර ගැනීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
- 
  - ආයතනය තුළ සුදුසු ආචාර ධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම
  - ඵලදායී අයුරින් ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගවීම සහතික කිරීම

  යන අරමුණු ඉටුකර ගැනීම උදෙසා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තක්සේරු සිදුකිරීම සහ ඒ අනුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

**8.6.4.1 වගුව : මෙම අංශයේ අනුකූලතා වාර්තාව**

| අංකය | අදාල අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදි අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මුරෙ 445) | | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය පවත්වාගෙන ගොස් ඇති අතර යාවත්කාලීන කර ඇත. | අනුකූල වේ | | |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කර ඇත. | අනුකූල වේ | | |
| 6 | අභ්‍යන්තර විගණන | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6.1 | මු.රෙ 134(2) සහ DMA/1-2025 අනුකූලව විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව වසර ආරම්භයේදීම අභ්‍යන්තර විගණන සැලසුම සකස් කර ඇත. | මු.රෙ. 134(2) සහ DMA/1-2025 අනුකූලව සකස් කර ඇති අතර අභ්‍යන්තර විගණන සැලසුම විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගැනීමෙන් පසුව සකස් කර ඇත. | | | |
| 6.2 | සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් තුළ පිළිතුරු සපයා ඇත. | පිළිතුරු ලැබී ඇත. (මාසයක් අතුළත) | පිළිතුරු ලැබී ඇත. (මාසයක කාලයක් ඉක්මවා) | එදිනෙදා කාර්යයන්හි කාර්යබහුලත්වය හේතුවෙන් | ඉක්මනින් පිලිතුරු ලබාගැනීම සඳහා සිහිකැඳවීම් ගණනාවක් නිකුත් කිරීම සහ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීම |
| | | 30 | 21 | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. | ඔව් | | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. | ඔව් | | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටුව | | | | |
| 7.1 | DMA/ -1-2025 චක්‍රලේඛය අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත. | ඔව් | | | |

*මූලාශ්‍රය : පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය, ශ්‍රී ලංකා රේගුව*

## 8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

### 8.6.5.1 හැඳින්වීම

1990 අංක 40 දරන පනත සහ 1994 අංක 08 දරන පනත මගින් සංශෝධිත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, ශ්‍රී ලංකා රජයේ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන නෛතික මූලාශ්‍රය වේ.

මුදල් අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය විසින් ජාතියේ සුභසිද්ධිය උදෙසා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ ඇති විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝග බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය ලෙස ජාතික වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

### 8.6.5.2 ප්‍රධාන කාර්යයන්

1. සිගරැට් හා අනෙකුත් අදාල නිෂ්පාදන ආයතන අධීක්ෂණය කිරීම සහ නියාමනය තුළින් නිවැරදි ලෙස ආදායම එකතු කිරීම.
2. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ නීති බලාත්මක කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම සහ නිෂ්පාදන බදු වලට යටත් අදාළ ආනයනික සහ දේශීයව නිෂ්පාදිත අයිතමයන් මත පැනවෙන නිෂ්පාදන බදු රැස් කිරීම.
3. නිෂ්පාදන බදු පැනවීම සම්බන්ධ කටයුතුවල නිරතවීම.

### 8.6.5.3 අරමුණු

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ අරමුණු වඩාත් පුළුල් ආකාරයෙන් පහත පරිදි හඳුනාගනු ලැබිය හැකිය :-

අ. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම.

ආ. ඛනිජ තෙල්, සිගරැට්, සිසිල් බීම, තුරඟ ප්‍රකාශන, දේශීයව එකලස් කරන ලද වාහන, මේද අම්ල, පලතුරු බීම හා නිෂ්පාදන බද්දට අයත් අනෙකුත් අයිතම වල බදු ආදායම එකතු කිරීම සහ සුරක්ෂිත කිරීම.

### 8.6.5.4 පද්ධති සහ ක්‍රියා පටිපාටි

මෙම අංශය ආරම්භ කළ දින සිට පනත යටතේ සාදන ලද රෙගුලාසි සහ නියෝග ඇතුළත් ගැසට් නිවේදන කලින් කලට නිකුත් කරනු ලැබ ඇත. නිෂ්පාදන බදු වල ව්‍යුහය ද ඉහත රෙගුලාසි සහ නියෝගයන්ට අනුව ක්‍රියාත්මක කරනු ලැබිණි.

### 8.6.5.5 2025 වර්ෂය තුළ සිදුකළ ප්‍රධාන වෙනස්කම්

සිගරට්/සිසිල් බීම සඳහා නිෂ්පාදන බදු

i. 2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය මගින් නියෝග සංශෝධනය වේ. (2025 වර්ෂය තුළ එකී ගැසට් නිවේදනය මගින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS code) සඳහා සංශෝධිත බදු අනුපාත පහත දැක්වේ)

| ගැසට් නිවේදන අංකය | දිනය | බලාත්මක වන දිනය | සංයෝජිත වර්ගීකරණ (HS) සංකේතාංකය | නිෂ්පාදන බදු අදාල වන අයිතම |
|---|---|---|---|---|
| 2418/43 | 10.01.2025 | 11.01.2025 | 2106.90.32 | පසු සම්මිශ්‍රණ (සංයුක්ත පාන වර්ග) ලීටරයකට රු. 72 |
| | | | 2201.10.90 | ලීටරයකට රු. 31 (සෝඩා) |
| | | | 2202.10 | ලීටරයකට රු. 15 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින් ග්‍රෑමයකට ශත 36 යන දෙකෙන් වැඩි අගය (සිසිල් බීම) |
| | | | 2202.99.30 | ලීටරයකට රු. 15 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින් ග්‍රෑමයකට ශත 36 යන දෙකෙන් වැඩි අගය (ශක්තිජනක පාන) |
| | | | 2202.99.51 | නිෂ්පාදිතයේ අඩංගු සීනි මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින් ග්‍රෑමයකට ශත 36 ( පළතුරු බීම) |
| | | | 2402.20 | සිගරට් |

ii.

(අ) ලියාපදිංචි දේශීයව එකළස් කරන ලද වාහන සමාගම් - නැත
(ආ) MIB ක්‍රියාවලිය යටතේ කර්මාන්ත හා සේවා අංශයට සම්බන්ධ අනෙකුත්.
(ඇ) ඉහත (ආ) ක්‍රියාවලිය පිළිබඳ නීතිපති උපදෙස් මෙතෙක් ලැබී නැත.

**8.6.5.1 වගුව : නිෂ්පාදන බදු අදාල වන වන අයිතම සහ 2024 වර්ෂය තුළ රැස්කරන ලද ආදායම (දේශීය)**

| | රු. බිලියන |
|---|---:|
| සිගරට් | 106.662 |
| ඛණිජ තෙල් (Petroleum) | 42.128 |
| මෝටර් රථ (දේශීයව එකළස් කරන ලද) | .130 |
| සිසිල් බීම | 3.674 |
| තුරඟ ප්‍රකාශන (Race Publication) | .018 |
| විදුලි භාණ්ඩ (දේශීය) අනෙකුත් | - |
| පළතුරු බීම | .183 |
| මේද අම්ල | - |
| උසාවි ආදායම (Court Revenue) | - |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | .001 |
| **මුළු එකතුව** | **152.796** |

*මූලාශ්‍රය : නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය, ශ්‍රී ලංකා රේගුව*

**8.6.5.2 වගුව : නිෂ්පාදන බදු ආදාල වන වන අයිතම සහ 2025 වර්ෂය තුළ රැස්කරන ලද ආදායම (දේශීය)**

| | රු. බිලියන |
|---|---:|
| සිගරට් | 110.397 |
| ඛණිජ තෙල් | 38.252 |
| මෝටර් රථ (දේශීයව එකළස් කරන ලද) | .070 |
| සිසිල් බීම | 2.400 |
| තුරඟ ප්‍රකාශන (Race Publication) | .040 |
| විදුලි භාණ්ඩ (දේශීය) අනෙකුත් | 0 |
| පළතුරු බීම | .300 |
| මේද අම්ල | .001 |
| උසාවි ආදායම (Court Revenue) | 00 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | 0 |
| **මුළු එකතුව** | **151.460** |

*මූලාශ්‍රය : නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය, ශ්‍රී ලංකා රේගුව*

### 8.6.5.6 නෛතික කටයුතු

හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීම සඳහා නිෂ්පාදන බදු ගෙවීම පැහැර හරිනු ලැබූ නිෂ්පාදන සමාගම් වලට විරුද්ධව නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබ ඇත. විස්තර පහත දක්වා ඇත.

| | |
|---|---|
| පෙනී සිටින ලද නඩු සංඛ්‍යාව | 03 |
| ඉදිරියට ගෙන ගිය නඩු සංඛ්‍යාව | 03 |
| වර්ෂය තුළදී ගොනු කළ නඩු සංඛ්‍යාව | 01 |
| වර්ෂය තුළදී අයකර ගත් ආදායම | - |

## 8.6.6 අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU)

### 8.6.6.1 හැඳින්වීම

මෙහෙයුම් සහ ශ්‍රම බලකා සුපිළිපන්භාවය වර්ධනය කිරීම සහ ආරක්ෂාකිරීම උදෙසා ශ්‍රී ලංකා රේගුව තුළ තීරණාත්මක ඒකකයක් ලෙස අභ්‍යන්තර කටයුතු ඒකකය ක්‍රියා කරයි. ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වලට අනුකූල වීම සහතික කිරීම සහ විෂමාචාර සහ දූෂිත ක්‍රියා සම්බන්ධ චෝදනා විමර්ශනය කිරීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීමේ වගකීම ද අභ්‍යන්තර කටයුතු ඒකකය දරයි. විශේෂයෙන්ම, සේවකයින් සම්බන්ධවිය හැකි අභ්‍යන්තර දූෂණ ක්‍රියාකාරකම්, අපරාධමය නොවන සේවක විෂමාචාර සහ නියෝජිතායතන මෙහෙයුම් සහ සම්පත් වලට අදාළ අනෙකුත් දුර්වල කළමනාකරණ ගැටළු කෙරෙහි අභ්‍යන්තර කටයුතු ඒකකය අවධානය යොමු කරනු ලැබේ.
අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් සිදුකරන කාර්යයන් ශ්‍රී ලංකා රේගුවේ සහ එහි මෙහෙයුම්වල සුපිළිපන්භාවය තහවුරු කිරීමට උපකාරී වන අතර, ආයතනය සහ එහි සේවකයන් වෘත්තීය හැසිරීම හා වගකීම් පිළිබඳ ඉහළම ප්‍රමිතීන්ට යටත්ව කටයුතු කරන බව තහවුරු කරයි. එමඟින් ආයතනය, එහි නායකත්වය සහ ඉදිරිපෙළ ශ්‍රම බලකාය පිළිබඳ විශ්වාසය ගොඩනඟනු ලැබේ.
සාරාංශයක් ලෙස, අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය සහ සුපිළිපන්භාවය තහවුරු කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මෙම ඒකකයට පැමිණිලි භාර ගැනීම හා විමර්ශනය කිරීම, විනය ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම, දූෂණය වැළැක්වීම සහ ආයතනික වගවීම ශක්තිමත් කිරීම සඳහා බලය ලබා දී ඇත .

### 8.6.6.2 නෛතික විෂය පථය සහ මූලික ලේඛන

රේගු ආඥාපනතේ සහ වෙනත් යම් අදාළ නීතිවල ප්‍රතිපාදන මෙන්ම රජයේ නිලධාරීන්ට අදාල වන පරිපාලනමය සහ මුදල් රෙගුලාසි වලින්, අභ්‍යන්තර කටයුතු ඒකකයේ මෙහෙයුම් පාලනය වන නෛතික රාමුව සකස් වේ.
මෙයට අමතරව, 2024.02.02 දිනැති අංක 1647 දරන දෙපාර්තමේන්තු නියෝගය, අංක PS/SB/Circular/2/2025 සහ 2025 පෙබරවාරි 18 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අදාළ ප්‍රතිපාදන මගින් අභ්‍යන්තර කටයුතු ඒකකයේ මෙහෙයුම් පාලනය වේ.

### 8.6.6.3 අභ්‍යන්තර කටයුතු කමිටුව

අභ්‍යන්තර කටයුතු ඒකකයට ලැබෙන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ තනතුරේ හෝ ඊට ඉහළ තනතුරක ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ස්ථාපනය කර ඇත. එම පැමිණිලි සම්බන්ධ මූලික විමර්ශන අවසන් කිරීමෙන් පසුව නිර්දේශ ද සමග කමිටුව විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඍජුවම වාර්තා කරනු ඇත.

### 8.6.6.4 ප්‍රධාන වගකීම්

- මහජනතාවගෙන්, බලපෑමට ලක්වූ පාර්ශවයන්ගෙන් සහ ඇල්මැති පාර්ශවයන්ගෙන් පැමිණිලි ලබාගැනීම
- ලැබුණු පැමිණිලි සම්බන්ධව මූලික විමර්ශන/ පරීක්ෂණ පැවැත්වීම
- ලැබුණු පැමිණිලි සම්බන්ධව ගැනීමට අවශ්‍ය පියවර සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කිරීම
- සුපිළිපන්භාවය වැඩිදියුණු කිරීමේ සමාරම්භයන් (initiatives) ක්‍රියාත්මක කිරීම

### 8.6.6.5 පැමිණිලි ලැබෙන ආකාර

- විද්‍යුත් තැපැල
- දුරකථනය
- ෆැක්ස්
- ජංගම දුරකථන
- වට්ස්අප් (WhatsApp)
- තැපැල් මගින්
- පැමිණිලි පෙට්ටිය
- පැමිණ භාරදීමෙන්

### 8.6.6.6 කාර්යසාධන විශ්ලේෂණය

#### 8.6.6.6.1 පැමිණිලි සාරාංශය

**8.6.6.1** වගුව : පැමිණිලි සාරාංශය

| වර්ෂය | පැමිණිලි සංඛ්‍යාව | අවසන් කළ සිද්ධි සංඛ්‍යාව | සිදු කෙරෙමින් පවතින විමර්ශන | වැඩ තහනම්කල නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2024 | 24 | 06 | 18 | 04 |
| 2025 | 36 | 13 | 23 | 00 |

*මූලාශ්‍රය : අභ්‍යන්තර කටයුතු ඒකකය, ශ්‍රී ලංකා රේගුව*

#### 8.6.6.6.2 ආචාර ධර්ම සංග්‍රහය (Code of Ethics) ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

සඵලදායී රේගු සුපිළිපන් වැඩසටහනක් ස්ථාපිත කිරීම සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම වැදගත් සහ අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස ලෝක රේගු සංවිධානයේ සංශෝධිත අරුෂා ප්‍රකාශනය (Arusha Declaration) මගින් හඳුනාගනී.
මෙම මූලධර්මයන්ට අනුකූලව, සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග මගින් ආර්ථික පාලනය ශක්තිමත් කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමග සහයෝගීතාවයෙන් යුතුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සහ “පිරිසිදු ශ්‍රී ලංකාවක්” (Clean Sri Lanka) සමාරම්භය යටතේ රජයේ නිලධාරීන් සඳහා නව ආචාර ධර්ම සහ චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීමට 2025 වර්ෂයේ දී ජාතික ප්‍රයත්නයක් ආරම්භ කරන ලදී.
ඒ අනුව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මඟපෙන්වීම සහ මෙහෙයවීම යටතේ, රේගු සේවය තුළ සුපිළිපන්භාවය සහ වෘත්තීමයභාවය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව සහ ජාතික ප්‍රමුඛතා සහ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතාවන්ට අනුකූලව ශ්‍රී ලංකා රේගුවේ සේවකයින් සඳහා නව චර්යා ධර්ම සහ ආචාර ධර්ම සංග්‍රහයක් වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් ආරම්භ කරන ලදී.
ආචාර ධර්ම සහ චර්යා ධර්ම සංග්‍රහය තුළ වෘත්තීය හැසිරීම, තීරණ ගැනීම සහ වගකීම් සඳහා මඟපෙන්වීම සිදු කරනු ලබන මූලධර්ම සහ ප්‍රමිති දක්වා ඇත. ශ්‍රී ලංකා රේගුව තම රාජකාරීන් ඉටු කිරීමේදී සුපිළිපන්භාවය, විනිවිදභාවය, වගවීම සහ ගෞරවය කෙරෙහි දක්වනු ලබන කැපවීම ඒ මගින් නිරූපණය වේ.
ශ්‍රී ලංකා රේගුවේ නව ආචාර ධර්ම සහ චර්යා ධර්ම සංග්‍රහය සකස්කිරීම 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, එය ජාත්‍යන්තර රේගු දින සැමරුමට සමගාමීව 2026.1.26 වන දින නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

#### 8.6.6.6.3 දූෂණ අවදානම් ඇගයීම (CRA)

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද මගපෙන්වීම් සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) සහ ලෝක රේගු සංවිධානය (WCO) මගින් ලබා දෙන ලද මාර්ගෝපදේශ වලට අනුව අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) මගින් දූෂණ අවදානම් ඇගයීම (CRA) සිදු කරන ලදී. රේගුවේ අංශවල පවත්වන ලද වැඩමුළු සහ සම්මුඛ සාකච්ඡා ඇතුළුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ඇතිව බඳු සහ රේගු ප්‍රවීණයෙකු වන ආචාර්ය. Bernd Schlenther විසින් තාක්ෂණික සහාය ලබදෙන ලදී.
ඉන්පසුව, ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර හඳුනාගනිමින්, සම්භාවිතාව සහ බලපෑම තක්සේරු කරමින්, පවත්නා අවදානම් අවම කිරීමේ (mitigation) ක්‍රියාමාර්ග ඇගයීම සිදු කරමින්, සහ ප්‍රතිශෝධන ක්‍රියාමාර්ග යෝජනා කරමින් අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් සම්පූර්ණ දූෂණ අවදානම් ඇගයීමක් (CRA) සිදු කරන ලදී. අංශ 28කින් තොරතුරු රැස්කර, සත්‍යාපනය කර සහ ප්‍රමිතිකරණය කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සකස් කරන ලද අවසන් වාර්තාවට ඒවා ඒකරාශී කර ඇත.

#### 8.6.6.6.4 දැනුවත් කිරීමේ සහ වැළැක්වීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය, දූෂණ විරෝධී සහ සුපිළිපන්භාවය සංවර්ධන කිරීමේ කේෂේත්‍ර ආවරණය වන විවිධ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා තම දායකත්වය ලබාදී ඇත.
උදා:

- රේගු පරීක්ෂකවරුන් සඳහා ආචාර ධර්ම සහ දූෂණ විරෝධීභාවය පිළිබඳ පුහුණු වැඩසටහන
- සහකාර නිවාරණ නිලධාරීන් සඳහා දූෂණ විරෝධීභාවය සහ සුපිළිපන්භාවය සංවර්ධන කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- රේගු මූලස්ථාන නියෝජිතයින් සඳහා දූෂණ විරෝධීභාවය සහ සුපිළිපන්භාවය සංවර්ධන කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- අළුතින් බඳවා ගන්නා ලද සහකාර රේගු නිලධාරීන් සඳහා දූෂණ විරෝධීභාවය සහ සුපිළිපන්භාවය සංවර්ධන කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

- අභ්‍යන්තර කටයුතු ඒකකය විවෘත කිරීමේ උත්සවයේ දී අභ්‍යන්තර කටයුතු ඒකකයේ විධිනියෝග (mandate) පිළිබඳව පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

8.6.6.6.5 පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම

දෙපාර්තමේන්තුවේ පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම පිළිබඳව උපදෙස් හා මාර්ගෝපදේශ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අභ්‍යන්තර කටයුතු ඒකකයට ලැබී තිබේ.
ඒ අනුව, ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශයේ සහයෝගයෙන් යුතුව ජාතික ප්‍රතිපත්ති මාර්ගෝපදේශ වලට අනුකූලව පුරවැසි ප්‍රඥප්තිය (Citizen Charter) සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

8.6.6.7 ඉදිරි ක්‍රියාමාර්ග

- ඩිජිටල් පැමිණිලි කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම
- කලින් කලට සිදු කරන සුපිළිපන්භාවය පිළිබඳ විගණන
- අඛණ්ඩ දැනුවත් කිරීම සහ ධාරිතා සංවර්ධන වැඩසටහන්
- අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

8.6.6.8 නිගමනය

වාර්තා කිරීමේ කාල සීමාව තුළ අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම, විමර්ශන කාර්යක්ෂමතාවය, සහ වැළැක්වීමේ සුපිළිපන් පියවර පිළිබඳව සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. අඛණ්ඩ ආයතනික ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකා රේගුව තුළ වගවීම, විනිවිදභාවය, සහ මහජන විශ්වාසය තව දුරටත් වර්ධනය වනු ඇත.

# ඇමුණුම

Annexure – I

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } PUR/A/CUS/2025/FA/01 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 ජූනි 10 දින

රේගු අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා රේගුව

**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව සමග විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

RECEIVED 25 JUN 2026 S.L. Customs P.P.& R. Division 9760

RECEIVED 25 JUN 2026 D. G. C. 644

එස්. රත්නවීර

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් : 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

02. ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

DC (PPRD) 06/25

SDDC (Admin)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. PUR/A/CUS/2025/FA/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 ජූනි 10 දින

RECEIVED
25 JUN 2026
S.L. Customs
P.R& R. Division

ගණන්දීමේ නිලධාරී
ශ්‍රී ලංකා රේගුව

**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය **247** - **ශ්‍රී ලංකා රේගුවේ** 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රේගුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා රේගුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා රේගුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබාගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

රේගු දෙපාර්තමේන්තුවට අදාල භිහ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ-1(i)) අනුව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් නොමැතිවුවද, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රේගුවට ගෙවිය යුතු මුදල රු.8,928,747,724 ක් සහ රේගුවෙන් ලැබිය යුතු මුදල රු.182,059,986 ක් වශයෙන් දක්වා තිබුණි.

### 1.6.2 ආදායම් නොවන ලැබීම්

පරීක්ෂණ අවසන් වූ රේගු විමර්ශනයන් 252 කට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු.7,151,811,103 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.6.3 පුනරාවර්තන වියදම්

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විදුලි වියදම් සඳහා රු. 41,035,059 ක් සහ ආහාර පාන සැපයුම් වෙනුවෙන් රු. 4,487,076 ක් ශ්‍රී ලංකා රේගුවෙන් ලැබියයුතු ශේෂයන් ලෙස දක්වා තිබුණද, රේගු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියට ආහාර පාන සැපයුම් වෙනුවෙන් පමණක් රු.4,687,253 ක් ගෙවීමට ඇති බව දක්වා තිබුණි. ඒ අනුව, එම ශේෂයන් අතර රු.40,834,882 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.4 මූල්‍ය නොවන වත්කම්

(අ) ශ්‍රී ලංකා රේගුවේ මූලස්ථානය පිහිටා ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩමේ වටිනාකම රු.2,983,500,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ඉඩම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිණුම් පොත්වල ද රු. 947,500,000 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති ශ්‍රී ලංකා රේගුව සතු ඉඩම් කැබලි 5 ක සහ ගොඩනැගිල්ලක වටිනාකම වූ පිළිවෙලින් රු.161,895,000 ක් හා රු. 9,520,000 ක් ගිණුම් ගත නොකිරීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය ප්‍රකාශනවල

මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. 171,415,000 කින් අවප්‍රමාණය වී තිබුණි. එසේම ශ්‍රී ලංකා රේගුවට අයත් තවත් ඉඩම් කැබලි 06 ක් ඒවායේ ඉදිකර ඇති ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රේගුවේ අයිතියට මෙතෙක් පවරාගෙන නොමැති සහ රේගුවේ කටයුතු සඳහා ඵලදායි ලෙස භාවිතාකර නොමැති ඉඩම් කොටස් 4ක් රු. 450,600,000 ක වටිනාකමකට මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් වාර්තා කිරීමේ සඳහාම යටතේ වූ ඡේද අංක 05 අනුව, වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ පිරියත උපකරණ ලෙස හඳුනාගනු ලබන බව දක්වා තිබුණි. ශ්‍රී ලංකා රේගුවට බහාලුම් පරිලෝකන යන්ත්‍රයක් මිලදී ගැනීමට 2021 ජුනි 08 දින එළඹී ගිවිසුමේ ඡේද අංක 3.1 ප්‍රකාරව දින 180 කින් පළමු වාරික තුන ගෙවීමෙන් පසුව වත්කමේ අයිතිය ශ්‍රී ලංකා රේගුවට හිමිවී තිබුණු අතර පළමු වාරිකය ගෙවීමෙන් පසු වත්කමේ ආර්ථික ප්‍රතිලාභ රේගුවට ලැබී තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වත්කමේ සම්පූර්ණ වටිනාකම වන රු.4,527,253,592.35 ක් ගිණුම් ගතකරනු වෙනුවට වර්ෂය අවසානය වන විට ගෙවා තිබූ රු. 3,157,801,585 ක් පමණක් ගිණුම්ගත කර තිබූයෙන් රු.1,369,452.007 කින් ජංගම නොවන වත්කම් අවප්‍රමාණය වී තිබුණි.

(ඉ) එවකට මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 30 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2024 ට අනුව රාජ්‍ය ආයතන සතු වාහනවල වටිනාකම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියට වාර්තා කිරීමේ හා ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කොට තිබුණද, ශ්‍රී ලංකා රේගුවට අයත් රජයේ වාහන සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා රේගුවේ රාජකාරී කටයුතු සඳහා භාවිතා කරන වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 12ක් ශ්‍රී ලංකා රේගුව වෙත පවරාගෙන ඒවායේ තක්සේරු වටිනාකමද ගිණුම්ගත කර නොතිබුණි.

**1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබූ ඉඩම් හා ගොඩනැගිලිවලින් මුළු අගය රු. 475,000,000 ක් වන මැලේ වීදියේ, සේරම් පෙදෙසේ හා මීගමුව ප්‍රදේශයේ පිහිටි දේපළ සම්බන්ධව අයිතිය සනාථ කරන කිසිදු ලේඛනයක් හෝ වත්කම් වටිනාකම් ගිණුම්ගත කිරීමට අදාළ කිසිදු ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් එම ඉඩම්වල වටිනාකමේ නිවැරදිතාවය හා වත්කම්වල අයිතිය තහවුරු කරගත නොහැකි විය.

### 1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා රේගුව විසින් පහත දැක්වෙන ලේඛන යවත්කාලීනව පවත්වාගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | පැමිණීමේ හා පිටවීමේ ලේඛනය | ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 1.3 ඡේදය | නියැදි විගණනය සිදු කල අංශ රැසකම මෙම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණ අතර මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්ව නොතිබුණි. |
| (ආ) | වාහන සම්බන්ධයෙන් වූ ස්ථාවර වත්කම් ලේඛනය | කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 2009(2) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි අංක 110 | පවත්වාගෙන ගොස් නොතිබුණි. |

### 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.6 | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සාධාරණ අගය ඇතුළත් කලයුතු බැවින් රේගුව සතු ඉඩම් හා ගොඩනැගිලි සියල්ල තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | 1.6.4(ආ) |

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු සහ තත්‍ය ආදායම් අතර විචලනය

ආදායම් සංකේත 02 කට අදාළව ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය අදායම අතර සියයට 29 සිට සියයට 43 ක් දක්වා වු පරාසයක ඌණ විචලනයක් ද ආදායම් සංකේත 06 අදාළව සියයට 14 සිට 1834 ක් දක්වා වූ පරාසයක අධි විචලනයක්ද නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයේ ආදායම සමඟ සැසඳීම

සමාලෝචිත වර්ෂයේ ආදායම් ඉකුත් වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේ දී ආදායම් සංකේතාංක 05 කට අදාළව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 14 සිට සියයට 34 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ බද්දට යටත්වන අපනයනවල ගෝලීය අපනයන ඉල්ලුම අඩුවීම මත අපනයන බදු එකතු කිරීම සීමා වීම, දඩමුදල් රාජසන්තක කිරීම්වලින් ලැබෙන ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවීම මේ සඳහා මූලික වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) හිඟ බදු ආදායම්

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ බදු ආදායම වූ රු. 57,707,523,914 ක් වසර 10 කට අධික කාලයක් තිස්සේ අය නොවී පැවති අතර එම ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකර ගැනීමට ශ්‍රී ලංකා රේගුව අපොහොසත් වීම හේතුවෙන් වසර අවසානයේ ශේෂය ද එලෙසම පැවති අතර සමස්ත හිඟ බදු අදායමෙන් රු.22,044,131,527 හෙවත් සියයට 38 ක් ආනයන බදු ද, රු. 15,236,676,819 ක් හෙවත් සියයට 26 ක් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දද විය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 20 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉන් වැය විෂයන් 4ක් සඳහා වෙන් කල ප්‍රතිපාදනයන්ගෙන් කිසිඳු වියදමක් සමාලෝචිත වර්ෂය තුළ දරා නොතිබූයෙන් නිසි පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කර නොමැති බව නිරීක්ෂණය විය.

3.2.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වැය විෂයයන් 04 කට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 07 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අතරින් යාපනය විවේකාගාර සහ ප්‍රාදේශිය කාර්යාල ප්‍රතිසංස්කරණය සඳහා මූලික අනුමැතින් ලබාගැනීමට නොහැකි වීම

හේතුවෙන් අපේක්ෂිත වියදම් ඇති වී නොතිබීම හේතුවෙන් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය සඳහා වෙන්කළ රු.258,000,000 ක වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනයෙන් රු.233,492,177 ක ප්‍රතිපාදන ඉතිරියක් සිදුව තිබුණි.

**3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 10 කට අදාළව සලසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා රු.34,950,215 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැරකම් විස්තරයේ ඇතුළත් නොවූ නමුත් ආයතනය විසින් නඩත්තු කරන බැරකම් ලේඛනයේ සටහන් කර 2025 වර්ෂයට අදාළ රු. 27,731,393 ක් 2026 වර්ෂයේදී ගෙවා තිබූ අතර 2025 වර්ෂයට අදාළ 2026 වර්ෂයේදී ගෙවා තිබූ වැය විෂයයන් 6 කට අදාළ රු. 11,020,220 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් විස්තරයේ සහ ආයතනය විසින් නඩත්තු කරන බැරකම් ලේඛනයේ ඇතුළත්ව නොතිබුණි.

**3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

**3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1869 අංක 17 දරන රේගු ආඥා පනත | |
| (i) | 135 සහ 162 වගන්ති | රඳවා තබාගෙන ඇති බහාලුම් සම්බන්ධයෙන්, මෙම වගන්ති |

| | | |
|---|---|---|
| | | ප්‍රකාරව හැකි පමණ ඉක්මනින් සුදුසු පරිදි ක්‍රියා කළ යුතු අතර නරක්වන සුළු බඩු වර්ග විකුණා දැමිය වුවත්, 2025 දෙසැම්බර් 31 දින වන විට විවිධ හේතු මත අල්වා ගෙන රේගුවේ විවිධ අංගනවල රඳවා ඇති වසර 05 ට වඩා පැරණි බහාලුම් 393ක් ඇතුලුව බහාලුම් 1051 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ii) | 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කළ යෝජනා ක්‍රමයකට අනුව කළ යුතු වුවද, 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා එසේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 2012 වසරේ සිට 2025 වර්ෂය දක්වා වූ වර්ෂ 14ක් තුළ ත්‍යාග මුදල් ලෙස නිලධාරීන් සඳහා රු.31,841,796,739 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.5,421,015,509ක් ද බෙදා හැර තිබුණු අතර විමර්ශන කාර්යයන්ට සෘජුව දායකත්වය නොසපයන අංශ 18ක නිලධාරීන්ටද රු.647,911,453ක් බෙදාහැර තිබුණි. |
| (ආ) | රේගු ආඥා පනතේ 51 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද අංක 1270/16 සහ 2003 ජනවාරි 07 දිනැති ගැසට් පත්‍රය | ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයෙක් විසින් සිදු කරනු ලබන රේගු ප්‍රකාශනයේ භාණ්ඩය පිළිබඳ අංගසම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවකට ලක්වූ දිනක එවැනි අංග සම්පූර්ණ තොරතුරු රහිතව භාණ්ඩ නිදහස් වූ අවස්ථා 02ක් ද දින 04 ක දී තොරතුරු රහිතව මිල පිරික්සුම් ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් වූ අවස්ථා 413 ක් ද නිරීක්ෂණය විය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | රේගුවේ විවිධ අංශ 15 ක් මඟින් සිදු කරමින් පවතින විමර්ශන 283කට අවශ්‍ය වියදම් දැරීම සඳහා අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුමෙන් වසර 05 කට පෙර ලබාගෙන තිබුණු අත්තිකාරම් රු.15,308,568 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද පියවා නොතිබුණි. තවද, ලබාගත් අත්තිකාරම් විමර්ශන අවසන් වූ පසුව කඩිනමින් පියවිය යුතු ව තිබුණද, අවස්ථා 7 කදී ලබාගත් අත්තිකරම් රු.1,338,518 ක් විමර්ශන අවසන්වී සමාලෝචිත |

|  |  |  |
|---|---|---|
|  |  | වර්ෂය අවසානයට වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා කාලය ගතවී තිබුණද පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය III | කොම්පඤ්ඤ වීදිය, මෝගන් පාරේ පිහිටි ශ්‍රී ලංකා රේගුව සතු ඉඩමක මේ වනවිට අනවසරයෙන් පවුල් 15ක් පමණ පදිංචි වී සිටින බව නිරීක්ෂණය වුවද චක්‍රලේඛය ප්‍රකාරව එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 | මෙම චක්‍රලේඛය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතනවල රාජ්‍ය නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වන අතර සියලු රේගු නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර අනිවාර්යයෙන් භාවිතා කලයුතු බවට 2023 සහ 2024 පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නිර්දේශ තුළ ද දක්වා තිබුණද එසේ කටයුතු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අතිකාල වියදම් ලෙස රු.1,426,216,662ක්ද, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු ලෙස රු.92,027,074ක්ද සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ගාස්තු ලෙස රු.12,979,200ක්ද පැමිණීම හා පිටවීම විධිමත් ලෙස තහවුරු කර ගැනීමකින් තොරව නිලධාරීන්ට ගෙවා තිබුණි. |

**3.6 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

(අ) භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලියට සම්බන්ධිත පාර්ශවයන් විසින් 2022 සිට 2024 වර්ෂය දක්වා කාලච්ඡේදය තුළ අවස්ථා 100 කදී සිදු කර තිබූ විවිධ අක්‍රමිකතාවයන්හි දී ආසන්න වශයෙන් එකතු වටිනාකම රු. 2,564,047,848 ක බදු මුදලක් ගෙවීමට පැහැර හැර තිබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ විවිධ අංශ විසින් රේගු පරීක්ෂණයන් සිදු කර අහිමි කිරීම හා දණ්ඩන වශයෙන් රු. 2,996,211,744 ක් අය කර ගෙන තිබුණද එම වටිනාකමින් සියයට 30 ක් එනම්, රු.898,863,523 ක් පමණක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූයෙන් රු.1,665,184,324 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(ආ) රේගු ආඥා පනතේ 84 අ (1) වගන්තිය ප්‍රකාරව ගුදමක් තුළ භාණ්ඩ නිෂ්පාදනය හා එකලස් කිරීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය මත සිදුකළ හැකි අතර, එහි 84 අ (3) වගන්තිය ප්‍රකාරව මෙවැනි ගුදමක නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද භාණ්ඩ ගුදමෙන් මුදාහරින අවස්ථාවේදී එම භාණ්ඩ ආනයනය කරන ලදැයි සලකා ඒ සම්බන්ධ තීරු බදු ගණනය කර ගෙවීම

කළ යුතු වුවත් 2025 වර්ෂය තුළ මෙවැනි ගුදම් 6 ක දී වාහන 94,941 ක් එකලස් කර වෙළඳපොලට මුදා හැර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඒ වෙනුවෙන් අයවිය යුතු රු.17,889,184,800 බදු මුදලින් රු.5,766,827,320 පමණක් අයකර ගෙන තිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා රේගු මූලස්ථාන ගොඩනැගිල්ලේ ආපනශාලාව පවත්වාගෙන යාම හා වරාය පරිශ්‍රයේ රේගු නිලධාරීන්ට දිවා හා රාත්‍රී ආහාර සැපයීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සහ තෝරාගත් පාර්ශවය සමග වලංගු ගිවිසුමකට එළඹීමකින් තොරව 2024 පෙබරවාරි 17 දින සිට මෙ දක්වා අපනශාලාවේ කටයුතු පවත්වාගෙන යනු ලබන අතර වරාය පරිශ්‍රයේ නිලධාරීන්ට දිවා සහ රාත්‍රී ආහාර සැපයීම වෙනුවෙන් 2025 වර්ෂයේදී පමණක් ශ්‍රී ලංකා රේගුව රු.41,134,400 ක් එකී පාර්ශවයට ගෙවා තිබුණි.

## 3.8 අධිකාරි බලය නොලත් ගණුදෙනු

ශ්‍රී ලංකා රේගුව විසින් අතිකාල දීමනා ලෙස රු. 1,439,899,829 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන්ට ගෙවා තිබුණු අතර අතිකාල හා නැවබඩු පරීක්ෂණ ගාස්තු අදායමින් පිළිවෙලින් රු.1,629,674,790 හා රු.294,485,750 බැගින් නිලධාරීන්ට හා ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා පදනම් කරගෙන තිබූ 1988 ජූලි 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ අංක 1435/21 හා 2006 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය 2007 ඔක්තෝබර් 26 වන දින අවලංගු කර තිබුයෙන් උක්ත ගෙවීම් සඳහා නීත්‍යානුකූල අධිකාරි බලයක් නොමැති බව නිරීක්ෂණය විය.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2016 වර්ෂයේ සිට ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීම (Build Own & Operate- BOO) යන ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ පුද්ගලික සමාගමක් මඟින් රේගුව සිය බහාලුම් පරිලෝකන කටයුතු සිදුකර ගෙන තිබුණි. 2021 වර්ෂයේදී එම සමාගම සමඟ ඇ.ඩො. 21,590,008 ක ගිවිසුමකට යටත්ව පද්ධතියේ පූර්ණ අයිතිය රේගුවට ලබා ගැනීමට කටයුතු කර තිබුණි. මෙහිදී රේගු නිශ්කාෂණ ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් අපේක්ෂා කර තිබුණ ද එය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සඟවා ඇති අයිතමයන් හඳුනා

ගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීතිවිරෝධී භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ලඟාවීමට නොහැකි වී තිබුණි.

### 4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

2025 වර්ෂයේ රේගුවේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව දැනට භාවිතයේ පවතින ඔරකල් එක්සාඩේටා පද්ධතිය වෙනුවට එහි නව සංස්කරණයක් ස්ථාපනය කිරීම, යාවත්කාලීන කිරීම සහ ඊට අදාළ මෘදුකාංග බලපත්‍ර සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය 2025 මාර්තු 31 දිනට අවසන් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය රු.මිලි.2,197,964,882 ක (බදු රහිත) කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික ආයතනයක් වෙත පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත්, 2026 මාර්තු 11 වන තෙක්ම එම ආයතනය සමග එබඳු කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

2025 දෙසැම්බර් 31 දින වනවිට රේගුවේ ප්‍රවාහන අංශයට අනුයුක්ත වාහන අතුරින් වාහන 38 ක් ධාවන තත්ත්වයේ නොතිබුණු අතර වරාය පරිශ්‍රයේ සහ ගරාජයන් තුළ මෙම වාහන ගාල්කර තිබුණි. මෙම වාහන අතුරින් බොහෝ වාහන ප්‍රමාණයක් නියමිත අලුත්වැඩියාව එම අවස්ථාවේම සිදු නොකිරීම නිසා මේවන විට අලුත්වැඩියා කිරීමට නොහැකි හෝ විශාල වියදමක් දැරීමට සිදු වන තත්ත්වයකට පත්ව තිබුණි. කෙසේ වෙතත්, එම වාහන කාලීනව අලුත්වැඩියා කර භාවිතයට නොගැනීම හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාර්ෂිකව රු. 67,825,484 ක වියදමක් දරමින් පුද්ගලික ආයතන තුනකින් වාහන 19 ක් ලබාගෙන තිබුණි.

### 4.3 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට මාස 10 සිට වසර 12ක් දක්වා කල් ඉකුත් වූ බැංකු ඇපකර 23 ක වටිනාකම රු.146,208,981 ක් විය. අදාළ ඇපකරවල කල් ඉකුත්වීම පිළිබඳව නිලධාරීන් යාවත්කාලීන නොවීම, කෙටි කාලයක් ඇතුළත නිලධාරීන් ස්ථාන මාරුවීම සහ කල් ඉකුත්වීම යාවත්කාලීනව දැන ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබීම මෙයට හේතු වී තිබුණි. ඉහත වටිනාකමින් රු. 11,806,400 ක් වටිනා බැංකු ඇපකර 3 ට අදාළව උපකාරක ලියකියවිලි ද බැංකුවේ නොමැති බවට එම බැංකුව විසින් රේගුවට දැනුම් දී තිබුණි.

(ආ) බැඳුම්කරුවෙකු විසින් තීරුබදු රහිත සාප්පුවක් සඳහා සහ සේවා ගුදමක්/පෝෂක ගුදමක් සඳහා බදු සුරක්ෂණයක් ලෙස බැංකු ඇපකරයක් පවත්වාගෙන යා යුතු වන අතර එම බැංකු ඇපකර මාස 12 ක කාලයක් සඳහා වලංගු විය යුතු වුවත් නියැදි ලිපිගොනු පරීක්ෂාවට අනුව 2025 දෙසැම්බර් 31 දින වන විට සක්‍රියව පවතින තීරු බදු රහිත සාප්පු සහ සේවා ගුදම්/ පෝෂක ගුදම්

22 කට අදාළ රු.88,210,000 ක් වටිනාකමකින් යුතු බැංකු ඇපකර කල් ඉකුත් වී තිබුණි.

(ඇ) රේගුව විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකින් ලබා ගෙන තිබුණු ඉඩමක අත් අඩංගුවට ගන්නා ලද වාහන 329 ක් රඳවා තිබුණු අතර රුහුණුපුර වරාය භූමියේ ද එදිනට තවත් වාහන 108 ක් රඳවා තිබුණි. මින් බහුතරයක් වාහන වසර 8කට වැඩි කාලයක් තිස්සේ අංගනවල ගාල් කර තැබීම හේතුවෙන් දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත්වීම නිසා වෙන්දේසියකින් සාධාරණ මුදලක් ඉපයීමට නොහැකි තත්ත්වයකට පත් වී තිබුණු අතර රේගු ආඥා පනතේ 109 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි.

(ඈ) ආනයනික වාහන 5කට අදාළව අපනයන රේගු සටහන්කරයේ ඇතුළත්ව තිබූ මි.ර.ගා (CIF) වටිනාකමට වඩා අඩු වටිනාකමකට සකස් කරන ලද ඉන්වොයිස් පත්‍ර ඉදිරිපත් කිරීමෙන් මුළු වටිනාකම ඕස්ට්‍රේලියානු ඩොලර් 97,510 ක් අඩුවෙන් ප්‍රකාශ කර වාහන රේගුවෙන් නිශ්කාෂණය කරගෙන තිබුණි. මෙම වාහන 5 ට අදාළව අපනයන රේගු සටහන්කරයේ ඇතුළත්ව තිබූ මි.ර.ගා (CIF) වටිනාකම සැලකිල්ලට ගත්කළ ආසන්න වශයෙන් රු.16,200,813 ක් බදු පදනමට ඇතුළත් වී නොතිබීම හේතුවෙන් රු. 26,701,747ක බදු ප්‍රමාණයක් රජයට අහිමි වී තිබුණි.

(ඉ) සැම අතින්ම නව වාහනයක් ලෙස සැලකිය හැකි වාහන භාවිතා කළ වාහන සේ සලකා සමාලෝචිත වර්ෂය තුළ දී ආනයනය කර තිබූ අවස්ථා විගණනයට නිරීක්ෂණය වූ අතර කිලෝමීටර 65 කට අඩු ධාවන දුරක් සහිත වාහන ආනයනය කළ අවස්ථා 26 කදී එම වාහන නිෂ්පාදක වෙබ් අඩවි වටිනාකමින් සියයට 85ක් පමණක් පදනම් කරගනිමින් බදු ගණනය කර තිබුණි. ඒ අනුව, ආසන්න වශයෙන් රු.167,494,713 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(ඊ) ජපානයේ වෙන්දේසිවල විකිණී ඇති ලංකාවට වැඩියෙන්ම ගෙන්වා ඇති වාහන වර්ග 4 කට අදාල මිල ගණන් පරීක්ෂාවේදී 2025 වර්ෂය තුළ ආනයනය කර ඇති වාහන නියැදියකට ඉතා ආසන්න කාලයක් තුළ වාහන වෙන්දේසියේ විකිණී ඇති මිල ගණන් සැලකිල්ලට ගත්කළ ආනයනකරුවන් විසින් එම වාහන අඩු මිල ගණන් යටතේ රේගුවෙන් නිෂ්කාශනය කරගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂාවට ලක්වූ එවැනි වාහන 29 ක් නිෂ්කාශනයේදී ආසන්න වශයෙන් රු.88,758,285 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

රේගුව විසින් දිගු කාලයක් රඳවාගෙන ඇති බහාලුම් අතර වාහන අමතර කොටස් සහිත බහාලුම් 33 ක්, ප්ලාස්ටික් ද්‍රව්‍ය සහිත බහාලුම් 56 ක්, ලී බඩු සහ දැව සහිත බහාලුම් 39 ක්, ආහාර ද්‍රව්‍ය

බහාලුම් 313 ක්, දුම්වැටි සහ දුම්වැටි සහිත දෑ ඇතුළත් බහාලුම් 25 ක්, පුවක් බහාලුම් 36 ක් සහ විවිධ මිශ්‍ර අයිතම් සහිත බහාලුම් 123 ක් විය. ඒ අතර වූ හාල් බහාලුම් 108 න් රු. 186,058,922 ක් වටිනා වසර 6කට වඩා පැරණි මිනිස් පරිභෝජනයට නුසුදුසු සහල් බහාලුම් 53 ක සහල් සත්ත්ව ආහාර වශයෙන් අලෙවි කිරීම පාරිභෝගික සේවා අධිකාරියේ අංක 2285/18 සහ 2022 ජුනි 24 දිනැති ගැසට් පත්‍රය මගින් වළක්වා ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනය වෙත දන්වා තිබුණි. එකී ගැසට් පත්‍රය සංශෝධනය කරන ලෙස 2024 දෙසැම්බර් 06 දින වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට ද 2024 දෙසැම්බර් 11 සහ 2025 පෙබරවාරි 11 යන දිනයන්හිදී ද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට රේගුව විසින් දැනුම්දී තිබුණද විගණන දිනය වූ 2026 මාර්තු 19 දින වන විට ද ඒ සඳහා විසඳුමක් නොලැබීම හේතුවෙන් එම බහාලුම් තවදුරටත් රඳවා ගෙන තිබුණි.

### 4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 ඔක්තොම්බර් 27 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් අංක PUR/A/CUS/2025/AQ/04-A යටතේ වාහන නිෂ්කාෂණ කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන විමසුම සඳහා මාස 06 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි.

### 4.7 කළමනාකරණ දුර්වලතා

(අ) මධ්‍යගත සිද්ධි ලේඛනයට (Central Case Register) අනුව 2015 සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා සිද්ධි 42,086 ක් ලියාපදිංචි කර තිබුණු අතර, ඉන් සිද්ධි 32,779 ක් විසඳා අවසන් කර තිබුණි. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් සිද්ධි 9,307 ක් විසඳීමට ඉතිරිව පැවතුණි. ඒ තුළ වසරක් ඇතුළත ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව 1,208 ක් ද, වසර 1 ට වැඩි වසර 5 ට අඩු සිද්ධි සංඛ්‍යාව 3,207 ක් ද, වසර 5 ට වැඩි සිද්ධි සංඛ්‍යාව 4,892 ක් ද විය. ලියාපදිංචි කර වසර 5 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණ ද මෙතෙක් නොවිසඳී ඇති සිද්ධි සංඛ්‍යාව සමස්ත නොවිසඳුනු සිද්ධි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 52 ක් විය. මාස හයකට වරක් වශයෙන් බහුතර නිලධාරීන් සංඛ්‍යාවකට අදාළව සිදුකරන ස්ථාන මාරුවීම, නව නිලධාරීන් පැරණි සිද්ධි අවසන් කිරීමට උනන්දුව අඩුවීම මෙන්ම ගොනු අස්ථානගතවීම විමර්ශන විසඳීම ප්‍රමාද වීමට ද හේතු වී තිබුණු අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) විමර්ශන තවදුරටත් පවත්වාගෙන යාම සහ රේගු විමර්ශන අවසන් වී රේගු පරීක්ෂණ කෙරෙමින් පැවතීම මත සමාලෝචිත වර්ෂය අවසානයට රඳවා ගත් බහාලුම්වල එකතුව 460 ක් වූ අතර ඉන් විමර්ශන ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට රඳවාගත් බහාලුම්වල එකතුව 88ක් ද වසරක් ඉක්මවා ඇතත් රේගු පරීක්ෂණ අවසන් නොවූ බහාලුම් 84 ක්ද විය. ඒ අනුව, රේගු විමර්ශන හා පරීක්ෂණ අවසන් කිරීමේ සැලකිය යුතු කාල පමාවක් පවතින බව විගණනයේ නිරීක්ෂණය විය. මීට අමතරව නිසි අධීක්ෂණයක් නොමැතිවීම හේතුවෙන් රඳවා ගැනීමට හේතු පැහැදිලි නොවූ බහාලුම් 12 ක්ද ලිපිගොනුව සොයාගැනීමට නොහැකිවූ බහාලුම් 23ක්ද විය.

(ඇ) ශ්‍රී ලංකා රේගුවේ විවිධ ගබඩාවල 2020 වර්ෂයේ සිට රඳවාතබාගත් භාණ්ඩ අයිතම විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වීම හේතුවෙන් 2025 වර්ෂයේදී විනාශ කර තිබුණි. මෙ විනාශ කරන ලද ද්‍රව්‍ය අතර දළ වටිනාකම රු. 759,200 ක් වූ රටඉඳි කිලෝ 584 ක්ද දළ වටිනාකම 21,938,400 ක් වූ කහ කිලෝ 9141 ක්ද දළ වටිනාකම 1,275,000 ක් වූ කරදමුංගු කිලෝ 204 ක්ද විය. කෙසේ වුවද, මෙම භාණ්ඩ කාලීනව ටෙන්ඩර් මගින් අලෙවි කිරීමට යොමු නොවීමෙන් රජයට ආදායම් අහිමිවීමක් සිදුව ඇති අතර සිදුව ඇති පාඩුව තක්සේරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා විදේශ සැපයුම්කරුවන්ට මුදල් ප්‍රේෂණය කිරීම් සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි ඇතුළත් කරමින් ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති අංක 1739/3 හා 2012 ජනවාරි 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 17වන වගන්තියට අනුව විවිධ පාර්ශවයන් විසින් පෙර ගෙවීම් ක්‍රමය යටතේ සිදුකරන ප්‍රේෂණයන් සම්බන්ධයෙන් වාණිජ බැංකු විසින් සපයා ඇති විස්තර සසඳා බලා නියම කර ඇති කාලය තුළ එකී ප්‍රේෂණයන්ට අදාළව භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථා හඳුනාගෙන අදාළ ප්‍රේෂණකරු 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ලියාපදිංචි කර ඇති ව්‍යවසායක් වන අවස්ථාවකදී ආනයන සහ අපනයන පාලක වෙතද එසේ නොවන ව්‍යවසායක් සම්බන්ධයෙන් විනිමය පාලක වෙතද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තා කරනු ලැබිය යුතු වේ. කෙසේ වෙතත්, 2023 ජනවාරි 01 දින සිට 2025 පෙබරවාරි 28 දක්වා කාලය තුළ පෙර ගෙවීම් ක්‍රමය යටතේ අවස්ථා 273කදී එකතු වටිනාකම එ.ජ.ඩො 12,638,875ක් හෙවත් රු.මිලියන 3,052කට ආසන්න ප්‍රේෂණයන් සිදුකර භාණ්ඩ ආනයනයකර නොතිබුණු ආයතන/පුද්ගලයන් 69දෙනෙක් සම්බන්ධයෙන් ගැසට් නිවේදනයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව, ගැසට් නිවේදනය මඟින් සත්‍ය ආනයනයන් සඳහා පමණක් ප්‍රේෂණයන් සිදුවන බව තහවුරුකිරීම පිණිස ඇතුළත්කර ඇති නියාමනයන් හා පූර්ව කොන්දේසි නිවැරදිව ක්‍රියාත්මකවන බව තහවුරු කිරීමට මෙම ගැසට් නිවේදනය බලාත්මක කිරීමට අධිකාරී බලය ලත් ආයතනයක් වන ශ්‍රී ලංකා රේගුව අසමත් වී ඇති බව

නිරීක්ෂණය කෙරේ. ඒ හේතුවෙන් ඌන තක්සේරුකර සිදුකරන ආනයනයන්ට අදාළ හිඟ මුදල් ප්‍රේෂණය කිරීම හා නිත්‍යානුකූල නොවන අයුරින් උපයා ගත් මුදල් විදේශ රටවල් වෙත ප්‍රේෂණය කිරීම වැනි අක්‍රමිකතා සඳහා මෙම ප්‍රේෂණ ක්‍රමය භාවිතා කළ හැකි බව නිරීක්ෂණය විය.

(ඉ) කොළඹ වරාය තුළ ඇති වී තිබූ තදබදය නිසා නිශ්කාෂණය ප්‍රමාද වූ ආනයනික බහාලුම් වෙළඳාම පහසු කිරීමේ උපක්‍රමයක් ලෙස භෞතික පරීක්ෂාවකින් තොරව භාණ්ඩ නිදහස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පත් කර ඇති කමිටුව විසින් 2025 ජනවාරි 18 දින බහාලුම් 309 ක් නිදහස් කර තිබූ අතර එම බහාලුම් තුළ අන්තර්ගත ද්‍රව්‍යන්හි අවදානමේ ස්වභාවය අනුව ඒ අතරින් 151 ක් රතු මාර්ගයටද (ඉහළ අවදානම්) 158ක් කහ මාර්ගයටද (මධ්‍යම අවදානම්) තේරී තිබුණි. ඉහළ අවදානම් කාණ්ඩයට අයත් බහාලුම් මුළුමනින්ම පරීක්ෂාවට භාජනය කළ යුතුව පැවතුණ ද ඉන් බහාලුම් 121ක් ඇතුළුව මුළු බහාලුම් 185ක් පරිලෝකනය පමණක් සිදුකොටද ඉතිරි බහාලුම් කිසිවක් පරිලෝකනය කිරීමකින් හෝ තොරවද නිදහස් කර තිබුණි. මේ සියලු බහාලුම් පශ්චාත් නිශ්කාෂණ විගණනයට යටත්ව නිදහස් කළ බව කමිටුව විසින් විගණනයට වාර්තා කර ඇතත් මේ දක්වා එකී පශ්චාත් නිශ්කාෂණ විගණන කටයුතු අවසන් කර වාර්තාවක් ලබා දී නොතිබුණි.

(ඊ) තාක්ෂණ අමාත්‍යාංශය විසින් 2023 මැයි 2 දිනැතිව නිකුත් කර ඇති අංක MOT/2023/01 දිනැති චක්‍රලේඛය අනුව රජයේ ආයතන විසින් සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කර ක්‍රියාත්මක කළයුතු වුවත් ශ්‍රී ලංකා රේගුව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එබඳු සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් සමඟ සංවර්ධන නිලධාරීවරයෙක් සහ කළමනාකරණ සහකාරවරු 11 ක් පමණ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව සිටිය ද, බහුතරයක් කළමනාකරණ සහකාරවරුන් සෑම මාස 06ට වරක් රේගුවේම විවිධ අංශයන්ට ස්ථාන මාරු කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකබව, කාර්යක්ෂම බව මෙන්ම ස්වාධීනත්වයටද බලපෑමක් එල්ල වී තිබුණි.

### 6.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අස්ථිත්වයක අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කරන බවට සමාලෝචනය කළ යුතු වුවද, වසර 5 ට වඩා මුදල් අමාත්‍යාංශයේ මෙන්ම රේගු දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේ ද සාකච්ඡාවට භාජනය කරන ලද ඉහත අරමුණුවලට සෘජු දායකත්වයක් ඇති කරුණු තවදුරටත් නොවිසඳී පැවතීම නිසා මෙම කමිටු පැවැත්වීමෙන් ලබා ගතහැකි ප්‍රතිඵල ලඟා කර ගැනීමට රේගුව අසමත් වී තිබුණි.

## 7. මානව සම්පත් කළමනාකරණය

### 7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 3,077 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 2,277 ක් වූ බැවින් එදිනට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 800 ක් පැවතුණි. ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරී / නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු 26 ක්, රේගු අධිකාරී / සහකාර රේගු අධ්‍යක්ෂ තනතුරු 218 ක්, සහකාර රේගු අධිකාරී තනතුරු 230 ක්, ප්‍රධාන රේගු පරීක්ෂක තනතුරු 99 ක්, රේගු පරීක්ෂක තනතුරු 144 ක් හා රේගු නියාමක තනතුරු 51 ක් ආදී වශයෙන් විවිධ මට්ටම්වල සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණු අතර ශ්‍රී ලංකා රේගුවේ අනුමත තාක්ෂණ නිලධාරී තනතුරු දෙකම පුරප්පාඩු වී තිබුණි. ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම රේගුවේ මෙහෙයුම් ක්‍රියාවලිය සුමටව හා කාර්යක්ෂමව ඉටුකර ගැනීමට බාධාවක්ව පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා රේගුවේ වෙනම අංශයක් ලෙස ස්ථාපිත වී ඇති නීති කටයුතු අංශය සඳහා එක් නීති නිලධාරී තනතුරක් අනුමත වී ඇතත් එම තනතුර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පුරප්පාඩු වී පැවතුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට